දහම්සරණ

# ගැටපද විවරණය.

වටද්දර මේධානන්ද ස්වාමීන් වහන්සේ

විසින්

ලියන ලදි.

කොත්මලේ
ඥානෝදය පරිවේණාධිපති පූජ්‍ය පණ්ඩිත
**කේ. ශ්‍රී. ධර්මානන්දාභිධාන මහාස්ථවිරපාදයන් වහන්සේ**
විසින් අවශාන ශුද්ධිපත්‍රාවලෝකනයෙන්
සංස්කෘත යි.

දෙලොස්බාගේ මීයනගොල්ලේ කත්දේ කඩේ පදිංචි
ජී. එච්. සොලමොන් ද සිල්වා මුදලාලි
මහත්මයා විසින්
**ස්වදේශ මිත්‍රයා යන්ත්‍රාලයෙහි මුද්‍රාපිත යි.**

2473
1930

මිල ශත 75.

# DAHAM SARANA
# GETAPADA VIWARANA

COMPILED BY

REV. WATADDARA, MEDHANANDA, SWAMI.

APPROVED BY

THE VEN'BLE PANDIT K. SRI, DHAMMANANDA MAHA THERO.

*Principal of*

*Jnanodaya Pirivena Kotmale.*

PUBLISHED BY

G. H. SOLAMON DE SILVA, MUDALALI.

KANDE KADE

DOLOSBAGE.

SWADESA MITRAYA PRESS.

2473
1930

# සංඥාපනය.

## දහම්සරණ ගැටපද විවරණය.

ත්‍රිසරණ ග්‍රන්ථත්‍රයය නිසා සිංහල බෞද්ධයන්ට පමණක් නොව සිංහල සාහිත්‍යයට ද විපුල වූ අනුග්‍රහයක් සිදුවූයේ ය. එහෙයින් ම ග්‍රන්ථ කර්තෘභූත **ශ්‍රීමත් විද්‍යා චක්‍රවර්තීහු** ද පණ්ඩිත ලෝකයා විසින් මහාකවි භාවයෙන් ගෞරව පූර්වකව සම්භාවිත ය. සිංහල භාෂාව පිළිබඳ වූ අවස්ථාත්‍රයය ග්‍රන්ථත්‍රයක් නිර්මාපණය කිරීමෙන් සතාර්ථ භාවයට පැමිණවීම විද්‍යාචක්‍රවර්තීන්ගේ අදහස වූ බව සරණ ග්‍රන්ථයන්හි උපයුක්ත භාෂා විලාසයෙන් පෙණේ. මෙයින් සංස්කෘත භාෂානුගත සමස්තපද බාහුල්‍යයෙන් විරචිත **දහම්සරණ** භාෂාවෙන් මධුරය. අර්ථ ගම්භීර්‍යයෙන් අන්‍යූනය. නාම මාත්‍රය පවා ඇසීම දුර්ලභව පැවැති මේ වැදගත් ග්‍රන්ථය පිළිබඳ තත්ත්වයත් කර්තෘන් පිළිබඳ විවේචනයත් සංශෝධිත **දහම්සරණ** පූර්විකාවෙන් මනාව දතහැකි බැවින් ඒ පිළිබඳව මෙහි යමක් නො පවසමු.

**දහම්සරණ** ප්‍රකාශයට පැමිණි පසු ග්‍රන්ථයෙහි වටිනාකමත් ගෞරවයත් සැලකූ **අධ්‍යාපන මණ්ඩලය** විසින් මෙය **විද්‍යාභ්‍යාස** විද්‍යාලයන්හි අධ්‍යාපනයට නියම කරණලද්දේ ය. එහෙයින් අධ්‍යයනය කරන්නවුන්ගේ ප්‍රයෝජනය සලකා මේ ග්‍රන්ථයට ගැටපදයක් අවශ්‍යබව දුටු **ඥානෝදය පරිවේණාධිපති** පූජ්‍ය වූ මගේ **ආචාර්‍ය්‍යපාදයන් වහන්සේ** විසින් මේ සත්කෘතියෙහි අප මෙහෙයන ලදි. විද්‍යාභ්‍යාස විද්‍යාලයන්හි ආචාර්‍ය්‍යවරුන් ද මෙහි අර්ථ විභාගකොට ගත නොහැකි තැන් නොයෙක්වර පිළිවිස එවීම වැඩියත් අපට මෙහිලා යුහුසුලු වීමට හේතු විය.

මෙය ලිවීමෙහි දී අසමදෘචාර්‍ය්‍යපාදයන් වහන්සේගේ අනුමතිය ද ඇතිව ශෝධිත දහම්සරණයෙහි ඇතැම් තැන් වෙනස්කර අර්ථ ලියන්ට ද සිදුවිය. හෙද පුරණාගතපාඨානුසාරීවම ය. එසේ ම විශේෂයෙන් අපහසු පදයන් ම මෙහි උදුරා අර්ථ දක්වන ලද්දේ සෙසු පදයන් පිළිබඳ අර්ථ යථායෝග්‍ය වශයෙන් යොදා

ගෙණ අර්ථ කිමෙන් ශිෂ්‍යයන් තුළ විචාර බුද්ධිය ඇතිකර ගැණිමට අවකාශ තැබීම් වශයෙනි. සමහර තැනක එක පදයට අර්ථ දෙතුන්පලක ලියන්නට විය. එය පදයන් පිළිබඳ අන්වය යෙදෙන පරිද්දෙනි.

බුද්ධරජාණන් වහන්සේගෙන් මොබ වූ සියලුදෙනාට ම වැර දීම ස්වභාවයකි. එහෙයින් ආ[illegible]නිසා වූ අපගේ මේ සත්කෘතියෙහි ස්මෘතිදෝෂ භාවයක් නම් කොහින් ලැබේ ද? මෙහි මුද්‍රණයෙන් පසු අප විසින් දක්නාලද දෝෂයෝ ද නැත්තේ නොවෙත්. නමුත් ශුද්ධිපත්‍රයක් නො යෙදීමු. ලොක ස්වභාවය සලකා එබඳු දෝෂස්ථාන සුධීන් විසින් ශුද්ධකොට ගණිත්වා.! එසේ ම යම් භවතෙකු විසින් මෙහි දෝෂ ස්ථාන අප වෙත ලියා එවුවොත් කාරුණා පූර්වකව පිළිගන්නා බවත්, එසේ දැන්වීම මෙහි දෙවන සංස්කරණයට උපකාරයක් වන බවත්, ශාස්ත්‍ර සඞ්ග්‍රහයක් බවත් දන්වනු කැමැත්තෙමු.

මේ සත්කෘතියෙහි අප මෙහෙයීමෙන් හා අවශාන ශුද්ධි පත්‍රාවලොකනයෙන් පිළිගැණීමෙන් ද ගැඹුරුතැන් විසඳා දීමෙනුත් **ඥානොදය පිරිවෙණාධිපති පූජ්‍යවූ මගේ ආචාර්ය්‍යපාදයන් වහන්සේ** හැම අතින් ම ආධාර කළ බව ගුරු භක්ති පූර්වකව අභිවාදනයෙන් සඳහන් කරමි.

එසේ ම අප සහ ප්‍රකාශකයන් උනන්දු කිරීමෙන් අප සහෝදර **මාකොල පඤ්ඤානන්ද** ස්වාමීන් වහන්සේ ද, මෙහි ඇතැම් කොපි මුද්‍රණයට නිසි පරිදි ලියාදීමෙන් වටද්දර සද්ධානන්දාරාම වාසී අප හිත මිත්‍ර උගත් **අටබාගේ ඥානානන්ද** ස්වාමීන් ද මීට උපස්ථම්භක වූ බව සාදරයෙන් සඳහන් කරමි.

අපේ හිතවත් දායක නොනෙක් වූ දෙළොස්බාගේ මියන ගොල්ලේ කන්දේ කඩේ පදිංචි ශාසනොදයකාමී **සද්ගුණවත් මාගාල්ලේ ජී. එච්. සොලමොන් ද සිල්වා මුදලාලි** මහත්මයා විසින් ඉතා මහන්සිව ස්වකීය ධන වියදමෙන් ශොභනීය ලෙස මෙය මුද්‍රණය කරවීම අපට මහත් ප්‍රීතියක් බවත් ශාසන සඞ්ග්‍රහයක් බවත් පවසනු කැමැත්තෙමු.

**වටද්දර මේධානන්ද.**

ශ්‍රී බුද්ධ වර්ෂ 2473 දුරුතු මස පුර
පැළවිය ලත් බුද දින දීය.

---

ඥාණොදය පිරිවෙන.
වටද්දර.

## දහම් සරණ

# ගැ ට ප ද වි ව ර ණ ය.

**නමො තස්ස භගවතො අරහතො සම්මා සම්බුද්ධස්ස.**

### (1) පිට.

**තිලෝගුරු**=තුන්ලොකයට අසහාය ආචාර්යවූ, හෙවත් ශ්‍රෙෂ්ඨවූ; සත්ත්ව, සංඛාර, ඔකාස යනු හෝ කාම, රූප, අරූප යනු දහම් පොත්හි **දක්**වූ තුන්ලොවයි. තාන්ත්‍රිකයෝ ස්වර්ග, මර්ත්‍ය, පාතාල යැයි දක්වත්. **සාරාසඞ්ඛ්‍යකල්ප ලක්ෂයක්**= සතර ස්ථානයෙක්හි බුද්ධශූන්‍ය මහාකල්පලක්ෂ සතරක් සහ මහාකල්ප දසදහසක්, නොහොත්: මහාකල්ප ලක්ෂයක් අධිකකොට ඇති සතර අසඞ්ඛ්‍යකල්ප ලක්ෂයක්. මෙහි "අසඞ්ඛ්‍ය" යනු ප්‍රමාණාතික්‍රාන්ත කාලයෙකි. එය බුද්ධිවිෂය නොවේ. "සතර අසඞ්ඛ්‍ය" නම්:—

| | | | |
|---|---|---|---|
| 1 දීපඞ්කර, කොණ්ඩඤ්ඤ බුදුවරයින් අතර මහා | | අසඞ්ඛ්‍යකල්ප | 1 යි |
| 2 කොණ්ඩඤ්ඤ, මඞ්ගල | ,, | ,, | 1 යි |
| 3 සොභිත, අනොමදස්සී | ,, | ,, | 1 යි |
| 4 නාරද, පදුමුත්තර | ,, | ,, | 1 යි |

මේ බුද්ධශූන්‍ය මහා කල්ප සතරයි. පදුමුත්තර බුදුරජාණන් වහන්සේගේ පටන් කල්පලක්ෂය ගැණේ. ඒ මෙසේයි:— පදුමුත්තර, සුමේධ බුදුවරයන් අතර කල්ප තිස්දහස (30,000) කා; සුජාත, පියදස්සී බුදුවරයන් අතර කල්ප සැටනවදහස් අටසියඅසූදෙක (69,882) කා; ධම්මදස්සී, සිද්ධත්ථ බුදුවරයන් අතර කල්ප විස්සෙක; සිද්ධත්ථ, තිස්ස බුදුවරයන් අතර එක්කල්පයෙක; විපස්සී' සිඛී බුදුවරයන් අතර සැටකපෙක; වෙස්සභූ, කකුසන්ධ බුදුවරයන් අතර තිස්කපෙක; මෙසේ පද්මොත්තර බුද්ධොත්පාදයවූ කල්පයෙහි පටන් මොබ ඒ ඒ බුදුවරයින් උපන් කල්ප හා මෙම භද්‍ර කල්පය ද සමග කල්පලක්ෂයෙකි. (කල්ප විස්තර සිංහල අනාගත වංශයෙන් හා ධර්මප්‍රදීපිකාවෙන් ද දතයුතු.)

**අන්තයෙහි**=කෙළවර, **බෝමැඩ**= බෝධි මණ්ඩයෙහි, ඇසතු ගස මුලැ. 'බෝධි' සඞ්ඛ්‍යාත චාතුර්මාර්ගඥානප්‍රතිලාභයට උපකාරවූ හෙයින් හෝ ස්ථානවූ හෙයින් අභෙදෞපචාර වශයෙන් ගස ද බෝධි නමින් පළවිය. **වජ්‍රාසනයෙහි**=වජ්‍රයක් සේ (විදුරුමිණක් මෙන්) මාරබ්‍රහ්මාදි කිසිවකු විසින් නොබිඳිය හැකිවූ; පොළොව පලා නැඟි තුදුස් රියන් ආසනය උපචාර වශයෙන් වජ්‍රාසනයැයි ව්‍යවහාර විය. වජ්‍රාසන"යනු ආසන(=හිඳීම්) වෙසෙසකි. පද්මාසන, ස්වස්තිකාසන, භද්‍රාසන, වීරාසන, වජ්‍රාසනයැයි අසුන් කොටස් පසෙකි. "බෝධිමූලවජ්‍රාසනස්ථ" යනාදියෙන් බෝධිමූලයෙහි වජ්‍රාසනයෙහි වැඩසිටිබව පෙණේ.

"ඌර්වෞ පාදෞ ක්‍රමාන්න්‍යසෙත්
තාලෙවාඃ ප්‍රත්‍යාඞ්මුඛාඞ්ගුලී
කරෞ නිදධ්‍යා දාඛ්‍යාතං
වජ්‍රාසන මනුත්තමම්" යනු වජ්‍රාසන ලක්ෂණයි.

ඌරුයුගමයෙහි පාදවය පිහිටුවා තල්ල කෙලින් ඇඟිලි පෙණෙන සේ අත්තබා හිඳීම වජ්‍රාසන ලකුණුයි. මේ ආකාර හිඳීම වජ්‍රාසන නමි. පොළොව පලාගෙණ නැඟි තුදුස්රියන් අසුනද් අභෙදෞපචාරයෙන් වජ්‍රාසන නම් විය. **සව්නේගෙවා**= සකලඥෙයමණ්ඩලය අවසන්කොට. සංස්කාර, විකාර, ලක්ෂණ, ප්‍රඥප්ති, නිර්වාණ, යනු සකල ඥෙයපදාර්ථ යි. **පසක්කළාවූ**=ප්‍රත්‍යක්ෂ (=අවබොධ) කළාවූ. **සවඟ මොක්ෂසම්පතැ** = දෙව් සැප නිවන් සැප.

**වියත් අවියත්**=ව්‍යක්තවූ (=දක්ෂවූ)ද අව්‍යක්තවූ(=අදක්ෂවූ) ද **සනාහා**= සංසිඳවා. **මුළු**=සියලු. **අමාකප්සිසෙසාගක්**=අමාදිය ඉසි මක්. "අමෘත" යනු ස්වාදුවූ ජලයෙකි. **ගෞතමගොත්‍රයෙහි**= ගෞතම නම් ඍෂිහුගෙන් සම්භවවූ වංශය හෙවත් පුත්‍රපරම්පරාව ගෞතමගොත්‍ර නම් විය. **අගමැණ**=ශ්‍රෙෂ්ඨවූ මණිරත්නය. **ශාක්‍ය සිංහදු**=ශාක්‍යවංශයට සිංහස්වරූපවූ.(ශ්‍රෙෂ්ඨවූ)ශාක්‍යවංශය නම්?

**ඔක්කාකරජහුගේ** අගමෙහෙසියගේ පුත්‍රයෝ සතරදෙනෙක් වූහ. ඔහු සතර බෑයෝ පියරජහු සැමැත්තෙන් අනෙකසහස්‍ර හස්ත්‍යශ්වරථපදාතීන් ගෙණ පස්බිත්තන් හා සමග අමාත්‍යයන් අටදෙනෙකු විසින් අධිෂ්ඨිත තුන්යොදුන් පමිදින් උපලක්ෂිතව හිමවත් අභිමුඛව ගොස් **රොහිණී** නදීතීරයෙහි **කපිල** මහර්ෂින් විසින් නිර්දිෂ්ට ස්ථානයෙහි **කපිලවාස්තු** නම් නුවරක් කරවාගෙණ අමාත්‍යයන් විසින් සමුත්සාහිතව තමනට තිබි රජකන්‍යාවන් නැත්තෙන් දූරියනට තිබි රජපුත්‍රයන් නැත්තෙන් කුලවංශ රක්තා සඳහා කණිෂ්ඨභගිනීන් අග්‍රමහිෂීන් කොට ගෙණ **ජ්‍යෙෂ්ඨ**

භගිනිය මාතෘස්ථානයෙහි තබා තමන් සතරදෙනා සොරෙහි මාළු **උල්කාමුඛරජකුමාරයා** රජ කොටගෙණ වුසූහ. **එසේ** වසන පරිදි අසා **ඔක්කාවක්රජ** "මා දරු කුමරුවෝ කුලවංශ රක්‍ෂාකර නුවට ශක්‍යයහ"යි පරිතුෂ්ටව "**සක්‍යාවත හො රජකුමරා! පරම සක්‍යාවත හො රජකුමරා!!**" යි උදන් ඇනුවේ යි. එතැන් පටන් ඔහු "ශාක්‍ය" වූහ.

**මූලප්‍රණිධානයෙහි**=මූලාධ්‍යාශයෙහි. බුදුබැව් ලැබීමේ ප්‍රථම අදහසෙහි. මනොප්‍රණිධාන, වාක්ප්‍රණිධානයැයි ප්‍රණිධි දෙකකි. මෙහි, අෂ්ටධර්මසමොධානයෙන් ලැබෙන වාක්ප්‍රණිධානය යෙදේ. **මිළකොට**=වටිනාකම්නිශ්චයකොට. **සිනෙහැතිව**=ආදරඇතිව. **සම්පත්තීන් අනූනවූ**=සියලු උපභොග පරිභොග සැපතින් අඩුනොවූ; **විපත්තින් ක්‍ෂීණවූ**=විපත්වලින් අඩුවූ, විපත් නැති-**අමරවර ශරීර සෞන්දර්‍ය්‍යසාරසංග්‍රහාභිරාමවූ**=අමරවරශරීර, උත්තමදිව්‍ය ශරීරයෙහි; සෞන්දර්‍ය්‍යසාර, සුන්දරභාවසඞ්ඛ්‍යාත සාරාංශය; සංග්‍රහාභිරාමවූ සංග්‍රහවීමෙන්(=සැටිවීමෙන්)මනොඥවූ; **විවිධ විදග්ධ මුග්ධ නරනාරිගණා'කීර්ණවූ**=විවිධ, නනාප්‍රකාරවූ විදග්ධ, නිපුණවූ; පණ්ඩිතවූ නොහොත් නාගරිකවූ; මුග්ධ, සුන්දරවූ හෝ ගායකවූ; නරනාරිගණ, ස්ත්‍රී පුරුෂ සමූහයාගෙන්; ආකීර්ණවූ. ගැවසීගත්තාවූ; **මෘදඞ්ග ශබ්දය**=මිහිඟු බෙරහඬ "මිහිඟුබෙර" නම් අරළුගෙඩියක ආකාර බෙර වෙසෙසකි. **ගීතශබ්දය**=ගී හඬ, **සඞ්ඛ ශබ්දය**-සක් හඬ, **සම්ම ශබ්දය**=කයිතාලම් හඬ. **තාලශබ්දය** ලොහොතාලම් හඬ.

**දුර්භික්‍ෂ භය ප්‍රලයයෙන්**=ආහාර නැතිවීම් සඞ්ඛ්‍යාත යකු ගෙන් වන විනාශයෙන්. **අනුපක්‍ෂීණවූ**=නොපිරිහුනාවූ. **නිරුපහතා'න්නපානසම්පත්තින්**=නොනටුවාවූ නොහොත් සම්පූර්ණවූ ආහාරපාන සැපතින්. **සා**=ක්‍ෂුධාව. බඩගිනි.

(2) පිට

**නිත්‍යයෙන් හෘෂ්ට ශිෂ්ට ජනසංසෙවිතවූ**=නිතර ආහාර පානාදි ලාභයෙන් සතුටුවූ යහපත් ජනයන් විසින් සෙවුනා ලබන්නාවූ. **විනෂ්ට**=විශෙෂයෙන් නසනලද. **දුෂ්ටජනා'ප්‍රහතවූ**= නපුරුජනයන් විසින් නො නසන ලද්දවූ. **පරිඛා**=නුවර හාත්පස, සාමන්ත ශත්‍රූන්ගේ අනනුප්‍රවෙශය සඳහා කරණලද දිය අගල්. **ප්‍රාකාර**=හාත්පස බඳිනලබන බැම්. නාප්ප. **ප්‍රතොලි**= වීථිය නොහොත් නුවර අතරවූ මහා මාර්ගය. **නගර රක්‍ෂාඞ්ගයෙන්**= නුවර ආරක්‍ෂාවට උපකාරවන අවයවයන් ගෙන්. **රාෂ්ට්‍ර**= රට. **දුර්ගය**= සතුරන්ට වහා පිවිසිය නොහැකි කෝට්ටය. **නිරුපසර්ග**= අනතුරය නැත්තා වූ. තිබීය වූ.

**ධම්මා'ත්ථ කාම මොක්ඛ**= **ධර්ම,** ශාස්ත්‍රොක්ත විධියෙන් සත්ප්‍රතිපදා සමාචාරය; **අර්ථ,** ප්‍රතිපදා සමාචාරයෙන් ලබන ධනය; **කාම,** පඤ්චකාම රසානුභවය; **මොක්ෂ,** සංසාරයෙන් මිදීම; **ස්ථූල**= මහත්. **සූක්ෂ්ම**= සියුම්. **කර්මාන්ත සම්පාදනව්‍යග්‍ර**= (කට යුතු කර්මය ම කර්මාන්ත නම්.) ඒ කර්මාන්තයන්ගේ සම්පාදනයෙහි ආශක්තවූ. **සමග්‍රකාරුශිල්පකුල කෞශල්‍යයෙන්**=සියලු ශිල්පීන් ගේ ශිල්ප සංඝතියෙහි දක්ෂභාවයෙන් යුක්තවූ. (කුශලයාගේ= දක්ෂයාගේ භාවය 'කෞශල්‍ය'යයි.)

**නිෂ්පාද්‍යමානවූ**=නිපදවනුලබන්නාවූ. **අසමානවූ**=අතුල්‍යවූ. සමවන අතිශයක් නැත්තාවූ. **කර්මාන්ත සන්තානයෙන්**= කර්මයන්ගේ විස්තරභාවයෙන් නොහොත් කර්මරාශියෙන්. **සමවායයෙන්**=එක්වීමෙන්. **පඤ්චෙන්ද්‍රිය සන්තර්පණයට**= ඇස්,කන්, නාසා දිව, කය යන පසිඳුරන්ගේ පිණවීමට. **විභක්තවූ**= වෙන්කොට බෙදනලද්දවූ. **විෂය විශෙෂයෙන්**=ඉන්ද්‍රිය ගොචරවූ(=ගොදුරුවූ) ධර්ම (=කාරණ) යන් ගෙන්. **පරම මනොහර**= ඉතා සිත්කළුවූ, **විමලස්ථූලා'තිස්ථූලමුක්තා ඵලාදි**=විමල, නිර්මලවූ; ස්ථූලා'තිස්ථූල, අතිශයින් මහත්වූ; මුක්තා ඵල ආදි, මුතුඇට ආදීන්ගේ; **සමුද්ගතවූ ප්‍රභාකලාපයෙන්**= උපන් දීප්ති සමූදයයෙන්. **වර්ණ භෙදසම්බන්ධයට**= රක්තනීලාදි නොයෙක් ආකාර වර්ණයන්ගේ එක්වීමට.

**පුරමධ්‍යා'කාශ දෙශයෙන්**= නුවර මතුයෙහිවූ අහස් ප්‍රදෙශයෙන්. **සර්වකාලික සෞභාග්‍ය ඇති**= සියලු කල්හි ම වූ නොහොත් සියලු කාලයට යොග්‍යවූ සම්පත් ඇති. **කර්ණාට**= 'මයිසූර්' ප්‍රදෙශයේ 'කර්නැටික්' නමින් ප්‍රසිඬ රට. **ලාට**= බාන් දෙශයේ උතුරු කොටසත් ගුජ්රපළාතේ දකුණු කොටසත්; ලාට ප්‍රදෙශයැයි කියත්. **කාශ්මීර**= ගන්ධාරදෙශ. උතුරු ඉන්දියාවේ පඤ්ජාබ් ප්‍රදෙශයේ පිහිටි එනම් පළාත. **කීර**= කාශ්මීරදෙශයේ කොටසක්වූ එනම් පළාත. **කාම්බොජ**= ආසියාවේ සියම්රටට දකුණෙන් පිහිටි බෞද්ධරට. **යවන**= ග්‍රීසිය. **චීන**= ආසියාවේ පූර්වදිග පිහිටි එනම් රට. **ශබර**= වැදිරට. **බර්බර**= ඉන්දියාවේ වන චරයන් වසන එනම් ප්‍රදෙශය. නොහොත් උතුරු අප්‍රිකාවේ ඇල්ජියස් රටේ පිහිටි බර්බරී ප්‍රදෙශය. **ගුර්ජර**= ඉන්දියාවේ බට හිර, පිහිටි ගුජරට් නම් ප්‍රදෙශය.

**නානා දෙශවාස කවිජන සමූහ සඞ්ගීත**= නානාදෙශ වාස, නන් දෙස්වැසිවූ; කවිජන සමූහ, පණ්ඩිත සමූහයා විසින්; සඞ්ගීත, මැනැවින් දක්වන ලද්දවූ;– **දෙශොචිත වෙෂභාෂා**

**විශෙෂ සංයොගයෙන් සුන්දරවූ**= දෙශ උචිත,දෙශයන්ට සුදුසුවූ; වෙෂභාෂා විශෙෂ සංයොගයෙන්, ආකල්ප විශෙෂ හා භාෂා විශෙෂයන්ගේ එක්වීමෙන්; සුන්දරවූ, මනොඥවූ. **ශික්ෂා**= වර්ණොච්චාරණ විධිය දක්වන වෙදාඞ්ගය; **කල්ප**= යාග හොමාදි කටයුතු පිළිවෙළ. **ව්‍යාකරණ**= ශබ්දව්‍යුත්පත්ති ශාස්ත්‍රය. **නිරුක්ති**=ශබ්දයන්හි අර්ථගන්නා ක්‍රමය උගන්වන ශාස්ත්‍රය. **ඡන්දො විචිති**= වර්ණවෘත්ත මාත්‍රාවෘත්තයන්ගේ ලක්ෂණ ප්‍රකාශිත පිඞ්ගලාදි ඡන්දශ්ශාස්ත්‍රය. **ජ්‍යොතිෂ**=ග්‍රහ තාරකාවන්ගේ සඞ්ක්‍රමණාදියෙන් වන ඵලාඵල ඇගන්වන ශාස්ත්‍රය.

**ඍග්**= ගිනි වායු ආදි ධාතූන් දෙවතාවශයෙන් පතවා යාඥ කිරීමාදිය උගන්වන තන්ත්‍රය. **යජුස්**= දෙවතාවන්ට කටයුතු යාගපූජාදිය ප්‍රකාශිත තන්ත්‍රය. **සාමන්**= යාඥ ප්‍රකාශිත ගීති ජාතය. **අථර්වන්**= සංගීත සහ නොයෙක් ශාස්ත්‍ර ඇතුලත්වූ තන්ත්‍රය. **අවෙද්‍ය**= අවබොධයට දුෂ්කරවූ. **විද්‍යාස්ථානසම්බන්ධයෙන්**= විද්‍යාවන් පිළිබඳව. **අග්‍රාම්‍යවූ**= අනින්දිතවූ නොහොත් පෙශලවූ. **තත්තද්විද්‍යොප ජීවින් විසින් නිරන්තරවූ**= ඒ ඒ විද්‍යාවන් නිසා දිවිපවත්වන්නවුන්ගෙන් අතරක් නැත්තාවූ. ඔවුන්ගෙන් ගැවසීගත්. **සන්ධි**= යුදපත් ප්‍රබල සතුරු සමග සමාදානය පැවැත්වීම. **විග්‍රහ**= සතුරු සමග යුදකිරීම. **යාන**= යුද පිණිස සතුරු ඉදිරියට යාම හෝ ප්‍රබලයකු පහර දෙන කල ආරක්ෂාව සඳහා පලායාම. **ආසන**= කඳවුරු බැඳ හිඳීම. **සංශ්‍රය**= විපත්ති, විනාශය පිණිස අන්‍යයන් ඇසුරු කිරීම. **ද්වෛධීභාව**= සතුරු සමග ඉදිරියෙහි මිත්‍රකම් පෙන්වා තම විශ්වාසය ඔහු වෙත නොතබා ක්‍රියාකිරීම. **ෂාඩ්ගුණ්‍යයන්ගේ**= කියනලද සවැදෑරුම් ගුණයන්ගේ.

**කාලොචිත ස්ථානොචිත**= (කාල + උචිත, (ස්ථාන + උචිත) කලට ඔබින, තැනට ඔබින. **ප්‍රයොගයෙහි**=යෙදීමෙහි. **ප්‍රවීණවූ**= දක්ෂවූ. **රාජරාජව්‍යසන විනාශයෙන්**=රජුන්ගෙන් හා රජනොවූ අන්‍යයන්ගෙන් වන විපත් නැසීමෙන්. **ස්වධර්මකර්මයෙහි**=තමාට යොග්‍යවූ වෙදාදියෙහි කියන ලද ආචාර ධර්මයෙහි. **අනුදාසීනවූ**= උත්සාහවත්වූ. **සත්‍යශෞචාචරණවූ**=සැබැවින් පවිත්‍රවූ හැසිරීම් ඇති. නොහොත් සත්‍යයෙහි හා ශෞචධර්මයෙහි හැසිරෙන්නාවූ. **ශෞචධර්මය** නම්:-

"අභක්ෂ්‍ය පරිහාරශ්ච-සංසර්ගශ්චාප්‍ය'නින්දිතෛඃ
ස්වධර්මෙච ව්‍යවස්ථානං-ශෞචමිත්‍ය'භිධීයතෙ"

යන ස්මෘති සොලෝවෙන් දක්වන ලද නො වැළඳිය යුතු දේ දුරලීම ද, ශිෂ්ටයන් හා සමග සෙවාව ද, ස්වධර්මයෙහි පිහිටීම ද යන මේයි. **සම්‍යක්පාලනසංවර්ධිත**=යහපත් පාලනයෙන් වර්ධනයවූ

**පෞරජනයන්**= පුරවැසියන්. **සතතොද්ඝොෂමාන**= නිරන්තර යෙන් ගයනු ලබන නොහොත් උස්හඬින් කියනු ලබන. **ජය ශබ්ද**=දිනුම් හඬ. **සාධුවාද**=සාධුකාර දීම්. **ශතසහස්‍රයෙන්**=ලක්ෂ යෙන්. **සම්මිශ්‍රවූ**=මොනවට එක්කාසු වූ. **අන්‍යොන්‍යසහයොගව**= ඔවුනොවුන් එක්ව. **ශුද්ධාෂ්ටකය**=පඨවි, ආපෝ, තෙජෝ' වායෝ, වණ්ණ, ගන්ධ, රස, ඕජා යන ධාතු අට. **කලත්‍රාදීන්**= භාර්‍ය්‍යා ආදීන්. **ශාඩ්ඝාරශාලාවන්**=තැටුම්හල්.

**වධ්‍ය භූමියක්**= නසන තැනක්. **ධර්මාධිකරණ ප්‍රවෘත්තින්**= දැහැමිවූ විනිශ්චයයන් පැවැත්වීමෙන්. **විනිවර්තිත**=සිය සතන්හි නොපැවැත්වීම් වශයෙන් විශෙෂයෙන් දුරුකරණලද. **මාත්සර්‍ය්‍ය**= සිය සැපත් සැඟවීම. **මුඛ**=මැනකාලයෙහි නොහොත් ඒ උතුමා. **සර්වඥතාඥාන**=සියල්ල දැනීමේ නුවණ.

**(3) සිට.**

**කල්පවෘක්ෂයෙහි**=උතුරුකුරු දිවයිනෙහි තිබෙන සිතූ පැතූ දෙය දෙන ගස. **ගෝත·න්න**=ආලවාලය. නෙත් බිම. **අමරපුර වරසපර්ධිතවූ**= දෙව්පුරය හා තරඟ කරන්නාවූ. **නිරූපදෙශයෙන්**= (නිර් + උපදෙශයෙන්)=අනුන්ගේ උවදෙසක් නැතිව. **මෙධාසම්පත්තින්**=ප්‍රඥා සමෘද්ධියෙන්. **වයොමූර්තිධර**=වෘද්ධශරීර ධාරීවූ. **උදිතොදිතවූ**=(උදිත × උදිතවූ)=අතිප්‍රසිද්ධවූ. **අධ්‍යයන**= ඉගෙණීම. **අධ්‍යාපන**=ඉගැන්වීම. **යජන**=යාගකිරීම. **යාජන**= යාගකරවීම. **දාන**=දන්දීම. **ප්‍රතිග්‍රහණ**=දන් පිළිගැන්ම. **අභිරත**= ඇලුනාවූ. **සුජාත**=මිශ්‍ර නොවීමෙන් පිරිසිදුවූ. **ජාතිවාදයෙන්**= අපිරිසිදු ජාති ඇත්තෙක යන නිග්‍රහයෙන්. **අක්ලිෂ්ටවූ**=කිළිටි නොවූ. **දෙතිස්මහාපුරුෂලක්ෂණයෙන්**= බුදුවරුන්ට පිහිටන මහාපුරුෂලක්ෂණ තිස්දෙකෙන්. **අශීත්‍යනුව්‍යඤ්ජනයෙන්**=අසූවක් කුඩා ලකුණෙන්.

**කෙතුමාලායෙන්**=සර්වඥයන්ගේ හිසින් උඩට නඟින රශ්මි කදම්බයෙන්. **ව්‍යාමප්‍රභායෙන්**=අවට බඹයක් පමණ පැතිරෙන රශ්මි රාශියෙන්. [විස්තරාර්ථීන් විසින් **ධර්මප්‍රදීපිකා** හා **ලක්ඛණ සූත්‍රය** බැලියයුතුයි.] **බුද්ධවිලාස වෛචිත්‍ර්‍යයට**=බුදුබැව් නැමැති විචිත්‍රකර්මයට. **වැටිකනක්**= වර්තිකාවිභාගයක්. තෙලිකුරක්. **කුන්දෙ'න්දුචන්ද්‍රිකාකුමුදෙන්දීවරාදි**= කුන්ද, කොඳය, ඉන්දු, සඳය, චන්ද්‍රිකා, සඳරැසය; කුමුද, කෛරවය, (සුදුනෙලුම්); ඉන්දීවරාදි, නිලුපුල්ය යන මේ ආදිවූ. මෙහි යු 'කොඳ' නම් රාත්‍රියෙහි චන්ද්‍රාලොකයෙන් පිපෙන සියුමැලි සුමන පුෂ්ප ජාතියකි.

**මධුර**=මනොඥ. **ස්ථානොචිත වින්‍යාසයෙන්**=තැනට ඔබින සේ පිහිටුවීමෙන්. **මනොඥ පරිනාමයෙන්**=යහපත් මේරීමෙන්. **ජනනයන මනොරඤ්ජනෛකරසායනවූ**=ජනයන්ගේ නෙත් සිත් සතුටුකිරීමෙහි එකම රසදුනක් වැනිවූ. **අනන්‍යසාමාන්‍යවූ**=අන්‍යයන් හා සමාන බවක් නැත්තාවූ. **සෞභාග්‍යභාග්‍යදෙදෙනාගේ**=සම්පත්ති, දෛව යන දෙදෙනාගේ. **සමසා ප්‍රසවයක් සේ**=යුග්මව (=නිවුන් වී) පහළවීමක් වැනි. **ලොකොත්තරවූ**=ලොකශ්‍රෙෂ්ඨවූ. **පවිත්‍ර චිත්‍ර චාරිත්‍ර විශෙෂපාත්‍රවූ**=පවිත්‍ර, පිරිසිදුවූ; චිත්‍ර, විසිතුරුවූ; චාරිත්‍රවිශෙෂපාත්‍රවූ, සිරිත් වෙසෙස්නට භාජනව. සිරිත් වෙසෙසින් යුක්තව. **විශුද්ධබුද්ධිප්‍රභාවභාවිතවූ**=විශුද්ධ, වෙසෙසින් පිරිසිදුවූ; බුද්ධිප්‍රභාව, ඥානමහිමයෙන්; භාවිතවූ, වඩනාලද්දවූ;නොහොත් අවබොධකරණ ලද්දවූ. **චිත්තොත්පාදමාත්‍රයෙකින්**=සිත් ඉපැදවීම් පමණෙකින්.

**ශ්‍රී හස්තතල ලලිත කොමලාමල බාලපල්ලවාදි විලාසයෙන්**=ශ්‍රී හස්තතල, ශොභාවත් අත්ලෙහි; ලලිත, තැබීමනලාවූ; කොමල, මොළොක්වූ; අමල, නිර්මලවූ; බාලපල්ලවාදි විලාසයෙන්, ලපලුපත් ආදි ආකාරයෙන්. මෙහි 'ආදි' ශබ්දයෙන් අතෙහි තුඹු තෙල්ලි ගෙඩිය ද දූරගම්ණ ද සංග්‍රහිතයි. **නිෂ්තුෂකොටැ**=බොල්රහිතව සාරය රැගෙණ. **නිශ්‍යඞ්කව**=නිසැකව. **විශිෂ්ට ශිෂ්ට ගොචරවූ**=විශිෂ්ට, උතුම්වූ; ශිෂ්ට, පණ්ඩිතයන්ට; ගොචර වූ, ඉන්ද්‍රියවිෂයවූ; **චතුෂ්ෂෂ්ඨිකලා** හා=සිවුසැටකලා ශිල්පයක්. **අෂ්ටාදශවිද්‍යාස්ථානයන්ගේ**=අටලොස් (=දහඅට) විද්‍යාවන්ගේ. **ග්‍රන්ථිස්ථාන**=ගැටලුතැන්. **ජීර්ණපර්ණපුට**=පරඬලා කොළ ගොටුවක්.

**ස්මෘතිනාරාචනිපාතයෙන්**=සිහිය නැමැති නාරස්සනය හෙළීමෙන්. **විද්ධ**=හිල් කොට. **කොවිදකොටැ**=දක්ෂ සේ. ක්‍රියා විශෙෂණාර්ථයෙහි පූර්වක්‍රියයි. **අවිචාර්‍ය්‍යවූ**=විචාරණය නොකටයුතු වූ. **උන්නතවූ කුලයෙන්**=උසස් වංශයෙන්. **විමලවූ**=නිර්මලවූ. **නවයුවතිජන**=අලුත් තරුණියන්ගේ. **මනොහර**=සිත්ගැන්මෙහි. **එකභෙෂජායමානවූ**=අවිතීය බෙහෙදක් වැනිවූ. **නවයෞවන සම්පත්තින්**=අලුත් යොවුන් බැව් නැමැති සැපතින්. **විරාජමාන**=බබලන.

**විශද ශරදාකාශ ගර්භයෙහි**=විශද, පිරිසිදුවූ; ශරදාකාශගර්භයෙහි, සරත් කල්හි අහස් කුසෙහි. වප්, ඉල් දෙමස සරත් නම්. **දෛදීප්‍යමානවූ**=අතිශයින් බබලන්නාවූ. **ශාරද චන්ද්‍රමණ්ඩලය සේ**=සරු සඳමඬල මෙන්. **ලොකොත්සවෛක කාරණව**=ලොකයාගේ උත්සවයට (=ප්‍රීතියට) අසහාය කාරණ වී. **විකසිත**

**කමල ගබ්භෙසු**= විකසිත, පිපියාවූ; කමල ගර්භයෙහි, පද්ම කුහරයෙහි; **කණ්ණිකාවක් සේ**=පියුම් කෙමියක් මෙන්. **නිසග්ග සොභා විසෙස සංසග්ගෙන**= නිසර්ග,ස්වාභාවිකවූ; ශොභාවිශෙෂ, උතුම් ශොභාවන්ගේ; සංසර්ගයෙන්, එක්වීමෙන්. **පරම මධුරවූ**= ඉතා මනොඥව. **මන්දාරලතාසු**=මදාරා මල් ලියෙහි.'මදාරා'යනු දිව්‍යපුෂ්ප විශෙෂයෙකි. **සඤ්ජාත**= හටගත්තාවූ, **සාමප්‍රබුද්ධවූ**= තෙමේම පිපියාවූ.

**අමන**=හමන්නාවූ. **මකරන්ද**= මල්රේණුන්හි. **සුගන්ධසම්බන්ධ**= සුවඳ පිළිබඳව. **බන්ධුරවූ**= මනොඥභාව ඇතිවූ. **කුසුමස්තවකයක් සේ**= මල් කැනක් සේ. මල් පොකුරක් සේ. **සකල ලොක ලොචනාහ්ලාදකවූ**= සකලලොක, සියලු ලෝකයාගේ; ලොචන, ඇසට; ආහ්ලාදකවූ, සතුටුදායකව. **අප්‍රතිමලල**= ප්‍රතිවිරෝධීන් රහිත්වූ; **වෙපුල්ල පබ්බතොදරෙසු**= රජගහ නුවර පිහිටි එනම් පර්වතාභ්‍යන්තරයෙහි.

**ප්‍රවර්තමානවූ**=පවත්නාවූ.**වර්ධිෂ්ණු**.වැඩෙනසුලු.**රොචිෂ්ණු**= දීප්තාවත සුලු. බබලන ස්වභාවඇති. **සමුත්පතිෂ්ණු**= නැගෙන සුලුවූ. **මරීචි මාලා සමාකුල වූ**= රශ්මි සමූහයෙන් ගැවසුනාවූ. **ලොකාතිවර්තිනි**= ලොකය ජයගන්නාසුලුවූ. **චක්‍රවර්ති නරවර භොග්‍යවූ**= චක්‍රවර්ති නරවර, උතුම් සක්විති රජුන් විසින්; භොග්‍යවූ, පරිභොග කටයුතුවූ. **මහා මණිරත්නයක් සේ**=උතුම් මිණි රුවනක් මෙන්. **ලොක බහුමාන භාජනවූ**= ලෝවැස් සන්ගේ බුහුමනට යොග්‍යස්ථානව. **ගන්ධ ගජ කුම්භයෙහි**='ගන්ධ' කුලයෙහි ඇතුන්ගේ කුම්භස්ථලයෙහි. **සර්වදෙෂ විනිර්මුක්ත**= සියලු දෙසින් මිදුනු. **නිරුපධි මධුර ලක්ෂ්මී නිවාසවූ**= නිරුපධි, කපට බැව් රහිතවූ; මධුර, මනොඥවූ; ලක්ෂ්මී, ශ්‍රී කාන්තාවට; නිවාසවූ, වාසස්ථානව.

**සර්වලොක සම්භාවනා භාජනවූ**= සියලු ලොකයාගේ බුහුමනට බදුනක්ව. **ප්‍රලයසමය**= කල්ප විනාශ කාලයෙහි. **දිවසකර කරොපලුප්ත තුහිනබින්දුද්වයක් සේ**=දිවසකරකර, හිරුරැසින්. උපලුප්ත, නසනලද; තුහින බින්දුද්වයක් සේ, පිනිබිඳු දෙකක් මෙන්. **දුර්වාර**=නොවැළැක්විය හැකිවූ. **මාරාහංකාරගොචරවූ**= මරුගේ ගර්වයට විෂයව. **කථාශෙෂවූකල්හි**= මළකල්හි. **නානා ද්‍රවිණගණ සම්පූර්ණ**= නොයෙක් වස්තු සමූහයෙන් පිරුණු. **කොෂ්ඨාගාර රක්ෂණ ලක්ෂණ**= භාණ්ඩාගාර රැකීමයැයි කියනලද. **ව්‍යාපාර නිරත**=මෙහෙයෙහි යෙදුනු.

**අමාත්‍යවරයා**=ශ්‍රෙෂ්ඨ ඇමතියා. **භක්තිභාර**=ආදර බරින්. **අවනත**= පහත්කරණලද. **හස්තඇතිවූ**= අත් ඇතිව. **නිජ මස්තක වින්‍යස්ත**=තම හිසෙහි තැබූ. **ශ්‍රීපාදෙ'ත්තංසයෙන්**=උතුම් පා නැමැති මුදුන්මල් කඩින්. **සඵලීකෘත**= සඵල කළ. **ප්‍රාණලාභ ඇතිවූ**= ජීවිතලාභ ඇතිව. **පරමා'දර**= උතුම් ආදරය. **කුල ක්‍රමානුගත**= කුල පරම්පරාවෙන් ආ. **සමන්වා**= එක්කොට බලා. **සප්ත රත්න**= රන්, රිදී, මුතු, මැණික්, වෛරොඩි මිණි, විදුරු මිණි, පබලු (=කොරල්) යන් රුවන් සත්වර්ගය. **ව්‍යවස්ථිත**=ව්‍යවස්ථා කරණලද. නියම කරණලද. **අනවස්ථිතවූ**= ව්‍යවස්ථාවක් නැති. මෙතෙක් විය දම්යයි සීමාවක් නැති. **එක් පුරුෂා'යුෂයකින්**= එක් පුරුෂයෙකුගේ ජීවිත කාලයකින්.

**දහම් පිළිසමක්**= ධර්ම සඞ්ඛ්‍යාත ප්‍රතිකර්මයක්. **සූවිසි අසඞ්ඛ්‍යෙය්‍යක්**= අසඞ්ඛ්‍ය විසි හතරක්. [විස්තර ධර්ම ප්‍රදීපිකා 284 පිටුවෙන් බලාදත යුතු.] **ත්‍රිභුවන මර්දනයෙහි**= තුන්ලොව මැඩීමෙහි නොහොත් ජයගැනීමෙහි. **නිරන්තර තත්පරවූ**= නිතර යෙදී සිටින්නාවූ. **අවසවර්තිවූ**= තමා වසහයෙහි නොපවැත. **පිට හඬහඬා**= පිට තම නමා. හඬ (හැඹුම්හි) දයින් පරව පෙර කිරියෙහි 'ආ' පසයි. පෙරකිරිය දෙරුවීමෙහි පූර්වය හ්‍රස්ව විය.

(5) පිට.

**මේ කපැ**= මේ කල්පයෙහි. කල්ප විභාගය පූජාවලියෙහි 44 පිටුවෙන් හා **සිංහල අනාගතවංශයෙහි** කල්පවිභාග කාණ්ඩයෙන්ද දත යුතුයි. **පස් බුදුකෙණෙකුන් වහන්සේ**= කකුසඳ, කෝනාගම, කාශ්‍යප, ගෞතම, මෛත්‍රී යන පස් බුදුවරයෝ. **හෙබැවි**= ශොභමාන කරවනලද. හෙබ (හෙබුම්හි) දයින් පරව කතු අරුත්හි 'ඉ' පස හා දු පස මැද පියදූ අරුත්හි 'ව' පස ව සිඩවූ කෘදන්තයෙකි. **භද්‍ර කල්පය**= යහපත් කප. [භද්‍ර කල්පයවූ පරිදි සිංහල අනාගත වංශයෙන් දතයුතු. *] **හෙවැ**= ශයනය කොට. හෙ (හෙවුම්හි) දයින් නිපන් පෙරකිරියෙකි. **යමාමහ පෙළහර**= ගණ්ඩම්බ නම් අඹරුක මුලදී කොට වදාළ ආශ්චර්ය්‍යවත් ප්‍රාතිහාර්ය්‍යය. යුවළ යුවළ බැගින් ද්විවිධ ඥානයෙන් සිඩ කරණලද හෙයින් 'යමක ප්‍රාතිහාර්ය්‍ය' නම් විය. 'යමක මහාපාටිහිර' යන්නෙන් 'යමාමහ පෙළහර' යි භින්නයි. ප්‍රතිපක්ෂයන් දුරලන හෙයින් හෝ මානාදීන් යුක්ත සිත්හි පවා සන්තොෂය උපදවන හෙයින් හෝ 'පෙළහර' නම් විය. [විස්තර සිංහල අනාගත වංශයෙන් දතයුතු.]

---

* මෙය දැනට මුද්‍රණාවස්ථායෙහිය.

**තව්තිසා වැඩෑ**= එනම් දෙව්ලොවට වැඩලා. 'තව්තිසා' නම් මඝ මානවකයන් හා පිරිවර ද යන තිස්දෙන උපන් දිගින් සතළිස් දහස් ගවු පමණවූ දෙව්පුරයෙකි. 'වැඩෑ' යනු 'වඩ' (වැඩුම්හි) දයින් නිපන් පෙර කිරියෙකි. **පණ්ඩුකම්බල සිලාසන සෙහි**= ශක්‍රයාගේ එනම් අසුනෙහි. මෙය ගවු දෙසිය පණසක් දිග ඇති,සතළිස් ගවුවක් පුළුල ඇති,සැට ගවුවක් බොළවූ බඳු වද මල් ගොඩක් සේ රත් වූ ගල් අසුනෙකි.

**විජම්**=අභිධර්මය.අභිධම්ම=අබිදම්–බිදම්–විදම්–විජම් යි සිඹයි. **රුකාවරණ**=ආරක්‍ෂා ආවරණය. **පස් වා දහසකට**= අවුරුදු පන් දහසකට. **පිළිසිඳගත්නුවර**=මවුකුස්හි පිළිසිඳගත්තේ යම් නුවර කදීනම්එය.කිඹුල්වත්පුරයය.**උපන්උයන**=ලුම්බිනී වනය.**සත්පිය වර එබූතැන**=ලුම්බිනියේදී පියුම් පිටින් පියවර සතක්ගිය සථානය. **වැඩසිටෑකළ සිංහනාදය**="අග්ගොහමස්මි ලොකස්ස,ජෙට්ඨොහමස්මි ලොකස්ස, සෙට්ඨොහමස්මි ලොකස්ස, අයමන්තිමාජාති නත්ථි'දනි පුනබ්භවො" යන ශ්‍රෙෂ්ඨ ප්‍රකාශය. **නො හැර ගිය දඹසේය**= බොධිසත්ත්වයන් වහන්සේ සත් මැසි කාල සුදෙවුන් මහරදුනෝ වප්මඟුලට යන්නාහු පුතනුවන්ද ගෙණ ගොස් දඹරුක් සෙවෙනෙක්හි සපිරිවරින් වඩා හිඳුවා තුමූ වප්මඟුලට වන්හ. දඹරුකෙහි සෙවනැල්ල අපරභාගයෙහිදු බෝසතානන් හැර නො ගියේය. එනම්:–සෙවනැල්ල පෙරවරු තුබූ නියායෙන් ම තිබුනේය. මෙහි කාපිතවූයේ ඒ පුවතය.

**ඇඹේනිසෝය**=අම්බිකාවය. බිසොවය. **ලදපුතනුවෝය**= රාහුල කුමරුය. **දුටු පූර්නිමිති ය**= ජරා; ව්‍යාධි, මෘත, ශ්‍රමණ යන පෙරනිමිති සතර.**නැඟි අසා**=කණ්ඨකයා.**නික්මුණු සමය**=මහාභිනිෂ්ක්‍රමණයට වාසලින් පිටත් වූ වේලාව. රෑ මැදුම්යම.**සඟිනවම**= තමා ම. නොහොත් හිතු කෙණෙහි ම. **පිනූ**= පනිතලද. පන (පිනුම්හි) දයින් පරව කර්මකාරකයෙහි 'උ' පස යෙදී නිපන් අතීතකාලික කෘදන්තයෙකි. **වැඩ සිටි වැල්ල ය**= නෙරඤ්ජරා ගංතෙර. **හළ මලසළුය**=අත්හරිනලද පාරිභොග වස්ත්‍රය. ඉවත්කළ ඇඳිවත. යම් වතක් ඇඳි පමණින් එය මලසළුවයැයි කිය වේ. ඒ මුත් දූලි මඩ ආදියෙන් වූ කිළුටක් නිසා නො වේ.**අටපිරිකාරය**= ගඳනය, තනිපටසිවුර, දෙපටසිවුර, පාත්‍රය, පටිය, කරකැත්තය, ඉදිකටුව, පෙරහන යන මේ ශ්‍රමණ පරිෂ්කාර අට.

**පිඩුසිගාවන් ගමය**= රජගහ නුවරය.**මෙහෙකළ**= වත් කළ. උපස්ථානකළ. 'මෙහෙ' යනුකටයුතුය පර්‍යාය යි. **පස්වගමහණහ**=

කොණ්ඩඤ්ඤය, භද්දිය, වප්ප, මහානාම, අස්සජි යන පස්නම. **පැන්සැනහු**= ජලස්නානය කළ. **නොටෑ**= නෙරජරා ගඟයි. **හළ පාත්‍රය**= අත්හරින ලද පාත්‍රය. **පනපන**= නැවත නැවත. ද්විත්ව නාමයෙහි නිපාතයි. **හෙළා**= අවඥාකොට. නොහොත් පතිත කොට. **මඟුල්මෙහෙ**= සක්දෙවිඳුගේ සක්පිඹීම, පන්සිළුගේ වීණා වාදනය යනාදී මඞ්ගලසේවා. **තුන්විද්‍යාවය**= පූර්වේනිවාසා'නුස්මෘතිඥානය, දිව්‍යංචක්ෂුරභිඥානය, ආශ්‍රවක්ෂයකරඥානය යන ත්‍රිවිද්‍යාව. **අරුණෝදය වේලෙහි**= අරුණ නැගෙන සමයෙහි. අඟස්ති මස් ඇස් වැනි මඳරත් රැස් පෙනෙන කාලය අරුණ නම්. ඉර උදාවට දෙපැයකින් පමණ පූර්වකාලයයි. **වැඳෑ ගෙණ හොත් ඇතාය**=නාලාගිරිඇතු. **උපස්ථානය කළ මතැතාය**=පාරිලෙය්‍යක හස්තියාය. **මිහි**= මී වද. 'මධු' ශබ්දයෙන් භින්නයි. සිදුහත්–සැදූහැ යනාදියෙහි මෙන් මෙහිද මාතෘශබ්දයේ මහාප්‍රාණාක්ෂරය නිමිතින් හකාරය විය. **වඳුරුය**= වානරයාය. වඳුරු යනු 'වාඳර යන ප්‍රාකෘත ශබ්දයෙන් භින්නයි.

**දරණ ගබැ වඩාහිඳුවූ නයා**= මුචලින්ද නාගයා. **දකුණන් සව්වන් වහන්සේ**=සැරියුත්තෙරණුවෝ. **වමත් සව්වන්වහන්සේ**= මුගලන්තෙරණුවෝ. **වැදූ**= ප්‍රසූත කළා වූ. වද (වැදුම්හි) දයින් පරව කතු අරුත්හි 'උ' පසවීමෙන් නිපන් කෘදන්තයෙකි. **පිරිමැසූ**= පරිවර්ධිතවූ. නොහොත් ඌන පූරණය කළ. **බාල මෑණියන් වහන්සේය**=මහා ප්‍රජාපතී ගෞතමිය. **සෙනඳුන් හැමැදි වහන්සේ**= ආනන්ද ස්ථවිර. **වෙහෙර කර වූ සිටාණෝය**=අනේපිඬු මහසිටුහුය. **උපස්ථාන කළ උපාසිකාවෝය**= උවටැන් කළ විශාඛාවය. **සල්වනය**= උපවත්තන නම් වූ මල්ල රජුන්ගේ සල්උයන. **පියවර එබූ තැනය**= සමනොලය.

## (6) පිට.

**තුඬැ**= මුඛයෙහි. පාලි 'තුණ්ඩ' ශබ්දයෙන් භින්නයි. **වකාපුවන්**= බහනලද අය. කියූ ජනයා 'වකා' යනතන්හි පෙරකිරිය පසතින් පා (පැමෙහි) ධාතුව යෙදී ඔහුකෙරෙන් කතු අරුත්හි 'ඌ' පස යෙදී සැදුනු 'වකාපූ' යනු 'වැකූ ජනයා' යන අර්ථවාචී කෘදන්තයෙකි. ඔහුකෙරෙන් පරව 'අන්' යන කම් විභක්තිරූපය යෙදී වකාරාගම හා පූර්වයට හ්‍රස්ව ද වීමෙන් 'වකාපුවන්, යනු සිඩයි. උවර්ණාන්ත ශබ්දයන් ස්වර විභක්ති ගන්නාකල ශබ්දාන්තයෙහි "ව" කාරාගම වීම සිංහල භාෂායෙහි රීතියකි. **මෙවැනි යක් බිමෙක**= මෙබඳු යක්ෂභූමියක. විජයාගමනයෙන් පෙර ලක්දිව යක්ෂාවාසයකැයි පුරාතනයන් සැලකූ හෙයින් මෙසේ කියන ලදි. **ගැත්කම්හ යි**= දසයම්හ යි. **නොබා**= නිර්භයව.

**සතර අපාය**= නරක, තිර්යක්, ප්‍රේත, අසුරකාය යන සිවු අපාය. 'අය' යනු සැපයට නම්. එයින් (සැපයෙන්) අපගතවූ (=පහවූ) යන අර්ථයෙන් 'අපාය'යි කියනු ලැබේ. **දෙව් බඹ ලෝ**= දෙව් ලෝ බඹ ලෝ. දිව්‍යලෝක හා බ්‍රහ්මලෝකද. අරුත්සමස්හිදී අවසානයෙහි කි ශබ්දය වෙන් වෙන් වශයෙන් එකඑක ශබ්දයක් පාසා යෙදීම ශාස්ත්‍ර යුක්ති හෙයින් මෙහි 'ලෝ' යනු වෙන වෙන ම දෙව් බඹ යන ශබ්ද දෙකම සමග යෙදේ. "ද්වන්දාත් පරං යච්ඡ්‍රූයතෙ තත් ප්‍රත්‍යෙකම'භිසම්බධ්‍යතෙ" යනු මාතෘභාෂා රීතියි.

**සකල සමෘද්ධින්**= සියලු අභිවෘද්ධි වලින්. නොහොත් හැම සම්පතින්. **ප්‍රසාදකරවූ**= සතුට ඇතිකරණ. **ප්‍රාසාදයෙහි**= පහයෙහි. සතරැස් කොට ගොඩ නැගූ ගෙය 'ප්‍රාසාද' නම්. **පළක් බැඳ** ඌරුබඩා'සනයෙන් යුක්තව. අරමිනිය ගොතා ගෙණ. "පළක්" යනු 'පල්ලඞ්ක' ශබ්දයෙන් ආයේය. **පිළිසිඳැ**= ප්‍රතිසන්ධි ගෙණැ. මවුකුසට පැමිණ. **පෙරළිම් නම්**= විෂයාභාස වීම වනාහි. **දුක**= දුකකි. මෙහි 'වේ' යනාදි ක්‍රියාවක් හෝ "ය" යනාදි වාක්‍ය පරිසමාප්තික නිපාතයක් හෝ අධ්‍යාහාර්‍යයි. **ජාතයහට**= උපන් නැනැත්තාට. **ජරාව ද**= දිරීමත්. මහළුවීමත්. **ජීර්ණයහට**= දිරූ නැනැත්තාට. මහල්ලාට. **අමුක්තවැ**= නො මිදී. **අජරවූ අමරවූ**= ජරාවක් නැති, මරණයක් නැති. **ක්ෂෙමවූ**= නිර්භීයවූ. **ශාන්තිපුරයට**= නිවණට. කෙලෙසුන් කෙරෙන් සංහුන් හෙයින් නිවන්පුරයට ශාන්තිපුරයැයි ද නමෙක් වේ.

**සැනහෙනු**= සංසිඳීම. සනහ (සැනහුම්හි) දයින් පරව හව්හි නු පස හා පිළිපෙරළි සි. **මොහයෙන්**= මුග්ධභාවයෙන්. මෝඩ බැවින්. **අසුචියෙන් අසුචි වදනෝය**=අපවිත්‍ර දෙයින් අපවිත්‍ර දෙයම වගුරන්නෝය. ඇස්, කන්, නාසාදී අවයවයෝද 'අසුචි' ය. ඔවුන් විසින් වමාරන කබ, කන්මල, සොටු ආදිය ද අසුචිය. මෙසේ මනුෂ්‍ය ශරීරය අසුචියෙන් අසුචි වදයි. **නවදොරක්**= ද්වාර (=මාර්ග) නවයක්. සිරුරෙන් අසුචි නික්මෙන මාර්ග නවය යි. එනම්:- ඇස්සිදුරු දෙකය, කන්සිදුරු දෙකය, නැහැසිදුරු දෙකය යන සය හා මුඛය, ගුදය, මූත්‍රමාර්ගය යන තුණ ද යන මේ සි.

**තිඹිරිගෙයය**= ප්‍රසූතිකාගාරය. වදනගෙයයි. **මඩොරගෙයය**= වැසිකිළියයි. **සැවයට**=ශවයට. මළ මිනියට. **නොසකස්**= අසකසවව. අපවිත්‍ර දේ. **වැඩි වැඩිසේ**= අධික අධිකව. **බරු'සුළා**= බර උසුළා. **වියතක්හට**= ව්‍යක්තයෙකුට නුවණැත්තෙකුට. **ශරීර සන්තාපකරවූ**= ඇඟ තවන්නාවූ. **හුණක්**= උෂ්ණයක්. **ප්‍රතිපක්ෂවූ**=

## (7) පිට.

විරුඪ වූ. **සුගන්ධ ශීතල ජල,හරිතවූ**=සුවඳ සිහිල් දියෙන් පිරුණු. **අපරාධ බව මුත්**=වරද විනා. **විවිධා'යුධහස්තවූ**=නොයෙක් අවිගත් අත් ඇති. **ක්ෂෙම මාර්ගයක්**= උවදුරු නැති පාරක්. **මහාව්‍යාධින්**= බලවත් ලෙඩකින්. **ව්‍යාධිශාන්තියට**= ලෙඩ සංසිඳුවීමට. **අෂ්ටාඞ්ගා'යුර්වේදයෙහි**= අඞ්ග අටකින් යුත් වෙදකමෙහි. ශල්‍ය, ශාලාක්‍ය, කායචිකිත්සා, භූතවිද්‍යා, කෞමාර භෘත්‍ය, අගදතන්ත්‍ර, රසායන තන්ත්‍ර, වාජීකරණ තන්ත්‍ර, යනු ආයුර්වේදයෙහි අඞ්ග අට යි. (විස්තර සුශ්‍රැතයෙන් දතයුතුයි.)

**ව්‍යාමෝහ බව මුත්**=(වි–ආ–මෝහ=ව්‍යාමෝහ) අතිශයින් මුළා බව විනා. **සංසාර ව්‍යසනයෙහි**= සසර පීඩාවෙහි. **එකාන්ත ප්‍රතිපක්ෂවූ**= සතතයෙන්(=නිතරම)විරුඪවූ. **අමෘතමහානිර්වාණයක්**= සියලු තෘෂ්ණාව නැසීම 'නිර්වාණ' නමි. 'මහා' ශබ්දය පූජ්‍යාර්ථයෙහි යෙදිනි. සැප දයකවූ අමාවක් බඳුයැයි උපමා වශයෙන් අමෘත ශබ්දාදි ප්‍රයොගයි. **ශුචිකාමීවූ**= පිරිසිදු බැව් කැමැති. **දුදුරුවූ නැවක්**= ඉතා දිරූ යාත්‍රාවක්. **නවච්ඡිද්‍රවූ**= වාරවශයෙන් නව සිදුරක් ඇත්තාවූ නොහොත් අලුත සිදුරුවූ. **ක්ෂෙම නෞකාව**= නිර්භය භූමියට පමුණුවන නැව. නොහොත් සාන්තිකර නැව. **සොරුන් විසින්**= මෙහි විසින් යනු කරණාර්ථද්‍යොතක නිපාතයි- 'දෙහෝ' යනු සංශයාර්ථද්‍යොතක නිපාතයි. 'කෙරෙන්' යනු සීමාර්ථද්‍යොතක නිපාතයි.

**මහසොරහට වැළැගී**= මහසොරුන්ගෙන් වැළකී. මහසොර හට යනු අවදි අරුත්හි සබඳ විබතයි. 'වැළගී' යනු වළහ (වැළහුම්හි) දයින් පරව ඊ පසව සිඬ පසරුත් සදකි. **කාවණුවකුදු**= කාෂීපණයකුත්. විසිමස්සක් වටනා රන්මිලයක්. මසු සොළසක් වටනේයැයි ද යෙති. 'කහවණුවක්' යන තන්හි හකාර ලොප යෙන් පූර්වයට දීඝයි. **අනාථ ගමනින්**= පිහිටක් නැති ගමනින්.

## (8) පිට.

**මහා අඥාන විජෘම්භනය ෂ**=මහත්වූ අඥාන භාවයාගේ පැළීමයි. **ශතසහස්‍ර ගුණයෙන් වඩා**= සියදහස්ගණිතින් වැඩිකොට. **අඞ්කුරයක්**=පැලයක්. **අසාධාරණ ඥාන මහිමායෙන්**=අසමානවූ නුවණෙහි මහත් බැවින්. **සංසාරයාගේ**= නොසිඳ පවත්නා ස්කන්ධපරම්පරාව සංසාර නමි; ඔහුගේ. **අසාරාර්ථය**= හරයක් නැතැයි දත් සත්‍යාර්ථය. **උත්සාහ සම්පත්තියක්**= වීර්‍ය්‍යසම්පතක්. **පරාක්‍රම සම්පත්තියක්**= විරොධ අකුසල් මැඩ පැවැත්වීමේ බලයක්.

**අභිමතවූ**=ඉෂ්ටවූ. **ස්වාත්ම පරාත්ම සිඬ්ඪ**=තමාගේ හා අන්‍යයාගේ අභිවෘද්ධිය සෑදීම. **රාගය**= අරමුණෙහි ඇලීම. **ද්වේෂය**= අනිෂ්ටවූ ආරම්මණයෙහි ක්‍රොධ වශයෙන් • ගැටීම. **මෝහය**= අරමුණෙහි තතු නො දැන මුළාවීම.

**අජල නිර්වාපණීයවූ**= දියෙන් නො නිවිය හැකිවූ. **අමන්ත්‍ර ශමනීයවූ**= මන්ත්‍රයෙන් ශමනය නොකොට හැකිවූ. **අනෞෂධ සාධ්‍යවූ**= ඖෂධයෙන් සුව නො කොට හැකිවූ, අජල, අමන්ත්‍ර, අනෞෂධ යන තුන් තන්හි ම ප්‍රතිෂෙධාර්ථ 'න' නිපාතය වනාහී සම්පසර් ජල, මන්ත්‍ර, ඖෂධ ශබ්දයන් හා සම්බන්ධනොව උත්තර පදය හා අයුක්තාර්ථ වශයෙන් සමස්තව අකාරයට පැමිණ සිටී. **මහාවහ්නිත්‍රය යකින්**=මහාගිනි තුණකින්. **ආදීපනවූ**=හාත්පසින් ඇවිල ගෙණ. **බුඬින්**= කල්පනාවෙන්. හැඟීමෙන්. **ඝොරවිෂවූ**= නපුරු විෂ ඇති. **මිරිඟු සෙන්**= අධික උෂ්ණසමයෙහි දියමෙන් සැලි සැලී පවතින හිරු රැසින්. **ශීතල සලිලපානය**- සිහිල් දිය බීම.

**සුඛශුන්‍යවූ**= සැප නැති. **අනුභවකාරම්භ සි**=විඳුමු යි. **අමිශ්‍රවූ දුඃඛයම**= සැපයෙන් මිශ්‍රනොවූ දුකම. **අසම්බද්ධ**=තහවුරු නො වූ. **පෙළි**= පීඩිතව. **ආතුරවූ**= ඔබලත්වූ. **අනවරතයෙන්**= නිතර. **ස්වරූප නිරූපණය කාරණා**= ස්වාභාවික ගතිය ප්‍රකාශ කාරණා. **චිත්තඛෙද කාරණයෙක්**= සිතට පීඩා උපදවන කාරුණක්. **විපරිනාමදුඃඛය**= කලින්කල විපයෘාසවීමේ (=අන්අතකට පෙර ළීමේ) දුක. **උපෙක්ෂාවෙදනාව**= මධ්‍යස්ථ (=හුදු සැප හෝ හුදු දුක් නැති) වේදනාව. **සංස්කාරදුඃඛය**= රැස්කිරීමේ දුක. **තත්ත්ව විචාර ලොලයහට**= ඇතිසැටි විමසීමෙහි ලොල්වූ තැනැත්තාට. **වක්‍ෂ්‍යන් සාඬ්ඛායෙක්**=සඳහන් සි යන සැකක්. **අවිද්‍යාභාවිත**=මොහයෙන් වඩනාලද. නොහොත් මුළාවෙන් යුත්.

## (9) පිට.

**මහාපාසයෙක**= මහත්වූ පුඩුවෙක. මහඋගුලක. **මොහමධුර වූ**=මුළාවෙන් මිහිරියැයි සිතන ලද්දවූ. **නවයෞවන ශ්‍රී නොමෝ**= අලුත් යොවුන් සම්පත. **කොසාකොසි යුඩයෙහි**= ඔවුනොවුන් කොහෙවලින් අල්වාගෙණ කරණ සටනෙහිදී. **නොලක්විරූවූ**= අලබ්ධපූජිව. මෙහි 'විරූ' යනු විසදෘශාර්ථයෙහි වැටෙන 'රූ' යන නිපාතය නොවේ. 'පූජ' ශබ්දයෙන් 'පිරූ'යි බිඳී වකාරාදෙශවී මෙන් සිඩ නාම ශබ්දයෙකි. **ප්‍රශස්ත ශත**= සියගණන් උත්සාහ යන්ගෙන්. **ගුප්තවූ**= වැසුනාවූ. **කබල නොවූ**= ආලොපයක් (=පිඩක්) නොවී. **මතැතුන්**= (මත් ඇතුන්) මදයෙන් මත්වූ ඇතුන්ගේ.

**කුම්භ පලා**= කුම්භස්ථල විදාරණය කොට ඇතුගේ සිරසෙහි ඉදිරියට නෙරා පිහිටි ගෝලාකාර කොටස කුම්භස්ථල නම්. **මුතු පීරා**= කුම්භස්ථලයෙහි වූ මුතු සූරා පසෙක තබා. **ඝනමේදස්**= දැඩි මස් තෙල්. නොහොත් මොල. **කේශරසිංහරාජයෝ**= ශ්‍රෙෂ්ඨ සිංහයෝ. **කාලාන්තරයෙක්හි**= (කාල × අනන්තරයෙක්හි) අන්‍ය කාලයෙක. මෙහි 'අන්තර' යනු අන්‍යාපිවාචිය. **ග්‍රාමාන්තර පරිඛායෙහි**= (ග්‍රාම + අනන්තර) ගම මැද දිය අගලෙහි. මෙ තැන්හි 'අනන්තර' යනු 'අතර'යන අරුත්හි වේ. **අශුචිද්‍රව පානයෙහි**=මල සේදූ දිය පිමෙහි හෙවත් දියවූමල පීමෙහි.

**සර්වලොක පරිභූතවූ**= සියලුලොකයා විසින් නින්දාකරණ ලද. **ගර්හාස්පද**= නින්දාවට කරුණු වූ. **එක'ලොක කල**=එකසේ ම ආලොක කළ. **දෙලොස්යොදුන්**= සැතපුම් 48ක් පමණ. යොදුන නම් සැතපුම් 4 ක ප්‍රමාණයයි. **ගුඤ්ජා ඵලමාත්‍රවූ**= ඔලිඳ ඇට පමණ. **ශරීර ප්‍රදෙශයෙහි**=ශරීරයේ කොටසෙක්හි. **පරිත්තප්‍රභා සංයොගයෙන්**= සවල්පවූ දිප්ති එක්වීමෙන්. **පරිභාෂ්‍ය**= අවඥා කටයුතුවූ. **වෘන්දාරකබෘන්දා'නන්දසන්දොහ නිදානවූ**=වෘන්දාරකබෘන්ද දිව්‍යසමූහයාගේ; ආනන්දසන්දොහ, සන්තුෂ්ටි සමූහයට; නිදානවූ උත්පත්තිස්ථානයක්වූ. **නන්දපුෂ්කරණීයෙහි**= 'නන්ද' නම් පොකුණෙහි.

**චණ්ඩාලකුල**= සැඩොල් කුලෙහිවූ (ස්ත්‍රියගේ). **ශරීරමලහරිතවූ**= සිරුරෙහිවූ කිළුටින් පිරුණාවූ. **පූතිගන්ධයෙහි**= ස්ත්‍රියගේ අපවිත්‍රවූ නිතම්බ ප්‍රදෙශයෙහි. **ශී**= පතිතව. ඉපිද. **ඓශ්වර්‍ය්‍ය ක්‍රීඩාභියොග**= ඊශ්වරභාවයෙන් යුක්තවූ–කෙළියෙහි යෙදීමෙන්. **විශද ශරදාකාශයෙහි**=පිරිසිදු සරත් කල්හි වූ අහසෙහි. **විප්‍රකීර්ණ**=අතිශයින් විසුරුණු. **තාරාගණ පරිවාරයෙන්**=තරුසමූහයා පිරිවැරීමෙන්. **චන්ද්‍රමණ්ඩලගතවූ**=සඳමඬුල්ලට–චන්ද්‍ර භවනයට පැමිණ. **විවිධ**= නානාප්‍රකාරවූ. **විදග්ධ**= නිපුණවූ. **මුග්ධ**= මනොඥවූ. **විබුධවධූගාඪාලිඞ්ගන**= නුවණැ'ති කාන්තාවන්ගේ අතිශය වැළඳ ගැණීම් සඞ්ඛ්‍යාතවූ. **මනො මහොත්සවපාත්‍රවූ**= මහත් චිත්ත ප්‍රීතියට කාරණව. **ව්‍යොමගාත්‍රා කල**=ආකාශයෙන් ගමන් කරණ ලද. **අනශව්‍යසන**= දුඃඛදායී විනාශයට. **උදග**= උදයපර්වතයාගේ. **තිරොධාන ශිඛර**= මුදුනෙහි හටගත් මුවහවෙන්. **විමුක්ති සම සමය**= මිදීම හා සමගම. **සමුද්ගීර්ණ**=නැගුනු. **කාන්තිශ්‍රෙණී**=රශ්මි රාශියෙන්– පඞ්ක්තියෙන්. **වි ශකලිත**= විශෙෂයෙන් දුරුකරණ ලද. විශෙෂයෙන් කැබැලි කරණ ලද.

**තමොඝොම**= අන්ධකාර සමූහයාගේ. **සාහස ඇති**= බලාත්කාරකම් ඇති. **චක්‍රවාලාන්තරාලාදි**= සක්වළ අතර සීමාකොට. **ආපූරිත**= හාත්පසින් පුරවනලද. **සහස්‍රරශ්මි ඇති**= දහසක් රැස් ඇති. **සූර්‍ය්‍යවිමානො'දරවර්තිවූ**= සූර්‍ය්‍යවිමානයෙහි හිඳිනා වූ.

## (10) පිට

**පූති මාංසයෙහි**= කුණු මසෙහි. **සාමිවැ**= පණුවෙක්ව. **ගොඛුරැ**= ගව කුරයෙහි. **වටැ**= පතිතවූ. වට (වැටීමෙහි) දසින් සැදිනි. **දියත්තක් නිසා**=සවල්පවූ දියක් ආශ්‍රය කොට. මෙහි 'දිය' සදින් අල්පාර්ථයෙහි 'ඉති' ප්‍රත්‍යයයි. පැතිත්ත, කැදිත්ත ආදිය මෙනි. **ක්‍ෂුද්‍ර ප්‍රාණිජාතින්ටත්**= කුඩා සත්ත්ව වර්ගයාටත්. දෘතට සියයක් පමණ ගත හැකි කුඩා සත්තු'ක්‍ෂුද්‍රප්‍රාණී'නම්. **ප්‍රබලපක්‍ෂවාත ප්‍රහාරයෙන්**= අතිශයින් බලවත් පියාපත් ගැසීමෙන් හට ගත් වාතයෙන්. **සාගර ජලස්කන්ධය**= මුහුදු දිය රාශිය. **දෙ බේ සොවැ**= දෙපලු සාර.

**නා ගොදුරු**=නාගයන් අහරකොට. මෙය වත්මන් වහරෙහි 'ගොදුරු'සි වේ. ඇජර යනු ඇදුරු වූවාක් මෙනි. **තනුතර**= ඉතා සවල්පවූ. **පූතිගාත්‍රයෙහි** = අපිරි සිදු ශරීරයෙහි. නොහොත් කුණුවූ අපිරි සිදු තන්හි. **ගැඩ ගුල්**= එනම් පණු වර්ගය. ගණ්ඩුප්පාදයෝ. ගැඩවිල්හු- ගැඩවුල් ගැඩවිල් යනු ද පාඨයි. **අමේධ්‍ය ගොචර ග්‍රහණයෙන්**- අසුචි ගොදුරු කොට ගැණීමෙන්. **චරිතාර්ථ**= හැසිරීම ප්‍රයොජන කොට ඇත්තේ. **ඒකා'තපත්‍ර**=(එක+ආතපත්‍ර) එක සේසතට යටත්වූ. **ශිඛාවට**= මුදුනට. **වැඩූ**= වඩනලද. **රජනිකර කර නිකර සංයොග**= චන්‍ද්‍ර රශ්මි සමූහයන්ගේ එක්වීමෙන්. **ද්විගුණිත**= දෙගුණ වූ. දෙකොන් වැඩි වූ. **ශ්වේතකාන්ති යුක්ත**=ශුභ්‍රවූ(=සුදුවූ) පැහැයෙන් යුත්. **විශාල චන්‍ද්‍ර ශාලායෙහි**=මහත්වූ සඳලුවල. සඳ රැස් වැටෙනු පිණිස සෙවෙනි රහිතව කරණලද ශාලා 'චන්‍ද්‍රශාලා' නම්.

**ආස්තීර්ණ**- අතුරණලද. **මහාභාග්‍ය ඇත්තෝ**= මහත්වූ පුණ්‍ය මහිමයෙන් යුත් අය. **අනල්පකල්පකාලසම්භූත**= බොහෝ කල්ප කාලයන්හි පහළවූ. **මහොෂ්ම**=(මහා-උෂ්ම) මහත්වූ උෂ්ණ-දහ. **විස්මයවූ**= ආශ්චර්යවූ හෝ මවිතවූ. **පැළඹි**=පිළිස්සී. පළඹ (පැළඹීමෙහි) දසින් නිපන් පෙර කිරියෙකි. **උත්සව ශෘඞ්ගාර පිණිස**= ප්‍රීති ක්‍රීඩා සඳහා. නොහොත් කාම චේෂ්ටාවට. **ලෙහි ලූ**-පපුවෙහි පැළැඳි. **මන්දාරකුසුමභාරය**= මදාරා මල් බර. **කොමලවූ**= මොලොක්වූ. සියුමැලිවූ.

## (11) පිට.

වෙරගි= ශරීරයෙහි. ශ්‍රපොරෝ=යකඩින් කළ එතම් ආවුධ. කිලිල්සාධක් සේ= රුක් ගොබයක් මෙන්. ශතයෝජනප්‍රමාණ= යොදුන් සියයක් පමණ. අඞ්ගාර පව්කාශ= අඟුරුමය වූ ගල්ගිර. අනෙකාලක්ෂ කෝටි වර්ෂ සඞ්ඛ්‍යාශෙන්=නොයෙක් කෙළසියදහස් අවුරුදු ගණනින්. රක්තොත්පල= (රක්ත-උත්පල) රත්නෙළුම්. ගබිසේ= ඇතුල මෙන්. කෝමලවූ= සිනිඳුවූ. විදුනාලද= ඉසිනු ලැබූ. බැර් ශී ගෙණෑ= ශරීරය අල්වා ගෙණ. කම්පියෙහි ආධාරයි. වෙරගි යනුද මේ මැයි. නාඩිතල්කඳ සා= තරුණ තල්කඳක් පමණ. ඩිරෙමින්= දිය වී යමින්. බැගෑහඬින්=දුඃඛිත ස්වරයෙන්. අධ්‍යවසායනය= අස්ථිරය.

සාදිනවය= දෙස් සහිතය. අසාරය= හරක් නැත්තේය. ව්‍යාකුලය= විශෙෂයෙන් අවුල්ය. ගෞරවපාත්‍රවූ= බුහුමනට බඳුන්වූ. නිල්ලජ්ජාවූ=ලජ්ජා නැති. ශෘඞ්ගාරචෙෂ්ටාවට= කාමාභි ප්‍රායයෙන් හටගත් ක්‍රියාවට. පසින් පෑවා= කකුලෙන් පෙන්වන ලද දෙය. හුන්පත= හිඳගත් කොළ ඇතිරිය. ලාභය= ලැබීමය. යසස= කිත්තිය. නින්දාය= ගර්හාවය. සුවය= සැපය. හූවිනොද දමා= නූලින් කළ. කෙළිපෙදක්=ක්‍රිඩා කන්දුකයක්, සෙල්ලම් පන් දුවක්.

## (12) පිට.

ප්‍රාණීනවූ= පිණවන්නාවූ. ස්වාපිස සිඛකොටෑ=තමාගේ අභිවෘද්ධිය සාදාගෙණ. ශාවකාවාතයා සමූහයා= සිහන්නත් නැමැති සෑදැති පක්ෂිරශිය. ස්වකීය ධනධාර නිපාතයෙන්= තමාගේ වස්තු නැමැති වැස්ස හෙළීමෙන්. සකලාර්ථිජනනිශ්මාන= සියලු යාචකයන් විසින් ගෙණ යනු ලබන. ධනසඤ්චයගේ= වස්තුරාශියෙහි; අති බහුතරවය= ඉතා බොහෝ බව. අක්ෂයබලා= නො ගෙවෙන බැව් දැක. ධනක්ෂයයෙහි= වස්තු හානිය අවසාන යෙහිදී. ආයුඃකාලය= ජීවත කාලය. නිරගීලයඥ ඝොෂය= නිරගීල නම්වූ යාගයෙහි ඝොෂය. සියලු දෙර'ගුළු හැර මුළු වස්තුව යාචකයන්ට දන්දීම 'නිරගීලයඥ' නම්.

නානාප්‍රකාර ද්‍රවිණගණ සම්පූර්ණ= නානාවිධ වස්තු රාශියෙන් පිරුණාවූ. භාණ්ඩාගාර මාර විවෘතකාරවා= බඩු ගබඩාවෙහි දෙර හරවා. ප්‍රබල දවානල සරභස සම්පාතයෙන්= මහත්වූ ලැව්ගිනි නැමැති චණ්ඩභාවය හෙළීමෙන්. සංදහ්‍යමාන= දැවෙනු ලබන. වෘක්ෂවල්ලිගුල්මාදි= ගස්වැල් පඳුරු ආදියෙන්. සංකීර්ණවූ= කලවම්වූ. ගහණවූ. වනගහණයෙකින්= වනලැහැබ

කින්. **දුහාතිරෙකාඝ**= අතිශයවත් දුවිල්ල. **ක්ෂමාකොටෑ**= ඉවසා ගෙණ, **මතනාමානඩ්භණකු**= මදමත් ඇතකු. **විවිධ ශරීරමල සම්පූණී**= මල මූ ඩහ ඈ සිරුරැ කිළුටින් පිරුණාවූ. **අසුචි ගන්ධෙසාෑ**= අසුචි වළකා. **සුචිකාමී**= පිරිසිදුබැව් කැමැති. **චණ්ඩවූ**= නපුරුවූ. **ශාර්දූලාදීන්**= ව්‍යාඝ්‍ර ආදිහු. **ප්‍රාණ රක්ෂණාර්ථිවූ**= (ප්‍රාණරක්ෂණ-අර්ථිවූ) පණ රැකගනු කැමැති. **වනා'භිමුඛවෑ**= වනයට ඉදිරි වී. **වෘතඝ**= පැවැත්ම. **තත්පරකාම්**= නියුක්තවීම.

## (13) පිට.

**මහ භිනික්මනට**= ශ්‍රෙෂ්ඨ නික්ම යාමට. ප්‍රව්‍රජ්‍යාව පිණිස නික්මයාම 'මහා 'භිනිෂ්ක්‍රමණ' නම්. **අස්වසක්**= අස්සාසයක්. සැනසිල්ලක්. පිහිටක්. **උද්දීපනවූ යෞවනයෙහිදු**= බබලන සුලු යොවුන් බැව්හි ද. **මදණක්**= මත් වීමක්. **සෞන්දර්‍ය්‍යයෙහිදු**= ශරීරාඞ්ගයන්ගේ මනහර බැව්හිත්. **අචින්ත්‍යසේ**= නො සිතිය හැකි පරිද්දෙන්. සිතීමට දුෂ්කර සේ. **ජුගුප්සාවක්**= පිළිකුලක්. **පක්ෂපාතකාමක්**= ලෙන් ගැතිකමක්. **උදුදුන් පරිදි**= පහළවූ ආකාරය. **උදුරාධ්‍යාශයකින්**= උසස් අදහසකින්. **විශවකාම දිව්‍යපුත්‍රයා**= සියලු ක්‍රියාවන්හි දක්ෂ හෙයින් එනම් වූ දිව්‍යපුත්‍රයා.

**සකලසම්ඃඩිසාරඝ**=ආඪ්‍යවූ සියලු සාරවත්ධනය. **හිමාලයාභිමුඛවෑ**=හිමාලය පර්‍වතය දෙසට හැරී. **පණ්ණශාලාදිඝ**=පන්සැල් ආදිය. **සමුදිනා**= අවසර දුන්නේය. **බර විෂමතාඝ**= කුරැවූද විෂමවූද බිම් ඇති බවය. **ගහණයෙන් මුවා බවඝ**= වනලැහැබින් වැසී තිබෙන බවය. **හැසාබවඝ**= ශඞ්කා සහිත බවය. සිංහ ව්‍යාඝ්‍රාදි චණ්ඩ සිවුපාවුන් නිසා ඇතිවන සැකය මෙහි කියනලදී. **පඤ්චදෙෂ වර්ජිත**= දෙස් පසින් දුරුවූ.

**නිශකයෙන්**= එකාන්තයෙන්. **නිබඩවූ**= විශෙෂයෙන් බඳනාලද. **අභිලාෂ**= ආශා ඇති. **මහ ඇඟිබව**= රත්රන් ආදියෙන් කරණලද හෙයින් වටිනාකමේ මහත් බව. මහාඝිතාවය. **පරාසිළිබඳ බව**=අනුන්ට අයිතිබව. **අනුභව කාල කාල්හි**=පාවිච්චි කළවිට. **දිරාවනබව**= ජරා ප්‍රාප්තභාවය. දිරීමට පැමිණෙන බව.

## (14) පිට.

**කිවිම්**= හැඟීම. **ගෙත්නම්**= ගෙතුම් කර්මාන්තය. 'ගෙත්-කම්' යනු පූර්‍ව රූප සන්ධිවිධියෙන් 'ගෙත්තම්'යි සිඩයි. **සාධාරණ බව**= සියල්ලට පොදු බව. **විභූෂණවෑ**= අලඞ්කාරව. සැරහී. **අපිස්**= අල්පෙච්ඡ. මඳදෙසින් සතුටුවීම. **මහෙච්ඡ**= බොහෝකොට ලැබී

මෙහි ආශා උපදවීම. **හන්සළව=** අවශ්‍යදිත සාටකය. ඇඳිවත. **සරූප් බවඝ=** සාරූප්‍යභාවය. යොග්‍යභාවය. **වැහැරි=**, නූල්. **වැහැරි සිවුර=** තියඳින් කළ චීවරය.

**ස්වීකාර කොට=** පිළිගෙණ. **ප්‍රත්‍යූෂවේලායෙහි=** අළුයම් වේලේ. **අනුරක්තවූ=** ඇලුනාවූ. **ක්‍රමාගතවූ=** (ක්‍රම–ආගතවූ) කුලපරම්පරායෙන් පැමිණියාවූ. **පරිවාර සම්පත්තින්=** පිරිවර සම්පත්තියෙන්. **ශෛලදුර්ගී=** පර්වතයෙන් නො යාහැකි තැන්.

**සූක්ෂ්මවූ=**සියුම් වූ. **අග්‍රාභරණයැයි=** ශ්‍රෙෂ්ඨ ආභරණය කියා. **අනුරූපකොට=**සුදුසු කර ලා. **ගෙසි=**ගෙහි. 'හි' යන අදරව්බත් එකාබසෙහි 'හ' කාරයට 'ය' කාරාදෙශවීම බෙහෙවින් දක්නා ලැබේ. **දණ්ඩකාෂ්ඨ්මාන්තයෙන්=** ලී වැඩවලින්. **පරම මනොහරවූ=** ඉතා සිත් කලූවූ. **නොදුරු දුරු තන්හි=**ඉතා කිට්ටු ද ඉතා ඈත් ද නොව.

**ලතාමණ්ඩපයෙන්=** ලියමඬුයෙහි. **හැලි දහසින්=** දහස් ගණන් දිය ඇලිවලින්. **විශෙෂ නාදයෙන් මධුරවූ=** උතුම් ාදින් මිහිරිවූ. **කොකිලාවන්ගේ=** කොවිල්ලන්ගේ. එනම්වූ පක්ෂි ධෙනූන්ගේ කොවුල් කෙවිල්ලෝ මිහිරිනද ඇත්තෝය. **කුල ගෘහ=** වසන ගෙය. **මයූරයන්ගේ=** මොණරුන්ගේ. **මෘග යන්ගේ=** මුවන්ගේ. **චක්‍රවාක=** සක්වාලිහිණි. **චකොර=** ඇටි කුකුළු. **කොඤ්ච=** කොස්වා ලිහිණි.

## (15) පිට.

**ජීවඤ්ජීවක=** 'ජීවං ජීවං' යනුවෙන් ශබ්දනඟන, දක්ෂිණා පථයෙහිවූ, මොණරුන් පමණ පක්ෂි වර්ගයකි. මොවුන් උතුරුකුරු දිවයින්හි ද සිටින බැව් දහම් පොත්හි පෙණේ. **කපොත=**කොබෙ ඩියෝ. **පාරාපත=** පරෙවියෝ. **කිර=** ගිරව්. **ශාරිකා=** සැළ ලිහිණි. **සථලචර=** ගොඩ හැසිරෙන. **ජලචර=** දියෙහි හැසිරෙන. සත්ත්වයෝ. **සැමනුම් ගන්නා=** සමන්‍නාගතවන. රුස්වෙන.

**චම්පක=** සපු. **අශොක=** හෝපලු. **ආම්‍ර=** අඹ. **ගන්ධිනී=** මූරු මාංසි. **ශිතගන්ධ=** රත් සඳුන්. **කණිණිකාර=** කිණිහිරි. **සහකාර=** මී අඹ. **සාල=** සල්. **තාල=** තල්. **තමාල=** කොල්ලන්. **වකුල=** මූනමල්. **ක්‍රමුක=** පුවක්. **කුරව(ක)=** රත්කරව්. **නාලිකෙර=** පොල්. **සනාහිර=** තැඹිලි. **පනස=** කොස්. **අසන=** පියාගස්. **සර්ජ=** දුම්මල. **අර්ජුන=** කුඹුක්. **විවිධ තරුවර=** නානා ප්‍රකාර වෘක්ෂ යන්ගෙන්.

**පදුමගබ්භයෙන්**= පියුම් ගැබින්. උපාත්‍යාවිෂයෙහි අවධියි. **මධුර මධුපානමත්තාවූ**= මිහිරිවූ මී (මල්රසය) බීමෙන් මත්වූ. **පරම රමණීය**= අතිශයින් මනොඥවූ. **තෙරෙහි**= තීරයෙහි. ඉවුරෙහි. **ලිය මඬුලුයෙන්**= මණ්ඩපාකාරයෙන් සැදි වැල්වලින්. **දියකොල**= ගංඉවුර. **වැලිතලායෙන්**= සමතලා වැලි බිමින්. **රාත්‍රින්දිවයෙහි**=රෑ දවල්. **නයනොත්සවාවහවූ**=(නයන × උත්සව ආවහවූ) ඇසට ප්‍රීතිය ගෙණ දෙන්නාවූ. **ගෘහදීර්ඝිකායෙහි**= ගෙදික් විල්හි. ගෙය අසල වූ දිය විලෙහි. **මිහිරිකෙළි නළුයෙන්**= මනොඥවූ ක්‍රීඩා නාටකයෙන්.

**යහළු යෙහෙළියන්ගේ**= තරුණ තරුණියන්ගේ. 'යහළු' සද මෙහි තරුණාර්ථවාචිය. **අනවරත සඤ්චරණයෙන්**= නිතර හැසිරීමෙන්. **හෘදයඞ්ගමවූ**= සිතට අනුකූලවන්නාවූ. **සමාන කුලශීල යෞවනාභිරාමවූ**= සමානවූ කුලය, සමානවූ සදාචාරය, සමානවූ තරුණ භාවය යන මෙයින් මනොඥවූ. **පිරුණු තන භාර සෙනහයෙහි**= පුන්තනබරෙහි ප්‍රේමයෙන්. **පිරුණුවූ වළග සේ**=සම්පූර්ණවූ ශරීර මධ්‍ය ප්‍රදෙශය මෙන්. **අවගුණයෙහි**= ගුණ රහිත භාවයෙහි. **තුනුවූ**= තුනීවූ. **සුරුදුකම්හි**= මෛථුනාචරණ සඞ්ඛ්‍යාත පරිචිත කම්යෙහි. **අධරසේ**= තොල්මෙන්. **අනුරාගයෙහි**= කාම්සුව ඇල්මෙහි. **රතවූ**= යෙදුනාවූ.

**හඬන**= නදදෙන. **නුරුවලාහි**=මිණි වලල්ලෙහි. **දුන්**=බදින ලද. **මණිමෙඛලා**= මිණිමුවා මෙවුල්දම. "මෙහනස්ස ඛස්ස මාලා= මෙඛලා" යනු "මෙඛලා" යන්නෙහි විග්‍රහයි. මෙහනස්ස, මෙහනෙන්ද්‍රියා පිළිබඳවූ; ඛස්ස, ඡිද්‍රයාගේ; මාලා, පළඳනාහොමෝ; මෙඛලා, මෙඛලා නම්. මෙහනස්ස, ඛස්ස, මාලා යන පදත්‍රයෙහි මෙ, ඛ, ලා යන අක්ෂරත්‍රය ගෙණ නෛරුක්තික විධියෙන් මෙය සිද්ධය. මෙය ස්ත්‍රීන් විසින් පළඳිනු ලබන ආභරණයෙකි. **සිත් බඳුවූ**= සිත් බඳින්නාවූ. **ශරීරයෙන්ම**= සිරුරෙන් පමණක්. 'ම' යනු අවධාරණාර්ථයෙහි නිපාතයි.

**ගිම් පමණක්**= හෙළීම විතරක්. **පෑගත්**= බඳහලද. **ආසාද**= ආශාවත්. ආලයත්. **බොලඳකමට ම බැවෙන**= ලපටි බවට ම බහින්නාවූ. **විදග්ධ කමටම**= මනොඥ භාවයටම. **දැඩිකමක්**= තද බවක්. **ලැගෙන උපායක්**= නැවත බැඳීමට ප්‍රයොගයක්. **අගහස්දී**= අග්‍රශස්‍ය දී. **මහාසම්භාරයෙන්**= ද්‍රව්‍ය රාශියකින්. **පරිහරණය**= ශුඩ පරිභොගකිරීම. **උත්ථාපනීය භාවය**= නැඟිටිය යුතුබව. **සියුමැලි**= සුබුමාල. මොළොක්.

(16) පිට.

**මමත්තාවෙ**= මාගේය යන ආලය. **සඤ්චිතභාවෙ**= ද්‍රව්‍යාදියෙන් රැස්වූ බව. **මදෙතනෙකින්**= සුළුවූ උත්සාහයකින්. **සුලභ බව**= පහසුවෙන් ලබාගත හැකිබව. **ගිලිහී**= ගැලවී. **අනිත්‍යසංඥාව**= සියල්ල අස්ථිරය යන හැඟීම. **සෙනාසන මාත්සර්‍යයෙන්**= සෙනසුනෙහි මසුරු බැවින්. **මුවාහරණ බවෙ**= කිසිවකින් ප්‍රතිච්ඡාදනයක් නැති බවය. එලිමහන් බව. **අනුභව යට සුඛබවෙ**= පරිභොග (පාවිච්චි) කිරීමට සැප ඇති බවය. **තෘෂ්ණාවක්**= ආශාවක්. **එළඹැ**= පැමිණ. ‘එළඹ’ (එළඹුම්හි) දසින් නිපන් පෙරකිරියයි. ‘ඇ’ ප්‍රත්‍යයයි. **මා**= මට. **ආහාරයෙක් අරුම හෙයින්**= භොජනයක් ලැබීම පුදුම නිසා.

**මහණවෙස් සැ**= ශ්‍රමණ වේෂය දක්වා. **නොවක් උනත්**= නොවූවත්. **ආහාර පර්‍යෙෂණ දුඃඛයෙ**= ආහාර සෙවීමේ දුකය. **එලා එල**= ලොකුගෙඩි හා කුඩාගෙඩි. ‘එල’ යන්නෙන් ගෙඩිද ‘අඑල’ යන්නෙන් කුඩා ගෙඩිද ගැණේ. ගඩාගෙඩි–මිලාමැලී ආදි තැන්හි මෙනි. **පඤ්චාභිඥා**= ඉර්ද්ධිවිධ, දිබ්බ සොත, පරචිත්ත විජානන, පුබ්බෙනිවාස, දිබ්බචක්ඛු යන ඥාණපස. **අෂ්ට සමාපත්ති**= ප්‍රථම, ද්විතීය, තෘතීය, චතුර්ථ රූපාවචරධ්‍යාන සතර හා ආකාසානඤ්චායතන, විඤ්ඤාණඤ්චායතන, ආකිඤ්චඤ්ඤායතන, නෙවසඤ්ඤානාසඤ්ඤායතන යන අරූපාවචරධ්‍යාන සතරදැයි මෙසේ සමවත් අට.

**ආභස්සර බ්‍රහ්මලොකයෙ**=එනම් තෘතියධ්‍යානතලය. **ධ්‍යාන සුඛයෙන්**= ප්‍රථම ධ්‍යානාදි ධ්‍යානයෙන් ලැබෙන සැපයෙන්. **පූරිත පාරමිතාබල ප්‍රතිලබ්ධවූ**= පුරණලද පෙරුම් බලයෙන් ලැබුවාවූ. [පාරමී කථා. දහම්සරණ 38 පිට පටන් බලනු.] **ප්‍රඥා පරිණාම**= නුවණ මිහිකිරීම්. මේරීම්. **මහීතලයෙ**= පොළොව. **බොධිසත්වාවස්ථායෙහි**= බෝසත්කාලයේ. බුදුවීමට පෙර පෙරුම්දම්පුරමින් සසර සැරිසරණ කාලයෙහි. **අපමණවූ පඤ්චකාම රසාස්වාදයෙහොටැ**= ප්‍රමාණ රහිත පස්කම් සුවෙහි රසවිඳ. **පඤ්චමහාවිලොකනය**= පස් මහ බැලුම්. බුදුවන්ට නිසි කාලය දැයි දැනගැණීම පිණිස බෝසතානන්වහන්සේ බලන බැලුම් පස. කාලය, දෙසය, දීපය, කුලය, මාතෘය යන පසයි. **සැවැ**= චුතව. **අභූතපූර්වවූ**= පෙරනුවූ විරූ. **ප්‍රතිසන්ධියෙහි**= මවුකුසට පැමිණීම නිමිතිකොට. **ලොකොත්සවයෙන්**= ලොකයාට ප්‍රීතිදායක කරුණු.

**පුනරුක්ත කොට**= නැවතත් ප්‍රකාශ කරවා. **නව යුවති**= අභිනව තරුණියන්ගේ. **නයන මධුකර**= නෙත්‍ර නැමැති බම රුන් විසින්. **නිපෙයබූ**= පානය කටයුතු වූ.

## (17) පිට.

**යෞවන මකරන්ද සම්පූර්ණ**= තරුණභාව සඞ්ඛ්‍යාත මල් රොණින් පිරුණු. **ප්‍රභාත සමය**= සූර්යෝදය වේලෙහි. **ප්‍රබුද්ධ වූ**= පිපුනා වූ. **පද්මයක් සේ**= නෙලුම් මලක් මෙන්. **ලෝකා'නන්ද කරවූ**= ලෝ වැස්සාට සන්තෝෂ ජනක වූ. **හිමය**= හෙමන්ත ඍතුව. ඉල්, උඳුවප්, දුරුතු, නවම් යන සිවු මස. **ගිම්හ**= ග්‍රීෂ්ම ඍතුව. මැදින්, බක්, වෙසක්, පොසොන් යන සිවු මස. **වසන්ත**= වසන්ත ඍතුව. ඇසළ, නිකිණි, බිනර, වප් යන සිවු මස.

**ඝනගාඪ නවයෞවන ඇති**= සැදුනා වූ අභිනව තරුණ භාවය ඇත්තා වූ. **විදග්ධ විලාසිනීන්ගේ**= කොමල ස්ත්‍රීන්ගේ. **මුඛා'ම්බුජයෙහි**= මුව නැමැති පියුමෙහි. **ප්‍රණය සුධා රසයට**= සමාදර සඞ්ඛ්‍යාත අමෘත රසයට. **පවිත්‍ර පාත්‍රවූ**=පිරිසිදු වූ ආධාර යක්වූ. **ප්‍රණය**= ආදර සඞ්ඛ්‍යාත වූ. **මධුර**= මනොඥ වූ. **කටාක්ෂ නික්ෂෙප**= අඞ් නිරීක්ෂණ (යටැස් බැල්ම) හෙළීම නැමැති. **භ්‍රමරා වලියට**=මී මැසි පෙළට. **විකසිතසහකාරසනවකවූ**=පිපුනු මී අඹ මල් පොකුරක්ව. **බාහුලතා'ශ්ලෙෂයට**= හස්ත නැමැති ලතාව වැලඳගැන්මට. **සුජාත**= මනාව හටගත්. **පාරිජාතද්‍රැමවූ**= කොබෝලීල ගසක්ව.

**මන්දස්මිත කාන්ති නිශෙකයට**= මඳ සිනා නැමැති ශොභා වැස්වීමට. **චන්ද්‍රකාන්ත පාෂාණවූ**= සඳකාන්ත පහණක් (දියතරිප්පු ගලක්) මෙන් වූ. **පීනස්තන රාජහංසයන්ගේ**= පිරුණා වූ පයොධර නැමැති රාජහංසයන්ගේ. **ස්වෛරක්‍රීඩාවට**= සිය කැමැති සේ ක්‍රීඩා කිරීමට. **විශාල වක්ෂස ම**= පළල් වූ පපුව ම. **රුචිර සරස් කොටැ**= මනොහර විලක් කොට. **අනුක්‍රමයෙන්**= පිළිවෙළින්. **උද්‍යාන යාත්‍රාගමනයෙහි**= උයන් කෙළියට යන ගමනේ දී.

**බ්‍රහ්මා'පණීත**= බ්‍රහමයා විසින් මවා එලවන ලද්දා වූ. **ජීර්ණ**= ජරා ප්‍රාප්ත. දිරූ. **ව්‍යාධි**= රොගී. **මෘත**= මළ. **නිමිත්ත සන්දර්ශනයෙන්**= පෙර නිමිති දූක්මෙන්. යම් දෙයක් සිදුවීමට පළමුව පහළවන ලකුණු 'නිමිති' නම්. **සඤ්ජාත උද්වෙග**= හටගත් නැති ගැණුම් නොහොත් කලකිරීම්. **ප්‍රව්‍රජ්‍යායෙහි සොත්සාහවූ**= මහණ වීමෙහි උත්සාහ ඇති කොට ගෙණ. **හස්තිස්කන්ධාධි රූඪවූ**= ඇත්කඳ පිට නැගී.

**සුවාසූදහසක්**= අසූහාරදහක් (84000). **සුවරකුඤ්ජරස්කන්ධාරෝහණ**= මඞ්ගල හස්තීන් පිට නැගීම පිළිබඳ. **චාතුර්‍ය්‍යසන්දර්ශනා**= චතුර බැව් (සමත් බැව්) දක්මෙන්. **විස්මිත**= ආශ්චර්යයට (පුදුම යට) පත් වූ. **විශ්ව ලෝකා**= සියලු ලෝවැස්සා. **ජයශබ්ද ගන සහස්‍රයෙන්**= දිනිම් නාද සියක් දහසින්. **පිළිරැව්**= ප්‍රතිරාව. 'ප්‍රතිරාව' නම් ශබ්දයක්' අනුව දුවන දෙඞ්කාරය යි. **දිවාභාගයේ**= දවල් වේලේ.

**ස්වෛර ක්‍රීඩා විහාරයෙන්**= කැමැති සේ ක්‍රීඩාවෙන් විසීමෙන්. **මඟුල්සලවට**= මඞ්ගල ශාල වෘක්ෂයෙහි. **ප්‍රව්‍රජ්‍යාභිමුඛවැ**= පැවිදිවීම කෙරෙහි නැමුනු සිත් ඇතිව. **අෂ්ට පරිෂ්කාර සන්දර්ශනයෙන්**= අටපිරිකර දැකීමෙන්. **සර්වාභරණ**= සියලු පළඳනාවෝ. **රාජවේෂෝචිත වූ**= රජවෙසට සුදුසු වූ. **හන්සළු**= ඇඳගත් වස්ත්‍ර. **ශ්‍රමණ වේෂෝචිත**=(ශ්‍රමණවේෂ × උචිත) මහණ වෙසට සුදුසු වූ. **කාෂායවස්ත්‍රාදි**= සිවුරු ආදිය.

**ඥානාධිගම**=සර්වඥතා ඥානය ලැබීම් සඞ්ඛ්‍යාත වූ. **මහෝත්සව නිදාන වූ**= මහත් උත්සවයට මූලකාරණ වූ. **භික්ෂාර්ථිවැ**= ආහාර කැමැතිව. **නගරාන්තරයකට**= අන්‍ය නුවරකට. **බලිකර්මාන්ත පිණිස ය**= බිලියම් සඳහා යි. **අසම්භින්න ක්ෂීරයෙන් භෝජනය**= දිය නුමුසු කිරෙන් පිසූ ආහාරය. **කෝටිමාත්‍ර වූ**= ලක්ෂ සියයක් පමණ වූ. **ප්‍රක්ෂිප්ත ඕජස්**= බහාලන ලද රස. **එකුන් පණස් පිඩක්**= (එක්-ඌනු-එකූනු-එකුන්) හතළිස් නව පිඩක්. **බෝධි ද්‍රුම ප්‍රාන්තයෙහි**= බෝ රුක සමීපයෙහි.

## (18) පිට.

**ගණයෙන්**=සමූහයාගෙන්. **සානන්ද වූ**=සන්තෝෂ සහිතවූ. **පිප්පලි බෝධිද්‍රුම**= පුලිල බෝ රුක. **තෘණ ඇතිරිය**=තෘණ ඉසිමෙන් කළ ඇතිරිල්ල. **අස්තායට**= අවරට. **ඝෝර මාර වීර වීර්‍ය්‍ය**= දරුණුවූ බලසම්පන්න මාරභට බලය. **නිජපරාක්‍රමයෙන්**= තමන්ගේ බලයෙන්. **උන්මූලයට**= මුල්සිඳීමට. **යාමත්‍රයාධිගත**= යාම තුණෙහි දී අවබෝධ කර ගත්. **ඥානත්‍රය**=පූර්වේනිවාසානුස්මෘති, දිව්‍යංචක්ෂුස්, ආශ්‍රවක්ෂයකර යන ඤාණ තුණ. **වාසනා සහිත**= පෙර පුරුද්දත් සමග. අනන්ත කාලයක් මුළුල්ලෙහි කෙලෙසුන් සමග වැස පුරුද්ද 'වාසනා' නම්. බුදුරජානෝ කෙලෙස් හා ඒ කෙලෙසුන් සමග වාසය කළ පුරුද්දත් නැසූ සේක. එහෙයින් 'වාසනා සහිත'යි කීහ.

**සකල කෙලශ කාලමෂ**=සියලු කෙලෙස් නැමැති කිළුටු. **ප්‍රකෲා ලනාෂෙන්**=සේදීමෙන්. **විශුඩ වූ බුඩි ඇති**=පිරිසිදු නුවණ ඇත්තාවූ. **සකල ලොක ශානතිකර**=සියලු ලෝවැස්සාට සැනසීම ඇති කරන්නාවූ. **කාරුණ්‍යාකරවූ**=(කාරුණ්‍ය × ආකර) කාරුණ්‍යවට උත්පත්තිස්ථානයක් වූ. **මොහාන්ධකාර දිවාකරවූ**= මෝහ නැමැති අඳුරට සූර්‍ය්‍යයකු වැනි වූ. **සූකති සුධානිෂෙක**=යහපත් වචන නැමැති අමා වැස්වීමෙහි. **නිශාකර වූ**=චන්‍ද්‍රයා වැනි වූ.

**කෂෙමඞකර වූ**= නිර්භය භාවය ඇති කරන්නා වූ. **මාර භයඞකර වූ**=මාරයන්ට බිය උපදවන්නා වූ. **ධම්මචක්‍ර**=ශ්‍රෙෂ්ඨවූ ධම්මචක්කසූත්‍ර ධර්මය. **තෘෂ්ණාදස වූ**=තණ්හාවට ගැති වූ. **නිදස කොරෙමින්**= දස භාවයෙන් මුදමින්. **සඩ්ර්ධකුර**= සදහම් නැමැති පැලැටි. **උන්වමින්**=උද්ගත කරමින්. දැල කොරෙමින්. **අභය භෙරිශ**=නිර්භය බෙරය. **ලවමින්**=ගස්වමින්. නාද කර වමින්. **මාර විජයොත්සව ප්‍රතිලබධ සඩර්මධවජ**=මාරයන් දිනූ උත්සවයෙහි දී ලබන ලද සදහම් නැමැති කොඩි ඇති. **තත්කා ලොද්භූත**=(තත්කාල + උද්භූත) එ සමයෙහි පහළ වූ.

**හෂි සම්භ්‍රම ඇති**=සන්තොෂ වෙග තොහොත් සන්තොෂ හා හුහුසුලුබැව් ඇති. **උපචිත**-රැස්කරණ ලද. **රුචිර**-මනොඥ වූ. **ප්‍රචුරොපහාර**=(ප්‍රචුර-උපහාර) මහත් පූජා ද්‍රව්‍යයන්. **පරිගත**=වළඳනා ලද. **භසත සම්පුට**=දෙහොත. **තත් පූර්‍ව'පූර්‍වරූප සන්දශීනයෙන්**= ඒ පෙර නුදුටු විරූ ශරීරාකාරය දැකීමෙන්. **අශ්‍රැතපූර්‍ව වූ**= පෙර නො ඇසූ විරූ. **ශ්‍රවණ නිපීපණීය වූ**=අසා සාන නිවාගතයුතු වූ. **මනොරථ ශෙහි**=සිතේ ප්‍රාර්ථනාවෙහි. මන දෙළෙහි. **අඩු පූරා**=අඩුව පුරවා. ඌනය පූරණයකොට.

**පවරා**= ආරධනා කොට. **උදසනක් සේ ම**= උදසන ම. උදේ ම. 'සේ' යනු ආධාරාර්ථයෙහි හා 'ම' යනු අවධාරණාර්ථයෙහි ද යෙදුනේය. **අළලන්නවුන් සේ**= කළඹන්නවුන් මෙන්. **සපතකුලපර්‍වතයන්**= යුගන්ධර, ඊසධර, කරවීක, සුදස්සන, නෙමින්ධර, විනතක, අස්සකණ්ණ යන, මහමෙර වටා සිටි පර්වත වළලු හත. මෙය 'සප්තකූට පර්‍වත' යයි ගත හොත්:-

"**මහෙන්‍ද්‍රා මලයඃ සහ්‍යඃ ශක්තිමා න්‍යෘක්ෂ පර්‍වතඃ**

**වින්ධ්‍යශචපාරියාත්‍රශච සප්තෛතෙ කුල පර්‍වතාඃ**" යන

කුල පව් සත ගැණෙත්. **හයා**=හෙළා. **උසුරා**=උගුළුවා. උඩට තබා.

**ප්‍රබුද්ධ වූ නීලෝත්පල පත්‍රයෙන්**= පිපියා වූ මහනෙල් මල් පෙත්තෙන්. **සුගන්ධී වූ**= සුවඳ ඇත්තාවූ. **චන්දනා'ගරුකල්ක යෙන්**= සඳුන් හා අගිල් අඹරා ගත් ආලේපයෙන්. 'කල්ක' නම් දිය සහිතව හෝ රහිතව ගලෙහි ලා අඹරා ගන්නා ලද ආලේපය යි. **පිරිබඩගන්නා ලද**= පරිභණ්ඩ ග්‍රහණය කරණලද්දා වූ. ගොම ආදිය ගානා ලද. **ලද පස් මලින්**= ලද පස්වනු කොට ඇති මල් වලින්. හී තණ, සුණු සහල්, හෙළ අබ, සමන් කැකුළු ලද යන මල් පස් වර්ගය යි. මෙහි 'ලද' නම් විලඳ යි. හේ 'ලාජ' ශබ්දයෙන් භින්නය.

**ස්ථාන ස්ථානයෙහි**= තන්හි තන්හි. **වින්‍යස්ත වූ**= තබන ලද. **පූර්ණඝට පඞ්ක්ති**= පුන් කලස් පෙළ. **ස්වර්ණ රජතමය**= රන් රිදීයෙන් නිර්මිත වූ. **තාරකා වින්‍යාස**= තරු යෙදීමෙන්. රනින් හා රිදියෙන් තාරකා වැනි රූ තනා තැන තැන විසුරුවන ලද්දේයැ යි සේ යි. **ශ්වේත විතානයෙන්**= සුදු වියනින්. **මුතු ලැල්**= මුක්තාලතිකා. මුතු ඇමුනු වැල්. **මහමල් දම්**= විශාල මල් මාලා. **කර්පූර**= කපුරු. **කාලා ගරු**= (කාල–අගුරු) කළු අගිල්. (යන මොවුන්ගේ). **ධූපයෙන්**= දුමින්. **අඛණ්ඩ ලක්ෂ්මී මණ්ඩිත වූ**= ශ්‍රී ශොභාවන්ගේ සැරසීමෙන් කඩ නොවූ.

## (19) පිට.

**පෙරමග**= ඉදිරි මාර්ගය. **පූර්ණකුම්භ**= පුන්කලස්. **පඤ්ච වර්ණ වූ ධ්වජ පතාකා**= නිල්, කහ, ලේවන්, සුදු, මදටිවන් යන පස් පාටින් යුත් ධ්වජ හා කොඩි ඇති. 'ධජ' නම් විශාල කොඩි ය. 'පතකා' නම් තුන්හුලස් කුඩා කොඩිය. **පිළි තොරණ**= වස්ත්‍ර යෙන් කළ තොරන්. **සුණු කොටැ**= චූර්ණ කොට. කුඩු කරලා. **පී**= එලන ලද.

**පස්වණක් පැහැයෙන්**=පඤ්චවර්ණ කාන්තියෙන්. **බුද්ධාඞ්කුර**= බොධිසත්ත්ව. සර්වඥතාඥනය විශාල ගසක් ලෙස ද ඒ පිණිස පෙරුම් දම් පුරණ උතුමා ඒ ලබාගන්නා තෙක් ක්‍ෂුද්‍ර ගසක් ලෙස ද සලකා 'බුද්ධාඞ්කුර' යි යෙත්. **ආශ්‍රම පදයෙන්**=පන්සැලින්. **සුසම්රවූ**= අතිශයින් තහවුරුව. **දෙව්දුනු කලඹක්**= දේදුනු කලාපයක්. 'කලාප' සදින් 'කලඹ' යි භින්න යි.

**ස්ථානෝ'චිත වින්‍යාසයෙන්**= තැනට සුදුසු වූ යෙදීමෙන් **ප්‍රභා සාරයක්**= කාන්තියෙහි වූ හරයක්. **කාලා'කාල විභාග යක්**= 'මෙ සුදුසු වේලාවය, මේ නුසුදුසු වේලාවය යන විභාගය යක්. **විචිත්‍ර වූ කුසුම කාන්ති සන්තානයක්**= විසිතුරු මල් කැලුම්

සමූහයක්. **කනක ඛචිත**= රතින් විසිතුරු වූ. **සන්නාහයෙන්**= සුඩ ඇඳුමෙන්. **සන්නද්ධවූ**= සැරසී. **ඓරාවත**= එනම් ඇතා. මොහු ශක්‍රයාගේ වාහනය යි. මේ තෙම සුදුසු අවස්ථාවෙහි ඇත් වෙස මවාගන්නා දිව්‍ය පුත්‍රයෙකි.

**ආකාශස්ථ**= ආකාශයෙහි සිටින. **භූමිස්ථ**= පොළොවෙහි සිටින. **එකපැහැර**= එකවිට. **හඬමින්**= යොමු කරමින්. **පුරමස්ත කා'ශෝකාශයෙන්**= නුවර මතුයෙහි වූ අහසින්. **මාර්ග සංස්කරණයෙහි**= පාර සකස් කිරීමෙහි. **යුගාන්ත වාත ප්‍රහාරයෙන්**= කල්පාවසානයෙහි වන වාතයාගේ වැදීමෙන්. **චන්ද්‍රමණ්ඩලයක් සේ**= සඳ මඬලක් මෙන්.

**දෛව බලයෙන්**= පූර්ව පුණ්‍ය මහිමයෙන්. **මාගීඥන සලිල ධාරා**= අර්හන්මාර්ගඥානාදී ඥාන නැමැති ජලධාරාවෙන්. **ක්ෂාලිත වූ**= සෝදන ලද්දා වූ. **ක්ලේශපඞ්ක**= කෙලෙස් නැමැති මඩ. **අනන්‍ය සාධාරණ වූ**= අනිකෙකුට සම නොවන. **ධර්මචක්‍රප්‍රවර්තනයෙන්**= 'ධම්මචක්ක' සූත්‍රය දේශනා කිරීමෙන්. **විශ්වලෝක මනස්සන්තර්පණය කෙරෙමින්**= සියලු ලෝකයාගේ සිත් සතප්වමින්.

**ස්වාර්ථපරාර්ථ සම්පාදන**= ස්වකීය කෘත්‍ය පරකීය කෘත්‍ය යන මොවුන් සම්පාදනයෙහි. **ව්‍යග්‍රවූ**= යෙදී. **චාරිකායෙන්**= හැසිරීමෙන්.

(20) පිට.

**අනිරූපිත පූර්ව රූපා'මෘතා'ස්වාදයෙන්**= පූර්වයෙන් නොදක්නා ලද රූප නැමැති අමාරස විඳීමෙන්. **අශ්‍රුතපූර්ව**= පෙර නො ඇසූ. **සද්ධර්මාමෘත**= සද්ධර්මය නැමැති අමාව. **ඉදිකරම්හ**= සකස් කරන්නෙමු. **සතෝතාෂ තාක්**= සියලු සතුටූ. **කන් ලද්දෙහි ඵල**= කන් ලැබීමේ ප්‍රයෝජන. **ජන්මලාභ**= ඉපදීමේ ඵලය. **මා**= මා විසින්. **නිශ්ශේෂයෙන්**= ඉතිරි නැතුව. **අවශේෂයක්**= ඉතිරිවූවක්. **බැගෑහැ**= පීඩාව. **ඉෂ්ට ඵල**= අභිමත වූ ප්‍රයෝජන. **අනුවිජේෂ**= ආශ්‍රවයී සි. **පෙළඹි**= ප්‍රලොභව. **ලිෂාවූ**= ඔබලත්ව. **ඉදිකරගු නම්**= සැදූහු නම්. **බා**= බියපත්ව. **වල්වන්**= ආරණ්‍යගත වූ. **චිත්තෝත්පාදමාත්‍රයකින්**= සිත් ඉපද වීම් පමණකින්. **මලස්නක් සේ**= (මල්-අස්නක්) මල් ආසනයක් මෙන්. **සලිල ප්‍රවාහයෙන්**= ජලෞඝයෙන්. දිය සමූහයෙන්. **කඳුරක්**=කඳුරයක්. පර්වතයකින් ගලා බසින දියදහරක්. **පෑලා**= පෙන්වා.

**(21) පිට.**

**දිව්‍යමන්දාර කුසුම=** දෙව්ලොව තිබෙන මදාරා නම් මල් වර්‍ගය. **සින්දුවාර කුසුම=** නිකමල්. **සහකාර=** මී අඹ. **කණිකාර=** කිණිහිරි. **චන්දන චූර්‍ණ=** සඳුන් සුණු. **අගරු චූර්‍ණ=** අගිල් සුණු. **අනුත්සාහයෙන්=** නිරුත්සාහයෙන්. උත්සාහයක් නැතිව. **ලඝු කොටැ=** සැහැල්ලු කොට. **නිරන්තර සන්තොෂයෙන්=** අතර නැති සතුටින්. **අනවරතයෙන්=** නිතර ම. **ශ්‍රී මුඛයෙහි=** උතුම් මුවෙහි. 'ශ්‍රී' යනු උත්තමාර්‍ථවාචීය. **වකාවකා=** කිය කියා. 'වක' (වැකුම්හි) යන දයින් පරව 'ආ' පස විමෙන් නිපන් 'වකා' යන පෙරකිරියට විත්‍ර්ඩ වීමේ දී පූර්‍වයට හුස්වැ 'වක වකා' යි සිද්ධ යි.

**විදැ විදැ=** විදැනය කොට කොට. 'විද' (විදුම්හි) යන දයින් පරව 'ඇ' පස යෙදී නිපන් 'විදැ' යන පෙර කිරියට විත්‍ර්ඩ යි. **ප්‍රවාල සාගරයෙහි=** පබලු සයුරෙහි. කොරල් මුහුදෙහි. **කුල දක්වා=** කූටය (මුදුන) තෙක්. **රතිඳුගොව් වන්=** (රත්-ඉඳුගොව් වන්) රක්තවර්‍ණ වූ ඉන්ද්‍රගොපකයන්. මොව්හු නම් ගැඩවිලුන් වැනි රත් පැහැති කුඩා පණු වෙසෙසකි.

**තථාගතො'චිත වූ=** (තථාගත-උචිතවූ) බුදුන්ට සුදුසු. **වරචීවරය=** උතුම් සිවුර. **ශ්‍රීමත් වූ=** සොභා සහිත වූ. **ධීමත් වූ=** ප්‍රඥ ඇත්තා වූ. **ශාන්ත වූ=** කෙලෙස් නිවීමෙන් සන්හුන්. **දාන්ත වූ=** දමන කළ ඉඳුරන් ඇති. **සන්තුෂ්ට වූ=** ඉතරීතර ප්‍රත්‍යය සන්තොෂයෙන් සතුටු වූ. **ශිෂ්ට වූ=** සදාචාර සම්පන්න වූ. **විනීත වූ=** හික්මුනා වූ. **ශීලසම්පන්න වූ=** ප්‍රාතිමොක්ෂසංවර සීලාදියෙන් යුක්තවූ. **සමාධි සම්පන්න වූ=** සමාධියෙන් (සිතේ එකඟ බැවින්) යුක්තවූ.

**චතුරාශ්‍රව ප්‍රතිපක්ෂ වූ=** කාමා'ශ්‍රව, භවා'ශ්‍රව, දෘෂ්ට්‍යා'ශ්‍රව, අවිද්‍යා'ශ්‍රව යන ආශ්‍රව සතරට විරුද්ධ වූ. **ශීලස්කන්ධාදි=** සිල් කඳු ආදිකොට ඇති. **පරම මහා ගුණගණා'ලඞ්කරණයෙහි=** උතුම් වූ මහත් ගුණ සමූහය සෙවීමෙහි. **ප්‍රවීණ වූ=** දක්ෂ වූ. **අනුගීත=** කියන ලද. **නිජ කීර්ත්ති ශ්‍රවණ ව්‍යග්‍ර=** තමාගේ කීර්ත්ති ශබ්දය ඇසීමෙහි තත්පරවූ. **ත්‍රිභුවන ජනොපජන්‍යමාන=** ස්වර්‍ග, මර්ත්‍ය, පාතාල යන තුන් ලෝ වැසි ජනයන් විසින් උපදවනු ලබන. **සාධුකාර ශතසහස්‍ර ඇති=** ලක්ෂගණන් සාධුනාද ඇත්තාවූ. **ප්‍රතිෂිද්ධ වූ=** වළක්වන ලද. **පුනර්භව ප්‍රතිසන්ධි=** නැවත භව යෙහි පිළිසිඳීම ඇති. **වීතරාගීවැ=** පහ වූ රාග ඇතිව. **අමෛත්‍රීවැ=**

වෙෂ (ක්‍රෝධ) රහිතව. **දාන්තවූ**= දමූ ඉඳුරන් ඇතිව. **විමුක්තවූ**= කෙලෙසුන් කෙරෙන් මිදුනෙක්ව. **ශුද්ධවූ**= කාය දුශ්චරිතාදියෙන් තොර හෙයින් පිරිසිදුව. **වීරවූ**= වීර්‍ය්‍ය ඇත්තෙක්ව. **ධීරවූ**= ප්‍රඥා සම්පන්නව. **කාරුණිකවූ**= කරුණා ඇත්තෙක්ව. **දක්ෂිණෙය්‍යවූ**= දක්ෂිණාව (දානය) පිළිගැණිමට සුදුසුව.

## (22) පිට.

**ආරාධනීයවූ**= මෙරමා සතුටු කළ හැකිව. **මානනීයවූ**= බුහුමන් කටයුත්තෙක්ව. **වන්දනීයවූ**= වැඳිය යුත්තෙක්ව. **අමානීවූ**= මානය නැත්තෙක්ව. **භාවනීයවූ**= සම්භාවනා කටයුත්තෙක්ව. **ශරණාගීවූ**= පිහිටවීමට සුදුස්සෙක්ව. **ගම්භීරවූ**= ගැඹුරු ගුණ ඇත්තෙක්ව. **සමරණීයවූ**= සිහිකටයුත්තෙක්ව. **ශ්‍රමණීයවූ**= ශ්‍රමණ භාවයෙන් යුක්තව. **රමණීයවූ**= සිත්කළු භාවයෙන් යුක්තව. **අවිසංවාදවූ**= බොරුවෙන් ලොව නො රවටන්නෙක්ව. **සුප්‍රතිපන්නවූ**= මනා සේ අභීන්මාගීයට පැමිණ. **සමුද්‍ර කුක්ෂියෙන්**= මුහුදු ගැබින්. **උකහා**= උගුළුවා. 'උත්ඛාත' යන්නෙන් බිඳෙන 'උකහ' යනු සිංහලයෙහි ධාතු යි. ඔහු කෙරෙන් පෙර කිරිය අරුත්හි "ආ" පසවීමෙන් 'උකහා'යි සිද්ධ යි.

**ෂඩ්වර්ණ බුද්ධරශ්මි තාක්**= නීල, පීත, ලෝහිත, ඔදාත, මඤ්ජිෂ්ඨ, පභස්සර යන පාට සයක් ඇති බුදුරැස් සියල්ල. **දශ දිග්භාගයෙහි**= සතරදිග, සතර අනුදිග, උඩ, යට යන දිශා දහයෙහි. **සමස්ත ලෝක සන්තෝෂ ප්‍රසව කෙරෙමින්**= මුළු ලෝකයාට සතුටු උපදවමින්. **පහණ**– පාෂාණය. මිටින් ගත නොහැකි තරම් මහත්වූයේ 'පාෂාණ'යි. **හකුරු**= කැටගල්. මිටින් ගත හැකි පමණවූ ගල් 'හකුරු' නම්. **දිව්‍ය නෘත්‍ය ගීත වාද්‍යයෙන්**= දිව්‍යමය වූ නැටුමෙන් හා ගී කීමෙන්. **දිව්‍ය ලෝක කුසුමයෙන්**– දෙව් ලොව තිබෙන මඳාරාදි මල් වලින්.

**අකනිට්ඨා බඹ ලොව**= එනම් බ්‍රහ්මලෝකය. ලෝක ධාතුවෙහි කෙළවර මෙය පිහිටි හෙයින් මීට 'භවාග්‍ර' යී ද කියනු ලැබේ. **පද්ම මකරන්ද යෙන්**= පියුම් රොනින්.

## (23) පිට.

**අපරිමිත වූ බුද්ධ විලාසයෙන්**= අප්‍රමාණ වූ බුද්ධ ශ්‍රියෙන්. **අසාධාරණ වූ**= අසමාන වූ. **අද්භූතවූ ප්‍රාතිහාර්‍ය්‍යයෙන්**= පෙර නුවූ තරම්වූ පෙළහරින්. **අචින්ත්‍ය වූ මහිමයෙන්**= නො සිතිය හැකි තරම් වූ ආනුභාවයෙන්. **අශ්‍රාන්ත වූ කීර්තීන්**= නැවතුම්

නැති කිතුගොසින්. **නභාන්තය**= තිය තෙලවර **හිමි**= සඬගතව. **රුචිරතර**= අතිශයින් මනොඥ වූ. **අව්‍යාජ වූ**= අසත්‍ය නො වූ. **සජීඥ විභ්‍රමයෙන්**= සජීඥ තෙජසින්. **වාග්විෂයාතික්‍රාන්ත වූ**= වචන විෂය ඉක්මෙව්වා වූ. වචනයකින් කිය නො හැකි. **උපමා විෂයාතික්‍රාන්ත වූ**= ,, උපමාවකින් කිය නො හැකි. **මනො විෂයාතික්‍රාන්ත වූ**= සිතින් නො සිතිය හැකි වූ.

**සමතිස් පැරුමන්**= පාරමී තිහ. දසපාරමීහු එකක් එකක් පාරමී, උප පාරමී, පරමත්ථ පාරමී යන හෙදයෙන් තුන් තුන් වැදෑරුම් වීමෙන් තිසක් වෙති. ඒ මෙසේය. දාන පාරමී, දාන උප පාරමී, දාන පරමත්ථ පාරමී, සීල පාරමී, සීල උප පාරමී, සීල පරමත්ථ පාරමී යනාදි වශයෙනි. **අන් මෙහෙයට**= වැඩකාර කමට.

**සත් බුමු**= සප්ත භූමක. මහල් සතක් ඇති. **මහාකානක පදුමයක් සේ**= විශාල රන් පියුමක් බඳු. **විශිෂ්ට ශොභා භ්‍රාජන වූ**= උතුම් ශොභාවට පැමිණෑ. **මිහිකාන**= පොළෝ නැමැති කාන්තාව. **සතුටු කඳුළු උපදෙස දෙමින්**= සතුටු කඳුළු ඉපදීමට කරුණු දක්වමින්. **ලොමු දැහැ ගැන්මට**= සිරුරේ ලොම් කෙළින් සිටීමට. **ඒකාචාර්‍ය්‍යවෙමින්**= අසහාය ආචාර්‍ය්‍යයෙක්ව. **ඉපිරෙණ**= ඉල්පෙන. **ශ්වෙතච්ඡත්‍ර**= සුදු කුඩ. **ශ්වෙත චාමර**= සුදුවල් විදුනා. **සත් රුවන් තල්වැට**= සත්රුවනින් තැනූ විජිනි පත. 'තාලවණ්ට' ශබ්දයෙන් 'තල්වැට' යි භින්න යි.

## (24) පිට.

**රන් කොතලා**= රතින් කළ කුඩා කෙණ්ඩි. **පූජොපකාරණ**= (පූජා + උපකරණ) පූජා ද්‍රව්‍ය. **විසිතුරක්**=විචිත්‍රාකාරයක්. **උනැගි කොටැ**= උඩුකුරු කොට. **ගුරුත්වයක්**= බර බවක්. **වෙරැ**= ශරීර යෙහි. **මහාත්මකමක්**= මහොත්තම බවක්. **ගහා**= තබා. **පුෂ්පාඤ්ජලි**= මල් අඳෙත. **විදුගි වැනි ගිය**= විහිදී නැමුනා වූ. **ඝන නීල වූ මෙඝපටලයක්**= බොල වු නිල්වලා කුලක්.

## (25) පිට.

**ලදැඩි කාමෙහි**= සිත පිළි බඳ තද බැව්හි. **නිමාවෙක**= අව සානයෙකි. **ලශේ ද?**= ආසන්නවේ ද? **පෙරළාවැන්දෙ**= නැවත වැන්ද අය. **පිවිවහල්**= උපකාර. පිහිට. **පලාබත්**= පලා හා බත්. **නොහැම්මෙ ද?**= නො පොහොනේ වේ ද?. **සභක්ති බව**= භක්ති සහිත බව. **නියත වි නම්**= එකාන්තවූයේ නම්.

## (26) පිට.

**කුසිනාර යමහල=** කුසිනාරා නුවර සල් ගස් යුවල. 'යම හල' යනු 'යමකසාලා' ශබ්දයෙන් භින්න සි. සල් ගස් දෙක යන අර්ථ සි. **සධර්මකර්මයෙහි=** සහපත් වූ ධර්ම ක්‍රියාවෙහි. **වැහෙන=** වැස් සෙන. **කාලඝනයක්=** කැලලක්. **බුද්ධගත ප්‍රසාදයෙන්=** බුදුන් නිසා උපන් පැහැදීමෙන්. **ඉෂ්ටාර්ථ සිද්ධියට=** කැමැති දේ සිදුවීමට. **ක්ෂීණාශ්‍රවවූ=** චතුරාශ්‍රවයන් ක්ෂය කළ කෙණෙක්ව. රහත්ව. **සඞ්ඝනවකව=** බාල සඟනෙක්ව. **අග්‍රදක්ෂිණෙය්‍ය ව=** දක්ෂිණාව පිළිගැන්මට උතුම් වු සුදුස්සෙක්ව. **නිෂ්කාරුණිකයෝ=** කරුණා නැත්තෝ. **ළ දැඩියෝ=** තද වු හෘදය ඇත්තෝ. **පරාර්ථයෙහි=** අනුන්ට අභිවෘද්ධි සැලැස් වීමෙහි. **පිළිමිවියෝ=** පරාඞ්මුඛවූවෝ. **ආත්මස්නේහයට=** තමා කෙරෙහි ඇති ආලයට. **දීර්ඝදර්ශී නොවන්නෝ=** දුරදිග නො බලන්නෝ. **දුක් පත් නැණෙක් ල=** දුකට පත් ස්ථානයෙක. **නො විසක් කමක්=** අව්‍යක්ත කමක්. මොඩකමක්. **අවිරතිමක්=** ඔබලත් කමක්.

## (27) පිට.

**අසුරබවක්=** කටයුත්තෙහි අදක්ෂ බවෙක්. **නිමග්න වූ=** ගැලුනා වූ. **ධ්‍යානාභිඥානාදිගුණ සම්පත්තිය=** ප්‍රථමධ්‍යානාදි ධ්‍යාන ගුණ හා පඤ්චාභිඥා ගුණ ද යන මේ ගුණ සම්පත්තිය. **අෂ්ට ධර්ම සමෝධානයෙන්=** ධර්ම අටක පිහිටීමෙන්. ධර්ම අටකින් යුක්තවීමෙන්. **සංසිද්ධවන්නා වූ=** මනා සේ සිදුවන. **දළ්හ ගහණින්=** දැඩිකොට ගැන්මෙන්. **උදර අධ්‍යාශය=** උසස් අදහස. **රිස්සෙන්=** කැමැත්තෙන්. **අනුග්‍රහයෙන්=** ප්‍රසාදයෙන්. **දොළ ගෙණ=** ආශා රැගෙණ. 'දොළ' යනු සාමාන්‍යයෙන් ගර්භිනින්ට පහළ වන ඊප්සාවන්ට කියනු ලැබේ. මෙහි වනාහි එය අභේදයෙන් 'ආශාර්ථයෙහි' යෙදිනි.

**සන්නද්ධ වූ=** සැරසුනු. **නොබැවූ වා=** බිය නො වූවා. **පර දුඃඛයෙහි දුඃඛිතවූවා=** අනුන්ගේ දුකෙහි දී දුක් වූ තැනැත්තේ. **ආත්ම සුඛයෙහි=** තමාගේ සැපයෙහි. **අරුචිකළා නමුත්=** රුචි නො කළ තැනැත්තේත්. **ජයධ්වජ–** ජය කොඩි. **මහවත් හසන් නට=** මහා මාර්ගී සුඩ කිරීමට. **එලෙන්නට=** එල්ලෙන්ට. ඇල වෙන්ට. **කුලදෙවිවූවාත්=** කුලදෙවතාවුයේත්. 'කුලදෙවතා' නම් කුලයෙහි පුදන තැනැත්තා සි.

**දෙසැටදෘෂ්ටියට=** මිථ්‍යාදෘෂ්ටි හැටදෙකට. දෙසැටදිටු නම්:– ශාස්වත දෘෂ්ටි සතර, එකත්‍ය ශාස්වත දෘෂ්ටි සතර, අධිත්‍යසමුප්

පන්න දෘෂ්ටි සතර, අනන්තානන්තික දෘෂ්ටි සතර, අමරාවික්ෂේප දෘෂ්ටි සතර, සංඥීදෘෂ්ටි අට, අසංඥී දෘෂ්ටි සොළොස, නෙවසංඥ නාසංඥ දෘෂ්ටි අට, පරම දෘෂ්ට ධර්ම නිර්වාණ දෘෂ්ටි පස, යන මොව්හු යි. **මාරසේනාවට**= 'මාරසෙනා' නම් වූ එකොළොස් වැදෑරුම් අකුශලයන්ට. [**'සුජනප්පමොදනී'** නම් වූ විනය ගාථා සන්‍යයෙහි උපග්‍රන්ථය බලනු.] **සත්ත්වානුග්‍රහ විද්‍යාවට**= සත්ත්ව යන්ට අනුග්‍රහ කිරීම් සඬ්ඛ්‍යාත ශාස්ත්‍රයට. **ආචාර්‍ය්‍යකමට**= ගුරු තනතුරට.

## (28) පිට.

**ඉන්ද්‍රජාලය**= එනම් විද්‍යාව. ඇස් බැන්දුම. **හෙල්මැලි කළඹක්**= කල්හාරපුෂ්ප මිටියක්. **ව්‍යර්ථ**= හිස්ය. **ලෙහි**= හෘදයයෙහි. **අවීචිමහා නරකයෙන්**= දුකින් හා සත්ත්ව ප්‍රමාණයෙන් වීචියක් (සීමාවක්) නැති හෙයින් එනම් වූ අපායෙන්. **ගිලිගි**= ගැලති. ගලහ (ගිලිහුම්හි) දයින් නිපන් පෙර කිරිය යි. **සවන පරනිර්මිත වසවර්ති දිව්‍යලෝකයෙහි**= එනම් වූ සහවෙනි කාමාවචර දෙව් ලොවෙහි.

## (29) පිට.

**අමානමෙහින්**= අමෘතය ඉසිඹින්. **කලල් පිට**= මඩ මතුයෙහි. **මහාපුරුෂයානන්**= මහාබොධි සත්ත්වයන් වහන්සේ. **කෙපැලැඟිවි හා**= කවර'කාර ද? **පැලා**= පෙන්වා. පා (පැමෙහි) දයින් පරව 'ඇලා' පස වී මෙන් 'පැලා' යනු සිඬ යි. පූර්ව ක්‍රියා යි. **භූෂණකාරකාවූ**= අලඞ්කර කරන්නාවූ. **තපස්විවෙෂධාරී වූ**= තාපසවේසය දරන්නා වූ. **අනුවාත ප්‍රතිවාත**= තමා යන දෙසට ම තමා අනුව පිටිපසින් හමන සුළඟ 'අනුවාත' නම්. ඉදිරිපසින් තමා දෙසට හමන සුළඟ 'ප්‍රතිවාත' නම් වේ.

**දශබල ගුණ**= **ඨානාඨාන ඥානය, කර්මවිපාක ඥානය,** සියලු ගතිවල සත්වයන්ගේ ගමන් දන්නා '**සබ්බත්‍ර ගාමිනි ඤාණය,** සත්වයන් සම්බන්ධ ධාතු විශෙෂ දන්නා **අනෙක ධාතු ඤාණය,** සත්වයන්ගේ සංසන්දන ඇලුම් දන්නා. **අධිමුක්ති ඤාණය** ඉන්ද්‍රිය පිළිවෙළ දන්නා **ඉන්ද්‍රියපරොපරියත්ති ඤාණය,** ධ්‍යානයන්ගේ කිළුටු පිරිසිදු බැව් දන්නා **ධ්‍යානාදිසංකිලෙස ඤාණය,** පෙර විසූ කඳ පිළිවෙළ දන්නා. **පුබ්බෙනිවාසානුස්සති ඤාණය,** සත්වයන්ගේ සිත් දක්නා **දිබ්බචක්ඛු ඤාණය,** සියලු ආශ්‍රවයන් ක්ෂය කරණ පිළිවෙළ දන්නා **ආශ්‍රවක්ෂයකර ඥානය** යන මොව්හු දශබල නම්. මින් අන්‍යවූ දශ විධ කාය බලයක් ද ඇත. හේ මෙහි නොගැණේ.

**ජඞ්ගම ගන්ධමාදනපබ්බතයෙක**= ඇවිදින්නාවූ 'ගන්ධමාදන' නම් පර්වතය වැන්න. **සද්ගුණ**= ශ්‍රද්ධාදි යහපත් ගුණ. **උන්වා ලු**= ඉන්දවන ලද. **සිසිවණින්ම**= පිපිනු හැටියෙන් ම. **නොමලා**= මිලාන නොවී. **අසාධාරණ ශ්‍රීයට**= අසමාන වූ ශොභාවට. **මඩු කාටුවෙක**= එනම් මත්ස්‍යයාගේ කටුවක් වැන්න.

## (30) පිට.

**ලූ**= බහනලද. 'ලා' (ලීමෙහි) ධාතුවෙන් නිපන් පසරුත් සදකි. **මහසෙණකා**= මහත් වූ සෙතුවක. ලොකු ඒ දණ්ඩක. **පෙහෙවස්ගෙණැ**= පෞෂධ ශීලය සමාදන්ව. **සසර පමණින්**= සංසාරය මෙන් දීර්ඝකාලයක්. **පඤ්චමහාපරිත්‍යාගයට**= ශ්‍රෙෂ්ඨ ධන, අඹුදරුවන්, රාජ්‍යය, ශරීරාඞ්ග, ජීවිත යන මේ පඤ්චමහා දානයට. **පුස්තාවනාවෙක**= පුරොවක්‍යයෙක. යමක් ඇඳින්වීම් වශයෙන් ලියන කියන දේ ප්‍රස්තාවනාව යි. **සැරණමෙක**= ඊතල යෙකි. **ශුමකාරවා**= අබ්‍යාස (පුරුදු)කොට.

**සනාථ කරත්**= පිහිට ඇත්තෙක් කරතත්. **සකල වස්තු විපුල වූ**= සියලු වස්තුහු ම මහත් සේ ඇත්තා වූ. **කපිලවස්තු**= කිඹුල් වත් නුවර. 'කපිල' නම් ඍෂි වරයෙකුට වාසස්ථාන වූ හෙයින් මෙනම් විය. **පීන පයොධර වූ**= පුන්පියොවුරු ඇති. **ශ්‍රොණිධර වූ**= කෘශ වූ මධ්‍ය ප්‍රදෙශ දරන්නාවූ. **නිරපෙක්ෂවැ**= බලාපොරොත්තුවක් නැතිව. **නිසඞ්ගවැ**= නොඇලී. **රුචිරගති කාන්තාමන්ථර**= රුචිරගති, මනොඥ ගමනින්; කාන්ත, කාන්තවූ; අමන්ථර, ශීඝ්‍රගාමී වූ; **කන්ථකාභිධාන**= කන්ථක නම් වූ. **හය වරාධිරූඪවැ**= උතුම් අශ්වයා පිට නැගී.

**අච්ඡන්න පක්ෂපාත**= ප්‍රකට වූ පක්ෂපාත බැව් ඇති. **භ්‍රූකුටි කුටිල කටාක්ෂ නික්ෂෙපයෙන්**= භ්‍රැකුටි, බැම බිඳීමෙන්; කුටිල, වක් වූ; කටාක්ෂ නික්ෂෙපයෙන්, යටැස් බැලුම් හෙළීමෙන්. **නිර්භර්ත්සිත කොටැ**= භයගන්වා. තර්ජනය කොට. **ජාත්‍යන්තර යෙහි**= පූර්ජාතිවල. **විනිවර්තිතචිත්තවිකාර**= පහවූ සිත් පෙරළුම්. **සටිකාර මහාබ්‍රහ්මොපණීත**= සටිකාර නම් මහබඹහු විසින් එලවන ලද. **විශිෂ්ටාෂ්ටපරිෂ්කාර**= යහපත් වූ අටපිරිකර.

**ස්වීකාර පූර්වාඞ්ගමවැ**= පිළිගැණීම් පෙරටුකොට. **ප්‍රචල**= අතිශයින් සැලෙන. **බාල ප්‍රවාල**= ලා කොළ ඇති. **අජපාල මූල ගතවැ**= අජපාල නම් නුගරුකමුලට පැමිණ. එළුවන් රකින් නන් නවතින තැන හෙයින් මේ නුගරුකට 'අජපාල' යන නම

ඇතිවිය. **උභයකුල සුජාත**= මවුපිය දෙකුලෙන් මොනවට උපන්. සමානවංශවත් මවු පිය දෙකුලෙන් උපන් යනු අර්ථ යි. **වනිතාකරකමලෝපලාලිත**= කාන්තාවන්ගේ අත් නැමැති පියුමෙන් එලවන ලද. **අසම්භින්නපායාසෝපහාරප්‍රතිග්‍රහණ පූර්වකව**= දිය නුමුසු කිරිබත් පිළිගැණීම පෙරටුව.

**ජලාවගාහෝත්‍ථාත**= ජලාවගාහ, දියට බැසීමට; ආයාත, පැමිණියා වූ. **නව යුවති**= යෞවන තරුණියන්ගේ. **පීනඝන මර්දන**= පිරුණු පියොවුරු මැඩීමෙන්. **ජර්ජරිත**= දුදුරු වූ (=ඔබලත් වූ). **නෙරඤ්ජරා නදී තීරයට**= එනම් ගං තෙරට. **සෞරභාවගාහණාහත**= සිය කැමැත්තෙන් දියට බැසීමෙන් ගැටුනු. **ශරීරකලමථ**= සිරුරු විඩා. **උඩුහෝයට**= උඩ්වශ්‍රොතසට. උඩුදිය පාරට. **තෘෂ්ණාප්‍රවාහයට**= තණ්හා නැමැති ජලෞඝයට. **අනුනොවැ**= අනුගත නො වී. යටි ගං බලා නො ගොස් සි සේ සි.

## (31) පිට.

**කුසුමාමෝද**= (කුසුම–ආමොද) මල් සුවඳින්. **මුදිත**= සතුටු වූ. **මඤ්ජුශිඤ්ජිත**= මධුර වූ පක්ෂිනාදයෙන් ද. **මධුකර නිකර**= භෘඞ්ග සමූහයාගෙන් ද. **නිරන්තර**= අතර නැත්තාවූ. **පාවන**= පවිත්‍ර වූ. **සාලවන**= සල්වනයට. **ප්‍රවිෂ්ටවැ**= පැමිණ. **විකසිත කුසුමනෙත්‍ර**= පිපුනු මල් නැමැති ඇස්. **දිවාවිහාර කොටැ**= දවල්කාලය ගතකොට. **ප්‍රදක්ෂිණා කොටැ**= පැදකුණු කොට. ගරුකටයුතු වස්තුව දෙසට ශරීරයෙහි දකුණු අංශය හරවා සිසාරා යාම ප්‍රදක්ෂිණා නම්. **ප්‍රබලාඩම්බර පුරස්සරවැ**= මහත් වූ ආඩම්බර පෙරටු කොට.

**විජිගීෂා සමුපස්ථිත වූ**= දිනනු කැමැතිව පැමිණියාවූ. **අවසවර්තී කොටැ**= සියවසහයෙහි නො පවත්නේක් කොට. **චාදශාඞ්ග ප්‍රතීත්‍ය සමුත්පාද**= අඞ්ග දොළසකින් යුත් හෙතු ඵල ධර්මය. අවිජ්ජා, සංඛාර, විඤ්ඤාණ, නාමරූප, සළායතන, ඵස්ස, වෙදනා, තණ්හා, උපාදාන, භව, ජාති, ජරාමරණ, සොකපරිදෙව දුක්ඛදොමනස්සඋපායාස,– යනු චාදශාඞ්ගය යි. **ප්‍රත්‍යවෙක්ෂා ක්ෂණයෙහි**= සිහිකරණ ඇසිල්ලෙහි. **අරුණෝදය**= අරුණ නැගීම. **සර්වඥතඥානොදයයෙන්**= සියල්ල දක්නා නුවණ පහළවීමෙන්. **සකල ලොක දුඃඛ විනොදන කාරණ**= සියල් ලෝවැස්සන්ගේ දුක් දුරුකරණ. **කෙලශවිකාරයෙන්**= පාප වියරුවෙන්. **අචලිත වූ**= නො සෙල්වෙන්නා වූ. **සංසාර ව්‍යසන**

**ෂෙහි**= සසර පීඩාවෙහි. **ජිනසාසනාකාසෙහි**= සර්වඥශාසන නැමැති අහසෙහි. **ප්‍රභාසුර**= අතිශයින් බබලන. **නක්‍ෂත්‍ර තාරකාව**= නැකැත් තරුව. **ස්මරණමාත්‍රෙණකින්**= සිහිකළ පමණින්.

**සකලලොක ක්‍ෂෙමඞ්කර වූ**= සියලු ලොකයාට අභය දෙන්නාවූ. **අවිවර්ණ වූ**= දුර්වර්ණ නො වූ. **අසංසට්ඨතාව**= නො සැප බව. **අෂ්ටාඞ්ගමාර්ගයේ**= මාර්ගාංග අටෙහි. නිර්වාණයට යන මාර්ගයෙහි අවයව අට. සම්මාදිට්ඨි, සම්මාසඞ්කප්ප, සම්මාවාචා, සම්මාකම්මන්ත, සම්මාආජීව, සම්මාවායාම, සම්මාසති, සම්මාසමාධි යන මේ අට යි.

## (32) පිට.

**ත්‍රිවිධ අර්ථචර්‍ය්‍යාවෙහි**=අර්ථචර්‍ය්‍යා තුණෙහි. එනම්:- ඤාණ'ත්ථචරියා, ඤාත'ත්ථචරියා, ලොක'ත්ථචරියා යන තුණ යි. නුවණ කරණ කොට ගෙණ අනුන්ට වැඩ සිදුකිරීම 'ඤාණත්ථචරියා' නම. නෑයන්ට වැඩසිදුකිරීම 'ඤාතත්ථචරියා' නම. සියලු ලොකයාට වැඩ සිදුකිරිම 'ලොක'ත්ථචරියා' නම. **නො වදා**= මුඛයෙහි නොකොට. නො කියා. **ස්වහස්තෙන්**= සිය අතින්.

**විවරණ පතුල්**= ව්‍යාකරණය. 'මේ තෙම මෙ පමණ කලකින් ඔබ්බෙහි මේ නමැති බුදුකෙනෙක් වන්නේයැ යි. බුදු මුවෙකින් ප්‍රකාශ කිරිම 'ව්‍යාකරණ' (=විවරණ) නමි. මෙහි 'පතුල්' යනු ප්‍රථමාරම්භාර්ථයෙහි යෙදිති. **දර්ශන විෂය**= දෘෂ්ටි පථය. දැකිය හැකි ප්‍රමාණය. **මල් ඇතිරිය**= මලින් කළ ඇතිරිල්ල.

## (33) පිට.

**අත්‍යුෂ්ණ**= (අති-උෂ්ණ) ඉතා උණුසුම්. **ප්‍රභාත වේලාව සේ**= අලුයම් කාලය මෙන්. **සමඍතු**= සම කාල ගුණ. **ප්‍රචණ්ඩ වාත**= තද වාතය. **තෘෂ්ණාශ්‍රොතස**= තණ්හා නැමැති දියපහර. **කෘතා'ධිකාර සත්ත්වයන්ගේ**=කරණ ලද පූර්වප්‍රාර්ථනා ඇති සතුන් ගේ. **ලොකොත්තරමාර්ගඵල**= සෝවාන් මාර්ගාදි සතර මග හා සතර ඵල. කාමලොකයෙන් එතරව සිටි හෙයින් මොව්හු ලොකොත්තර නම් වෙති. **නො වැලඹී**= නො වැළකී. **ප්‍රාදුර්භාවයෙහි**= පහළවීමෙහි. **සප්තබොධ්‍යඞ්ග රත්නයන්ගේ**= චතුරාර්‍ය්‍ය සත්‍යය අවබොධ කරගැණීමෙහි ඉවහල්වන අවයව හතේ. සති, ධම්ම විචය, විරිය, පීති, පස්සද්ධි, සමාධි, උපෙක්ඛා යන මොව්හු යි.

**උජ්වලවීම**= විශෙෂයෙන් බැබලීම. **ධර්මවිජය භෙරි**= දහම් නැමැති ජය බෙර. **ශ්‍රමකරන්නා සේ**=පුරුදු කරන්නාක් මෙන්. **ජාතිමහො'ත්සවයෙහි**= උත්පත්ති මඞ්ගලයෙහි.

(34) පිට.

**උඩනවූ**= උඩඟුව. **සෑලෙන**=කම්පාවන. **විනීත වෛනෙය්‍යා සේ**= හික්මෙන්නාක් මෙන්. **තරඞ්ග විශෙෂාංගයෙන්**= රළ කැළඹී මෙන්. **වහ්නිස්කන්ධයන්**= ගිනිකඳු. **චිරානුගත**= බොහෝ කලක් අනුව පැවැති. **අභ්‍රෂ්ට වූ ප්‍රභාඇතිවූ**= නො නැසුනු කාන්ති ඇතිව. **තාරූ කැල**= තාරකා සමූහයා. මෙහි 'කැල' යනු 'කුල' ශබ්දයෙන් භින්න සි. **අඛණ්ඩප්‍රසා'දෝදයට**= නො කඩව ප්‍රසාදය පහළ වීමට.

**දළවූ**= දෘඪව. **සුහුඹුල්වූ**= බල සහිතව. **කඳ වෙලපයක්**= කඳින් අතු බෙදී ගිය තැනක්. 'විටප' ශබ්දයෙන් වෙළෙප් සි භින්න සි. **පැළඹීම්**= ක්‍රීඩා. **කීර්ති පුඤ්ජය හා**= යසස් පිඩ සමග. **නොඑක් බිලයෙහි**= නානා සිදුරුවල.

(35) පිට.

**මාන**= 'මම ශ්‍රේෂ්ඨයෙක්මි' යනාදීන් උඩඟු වශයෙන් සිතීම. **අතිමාන**= අධික වූ මානය. **ථම්භ**= අවවා දයට නො නැමෙන තද ගතිය. **සාරම්භ**=කරණුත්තරියකරණය. (=කළදෙයට වැඩිදෙයක් කිරීම. **රජසුන්**= ධූලින්. **අධර්මනාක්**= අධර්ම සියල්ල. **අනිෂ්ට ගන්ධනාක්**= නපුරු ගඳ සියල්ල. **අරූ තෙලෙහි**= රූපවිරාග භාවනා කොට උපදනා අරූපාවචර බ්‍රහ්ම ලොකවල. **ස්වර්ගා'වරණයක්**= ස්වර්ගීය වැළැක්මක්. දෙව්ලොව ඉපදීමට බාධාවක්. **මාර්ගා'වරණයක්**= සෝවාන් ආදි මාර්ගයන්ට පැමිණීමට බාධාවක්.

**ඒකාඞ්ගණ වූ පරිදි**= එක ම සමතලා බිමක් (=මිදුලක්) මෙන් වූ ආකාරය. **නිරුපධිශේෂ නිර්වාණධාතුවෙන්**= පඤ්චස්කන්ධය ද නො ඉතුරුව පිරිනිවීම. **කෘතපුණ්‍යයම්හ**= කළ පින් ඇත්තම්හ.

(36) පිට.

**අධර්මඝර්මසන්තප්ත වූ**= අධර්ම නැමැති නියඟින් තැවුනු. **පටනින්**= ආරම්භයෙන්. **මාරවීර තිමිර නිකර දිවාකරවූ**= මාරභට නැමැති අන්ධකාර සමූහයට සූර්යයකු වැනිව. **පූරිත පාරමිතා ලතා මඤ්ජරීගතවූ**= පුරණලද පාරමී නැමැති ලතාවෙහි (=වැලෙහි) මල් පොකුරක් වැනිව. **සර්වඥඥාන විලාස විශේෂ පරමා'ධාරවූ**= සර්වඥතාඥාන නැමැති ක්‍රීඩා වෙසෙසට උතුම් ආධාරයක්වූ. **විනෙයබන්ධු**= බුදුන්ගෙන් බණ අසා සෝවාන්

ආදි මාර්ගඵල අවබොධකර ගැණීමට හෙතු සම්පත් ඇති සත්ත්ව යෝ. (ඔවුන්ගේ). **ක්ලෙශබන්ධන**= කෙලෙස් නැමැති බැමි. **කාල දෙසස්ථානොචිත**= කලට, පෙදෙසට, හා තැනට ඔබින.

**අද්භුත බුද්ධ විභ්‍රම ප්‍රකාශන**= ආශ්චර්යවත් වූ බුද්ධ මහිමය ප්‍රකටවීමෙන්. **ප්‍රහෘෂ්ට**= අතිශයින් සතුටු වූ. **ත්‍රෛලොක්‍ය ප්‍රශස්‍යමාන**= තුන්ලෝ වැස්සන් විසින් පමුණුවනු ලබන (=කියනු ලබන.) **සමුච්ඡ්‍රිත**= උස්ව නැඟුණු. **නිරාලොක**= (නිර්-ආලොක) බුද්ධ සූර්‍ය්‍යා'භාවයෙන් ආලොක රහිත වූ. **ලොකා'ලොක කරණයෙන්**= ලොව එළිය කිරිමෙන්. **බුද්ධකාරකධර්ම**= බුදු බැව් සිදුකරණ ධර්මයෝ. ඔව්හු නම් දශපාරමීහු ම ය.

**පූර්වසර්වඥ ප්‍රවරො'පසෙවිත වූ**= පෙර උතුම් සර්වඥවරයන් විසින් සෙවුනා ලද්දවූ. **සර්වඥ ලක්ෂ්මී නායිකා**= බුද්ධ ශ්‍රී නැමැති නළඟනගේ. **ප්‍රකටනර්ත විභ්‍රමා'භිරාම වූ**= ප්‍රසිද්ධ නාට්‍ය ලීලා යෙන් මනොහර වූ.

(37) පිට.

**යාචක චාතක**= යාචක නැමැති සැඳැත්තන්ගේ. **මනො නිර්වාපණෙ'කධාරාධර ප්‍රථමාරම්භායමාන වූ**= මනො නිර්වා පණ, සිත් නිවීමට; එකධාරාධර, එක ම වලාකුලක්හුගේ; ප්‍රථමා රම්භායමාන වූ, පළමු ආරම්භයක් වැනි වූ. **සකල දසබල නිසෙවිත වූ**= සියලු බුදුවරයන් විසින් සෙවුනා ලද්ද වූ. **ශ්‍රීඝන වචන විලාසයට**= සර්වඥයන් වහන්සේගේ අෂ්ටවිධ බ්‍රහ්මස්වරයෙන් හෙබි වචන ආකාරයට. **වජ්‍රාසනා රොහණයට**= වජ්‍රාසනයට නැඟීමට.

**වෙදිකාස්ථානයෙහි**= පිල්කඩෙහි. **වශ්‍යාඤ්ජනායමාන වූ**= (වශී-අඤ්ජනායමානවූ) මිනිසුන් වසඟ කිරීමට දෙන අඳුනක් වැනිවූ. **ඉෂ්ටා'ර්ථපුෂ්ටිකරන්නාවූ**= අභිමතාර්ථය පොෂණය කරන්නා වූ. **මාතෘස්ථානයෙහි**= මවු තනතුරෙහි. **සර්වඥ ලක්ෂ්මිය**= සර්වඥතාඥාන නැමැති ශ්‍රීකාන්තාව. **සඛීස්ථානයෙහි**= යෙහෙළි තනතුරෙහි. **කාමොඝාදී**= (කාම-ඔඝාදි) කාමය ම සත්ත්වයා සංසාර සාගරයට උල්පවා හරින ඔඝයක් (=ජල ප්‍රවාහයක්) වැනි නු යි කාමොඝ' ය යි කියනු ලැබේ. **සෙතුස්ථානයෙහි**= ඒදණ්ඩක් වැනි කොට. **ආහ්වානයෙහි**= කැඳවා ගැන්මෙහි.

**රක්ෂණීය වූ**= රැකිය යුතු. **සර්වසත්ත්ව සාධාරණ**= සියලු සතුන්ට පොදු වූ. **වම්වමි**=වගුරුවමි. තමා හරිමි. වම (වැමූම්හි) දසින් නිපන් පියදූ අරුත්හි වත්මන් මසඳ කරු එකබස කිරිය පෙදෙකි. **අධ්‍යා'ත්මිකවස්තූන්**= තමා ශරීරය පිළිබඳ වස්තු. **මුක්තාමණී**= මුතු මිණි. **වෛඩූර්‍ය**= විදුරු මිණි. **බාහ්‍ය**= ශරීරයෙන් පිටත් වූ. **අවලම්බන යෂ්ටිය**= එල්බෙන සැරයටිය.

(38) පිට.

**ප්‍රතිඥා**= පොරොන්දුව. **භඞ්ගයක්**= බිඳීමක්. **ශක්‍ර බ්‍රාහ්මණ යාට**= බමුණු වෙසින් ආ ශක්‍රයාට. **පස් පැ දිස්නා**= පඤ්චවිධ වර්‍ණයෙන් බබලන්නාවූ. **සාමි සි**= බඩගිනි ඇත්තෙමි යි. 'සාමි' යනු නාමපදයක් කෙරෙන් ආඛ්‍යාත ප්‍රත්‍යය යෙදුනු තැනි. මෙය සිංහල භාෂාවේ විශෙෂ රීතියෙකි. **සහවැ**= සාවෙක් වී ඉපිද. **සයින්**= ක්‍ෂුධාවෙන්. බඩගින්නෙන්. **මෙතෙක් මතු**= මෙප මණෙක්මය යි. **සකල මනොමල**= සියලු සිත් කිළුටු. **ප්‍රක්‍ෂාලන**= සේදීමෙහි. **එකසලිල සෙකාශමාන**= අසහාය දිය ඉසීමක් වැනි වූ. **සකල දශබල බලාධාර සත්ම්භා'යමානවූ**= සියලු බුදු වරයන්ගේ බලයට ආධාර ටැඹක් බඳුවූ.

**ව්‍යාපතවැ**– පැතිර. **වසන්තමාරුතා'නීත**= වසන්ත කාල යෙහි හමන සුලඟින් ගෙණෙන ලද. **මන්‍දාකිනිජලබින්දුසන්දොහ යෙනුදු**= ආකාශ ගඞ්ගාවේ දියබිඳු සමූහයෙනුත්. **අනිර්‍වා පණීය වූ**= නො නිවිය හැකිවූ. **කෙලශසන්තාප**= කෙලෙස් නැමැති තැවුලි. **චතුස්සාගර**= මහමෙර සතර පැත්තෙන් පිහිටි සාගර සතර. **වාරිධාරාපරිෂෙකයෙනුදු**– දිය දහර ඉසිමෙනුත්.

**අශමණීය වූ**= සංසිඳවිය නො හැකිවූ. **රාගරජස්**= රාග නැමැති දූවිලි. **තදදශීනො'ද්භූත**– ඒ දැකීමෙන් පහළ වූ. **වසන්ත මාරුත සන්තොෂ කොශ**= වසන්ත කාලයෙහි වූ සුලඟින් හට ගත් සතුටු නැමැති කුඩ්මලයෙන්. **නිර්ඣරිත**= නිශ්ශෙෂයෙන් බර වූ. **සකල බුධ්ධාරක ධර්‍ම ගණ ශිවාමණී වූ**= සියලු බුදු කුරු දහම් සමූහයට සිළුමිණ වූ. **කිරලෙකු**= එනම් පක්‍ෂියකු. **වාලධිය**= වල්ගය. **සෙමරෙකු**= එනම් මෘගයකු. **නක්පරකම්**= නියුක්තවීම්. **ශවාසමාත්‍රයෙකින්**= හුස්ම හෙළීම් පමණකින්.

(39) පිට.

**තීක්‍ෂණ වූ කණ්ඨක ඇති**= තියුණුකටු ඇති. **උෂ්ණීෂ පට්ටය**= නළල්පට. **දෙෂ විකාරයක්**= කොපයෙන් හටගන්නා විපය්‍ර්‍යාසයක්. **ශ්‍රීපාද මණ්ඩය**= සිරිපා දෙක. **නිරවධි**= සීමා රහි

ත වූ. **නිරුපධි ගුණගණ නිධාන වූ**= විනාශ රහිත වූ ගුණසමූහයට උත්පත්තිස්ථානවූ. **සකල බොධිසත්ත්ව වික්‍රමෛක සාධ්‍ය**= සියලු බෝසතුන්ගේ අසහාය වික්‍රමයෙන් සිද්ධකටයුතු වූ. **නෛෂ්ක්‍රම්‍ය**= ගිහි ගෙයින් නික්මීම. **සර්වබොධිසත්ත්ව සන්දෘෂ්ට**= සියලු බෝසතුන් විසින් මැනැවින් දක්නා ලද.

**මහාබොධි සත්ත්ව ප්‍රසව සාමර්ථ්‍ය විශෙෂ ඇති**= මහබෝසතකු පහළ කිරීමෙහි දක්‍ෂ බැව් ඇති. **සකල ප්‍රව්‍රජ්‍යා ගුණගණ මාණික්‍ය මහානිධාන වූ**= සියලු පැවිදි ගුණ සමූහ නැමැති මාණික්‍යයන් පිහිටා සිටින තැනක් වැනි වූ. **භවා'ශාව**= (=භව ආශාව)සසරෙහි ඇල්ම. **නිරන්තරා'භ්‍යාසිත**–නිතර පුරුදු කරණ ලද. **විභවා'භිප්‍රායයෙන්**= නිවන් ලබන අදහසින්. **අභිවාතකරොග උපද්‍රැත**= එනම් වසංගත රෝගයෙන් උවදුරට පැමිණි. **නිරපෙක්‍ෂවැ ම**= බලාපොරොත්තුවක් නැතිව.

**පඤ්චකාමානුභාවයෙහි**= පස්කම් සුව විඳීමෙහි. රූ, සඳ, ගඳ, රස, පහස යන පඤ්චවස්තූන්හි පැවැතෙන ආශාව පඤ්චකාම නම්. **සඤ්ජාත සංවෙගයෙන්**= හටගත් කනගාටුවෙන්. **නරෂක්**= පැසැනු කෙසක්. 'නර' යනු පැසුනු කෙහෙවලට නම්. 'නරෙයි' යන දෙමළ සදින් හේ නිපන සි. **තපස්විවෙෂණ**= තපස් වේස.

(40) පිට

**සර්වඥතාඥාන සම්භවෛ'ක බීජා'යමාන**= බුද්ධඥානය පහළ වීමට එක ම බිජුවටක් වැනි වූ. **අතිනෙත්‍ර**= පූජ්‍ය ඇසක්. මෙහි 'අති' ශබ්දය පූජ්‍යාර්ථ වාචීය. **සකලා'කුසල ප්‍රවෙශ ප්‍රතික්‍ෂෙපක ප්‍රතිහාරි ධුරන්ධර**= සකල අකුසල, සියලු අකුශලයන්ගේ; ප්‍රවෙශ, ඇතුළුවීම; ප්‍රතික්‍ෂෙපක, වළක්වන ප්‍රතිහාරි ධුරන්ධර, දොරටු පාලිකාධුරය දරන්නාවූ. **සර්වබොධිසත්ත්වා'නුජාත වූ**= සියලු බෝසතුන්ට අනුව උපන්නා වූ. **ආත්මවිතීය**= තමා දෙවනු කොට. **සර්ව ගුණ පවිත්‍ර චිත්‍ර නිෂ්පාදනෛ'කා සුවර්ණතූලිකා 'යමාන**= සර්වගුණ, සියල් ගුණ නැමැති; පවිත්‍ර චිත්‍ර, පිරිසිදු සිතියම්; නිෂ්පාදන, නිපදවීමෙහි; එක, අසහාය වූ; සුවර්ණතූලිකා 'යමාන, රන් තෙලිකූරක් වැනි වූ.

**විඥයන් විසින්**= පණ්ඩිතයන් විසින්. **සුදුසු ම නුසි**= සුදුසු ම නොවේ ද? 'නු' යනු ප්‍රශ්නාර්ථයෙහි හා 'සි' යනු වාක්‍යාවසානාර්ථයෙහි ද නිපාත සි. **නිපීඩ්‍ය ජාඩ්‍ය නිගඩ බන්ධ විච්ඡෙදන**= නිපීඩ්‍ය, සත්ත්වයාට නිශ්ශෙෂයෙන් පීඩා දායක වූ; ජාඩ්‍ය, ජඩ

(–අඥත) බැව් නැමැති; නිගඩබන්ධ, විලංගු බැම්ම; විච්ඡේදන, සිඳීමෙහි. **විද්‍යාබද්ධ කක්ෂ වූ=** ප්‍රඥාවෙන් බඳනා ලද උද්‍යොග ඇති. නොහොත්, ආදර සහිත වූ. **සකල බුද්ධකාරක ධර්ම ධූර්‍ය වූ=** සියලු පාරමී ධර්මයන්ගේ ධුරය ධරන්නා වූ. **දිවස භාගස භා=** දවල්කාලය සමග. **අභිනාභාවී වූ=** වෙන් නොවන සුළු වූ. **ශී=** වැටී.

**අක්‍රම විධායී=** අන්‍යායයෙන් පවත්නා වූ. **මානාති'ක්‍රාන්ත=** පමණ ඉක්මෙව්වා වූ. **නක්‍ර චක්‍රාකූල වූ=** මෝර සමූහයාගෙන් ගැවසුනා වූ. **සාගරකුක්ෂිසෙහි=** සයුර තුළ. **පඤ්චවර්ණ පද්ම ෂෙන්=** උත්පලය, පදුමය, පුණ්ඩරීක, රාජීව, ශතපත්‍ර, යන පඤ්ච විධ පද්මයෙන්. **ශෙදික් විලෙසා=**ගෘහදීර්ඝිකාවක. මේ ගෙය අසල තිබෙන ජලාශයකි. **ප්‍රඥාවිරොධ නිරොධ නිෂ්ප්‍රත්‍යූහ ප්‍රබොධ=** ප්‍රඥාවිරොධ, ප්‍රඥාවට විරුඬ වූ ධර්මයන්ගේ; නිරොධ, වැළැක්මෙහි; නිෂ්ප්‍රත්‍යූහ ප්‍රබොධ, විනාශ රහිත වූ ප්‍රබොධ ඇති; නොහොත් ප්‍රඥා අවිරොධ, ප්‍රඥාවට අවිරුඬ වූ; නිරොධ, නිර්වාණය ලැබීමෙහි; නිෂ්ප්‍රත්‍යූහ ප්‍රබොධ, උපද්‍රව රහිත වූ පිබිදීම් ඇති.

(41) සිට.

**සර්වගුණවත්=** සියලු ගුණ ඇති. **සකල සාධු ජනකාන්ත වූ=** සියලු සත්පුරුෂයන්ට මනොඥ වූ. **ක්ෂාන්ති=** ඉවසිම. **සුකුමාල වූ=** සියුමැලි වූ. **තීක්ෂ්ණ වූ ධාරා ඇති=** තියුණු වූ මුවහත් ඇති. **අශ්‍රාන්ත මෛත්‍රීධාරාෂෙන්=** නොනවතින (=විඩා නොවූ) මෙත් දියදහරින්. **ආර්ද්‍ර වූ=** තෙත් වූ. **නෙත්‍රොත්පලපත්‍ර=** නෙත් නැමැති උපුල්පත්. **චතුරාර්‍ය්‍යසත්‍ය ප්‍රතිවෙධයට=** දුඃඛ, සමුදය, නිරොධ, මාර්ගස්ත ආර්‍ය්‍ය සත්‍ය සතර අවබොධ කිරීමට. **මහා කාරණ වූ=** උතුම් කරුණක් වූ. **සත්ගුණා'විරොධ නිත්‍ය වූ=** යහපත් ගුණවලට නිතර ම විරුඬ නැති හෙවත් සත්ගුණයන්ට අවිරුඬ බව නිතර ම ඇති.

**ප්‍රතිඥාව=** පොරොන්දුව. **සකල බොධි පාක්ෂික ධර්මා ධිෂ්ඨාන වූ=** සියලු බොධිපාක්ෂිය ධර්මයන්ට කරුණු වූ. **සකල ලොකදුඃඛව්‍යුපසමණෙහි=** සියලු ලොකයාගේ දුක් සංසිඳුවී මෙහි. **ඒකාදීක්ෂිත වූ=** අසහාය යාගයක් බඳුවූ. **සර්වතථාගත මනොරථ නිෂ්ඨා නිර්දිෂ්ට=** සියලු තථාගතයන්ගේ ප්‍රාර්ථනා වෙහි අවසානය දක්වන ලද. **පරාක්‍රම අඛණ්ඩතොටැ=** වීර්‍ය්‍යය නොකඩා.

### (42) පිට.

**දූර්භිශවිසාරයක්=** පසිඳුරන්ගේ විජයඝෝෂයක්. **සමස්ත බුඩාඞ්කුරෙ'සාමිත්‍ර වූ=** සියලු බෝසතුන්ගේ අසහාය මිතුරෙක් බඳු වූ. **සකල මහාසත්ත්වමනොරථ නිෂ්පාදනෛ'ක චරිත්‍ර පවිත්‍ර වූ=** සියලු බෝසතුන්ගේ අදහස් නිපදවන එක ම සිරිතින් පිරිසිදු වූ. **නිජනෙත්‍රනිර්විශෙෂකොට=** තමාගේ ඇස හා වෙන සක් නො කොට (=එකසමාන කොට). **අසාධාරණො'ත්සාහයෙන්=** අසමාන වූ වෑයමින්. **ය සාල්ලෙහි=** යකඬ සාල්ලෙහි.

**සකලබුඩසිංහ සමන්ත චක්ෂුඃ ප්‍රතිලාභයට=** සියලු බුඩ ශ්‍රෙෂ්ඨයන්ගේ සමතැස් ලැබීමට. මෙහි සමන්තචක්ෂුඃ (=සමතැස්) නම් සියල්ල දක්නා නුවණ යි. **නිරපෙක්ෂෛ'කකාරණාවූ** බලාපොරොත්තු රහිත බව එක ම කාරුණු කොට ඇති. **බොල්කොල=** ඝන කොල. **උත්කලිතොත්කලිත=** අතිශයින් ගැට ගැසුනා වූ. **භවකල්මෂ=** සංසාර කිළුටින්. **දූලිබිබි ලාසිකා=** මිත්‍යාදෘෂ්ටි නැමැති නාටිකාවන්. **සුචරිත්‍රා'දුර්ලලිත=** සුචරිත කාරණකොට ගෙණ සුන්දර වූ. **අනුමාගීණීය වූ=** සෙවිය යුතු වූ. **ස්විකරණීය=** ප්‍රතිග්‍රහණයකට යුතු. **සම්බොධි සංසිඩි සිඩානො'පදෙශ=** බුඩත්වය සිඩවීමෙහි සිඩාන්ත වූ. **සමාචාශ්‍රීසථානීය වූ=** යහපත් ඇදුරු තැන්හි සිටි. **අනුලොමයෙන්=** මුල සිට අග තෙක් බැලීම අනුලොම නම්. **ප්‍රතිලොමයෙන්=** අග සිට මුල තෙක් බැලීම ප්‍රතිලොම නම්.

**ප්‍රත්‍යවෙක්ෂා කරන්නා වූ=** නුවණින් සලකා බලන්නාවූ. **ධුරපැමිණෑ සිටි=** තනතුරු පත්ව සිටියා වූ. **නිරූ'පදෙශයෙන්=** මෙරමා උවදෙසක් නැතිව.

### (43) පිට.

**ඝන බහල=** ඝන සඞ්ඛ්‍යාත බොළ බැව් ඇති. **ගුගුරන්නට=** ගජිනා කරන්නට. **පටනය=** ආරම්භය යි. **අනූ'පමබොධි සත්ත්ව ගුණ සඤ්ශිනයෙන්=** උපමා රහිත වූ බෝසත් ගුණ දැකීමෙන්. **මෙරුපර්වතය=** මහමෙර. **යූනයක්හු සේ=** තරුණයකු මෙන්. **සප්තකුලාචලයන් හා=** සප්තකුට පර්වතයන් සමග. මෙහි, "සප්තකුලාචලබහිර කුලය හා එක්ව' යනුදු පාඨයි. සත්කුල පව්, බහිර නම් පව් හා සමග යනු අර්ථ යි. **අනවස්ථිත ව=** නො නැවතී.

**ලොකො'ත්සව=** ලොකයාට ප්‍රීතිදායක කාරුණු. **සකල නරා'මර බ්‍රහ්මගණයා විසින්=** සියලු මිනිස් දෙව් බඹ සමූහයා විසින්. **ස්තුති ගීති පූර්වාඞ්ගම කොට=** තුති ගී පෙරටු කොට.

**ව්‍යාකරණ ප්‍රතිලාභයෙන්**= විවරණ ලැබීමෙන්. **ශ්වෙතපද්මවන ෂෙකින්**= සුදු නෙලුම් වනයකින්. **පියාසැහැර**= පියාපත් ගසා. **ධෘතරාෂ්ට්‍ර**= එනම් හංසකුලයෙහිවූ. **පුෂ්පා'සනයෙන්**= මලසුනෙන්. **ෂඩභිඥවූ**= සවැදෑරුම් අභිඥ ඇත්තා වූ. දිව්‍යංචක්‍ෂුර'භිඥනය, දිව්‍යශ්‍රොත්‍රඥනය, පූර්වෙනිවාසා'නුස්මෘතිඥනය, පර චිත්ත විජානනඥනය, ඍඬිවිධඥනය, ආශ්‍රවක්‍ෂයකරඥනය යන මොවුහු ෂඩභිඥවෝ යි.

**සමන්තභද්‍ර වූ**= සියල්ලෙන් උතුම් වූ. නොහොත් හාත්පසින් යහපත් වූ. **දීපඩ්කරපාදමූලයෙහි**= දීපඩ්කර සර්‍වඥයන් වහන්සේගේ පා මුලැ. **සර්‍වමඞ්ගලෛ'කනිදාන වූ**= සියලු මඞ්ගලයන්ට එක ම මූලකාරණයක් වූ. **අභිමතසම්පත්ති**= කැමැතිවන ලද සැපත්. **ඵලවන්නාවූ**= පමුණුවන, ගෙණ දෙන. **අනූපම**= උපමා නැති. **ආදිමධ්‍යාන්තකල්‍යාණ වූ**= මුල මැද අග යහපත් වූ. **ගම්භීරසිම්සාරා'කර වූ**= ගැඹුරු ගුණයෙන් සමුද්‍රය වැනි වූ.

**විශ්වලොක ප්‍රියඞ්කර වූ**= සියලු ලොකයාට ප්‍රිය උපදවන්නාවූ. **දීපඞ්කර ශ්‍රීඝන**= දිවකුරුබුදුන්ගේ. **ශ්‍රීපාදමූල ප්‍රතිලබ්ධ**= සිරි පා මුල දී පිළි ලැබූ. **පූරණා'භිප්‍රායයෙන්**= පුරණ අදහසින්. **දුස්තර**= තරණය කිරීමට දුෂ්කර වූ. එතරවිය නොහැකි වූ. **සංසාරසාගරා'වතීර්ණවූ**= සසර සයුරට බැස. **සකීය විචිත්‍ර පවිත්‍ර චරිත්‍ර සම්බන්ධයෙන්**= සිය විසිතුරු පිරිසිදු හැසුරුම් පිළිබඳව. **ත්‍රිභුවන පාවනය කොරමින්**= තුන්ලොව ශුඬ කරමින්. **භව**= ත්‍රිවිධ භවය. **යොනි**= චතුර්විධ යොනිය. **ගති**= පඤ්චවිධ ගතිය. **විඥනස්ථිති**= සප්තවිඥනස්ථිති. **සත්වාවාසයෙහි**= නව සත්වාවාසයෙහි. මොවුන් පිළිබඳ විස්තර ග්‍රන්ථාන්තරයෙන් ඥතව්‍ය යි.

**(44) පිට.**

**කාරුණ්‍යව්‍රතපරිණතභාවයෙන්**= කුළුණුව්‍රතය (=වත) පිළිබඳ මුහුකළ භාවයෙන්. **ලොකාර්ථ පාණ්ඩිත්‍යයෙන්**= ලොවට අර්ථ සිඬිකර වූ නුවණින්. **විවිධා'ශයශ්‍රී සාභිත්‍යයෙන්**= නානාප්‍රකාර ආශයශ්‍රීයන්ගේ යුක්ත භාවයෙන්. **අඥන රාහිත්‍යයෙන්**= නුනුවණ රහිත බැවින්. **බොධිපාක්‍ෂිකධර්ම සාඞ්ගත්‍යයෙන්**= සතර සතිපඨානාදි සත්තිස් බොධිපාක්‍ෂිකධර්මයන්ගේ එකී භාවයෙන්. **ලොකොත්සව ප්‍රසවය**= ලොකයාට ප්‍රීති පහළ කිරීම. **සර්වඥ'ලොක විරහයෙන්**= බුඬා'ලොකයක් නො මැත්තෙන්. **එකා'න්ධකාරවූ**= අතිශයින් අඳුරුවූ. **ජගත්හි**= ලොකයෙහි.

**සර්වසත්ත්වයන්ගේ**= සියලු සතුන්ගේ. **අනල්පසඞ්කල්පසිද්ධිකාරණවූ**= නොයෙක් චිත්ත ප්‍රාර්ථනාවන්ගේ සිඞියට කරුණුවූ. **අලෞකසාමාන්‍ය** වූ= ලෞක සාමාන්‍ය නොවූ. ලෞකය හා අසාධාරණවූ. **සර්වසම්භාව්‍යවූ**= සියල්ලන් විසින් සම්භාවනා (=බුහුමන්) කටයුතු වූ. **නිරතා'තිශය ප්‍රාධාන්‍යධන්‍යතා සම්බන්ධ**= නිරත, නියුක්තවූ, ප්‍රාධාන්‍ය, ප්‍රධාන බැව් හා; ධන්‍යතා සම්බන්ධ, භාග්‍යතා පිළිබඳව. **බන්ධුර** වූ= මනොඥ වූ. **පරමසෞජන සම්භාවිත** වූ= උතුම් සුදනන් විසින් බුහුමන් කරණ ලද්ද වූ.

**දෞර්මනස්‍ය සම්බන්ධයෙන්**= දෞර්මනස් පිළිබඳව. **අකලුෂිත** වූ= කිළිටි නො වූ. **රුචිරා'මර චාමර ග්‍රාහිණී**= මනොඥ වූ දිව්‍ය චාමරයන් ගත් අත් ඇත්තියන්ගේ. **විභ්‍රම**= ලීලායෙන්. **විභූෂිත** වූ= අලංකෘත වූ. **සමස්තා'භිෂ්ට වස්තුසාඞගත්‍යයෙන්**= සියලු අභිමත වස්තූන්ගේ එක්විමෙන්. **පරමරම්‍ය**වූ= අතිශයින් රමණීය වූ. **සකලා'ද්භූත ප්‍රසූති නන්ද** වූ= සියලු ආශ්චර්‍ය්‍යයන්ගේ පහළවීමෙන් සතුටු වූ. **අතිවිශිෂ්ට සම්පත් සමෘද්ධීන්**= ඉතා උසස් සම්පත්ති සමෘඞි හෙතුකොට ගෙණ. **සර්වලෝකපූජිත** වූ= සියලු ලොකයා විසින් පුදනලද්ද වූ. 'රාජවංශයෙහි' යන්නට විශෙෂණ යි. **සර්වා'ද්භූතප්‍රසවය**= සියලු ආශ්චර්‍ය්‍යයන්ගේ පහළවීම. **නවයුවති**= අභිනව තරුණියන්ගේ. **නයනාඤ්ජලිකා**= නෙත් නැමැති ඔඩමින්. **නිපෙය**= පානය කටයුතු වූ (ගිජුලෙස බැලිය යුතුවූ යන අර්ථයි). **යෞවනශ්‍රී මදිරායෙන්**= යොවුන් සිරි නැමැති සුරාවෙන්. **ජනනයන මොහොනය කාරණ අවස්ථායෙහි**= ජනයන්ගේ ඇස් මුළාකරණ විට.

**ශාරදචන්ද්‍රකාන්තින් සුන්දර** වූ= සරාසඳ කැලුම් සේ මනොඥවූ. **නිජදෙහ රුචිර ඇති**= ස්වකීය ශරීර ශොභා ඇත්තා වූ. **සකලලෝක විදිත** වූ= සියලු ලොකයා විසින් දන්නා ලද්ද වූ. **සුධාවාස මහා බ්‍රහ්මොපශ්ලෝකිත**= 'සුධාවාස' නම් බඹ ලෝ වැසි මහබඹහු විසින් එළවන ලද්ද වූ. **උද්විග්නවැ**= තැති ගැනී. **ප්‍රව්‍රජ්‍යායෙහි සාභිලාෂවැ**= මහණවීමෙහි ආශා ඇතිව. **සුරේ'න්ද්‍ර සමාන** වූ= ශක්‍රයා වැනි. **ආඪ්‍ය ජනයා විසින්**= ඉසුරුමත් දනා විසින්. **ආකීර්ණ** වූ= ගැවසීගන්නා ලද්ද වූ. **චාරුබිම්බාධර** වූ= මනොඥ සිරුරක් දරන්නී වූ.

**ගණයා හැර**= සමූහයාගෙන් වෙන්ව. **ආජීවකයා**= ශාසනයෙන් බාහිර ශ්‍රමණයෙක්. **සකල ලෝක කල්‍යාණ** වූ= සියලු ලොවට යහපත් වූ. **සාල කල්‍යාණ වෘක්ෂ මූලයෙහි**= මඟුල් සල්

රුක් මූල. **චතුරඞ්ග වීර්‍ය්‍යාධිෂ්ඨාන**= සතරඟකින් යුත් වීර්‍ය්‍යය ඉපීම. චතුරඞ්ගය නම්:- සම්, මස්, නහර, ඇට, යන මොව්හු වියලීම දක්වා වැර වැඩීම සි. **මාරා'හඞ්කාර නිහාර**= මරුන්ගේ දර්ප නැමැති පිනිබිඳු. **සංහාර**= නැසිමෙහි. **දිවාකරවූ**= සූර්‍ය්‍යයකු වැනිව. **ප්‍රත්‍යූෂකාලයෙහි**= අලුයම. **සමධිගත**= අවබොධකරණ ලද. **ග්‍රාම නිගම රාජධානිසෙහි**= ගම්, නියම් ගම් රජදහන්හි. කුඩාගම් 'ග්‍රාම' නම්. මහගම් 'නිගම' නම්. රජුන් සිටින නගර 'රාජධානි' නම් වෙත්.

## (45) පිට.

**ධර්මා'නුවර්ත්ති වූ**= ධර්මය අනුව පවත්නා වූ. **විනයා'නුවර්ත්ති වූ**= විනය අනුව පවත්නා වූ. **නභො'දිත**= අහස්හි පහළ වූ. **චන්ද්‍ර මණ්ඩලා'භිමුඛවූ**= සඳමඩල දෙසට හැරී. **පියූෂපාන රසික වූ**= සඳරැස් බොනු කැමැති වූ. **චකොර සාබකයක්හු සේ**= ඇටිකුළු පැටවකු මෙන්. **බුද්ධ ප්‍රමුඛ**= බුදුන් ප්‍රධාන කොට ඇති. **ආහාර විහාරයෙන්**= ආහාරයෙන් හා සෙනසුනින්. **අස්ථිර වූ**= නො නහවුරු වූ. **නි'රභිලාෂවූ**= ආශා නැතිව. **පිටකත්‍රය**= තුන් පිටකය සූත්‍ර, අභිධර්ම, විනය සි යූ තුණය.

**ජීවිත පර්‍ය්‍යවසානයෙහි**= දිවි කෙළවර. **සප්තරත්න සමලඞ්කෘත**= චක්‍රරත්නය, හස්ති රත්නය, අශ්වරත්නය, මාණික්‍ය රත්නය, පුත්‍ර රත්නය, ගෘහපති රත්නය, ස්ත්‍රී රත්නය, යන රත්න සතින් ශොභිත වූ. **සතර සමෘද්ධියකින්**= උතුම් රූප සෞන්දර්‍ය්‍යය, දිගාසිරිවිඳීම, නිරෝගීවීම, ප්‍රියවීම යන සතර සමෘද්ධියෙන්. **නානාවිධ**= නානා ප්‍රකාර වූ. **ශව ශත නිචිත වූ**= සිය ගණන් මිනියෙන් රාශිභූත වූ. **ස්වයම්භූ ඥානයෙන්**= තමාගේ ම නුවණින්. **පසක් කළා වූ**= අවබොධකර ගත්තා වූ. **අසබල දසබල ගුණ ෂණ්ඩමණ්ඩිත**= අසබල, සබලනු වූ; හෙවත් තැනින් තැන කැලැල් නැති; දසබල ගුණ සණ්ඩ' දසබල ගුණ ගහණ යෙන්; මණ්ඩිත' සැරසුනා වූ. ගෝමර ඉසුනාක් මෙන් තන්හි තන්හි කැලැල් ඇතිබව සබල නම්. බුදුරජානන් වහන්සේගේ දසබල ගුණයෙහි එබඳු කැලැල් නැත් නාහ. 'අසබල දසබල ගුණ ෂණ්ඩ මණ්ඩිත' සි කියේ එහෙයිනි.

**ශ්‍රීඝන ශාසනා'න්තර්ධානයෙහි**= සර්වඥයන් වහන්සේගේ ශාසනය අතුරු දහන් වීමෙහි දී. **ශ්‍රීඝන ඝනා'ඝන**= සර්වඥ නැමැති සාන්ද්‍ර වලාහකයා (-ඝනවලාකුළ) විසින්. **ප්‍රවචනා'මෘත**

**ධාරා'භිෂෙකයෙන්**= කෙවලා දහම් නැමැති අමාදහර ඉසීමෙන්. **ලොකනිර්වෘතික්**= ලොව නිවීමක්. **පරමදුඃඛා'ක්‍රාන්ත** වූ= අති ශය දුකින් මඩනා ලද.

## (46) පිට.

**සවර්ගා'පවර්ගමාර්ග රාසා'නභිඥතාවැ**= සවර්ගමාර්ගයෙහි හා නිර්වාණ මාර්ගයෙහි රසක් නොදන්නෝව. සගමොක් මං නො දැන. **නිර්විකල්ප**= විකල්ප රහිත වූ. හෙවත් අනියම් බවක් නැති. **ධර්මසඞ්කල්පනිරන්තර** වූ= සද්ධර්ම සංකල්පනාවලින් ව්‍යවධාන රහිත වූ. නිතර ම සද්ධර්මසඞ්කල්පනා පැවැති. **එක්කල්පාන්තර යෙක්හි**= එක් අන්‍යතර කපක් තුළ.

**ආවිර්භාවිත**= පහළ කරණ ලද. **විශවලොකෛ'කමඞ්ගල** වූ= මුළුලොවට අසහාය මඟුල් ඇති. **සවදෙශනා**= සවකීය ධර්ම දෙශනා නැමැති. **වසන්ත ශ්‍රී සමපාත**= වසන්ත ශොභා හෙළී මෙන්. **විකසිත**= පුබුදුවන ලද. **කෘතාධිකාර සුමනසුන්**= කළ පින් ඇති සත්ත්වයන් නැමැති පුෂ්පයන්. **ධර්මාමෘත රසා'සවාද සුමනස්** වූ= ධර්ම නැමැති අමෘතරසය ආසවාදනය කිරීමෙන් සොම්නස් වූ.

**නිජා'ද්භූත විශෙෂ**= සවකීය ආශචර්‍ය්‍ය විශෙෂයන්ගෙන්. **විරජිත**= බබුලුවන ලද. **වසුන්ධරාමණ්ඩලඇති**= පොළෝ තලය ඇත්තා වූ. **නිර්ව්‍යාජ**= කපට බැව් රහිත වූ. **ධර්මරාජ ලක්ෂ්මී ශොභිත** වූ= සද්ධර්මරාජශ්‍රියෙන් හොබනා ලද. **නිරස්ත**= පහරණ ලද. **සමස්තා'මඞ්ගල** වූ= සියලු අවමඟුල් ඇති. **විවිධ මණි මරීචි රුචිර**= නානා මාණික්‍ය කාන්තියෙන් මනොඥ වූ., **තුෂිත පුර වරාධි'රූඪවූ**= තුසී පුරවරයට පැමිණ. **ශ්‍රී වළඳා**= සම්පත් අනු භව කොට.

**තුෂිත කායයෙන්**= තුෂිතා'ත්මභාවයෙන්. **ලොකො'ත්තර ගුණ ගුණා'භිරාම** වූ= ලොවුතුරා ගුණෙහි ඇලුනාවූ. **සෞභාග්‍ය ලක්ෂ්මීන්**= පුණ්‍යශ්‍රියෙන්. **ප්‍රසවශ්‍රියෙන්**= බිහිවීමෙන්. **සකල ලොකා'නන්දසන්දොහ නිදාන වූ**= මුළු ලොකයාගේ සන්තොෂ සමූහයට මූල කාරණව.

**පඤ්චෙ'න්ද්‍රිය බාල මධුකර**= පසිඳුරන් නැමැති තරුණ මී මැස්සන්. **සන්තර්පණ**= සතප්වීමෙහි. **එකමධුරසික**= අතුල්‍ය (=අසමාන) මී රසයක් වැනි. **පඤ්චකාමගුණ**= පස්කාම්ගුණයට.

**එකනිධාන වූ**= එකම නිධානයක් වැනි වූ. **ශීලවතී වූ**= සිල් ඇත්තාවූ. **රූපවතී වූ**= ශොභන රූපයක් ඇත්තාවූ. ගුණවතීවූ යනාදී යෙහිදු මේ නයින් අර්ථ දතයුතු.

**මදනදහනිර්වාපනයෙහි**= කාම දැවිල්ල නිවීමෙහි. **අභිනව කර්පූරහාරවැ**= කපුරු හරක්ව, කපුරින් කළ මල්දමක්ව. **ප්‍රිය ශීලිවූ**= ආදරවත්. **ශිල්වත් කුමාර මඤ්ජරී ග්‍රහණයෙන්**= සිල් වත් කුමරු නැමැති මල් පොකුර හටගැණීමෙන්. **යශස්වනී දෙවි ලතාව**= යශස්වතී දේවිය නැමැති මල්වැල. **සනාථවූ කල්හි**=ප්‍රමුතවීම් සඞ්ඛ්‍යාත පිහිට ලැබූ කල. **පූජිත**=පුදන ලද්ද වූ. ‘පාණ්ඩර නම් අශ්වරාජයා’ යන්නට විශෙෂණ සි. **ශරද්‍ර‍ භ්‍රපිණ්ඩ පාණ්ඩුර වූ**= සරත් වලාවක් මෙන් සුදු වූ.

(47) පිට.

**සකල ලොක**= මුළු ලොවට. **භාගධෙයෙ‘කවූ**= අතුල්‍ය පුණ්‍ය වස්තුවක් වූ. **බොධිසත්ත්ව රාග ක්‍ෂය කාර වූ**= බෝසතුන් ගේ රාගය ප්‍රහීණ කරන්නා වූ. මෙහි බෝසතුන්ගේ රාගක්‍ෂය කරන්නේ බෝරුකයැ යි නො සිතිය යුතුයි. බෝ රුක මුල වැඩ හිඳ බෝධිසත්ත්වයන් වහන්සේ රාගය ප්‍රහීණ කරණ හෙයින් උප චාර වශයෙන් මෙසේ කීහ. **විෂ්‍යන්දමාන ඝනපරාගධාරා සුරභි භූත වූ**= විෂ්‍යන්දමාන, වෙසෙසින් වහනය වන්නාවූ; ඝනපරාග ධාරා, අධික වූ රොන් දහරින්; සුරභිභූත වූ, සුවඳවත් වූ. කුසුම කලාප යන්නට විශෙෂණ සි.

**නිජ**= තමන්ගේ. **රූපලක්‍ෂ්මී**= රූපශ්‍රිය. **දිදෘක්‍ෂා**= දක්නා කැමැත්තෙන්. **උන්මීලිත**= ඇස් ඇරියා වූ. **මත්තමධුකර**= මත් බමරුන්ගේ. **ඣාඞ්කාරමණ්ඩල**= කළු ඉංගිරියාවෙන්. **උප ශොභිත**= හෙබියාවූ. **කුසුමකලාප**= මල් සමූහ ඇත්තාවූ. **වර**= කුරවූ. **නඛරප්‍රකර**= නිය රාශියෙන්. **ප්‍රතිම ප්‍රමථන**= ඇත්කුඹු මැඩීමෙහි. **දුර්වාර**= නොවැළැක් විය හැකිවූ. **කෙශරීකිශොරී**= තරුණ ‘කෙශර’ සිංහ යන්ගේ. (දශවර්ෂය පටන් පසළොස් වර්ෂය තෙක් වයස් ඇත්තන් ‘කිශොර’ ශබ්දයෙන් ගණිත්.) **හුංකාර ශ්‍රවණ**= හුං හුං යන නාදය ඇසීමෙන්. **කාතරීභූත**= බැගෑබවට පත් වූ. **කලභ කුල ලීලායෙන්**=ඇත් පොව්වන් සමූහයක් මෙන්. **මාරබල ප්‍රලය කොටැ**= මරසෙනඟ පලවා හැර.

**අරුණො‘දය සමධිගත**= අලුයම් වේලෙහි අවබොධකරණ ලද්දු වූ. **විශවඥෙයමණ්ඩල ප්‍රතිච්ඡාදක**= සියලු “ඥෙයමණ්ඩ

ලය" ප්‍රතිච්ඡාදනය කරන්නා වූ (=වසන්නාවූ). **මොහඝනතම විඝාතය කොටැ**= මොහරාශිය නසා. **බොධිසත්ත්ව භූමියෙහි දී**= බෝසත් කාලේ දී. **මූලපලා අලයක්**= රාබු අලයක්.

**විරූඪාපි රන්රසයෙන්**= උණු කළ රත්රන් දියෙන්. **තූත් තක්**= කෝවයක්. **බුඩශ්‍රීවෛචිත්‍ර්‍යයට**= බුද්ධ ශ්‍රීයගේ විචිත්‍ර භාවයට. **චිත්‍රපට**= සිතුවම් පටක්. **ලොකාර්ථසම්පාදන ව්‍යාවෘතවැ**= ලොවට වැඩ සැපයීමෙහි යෙදී. 'ව්‍යග්‍රවැ' යන පාඨයෙහි ආශකතාව යනු අර්ථයි. **කෘතඅධිෂ්ඨානයට**= කරනලද ස්ථිර අදහසට. **හළ**= අත්හරින ලද. **ආත්මප්‍රෙමයට**= ආත්මය (=තමා) පිළිබඳ ආදරයට. **එකචිත්තොත්පාදමාත්‍රයක්**= එකසිතක් පහළ වීම් පමණ. **කාලුදු**= කාලයකුත්.

**විරොධයක්**= විරුඬත්වයක්. **බොධිසම්භාරධර්මාර්ජනයෙහි**= පෙරුම් දම් රැස් කිරිමෙහි. **තත්පරවැ**= යෙදී. **බ්‍රාහ්මණ ග්‍රාමයෙක්හි**= බමුණුගමක. **සඬර්මෛකාරුචිවූ**= සඬර්මය ම අ,තුල්‍යයෙන් කැමැතිවූ. **බ්‍රාහ්මණොත්තමයෙක්වැ**= උතුම් බමුණෙක්ව. **සුගන්ධසම්බන්ධ**= සුවඳ පිළිබඳ. **බන්ධුර**= මනොඥ වූ. **පදෙමාදර නිපාත ශිලිවැ**= පියුම් ගැබට පැමිණෙන අභිප්‍රාය ඇතිව. **භෘඞ්ගයක්හුසේ**= බමරෙකු මෙන්.

## (48) පිට.

**සඬර්මරසලොලවැ**= දහම් රසයෙහි ලොල්ව. **මඞ්ගල සර්වඥ චන්ද්‍රමණ්ඩලයෙන්**= මඞ්ගල බුදුන් නැමැති සඳ මඬුල්ලෙන්. **වැහෙන්නාවූ**= වැස්සෙන්නා වූ. **චන්ද්‍රකාන්තිය**= සඳරැස්. **හෙත් හෙත්**= වැටෙද්දී. **චන්ද්‍රකාන්තපාෂාණයක්සේ**= සඳකැත් ගලක් මෙන්. **ද්‍රවකොරෙමින්**= දිය කරමින්. **මඞ්ගල සර්වඥ දිවාකරයාගේ**= මඞ්ගල සම්බුඩ නැමැති සූය්‍ර්‍යයාගේ. **නානාරස මධුර**= නොයෙක් රසින් මිහිරිවූ. **වචනකරනිකර ස්පර්ශයෙන්**= වචන නැමැති රශ්මි සමූහයාගේ පහසින්. **විකාරයට පමුණුවමින්**= ප්‍රබොධ කොරෙමින්.

**විකසිත**= පිපියා වූ. **දසබල මඞ්ගල කමලොදරයෙහි**= සර්වඥ නැමැති සුන්දරවූ පද්මගර්භයෙහි. **නිරන්තර සම්පූර්ණවූ**= අතර නැතිව යහපත්ව පිරුණා වූ. **ධර්ම මකරන්ද සන්දොහයට**= ධර්ම නැමැති රොන් සමූහයට. **තමන්**= තමන්ගේ. **ශ්‍රවණමත්ත භ්‍රමර විභ්‍රමයෙන්**= කන් නැමැති මත් බඹර කෙළියෙන්. **යොමු කොරෙමින්**= අභිමුඛ කොරෙමින්. **කොළලක්ෂයක්**= කොටිලක්ෂයක්. **සම්පත්තිය අධික හෙයින්**= සම්පත් වැඩි නිසා.

**ස්වර්ණකාන්තිය**= රන්වන් රශ්මිය. **වැජඹෑ**= විජාම්භමානව. **ගොනකය**= කොළබෝගෙහි වළල්ල. **ජේකාධය**= ' කණු මුදුන්හි සවිකළ කැටයම් ලෑල්ල. **දූවකාඩය**=දූව කෙළවර. **විලම්බමානවූ**= එල්බෙන්නාවූ. **කුසුමදාම**= මල්දම්. **කිංකිණිකජාලා**= කිකිණිදැල්. ගෙජ්ජිවැල්. **සමාකුලවූ**= ගැවසීගත්තා වූ. **සප්තරත්නමය ආසනයෙන්**= සත්රුවනින් නිම වූ අස්නෙන්. **ජලස්කන්ධය**= දියරැස. **හයන්නාසේ**=එකතු කරන්නාක් මෙන්. **චතුමධුරයෙන්**= ගිතෙල්, මීපැණි, උක්සකුරු, වෙඬරු යන සිවු මිහිරෙන්. **තුන්සිවුරු**= 'අන්තර වාසකය (-හඳනය), උත්තරාසඞ්ගය (-තනිපටසිවුර), සඞ්ඝාටිය (-දෙපටසිවුර) යන මොව්හු 'තුන්සිවුරු'නම්. **මාහැඟිකම්**= බොහෝ වටනා බැව්. **මෙහි පෙලෙන්**= මෙහි විපාකානිසංසයෙන්.

## (49) පිට.

**උදග්ගජ්ඣාසය**= උසස් අදහස. **නිබද්ධවූ**= බඳනා ලද්දා වූ. **මහො'ත්සාහයෙන්**= මහත් වූ වෑයමින්. **බුද්ධපාමොක්**= බුදුන් ප්‍රමුඛ. **සිවුපසයට**– ප්‍රත්‍ය සතරට. චීවර, පිණ්ඩපාත, සෙනාසන, ගිලානපච්චය යන සතර සි. **සතරබ්‍රහ්මවිහාර**= මෛත්‍රී, කරුණා මුදිතා, උපෙක්‍ෂා යනු 'සතර බ්‍රහ්මවිහාර'නමු. **සඳ**= අලංකාර කොට. **බ්‍රහ්මලොකය සඳ වඳුළ සෙයෙකා**= බඹලොව අලංකාර කළ සේක හෙවත් උපන් සේක. මෙ තුමන්ගේ උත්පත්තියෙන් බඹලොව අලංකාර වන හෙයින් මෙසේ කිහු. **මේසා**= මෙ පමණ. **අයත්නයෙන්**= උත්සාහයකින් තොරව. **ස්වශරීර ජ්‍යොත**= ස්වකීය ශරීර කාන්ති නැමැති. **සථිර**= තහවුරු වූ. **අචිරද්‍යොත**= හටගත් විදුලි ශොභායෙන්.

**විහතක**=විශෙෂයෙන් නසන ලද. **ලොකාන්ධකාර පටල**= ලොකය පිළිබඳ අඳුරු රාශි. **වර්ණ ප්‍රත්‍යාපත්ති**= වර්ණයන්ගේ පැමිණීම. **අතුරෙහි**= අතර. **එක් බුද්ධාන්තරයක්**= බුදුන් නැති එක් කල්පයක්. **ස්වශ්‍රීචරණ**= ස්වකීය පාදමූලයෙහි දී. **ස්වාභිලාෂ විරචිත**= සිය අදහසින් කරණ ලද. **විශ්වලොකා'ධිගමන**= සියලු ලොකයාගේ ධර්මා'වබොධය. **මතුපත්වූ**= සම්පූර්ණ කොට. **කාමා'වෙශ**= කාමයන් ගෙන් ආවිෂ්ටව. **විවශ**= ආත්ම වශිතාවය නැති, ස්වප්‍රධාන නො වූ. **ලලිත**= ලීලොපෙත වූ. **වනිතාවදන පද්මවන**= ස්ත්‍රීන්ගේ මුඛ නැමැති පියුම් වනයට. **අන්තයෙහි**= කෙළවර. **තුෂිතකායයෙන්**= තුෂිතාත්මභාවයෙන්.

(50) පිට.

**අක්ෂීණ විත්තවූ**= ක්ෂය නොවූ ධන ඇති. **සුවිනීත චිත්තවූ**= අතිශයින් හික්මුනු සිත් ඇති. **අක්ෂීණවූ යෞවන ශ්‍රී ඇති**= නො වැරුණු තරුණ ශොභා ඇති. **දශමාසාන්ත්‍යයෙහි**= දසමස් කෙළවර. **සඳා**= අලංකාර කොට. සද (සැදීමෙහි) දයින් 'ආ' පස යෙදී නිපන් පෙරකිරියෙකි. **විදග්ධ**= දක්ෂවූ. **මුග්ධ**= මනොඥ වූ. **සරස**= පඤ්ච රස සහිත. **මධුරකටාක්ෂනික්ෂෙපයට**= මිහිරි වූ යටැස් බැලුම් හෙළීමට. **එකපාත්‍රවූ**= අසහාය භාජනව.

**ඡන්දො'පවනො'පගමන**= සතුටු එලවන උද්‍යානයට පැමිණ. **ස්වෛර වාරි විහාර**= සිය අදහස් පරිදි දිය කෙළියෙන් හා. **සඞ්ගීතප්‍රසඞ්ගාදි**= සංගීතයෙහි යෙදීම් ආදි වූ. **විවිධානුභාව විශෙෂයෙන්**= නානා ප්‍රකාර ප්‍රභා සමූහයෙන්. **සකලයුවතිජනාවතංසවූ**= සියලු තරුණියන් හට මුදුන්මල්කඩක් වැනි වූ. **සෞන්දර්‍ය්‍ය සාගරයෙන්**= සුන්දරභාව සමූහයෙන්. **කුමාර රත්නය**= කුමාර සඞ්ඛ්‍යාත රත්නය. **චතුෂ්ටය නිමිත්ත සන්දර්ශනයෙන්**= ජරා, ව්‍යාධි, මෘත, ප්‍රව්‍රජ්‍යා යන සතර නිමිති දැකීමෙන්.

**විචිත්‍ර**= විසිතුරු. **සජ්ජාවිශෙෂ**= සැරසීම් වෙසෙසුනින්. **බන්ධුර**= මනොඥ. **සින්ධුර වරාධිරූඪවූ**= අශ්වරාජයා පිටට නැඟී. **විශ්වවිභවා'නවම වූ**= සියලු සම්පත්තියෙන් අප්‍රමාණවූ. **විතොපම වූ**= දුරුකරණලද උපමා ඇත්තාවූ. හෙවත් උපමා රහිත වූ. **මන්දමන්ථරනාගවිභ්‍රමයෙන්**= අතිශයින් මඳව යන හස්ති ගමනින්. **චතුරඞ්ග වීර්‍ය්‍යය**= සිවු අඟින් යුත් වීර්‍ය්‍යය. **මාර සෙනාභිමාන**= මරසෙනඟගේ අධික වූ මානය. **මර්දන**= මැඩීමෙන්. **ප්‍රඛ්‍යාත**= විශෙෂයෙන් පැතුරුණු. **කීර්ත්තිපිණ්ඩ**= යසස් පිඬ කරණ කොටගෙණ. **පාණ්ඩුරිත**= සුදු වන්නා වූ. **භුවනාභොග ඇතිවූ**= ලොක කුක්ෂි ඇතිව.

**බ්‍රහ්ම මුහුර්ත්ත**= බ්‍රහ්මමුහුර්තය යි කියන ලද. **ප්‍රාදුර්භාවසමය**= පහළවීමට යොග්‍ය කාලයෙහි. **ආවිර්භූත**= ප්‍රකට වූ. **බ්‍රහ්මාතිබ්‍රහ්මභාව**= බ්‍රහ්මයන්ටත් උතුම් බ්‍රහ්මභාවය. **විභාවිත**= ප්‍රකාශ කරණ ලද. **සර්වඥවිලාස ඇතිවූ**= සර්වඥලීලා ඇතිව. **සකලජගදානන්ද**= සියලු ලොකයා සතුටු කිරීම. **කන්කන්හි**= කණක් පාසා. පදවීප්සාව යි. **නිජවාද නිහිත**= ස්වකීය වචනයෙන් පිහිටුවාගන්නා ලද. **සමත්‍රිංශත් පාරමිතා**= සමතිස් පෙරුම්. **පූරණාශායෙන්**= පුරණු කැමැත්තෙන්. **විවශවූ**= ලහිව.

**අශූන්‍යවැ**= ගිස් නො වී. **බැහැවි**= අභ්‍යාසව, පුරුදුව්. **ස්මරණීය**= සිහිකටයුතු. **රමණීය**= සිත්කළු.

**(51) පිට.**

**භවයෙහි**= සංසාරයෙහි. **ප්‍රබල වූ**= අතිශයින් බලවත් වූ. **තුලනාතික්‍රාන්ත** = අන්‍යයන් හා සමභාවය ඉක්ම වූ. **අඥලෝක**= මුග්ධ (=මෝඩ) ලොකයාහට. **ප්‍රඥාලෝකදායක**= නුවණ නැමැති එලිය දෙන. **බුද්ධාලම්බන**= බුදුන් අරමුණු කොට ඇති වූ. **ප්‍රීති සන්තති**= සතුටු පරපුර. **ප්‍රාදුර්භාව**= පහළවීමෙන්. **නිර්භරිතාත්ම භාව ඇතිවැ**= බර වූ අත්බැව් ඇතිව. **කඩුපුල් මලින්**=නාගලොකයෙහි ඇති මල් වර්ගයක්. **කාලාගරු ධූපද්‍රව්‍ය**= කළු අගිල් නම් දුම්දෙන දේ. **කරණ්ඩක සන්තතින්**=කරඬු සමූහයෙන්. **නිරන්තර කෙරෙමින්**= ගවසමින්.

**දිව්‍යකර්පූර චන්දනාදි**=දිව කපුරු සඳුන් ආදි වූ. **සෞරභ්‍ය ප්‍රබන්ධ**= සුගන්ධ සමූහයෙන්. **බන්ධුරකෙරෙමින්**= මනොඥ කෙරෙමින්. **නාගවල්ලිදලයෙන්**= බුලත් පලු කැතින්. **භරිතවූ**= බර කරණ ලද්දවූ. **නානාප්‍රකාරවිතාන වින්‍යාසයෙන්**= නොයෙක් ආකාර වියන් බැඳීමෙන්. **සකලාකාශය**= මුළු අහස. **නිරවකාශ කරමින්**= ඉඩ නැති කරමින්. **මිණිදඬු වැටපහන්**= මැණික්මය පන්දම් එලිය. **පරිවාර නාගයන්ගේ**=පිරිවර නයින්ගේ. **කණ්ඨමණි ආලොකයෙන්**= ගෙලෙහි වූ මැණිකේ එලියෙන්.

**රුචිතරතර**= අතිශයින් මනොඥ වූ. **තාරකානිකර**= තරු සමූහය. **අවතීර්ණ**= බැස්සා වූ. **ගගනාඞ්ගණය සේ**=අහස් මලුව මෙන්. **මනොහර කෙරෙමින්**=සිත් පැහැර ගන්නක් කරමින්. **අමිත**= අප්‍රමාණ වූ. **වල්ලිත**= වැලෙහි බැඳීමෙන් හටගත්. **ආවලිත**= හටගත් රැළි ඇත්තාවූ. **කෞතුපතාකා**= සිවුරැස් කොඩි, තුනැස් කොඩි. **විජෘම්භණයෙන්**= බැබලීමෙන්. **සම්භූත**= හට ගත්. **නෙත්‍රොත්සව**= ඇසට සැනකෙළි. **රිස්සෙන්**= අදහසින්. **ධර්මාමෘතයෙහි**= දහම් නැමැති අමායෙහි. **කාන්ගලා**= කන් නමා. **රමණීය**= සිත්කලු වූ. **සර්වඥ ගුණානුස්මරණය**= බුදුගුණ සිහිකිරිම. **නිරවද්‍යවූ**= (නිර්-අවද්‍යවූ) වරද රහිත වූ. **වාද්‍යයෙන් හා**= තූර්යයෙන් ද.

**විවිධලයානුවර්තී**= නොයෙක් තාලයට අනුව පැවැති. **නෘත්‍යයෙන් හා**= නැටීමෙන් ද. **රසනිර්භරිත**= රසයෙන් බර වූ. **ගීතයෙන් හා**= ගී කිමෙන් ද. **සුහෘදය**= යහපත් සිත. **භරණ**=

පැහැර ගැන්මෙහි. **ප්‍රවීණ**= ප්‍රගුණ වූ. **චාරුවාණියෙන් හා**= මනොඥ ශබ්දයෙන් ද. **රසවිශෙෂ**= රස වෙසෙසින්. **නිරංශ**= පහ වූ කොටස් ඇති, හෙවත් එක් වූ. **වංශනාදයෙන් හා**= වස් කුලල් හඬින් ද. **ආවිර්භාවිත**= පහළ වූ. **හෘදයානන්ද**= සිත සතුටු කරන්නා වූ. **කාහල**= කරඬවනි ඇති. **මද්දල**=මිහිඟු බෙර හඬින්. **සංගීත විද්‍යාපයොගී**= සංගීත ශාස්ත්‍රයට අනුකූල වූ. **නිරුප දෙශයෙන්**= උපදෙස් රහිතව. **නවලොවුතුරාදහම්**= නවලොකොත්තර ධර්මය. **පසක්කටහෙම්වයි**= ලබම්ව යි. **සර්වඥාධිගම යම**= බුදුබව ලැබීම ම.

## (52) පිට.

**සිවුවණක් පිරිස්මැද**= භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සතර පිරිස මධ්‍යයෙහි. **දෘඪග්‍රහණය**= දැඩි කොට ගැන්ම. **නාගාත්මභාවයෙහි**= නා කුලයෙහි. **සර්වබුද්ධප්‍රත්‍යෙකබුද්ධ නිසෙවිතවූ**= සියලු සර්වඥ බුද්ධ, පසේබුදුන් විසින් සෙවුනාලද්ද වූ. **චිත්තශුද්ධිකාරණ වූ**= සිත පිරිසිදුවීමට කරුණු වූ. **ත්‍රෛලොක්‍යශිඛාමණි විලාස**= තුන්ලොවට සිළුමිණි ආකාරය. **පරිනිෂ්පන්න වූ**= හාත්පසින් සම්පූර්ණ වූ. **බුද්ධකෘත්‍ය**= බුදුන් විසින් කටයුතු වැඩ. **එක් බුද්ධාන්තරයක්**= එක් බුද්ධ කාලයක්. **සමත්‍රිංශත් පාරමිතාපූරණ**= සමතිස් පෙරුම් පිරුණා වූ. **ප්‍රාවිණ්‍ය**= ප්‍රගුණ භාවයෙන්. **ප්‍රතිලබ්ධ**= ලබන ලද. **ප්‍රඥා ප්‍රකර්ෂ**= ප්‍රඥාව පිළිබඳ උසස් බව. **ලොකාභිරත වූ**= ලොකාභිවෘද්ධියෙහි ඇලුනා වූ. **ලලිත**= ලීලොපෙත වූ. **අමිත**=අප්‍රමාණ වූ. **දෙවතා වනිතා**= දෙවඟනන්ගේ. **කටාක්ෂ**= ඇස් කොන් බැලුම් තැමැති. **ශූලකොටි**= හුල් කොණින්. **සමුන්මූලිත**= මුල් සිඳින ලද. **මාන බන්ධ**=මාන බැම්ම හෝ මාන සමූහය. **මධුපාන කෙලිරසිකාවූ**=මී බීමෙහි රස ඇතිව. **ස්ප්‍රෂ්ටව්‍ය**= පහස. **සම්‍යපෙක්ෂ**= බලාපොරොත්තු සහිත වූ. **පඤ්චවිධාක්ෂ**= පඤ්ච ඉන්ද්‍රියයන්. **සන්තර්පණ**= පිණ වීමම.

**එකාකාපෙක්ෂකාවූ**= එකම අදහසව. **පඤ්චමහාවිලොකනය**= පස් මහ බැලීම. **අමිතධනාර්චිත**= අපමණ ධන රැස් වූ. **ත්‍යාග**= දීම. **සත්‍ය**= සබවස. **සෞශීල්‍ය**= ගුරබව. **විපුල වූ**= මහත් වූ.

## (53) පිට.

**කුක්ෂියෙහි**= බඩෙහි. **පිළිසිඳගෙණැ**= ඉපිද. **දශමාසාන්ත්‍යයෙන්**= දසමස ගෙවීමෙන්. **ප්‍රසවවූ**= බිහි වී. **ප්‍රණයරස**= ප්‍රෙම රස ඇති. **මධුරදර්ශන වූ**= මිහිරි දැකිමක් වූ. **කුචකලශ**= තන

නැමැති සටයන්ගේ. **ස්වෛරසඤ්චාරයට**= සිය කැමැත්තෙන් හැසිරීමට. **භවනොපාන්ත**= ගෘහය සමීප වූ. **සරසීවැ**=විලක්ව. **හෘදයහරණවූ**= සිත් පැහැර ගන්නා වූ. **බ්‍රහ්මොපනීත**= බඹුන් විසින් එළවන ලද. **නිමිත්තවිශෙෂ සන්දර්ශනයෙන්**= නිමිති වෙසෙස් දැකීමෙන්, **සඤ්ජාත**= හටගත්. **සංසාරවිරාග**= සසර නො ඇල්ම. **ප්‍රව්‍රජ්‍යා රාග ඇතිවැ**= පැවිද්දෙහි ඇලුම් ඇතිව. **මහාපරිවාරයෙන්**= මහ පිරිවරින්.

**ආජානීයරථයෙන්**= ශ්‍රෙෂ්ඨ අසුන් යෙදූ රථයෙන්. **කොටිප්‍රමාණ**= කෙළක් පමණ. **මහාවීර්‍ය්‍ය**= බලවත් වීර්‍ය්‍යය. **අකලඞ්ක**= කැලැල් නැති. **යශොධර**= කීර්ති දරන්නා වූ. **වනිතො'පනීත**= ස්ත්‍රිය විසින් එළවන ලද. **පායාසානුභව පූර්වාඞ්ගම**= කිරිබත් වැළඳීම පෙරටු කොට. **දිවාවිහාර**= දවල් විසීම. **විකච**= පිපියා වූ. **කුසුමොදර**= පද්ම ගර්භයෙන්. **ප්‍රස්‍යන්දමාන**= වැගිරෙන්නා වූ. **මන්දමකරන්ද**= මඳ සුවඳ පිළිබඳ. **බින්දුසම්බන්ධ**= බිඳු සම්බන්ධ වූ. **නාගබොධිද්‍රුමොපසඞ්ක්‍රමණයකොටැ**= නා බෝ මුලට එළඹ. **මාරවාරණ**= මාර නැමැති ඇතුගේ. **මානවිදාරණ**= මානය බිඳීමෙහි.

**ඒකපඤ්චානනවැ**= අසහාය සිංහයෙක්ව. **සර්වඥතාඥාන සමධිගමයෙන්**= බුදුබව ලැබීමෙන්. **සම්පූර්ණ මනොරථ ඇතිවැ**= පිරුණු මනදෙළ ඇතිව. **සප්තසප්තාහා'තික්‍රමණයෙන්**= සත් සති යැවීමෙන්. **බ්‍රහ්මාරාධනා**= බඹහුගේ ආරාධනය. **අනන්‍යප්‍රවර්තනීය**=අනිකෙකුවිසින් නො පැවැත්විය හැකි. **විනිවර්තිත**= නවත්වන ලද. **සංසාරදෙෂ වෛෂම්‍ය ඇතිවැ**= සසර දෙස් නැමැති විෂමතා ඇතිව. **අමාගඟක් බහන්නාක්හු**= සුධාරස නැමැති නදියක් හරවන්නාක් මෙන්. **හෘදයා'නන්දයට**= සිත සතුටුවීමට. **බිජුවට**= මූලකාරණය. **ලොකාස්වාදයෙහි**= පඤ්චකාමයෙහි. **අස්බිඳුනක්හුමෙන්**= සිල් කඩන්නාක් මෙන්. **ජයස්තම්භ**= ජය කණු. **සමාධියට**= සිත එකඟබවට. **අභිෂෙක**= මඞ්ගල ජලයෙන් තෙමීම. **ආඥාවෙහි**= බලයෙහි. **ලොකාර්ථයෙහි**= ලෝ වැඩෙහි. **තත්පරවැ**= ඇලී. **සෞජන්‍යයෙහි**= සත් පුරුෂ භාවයෙහි. **කූළ**= මුදුන. **පරාක්‍රමයෙහි**= උත්සාහ පැවැත් වීමෙහි.

**නිමාම් දක්වමින්**= කෙළවර පෙන්වමින්. **බොධිසත්වචරිතයෙහි**= බෝසත් සිරිතෙහි. **කාරුණ්‍යයෙහි**= කරුණා සහගත භාවයෙහි. **තාරුණ්‍යය**= මන්දහාවය. **සංසරණය**= හැසිරීම.

**චාතුර්වේද**= සිවුවෙදය සහිත. **විඥ්‍යස්ථාන**= විඥ්‍යස්ථාන නැමැති, **මහාසාගරපාරගතවූ**= මහා සයුරෙහි තෙර දුටු. **නානානුභාවයෙන්**= නොයෙක් මහිමයෙන්. **භක්ති ප්‍රසාද පුරඃසරවූ**= ආදර සැදැහැ පෙරටුව.

## (54) පිට.

**රූපනිරූපනයෙන්**= රූප ලක්‍ෂණය බැලීමෙන්. **සාක්‍ෂීභූතාමාන**= සාක්‍ෂිට අමා වැනි වූ. **ප්‍රවචනා'සාක්‍ෂීණයෙන්**= ධර්මය ඇසීමෙන්. **සජාත**= හටගත්. **ප්‍රීති සෞමනස්‍ය**= සිත පිණායාම හා අධික සතුටෙන්. **ලෙන්**= හෘදයෙන්. **උනුරූවන්නාක්‍ෂමෙන්**=පිට කර හරින්නාක් මෙන්. **දසරූවෙයි**= උරහිසෙහි. **චිත්තාචාරය**= සිතෙහි අදහස. **සර්වලොකොත්තම**= සියලු ලොවට උතුම් වූ. **ඍත්න**= උත්සාහ. **ශාන්ත**= සංසුන්. **ප්‍රශාන්ත**= මධුර වූ. **භගවත්**= භග්න කළ රාගාදීන් ඇත්තා වූ. **අර්හත්**= පුදට සුදුසු නොහොත් පව් නැසූ. **අනතර්හිත වූ කාල්හි**= අතුරු දහන් වූ විට. **ආකාරණ**= කැඳ වූ. **කාරුණාපලොභිත**= කාරුණායෙන් ලොභොබ කළ. **චිත්ත ඇති**= සිත් ඇත්තා වූ. **පරමධාර්මික වූ**= අතිශයින් ධාර්මික වූ. **පතිව්‍රතාධර්මපර**= පතිවත රැකීමෙහි නියැලුනු.

## (55) පිට.

**විචකිලදශීන වූ**= අතෘප්ති කර දැකුම් ඇති. **අඛිල ගුණගණාභිරාම වූ**= සියලු ගුණ සමූහයෙන් සිත් අලවන්නා වූ. **නාටකස්ත්‍රීන්ගේ**= නළඟනන්ගේ. **රතිකෙලිශ්‍රාන්ත**= කාමාභිරති ක්‍රීඩායෙන් විඩා වූ. **කුචාන්ත**= තන කොණින්. **නිර්‍යාන්ත**= වැහෙන්නා වූ. **ස්වෙදාම්බුධාරා**=ඩහදිය දහරින්. **නිර්ඣර**= වැළකූ. **රතිඛලමදූ ඇතිවූ**= රතිකෙළි විඩා ඇතිව. **පුරුෂ සිංහ වූ**= පුරුෂ ශ්‍රෙෂ්ඨ වූ. **සඥශීනාවශානාසෙහි**= දැකීම කෙළවර. **පශ්චිමයාමසමනන්තර**= අන්තිම දස පැය හා එක්වම. **සම්ධිගත**= ලැබූ. **සම්‍යක්සම්බොධි ඇතිවූ**=බුද්ධත්වය ඇතිව. **ලොකාර්ථකොටා**= ලෝ වැඩ කොට.

**ප්‍රවරවූ රූපධෙය ඇති**= උතුම් රූප සම්පත් ඇත්තා වූ. **රූපගත වූ**= රූපයෙහි පිහිටියා වූ. **භාග්‍යධෙය ඇති**= වාසනා ලකුණු ඇති. **සර්වඥතාධෙය වූ**= බුද්ධ ඥානය දැරීමට සුදුසු වූ. **ශ්‍රධෙය වූ**= ඇදහිය යුතු වූ. **කාරුණාවිධෙය වූ**= කාරුණාවට පිහිට වූ. **සකලලොකාභිධෙය වූ**= සියලු ලොකයා විසින් කිය යුතු වූ. **හෘදය සන්නිධෙය වූ**= සිතෙහි තබා ගතයුතු වූ. **නාම**

**ධෙයවූ**= නම් දරන්නෙක්ව. **සද්ධර්මරසාස්වාදයකොට**= උතුම් දහම් රස විඳ. **පඤ්චමහාගඞ්ගාප්‍රවාහය**= ගංගා, යමුනා, අචිරවතී, සරභූ, මහී යන පස්මහගඟෙහි දිය පහර. **අනාගතාංශඥාන යෙන්**= අනාගත කොටස පෙණෙන නුවණින්. **මනොරථය**= ප්‍රාර්ථනාව.

## (56) පිට.

**දෘඪග්‍රහණය**= දැඩි සේ අලවා ගැණීම. **ඒකාලොකීකෘත**= එක ම ආලෝක ඇති කළා වූ. **විශ්වලොකි වූ**= සියලු ලොකය ඇත්තා වූ. **බුද්ධොත්පාද මහොත්සවයක්**= බුදුන් පහළවීමේ උතුම් ප්‍රීත්‍යුත්සවයක්. **කෘතිව්‍යය**= කටයුතු ය. **අකෘතිව්‍යය**= නො කටයුතු ය. **මාර්ගය**= මඟ ය. **අමාර්ගය**= නොමඟ ය. **සාවද්‍යය**= වරද සහිත ය. **නිරවද්‍යය**= වරද රහිත ය. **සුචරිතය**= යහපත් හැසිරීම ය. **දුශ්චරිතය**= නො මනා හැසිරීම ය. **බුද්ධාදිත්‍යවිගමයෙන්**= සව්ඥ සූර්‍ය්‍යයා නැති වීමෙන්. **මොහාන්ධකාර විජෘම්භණය**= මොහ නැමැති අඳුර පැතිරීම.

**සකලලොක**= සියලු ලෝ වැස්සාගේ. **මනොරථ**= මනදෙළ. **ඒකනිෂ්පාදන**= අතුල්‍ය ලෙස සිඬ කිරීමෙහි. **ඒකකල්පවෘක්ෂවූ**= උතුම් කප්රුකක් වැනි වූ. **පරමාර්ථදර්ශිවූ**= අවිපරීතාර්ථයන් දක්නා සුලු වූ. **ශ්‍රමණපද්මවූ**= ශ්‍රමණයන්ට පද්මයක් බදු වූ. **අනවරාග්‍රසංසාර**=ප්‍රමාණ නො කළහැකි අක්මුල් ඇති සසර. **දූවූ**= හළුකළා වූ. **අනොමනිර්වාණ දර්ශිවූ**= අලාමක වූ නිවන් දක්නා සුලු. **සම්පත්තිසාන්ද්‍රවූ**= සැපතින් අඩු නො වූ. **දුරවගාහ**= ලං විය නො හැකි. **ප්‍රතාප**= තෙජසින්. **භාස්වත්වූ**= සූර්‍ය්‍යයා වැනි වූ. **අප්‍රතිහතයශොධරවූ**=නො නැසුනු කිත්තිය දරන්නා වූ. **නයනො න්මාද**= නෙත් මත් කරවන. **යෞවන**=තරුණ බැවින්. **ශ්‍රීමත්වූ**= ශොභා ඇති. **වදන**= මුව නැමැති. **වනජවිකාශ**= පද්ම ප්‍රබොධ යෙහි. **භාස්කරවූ**=හිරුව. **සකලලොක ප්‍රෙමකාරණවූ**= සියලු ලොකයාගේ ප්‍රෙමයට කාරුණු වූ.

## (57) පිට.

**විශොකභාවට**= ශොක රහිත භාවයට. **කාරණවූ**= කාරුණු වූ. **විශාඛපූර්ණමාසිය**= වෙසක් මැදි පසළොස්වක. **දිවාවිහාර**= දවල් විසීම. **සජ්ජනපූජිතවූ**=සත්පුරුෂයන් විසින් පුදන ලද්දවූ. **මාරතර්ජනකරවූ**= මරු බිය කරන්නාවූ. **අර්ජුනබොධිමූලයට**= කුඹුක් බොධිය සමීපයට. **දුර්වාර**= වැළැකිය නො හැකි. **මාර**= මරු නැමැති. **තරුණ**= අභිනව වූ. **තරණීමණ්ඩල**= හිරමඬල.

**ග්‍රාස**= කබල කොට ගැන්මෙහි, හෙවත් ගිලීමෙහි. **එකග්‍රාම ග්‍රාහඩැ**= අසහාය රාහු ග්‍රහයාව. **යාමත්‍රයෙහි**= තුන්යම්හි. **විද්‍යාත්‍රයය**= ත්‍රිවිද්‍යාවන්. **විධකොටැ**= ප්‍රතිවෙධ කොට. **පශ්චිම යාම සමධිගත**= අලුයම්හි ලබන ලද.

**සර්වඥතාඥාන ඇතිවැ**= බුදුබැව් ඇතිව. **අගලස්බඳුවූ**= අඟුලාඤ්ජනයක් වැනි වූ. **කුසල්බඩුපට්ටනක්**= කුසල නැමැති බඩු ඇති පටුනු ගමක් වැනි වූ. **එක ඇඳුරුහලක්**= එක ආචාර්‍ය්‍ය ශාලාවක්. **ධර්මරත්න නිධානයක්**= දහම් නැමැති රුවන් නිධියක් වැනි වූ. **පවිත්‍ර කෙරෙමින්**= පිරිසිදු කෙරෙමින්. **මෞන මුද්‍රාව**= නිශ්ශබ්දභාව නැමැති ලස්. **සද්ධර්මාමෘත නිෂෙකය**= සද්ධර්ම නැමැති අමා වැස්සීම. **මොහනිද්‍රා**= මුළා බැව් නැමැති නිදීම. **ලොකාර්ථ තත්පරවැ**= ලොකාභිවෘද්ධියෙහි ඇලී. **බොධිපාක්ෂික ධර්මයන්**= සතරසතිපට්ඨානාදි රහත්මඟ ලබා දෙන ධර්මයන්. **මරහුගේවිරොධ අසම්රකාරමින්**= මාරයාගේ විරුඬකම් බිඳිමින්. **ඛදවඩනා**= සතුටු උපදවන. **බොධිසත්ත්වධුරය**= බෝසත් තනතුර. **එකමාර**= එක ම දෙරටුවක්.

(58) පිට.

**ධර්මලොභයෙන්**= ධර්මය කෙරෙහි ආශාවෙන්. **ශාක්‍යසිංහයන්**= ශාක්‍යවංශයට උතුම් වූ. **ත්‍රිකාලදර්ශිවූ**= අදු, අනා, වත් මන් යන තුන් කල් දක්නා වූ. **නිරූපමවූ**= උපමා රහිත වූ. **බුද්ධශ්‍රී පද්මවූ**= බුදු බව නැමැති ශ්‍රීදෙවියගේ වාසයට පියුමක් වැනි වූ. **විකශිතමුඛපද්මවූ**= පිපියා වූ මුව පියුම් ඇත්තා වූ. **සකල ලොකාර්ථ සම්පාදකවූ**= සියලු ලොකයාගේ වැඩ සිඩ කරන්නා වූ. **සකලගුණගණයෙන්**= සියලු ගුණ සමූහයෙන්. **අප්‍රතිසමවූ**= සමවූවෙක් නැත්තා වූ. **කාල්‍යතා**= මනොඥ භාවය හා සම වූ. **තනුලතා විලාස ඇති**= සිරුරු නැමැති වැලෙහි සොභා ඇති. **රුචිර**= මනොඥ වූ. **යෞවනාවතාර**= යොවුන් බවට පැමිණීමෙන්. **පරම'මාධුරීභූත**= ඉතා මිහිරි වූ. **ශරීරශොභාවෙන්**= ශරීර කාන්තියෙන්. **ලොකොත්තරවූ**= ලොක ශ්‍රෙෂ්ඨ වූ.

**මධුර**= මිහිරි වූ. **අධර**= තොල් නැමැති. **චෂක**= ඔබමින්. **උපනීත**= එළවන ලද. **ගණ්ඩූෂ**= කොපුල් පිරූ. **මධුපාන**= මී බීමෙන්. **මත්තවැ**= මත් ව. **නිරතිශය**= ඉතා වැඩි වූ. **ස්නෙහොත්තර**= ප්‍රෙමාධික වූ. **පරමරම්‍ය**= ඉතා සිත් කළු වූ. **උද්විග්නවැ**= කළකිරී. **ප්‍රව්‍රජ්‍යාවෙහි**= මහණකමෙහි. **සාභිලාෂවැ**= කැමැතිව. **නිර්ව්‍යාජ**= සත්‍ය වූ. **මනොරථසාධනීය**= මනදෙළ සිදු කරණ.

**(59) පිට.**

**අතිධන්‍යවූ**= ඉතා පින්‍යත්තා වූ. **නයන මනොහරවූ**= නෙත් සිත් ගන්නා වූ. **මධුකර**= මී මැස්සන්ගෙන්. **ආකර**= ගැවසී ගත් තැනක් වැනි වූ. **සහකාර වනයෙහි**= මී අඹ වෙනෙහි. **අෂ්ටතෘණමුෂ්ටිග්‍රහණවැ**= තණමිටි අට ගෙණ. **තරුණ**= අලුත් වූ. **සොණ**= රත්පාට වූ. **පල්ලවාගිරාම**= පත්‍රයෙන් සිත් කළු වූ. **මහාශොණබොධියට**= තොට්ල බොධියට. **වජ්‍රාසන**= (පෙර කී සේ යි). **චතුරඞ්ගවීර්‍ය්‍යාධිෂ්ඨාන**= අඞ්ග සතරකින් යුත් වීර්‍ය්‍ය ඉටී ම. **පූර්වාඞ්ගමවැ**= පෙරටුව. **මාරසාහසප්‍රභාව**= මාරයාගේ බලාත්කාර ක්‍රියා නැමැති මහිමය. **නවභානු ප්‍රතාණ**= අභිනව සූර්‍ය්‍යරශ්මිය පැතිරීමෙන්. **තුහිනලෙසයට**= පිණී ආකාරයට. **බ්‍රහ්මමුහුර්තය**= ශ්‍රෙෂ්ඨ මොහොත. **එලිවෙන** දෙපැය හමාර. **සකල**= සියලු. **කාලදෙශ**= කාලදෙශයන්ගේ. **සවභාව**= සවභාව විසින්. **ව්‍යවසිත**= වසන ලද.

**කෘෂ්ණ**= පාපය. **ශුකල**= කුශල ය. **හින**- ලාමක ය. **ප්‍රණීත**= ශ්‍රෙෂ්ඨ ය. **සාවද්‍ය**= වරද ය. **අනවද්‍ය**= නිවරදය (යන.) **නෛක වස්තු**= නොයෙක් වස්තූන්ගේ. **විස්තාරතත්ත්‍ව විභාවිවූ**= විස්තර බව ප්‍රකට කරන්නා වූ. **සර්වඥතාඥානලදින්**= බුදු බව ලත් හෙයින්. **ධර්ම මකරන්ද**= දහම් නැමැති මල්රොන්. **සන්දොහ**= සමූහය. **නිෂ්‍යන්ද**= වැගිරීමට. **පද්මවූ**= පියුමක් වූ. **ලොකානුශාසන යොාට**= ලොවට අවවාද දී. **මධුර**= මිහිරි වූ. **ගුමුගුමාරවැ**= ගුම් ගුම් යන අනුකරණ ශබ්දයෙන්. **මුඛර**= දෙඩමලු වූ. **මධුකර නිකර**= මී මැසි සමූහයාගෙන්. **නිරන්තරවූ**= නොතොර වූ.

**ප්‍රචල**= වඩා වැනෙන. **ප්‍රවාලජාල**= දලු සමූහයෙන්. **දන්තුර වූ**= උස් දත් හටගත්තාක් වැනි වූ. **තරුණ**= ලපටි වූ. **සහකාරඅඞ්කුර**= මී අඹදලු. **අස්වාද**= රස විඳීමෙහි. **චපල**= ඇලුනු. **කොකිලකුලයා විසින්**= කොවුල් සමූහයා විසින්. **කුහ කුහාරවයෙන්**= කුහා කුහා යන අනුකරණ ශබ්දයෙන්. **මනොහරවූ**= සිත් ගන්නා වූ. **සිතලච්ඡායාවෙහි**= සිහිල් සෙවනෙහි. **හොත්තාවූ**= සයනය කළා වූ. **තරුණ**= ලදරු වූ. **අරුණවූ**= මඳ රත් වන් වූ. **හරිණගණයා විසින්**= මුව සමූහයා විසින්. **රොමන්ථයෙන්**= වමාරා කෑමේ තලු ගැසීමෙන්. **මන්ථරවූ**= ලැසි වූ. **මන්ද මාරුත**= මඳ සුළඟින්. **ආන්දොලිතවූ**= කම්පිත වූ. **නවලතා වනිතාවන්ගේ**= අලුත් වැල් නැමැති ස්ත්‍රීන්ගේ.

**පල්ලවාඞ්කුරාභිඝාතයෙන්**= ලපලු අකුරු ගැටීමෙන්. **සන්තුෂ්ටවූ**= සතුටුව. **තරුණ පුෂ්පාඞ්කුර**= අලුත් මල් කැකුළු නැමැති. **රොමාඞ්කුර**= රොමොද්ගම ඇති. **ශාඛාද්‍රුමයෙන්**= සෙවෙනි ගස් ඇති. **සතතනාරබ්ධවූ**= නිතර පටන් ගත්තා වූ. **ශිඛ**= 'සිඛ' නම් දෙවයා. **විද්‍යාධර**=විද්‍යාධරනම් දෙවයා. **සඞ්ගීත ප්‍රසඞ්ග**= සඞ්ගීතයෙන් ඇලුනු. **වනමශීෂ**= වල්මීවුන්ගේ. **විෂාණඝාතයෙන්**= අඟින් ගැසීමෙන්. **චූර්ණිතවූ**= සුණු කරණ ලද. **සරොරොධස්ඇති**= විල් ඉවුරු ඇති. **මත්තමාතඞ්ග**= මතු තුන්ගේ. **සථූල**= මහත් වූ. **කපොලභිත්තින්**= කොපොල්තලෙන් නොහොත් උතුම් කොපොලින්. **දානධාරානිපාතයෙන්**= මදදිය වැගිමෙන්. **සුරභිභූත**= සුවඳවත් වූ. **ශිඛණ්ඩි**= මොනරුන්ගේ. **එක ජීවිතාශමානවූ**= එකම ජීවිතයක් බඳු වූ. **විශීර්ණවූ**= වතළා වූ. **සීතල ජල ඇති**=සිහිල් දිය ඇති. **නවසාද්වල**= අලුත් ඊතන නැමැති. **කම්බලාව ගුණ්ඨිත**= කම්බිලියෙන් වසන ලද. **වනසථලී**= වනරොද නැමැති. **සිමන්තිනීන් ඇති**= සත්‍රීන් ඇති.

## (60) පිට.

**චම්පකවනොද්භූතවූ**=සපු වනයෙහි හටගත්තා වූ. **සෞරභ්‍ය ප්‍රසරයෙන්**=සුවඳ හැමීමෙන්. **සුරභිභූතවූ**=සුවඳවත් වූ. **වනමස්තක ඇති**= වන මුදුන් ඇති. **උද්ගන්ධි**= නැගෙන සුවඳ ඇති. **සීතල ගන්ධි**= සිසිල් සුවඳ ඇති. **විටප**= වෙලෙපින්. **විගලිත**= ගිලිහුනු. **පුෂ්පාඞ්කුරයෙන්**= මල්රොණින්. **කරාලවූ**= උස් වූ. **භූමිමණ්ඩල**= භූමි ප්‍රදෙශ ඇති. **විශාල**= මහත් වූ. **සාලතරු**= සල්ගසින් (ගැව සුනු) **නූතන ප්‍රසූන**= අලුත් මල් හා. **සම්පර්කයෙන්**= එක්වීමෙන්. **පරමරමණීයවූ**= ඉතා සිත් කළු වූ. **විකසිත**= පිපියා වූ. **වකුල මුකුලපටල**= මුහුණමල් රොන් සමූහයෙන් වූ. **නෂ්ට පරිශ්‍රාන්ත**= ඇසට වූ විඩාව. **මන්දමාරුත සන්තානයෙන්**= මඳසුළං පෙළින්. **ශරීරක්ලාන්ත ඇති**= ඇඟවිඩා ඇති.

**විනිද්‍ර**= පිපියාවූ. **සාන්ද්‍ර**= ඝන වූ. **නාගපරාගාතුරාගයෙන්**= නා මල් රොන් තැවරීමෙන්. **පිඤ්ජරිතවූ**= පිඟුවන් වූ. **පර්වත නිකුඤ්ජ ඇති**= පර්වතයන්හි නිම්න ස්ථාන ඇති. **ගිරිශිඛර යෙන්**= පර්වත මුදුනෙන්. **නිර්ඣර**= ගහුලැලි නැමැති. **ඣල්ලරීන්ගේ**= ඣල්ලරී නම් බෙරයන්හි. **ඣංකාරයෙන්**= "ඣං" යන අනුකරණයෙන්. **ස්වෛර විහාරනිරත**= සිය කැමැති සේ විසීමෙහි ඇලුනු. **ශබර**= වැදිය. **පුලින්ද**= හිමාලය කාලාඤ්ජන පර්වත අතර වසන චණ්ඩාල භෙදයක් වූ පුලිඳුය යන මොවුන්ගේ.

**සුන්දරීන්ගේ**= සත්‍රීන්ගේ. **මධුරගායනායෙන්**= මිහිරි සේ ගැයී මෙන්. **අචේතනස්කාවූ**= චේතනා රහිත වූ. **මන්දානිල**= මඳ සුළඟින්. **අන්දෝලිත**= කම්පිත වූ. '**නවමඤ්ජරී**= අලුත්කරල් තැමැති. **චාමරයෙන්**= සෙමරින්. **ව්‍යාධූයමානවූ**= සැලෙනු ලබන්නෙක් ව.

**පුෂ්පාසවාද**= මල් රස විදිමෙහි. **විදග්ධවූ**= බුහුටි ව. **කෝකිලාවන්**= කොවුල් ධේනුන් විසින්. **සඞ්ගීයමාන**= ගයනු ලබන. **වනසරසුන්**= වනවිල්. **පද්ම**= පියුම්. **රාජහංස**= හංසරාජයන්. **නිත්‍යවිරෝධි සත්ත්වයන්**= ජන්මයෙන් ම විරුඬ සත්ත්වයන්. **පරම මෛත්‍රියෙහි**= උතුම් මිත්‍ර භාවයෙහි. **ප්‍රශාන්ත**= අතිශයින් සංසුන්. **චේතනාය**= චේතනාවන්ගෙන්. **අවිරෝධ**= විරුඬ නො වූ. **නිරෝධසමාපත්තියෙන්**= චිත්ත නිරෝධය ඇති සැපවත් සමවතට පැමිණීමෙන්. **පරාශ්‍රණවූ**= පිහිට වූ. **දංෂ්ට්‍රාබලයෙන්**= දත් ශක්තියෙන්. **බාහුබලයෙන්**= අත් ශක්තියෙන්. **ඌරුබලයෙන්**= පාද බලයෙන්. **නඛබලයෙන්**= නිය බෙලෙන්. **මුඛබලයෙන්**= මුව බෙලෙන්.

**රුචිර**= සිත් කලු වූ. **කේශරවිසර**= කෙසර සමූහය. **විස්තාර**= පැතිරීම් සම්බන්ධයෙන්. **බන්ධුර වූ**= මනොඥ වූ. **ස්කන්ධසන්ධි**= ග්‍රීවා සන්ධි ඇති. **ස්ථානෝචිත**= තැනට සුදුසු. **වර්ණවිශේෂයෙන්**= පාට වෙසෙසින්. **විරාජමාන**= බබලන. **අඞ්ගප්‍රත්‍යඞ්ගශෝභා**= අඟ පසඟ කාන්තිය. **වික්‍රමය**= අනුන් මැඩ පැවැත්වීමේ ශක්තිය. **වනඝටායෙන්**= වන රොදින්. **පවනානුපාත**= වාතය වැටීමෙන් සෙලවුනු. **කුසුමාඤ්ජලී**= මල් ඇදිලි.

## (61) පිට.

**සුපක්වවූආම්‍රඵලයෙහි**= ඉදුනු අඹ ගෙඩිවල. **පනපනහි**= මාගියක් පාසා. **දර්පයෙන්**= අභිමානයෙන්. **පඤ්චවර්ණපද්මාකීර්ණවූ**= පස් පැ පියුමෙන් ගැවසුනු. **ඉන්ද්‍රනීලමාණික්‍යරසායමානවූ**= ඉදුනිල් මිණි දියක් සේ නිල් වූ. **සීතලසලිල**= සිහිල් දිය. **මෝහාන්ධකාරවූ**= මොහයෙන් අදුරුවූ. **තරුණතර සිංහින්ගේ**= ඉතා තරුණ සිංහධෙනුන්ගේ. **අතරුණස්නේහයෙහි**= මහත් ප්‍රේමයෙහි. **නිර්විෂාදවූ**=කළකිරීම් රහිත වූ. **උද්ගාරය**= වැමැරීම. **බුද්ධාලම්බන ප්‍රීතින්**= බුදුන් අරමුණු කොට උපන් ප්‍රීතියෙන්. **ගෝචරයෙහි**= ආහාර සෙවීමෙහි. **සිත්තම**= සිතියමක. **ධර්මරාජවෙසී**= බුදු වෙසී. **ව්‍යාකරණ**= ප්‍රකාශය.

**(62) පිට.**

**තත්පරවූශේක**= ඇලුනු ශෝක. **ආදිමධ්‍යාන්තකල්‍යාණ වූ**= මුල මැද අග යහපත් වූ. **මනොමල**= සිතෙහි පාපකිලුට. **දහන**= දවන්නාවූ. **දවානල**= ලැව්ගින්න. **ලොක**= ලොකයාගේ. **ලොචන**= ඇස් නැමැති. නොහොත්. **ආලොචන**= බැලීම් නැමැති. **චකොර**= ඇටිකුකුලන්ට. **චන්ද්‍රකාශමාන**= සඳරැස වැනි වූ. **සවර්ණකාන්තින්**= රන්වන් කාන්තියෙන්. **ශ්‍රවණිය**= ඇසිය යුතු. නොහොත් කණට හිත වූ. **පියූෂනිෂෙක**= අමා වැහීමක් සේ. **මනොහර**= සිත්කලු. **භාරති විලාසයෙන්**= වචන විලාස යෙන්. **ජගදානන්දනය කොටැ**= ලොව සතුටු කොටැ. **අනතශෙෂ**= කෙළවර. **නියති නියොග**= භාග්‍ය නියමය. **අතික්‍රමණ**= ඉක්ම වීමෙහි. **අසමර්ථවෑ**= නො හැකිව. **ශාසනය අන්තර්හිත වෑ**= ශාසනය අතුරු දහන් වී. ශාසනාන්තර්ධානය වනාහි **පර්‍යාප්ති අන්තර්ධානය, ප්‍රතිපත්ති අන්තර්ධානය, ප්‍රතිවෙධ අන්තර්ධානය, ලිඞ්ග අන්තර්ධානය, ධාතු අන්තර්ධානය,** යන පඤ්ච අන්තර්ධානයෙන් සිදු වන්න කී.

**බුද්ධාන්තරයක්**= එක් බුඩකාලයක්. **තෘෂ්ණාභිලාෂලතා**= තණ්හාසාව නැමැති වැල්. **උන්මූලන**= උගුළුවීමෙහි. **කෙලි චිරදවූ**= ක්‍රිඩා හසිතියෙක් වූ. **සමස්ත ලොක**= සියලු ලොකයාගේ. **ශොකාවිනොද විද්‍යා**= ශොකයන් දුරුකරණ විද්‍යා විෂයෙහි. **විශාරදවූ**= පැතිර පවත්නා නුවණ ඇති. **දානාධ්‍යාශය**= දන් දීමේ අදහසින්. **අපෙක්ෂිත**= බලාපොරොත්තු රහිත. **ප්‍රියපුත්‍ර දාරවූ**= ප්‍රිය වූ පුත්‍ර දුහිතෘන් ඇති. **භුවනාභොගව්‍යාපී**= ලොක කුහරයෙහි පතළ. **ශ්වෙතකීර්ති පූරපාරවූ**= ශුභ්‍ර කීර්තීන් පිරී මෙන් තෙරපත්. **චරණ සරණාපන්න**= පාදය පරම පිහිට කිරීම් වශයෙන් පැමිණි. **ජනතා**= ජනසමූහයාට. **බ්‍රහ්මවිහාරදවූ**= මෛත්‍රී, කරුණා, මුදිතා, උපෙක්ෂා යන සතර බඹවිහරණ දෙන්නා වූ.

**සකලකලිකල්මෂාපහරණ**= සියලු පාප ග්‍රීෂ්මය පහකිරීමෙහි. **ප්‍රවිණ**= සමර්ථ වූ. දක්ෂ වූ. **මහානිරදවූ**= මහත් මෙඝපටලයක් වූ. **නිහිත**= පිහිටුවන ලද. **මහිත**= පුදන ලද. **පරිචිත**= පුරුදු කරණ ලද. **පාරමිතාමහිමොපනීත**= පාරමී ධර්මබලයෙන් එලවන ලද. **මතිපරිණාම**= ප්‍රඥාවගේ මේරීම. **දෙවස්පදවූ**= දෙවියන්ට නිගා දෙන්නා වූ. **ප්‍රතාප ඇති**= තේජස් ඇත්තා වූ. **මහාදෛව ඇති**= මහත්වූ වාසනා ශක්ති ඇති. **සකලකාම සෙනානායකවූ**= සියලු කාමවස්තු නැමැති සෙනාවට ප්‍රධාන වූ. නොහොත් සියලු අනඞ්ග

සෙනාවට ප්‍රධාන වූ. **යුවතින්ගේ**= ස්ත්‍රීන්ගේ. **චරණ ප්‍රණාම**= පාද වන්දනා නැමැති. **ප්‍රණයප්‍රසාදවිද්‍යා**= ප්‍රෙම ප්‍රසාද විද්‍යා යෙහි. **විදග්ධවූ**= නිපුණව. **සකල ජනනයන මනොනන්දනොත්කරවූ**= සියලු දෙනාගේ නෙත් සිත් වැඩියක් සතුටු කරන්නා වූ.

## (63) පිට

**ඒක්වූ**= රාශීභූතව. සම්ගිව. **ෂඩ්දිව්‍යලොකයෙහි**= චාතුර්මහා රාජික, ත්‍රයත්ත්‍රිංශත්, යාම, තුෂිත, නිර්මාණරතී පරනිර්මිත වසවර්ති යනු දිව්‍යලොක සය යි. **සකලලොක සුදර්ශනවූ**= සියලු ලෝකයාට යහපත් දැකුම්ක් වූ. **ස්වර්ගාපවර්ග මාර්ගාරොහණය කරන්නාවූ**= සගමොක් මඟට නං වන්නා වූ. **මහාසොණ**= තොටිල. **බොධිද්‍රුමවරමූලයට**= උතුම් බෝරුක්මුලට. 'බොධිද්‍රුමවර' යනු විශෙෂණ පරපදනාවයෙන් සමාස වූ තැනි. **පශ්චිමයාම සමනන්තර**= පැසුළුයමට අනතුරුව ම. **සර්වඥතාඥානලක්ෂ්මින්**= සර්වඥභාවයෙන් ලත් ඤණ සම්පත්තියෙන්. **බුද්ධකෘත්‍ය**= බුදුන් විසින් සිදුකට යුතු ක්‍රියා. **අනුග්‍රහ**= උපකාර. **නාරද ශ්‍රී ඝණ ශ්‍රී මුඛ සන්දර්ශනයෙන්**= 'නාරද' සම්බුද්ධයන් වහන් සේගේ උතුම් මුහුණ දැකීමෙන්.

**ප්‍රසන්ධාවිර්භූත**= ආගන්තුකව මහත්සේ පහළ වූ. **ප්‍රමොද පරම්පරායෙන්**= සන්තොෂ පරපුරෙන්. සතුටු රැසින්. **පරිපූර්ණවූ**= හාත්පසින් පිරිසිදු වූ. **අන්තඃකරණ ඇතිවූ**= සිත් ඇතිව. **ආශ්‍රම පදයක්**= අසපු පියසක්.

## (64) පිට.

**ශ්‍රමණපද්ම**= පියුමක් වැනි ශ්‍රමණයන් වහන්ස, (ඔබ) **ජයජය**= දිනෙහි වා දිනෙහි වා. **ශ්‍රමණ සිංහ**= සිංහ සදෘශ වූ ශ්‍රමණයන් වහන්ස. **ශ්‍රමණමාණික්‍ය**= මැණිකක් වැනි ශ්‍රමණයන් වහන්ස. **ශ්‍රමණ භාස්කර**= සූර්යයා සමාන ශ්‍රමණයන් වහන්ස. **ශ්‍රමණාවතංස**= මුදුන්මල්කඩක් වැනි ශ්‍රමණයන් වහන්ස. **ශ්‍රමණධීර**= ප්‍රඥවත් වූ ශ්‍රමණයන් වහන්ස. **ශ්‍රමණපීයූෂපූර**= ශ්‍රමණ නැමැති අමාබඳුන. **ශ්‍රමණ ප්‍රදීප**= ශ්‍රමණ නැමැති පහන.

**ප්‍රතිවාදි**= විරුද්ධවාදීන්ගේ. **විශ්වගර්ව**= සියලු ඔද. **විශොෂණ**= වියලීමෙහි. **ප්‍රලයමාර්තණ්ඩ**= කල්පාන්තික සූර්යයා තෙනි. **හරිණශාබ**= මුවපොල්ලන්. **විදාරණ**= පැලීමෙහි. හෙවත් විනාශයෙහි. **එකපඤ්චානන**= අසහාය සිංහයන් වහන්ස.

**තාලපණ්ණ**=තල්කොළ. **සඤ්චුණ්ණ**= මැහැවින් සුණු කිරීමෙහි. **ඒකනිඝාතපාත**= අසහාය අසනි' ප්‍රහාර (–ඝෙතපහර)ය. **මෘණාලනාල**= නෙලුඹල. **විකෂොභ**= කැළඹීමෙහි. ඉදිරීමෙහි. **ෂොලිදනතාවල**= හස්තිරාජයන් වහන්ස. **ඝොෂපරිවාරි**= නද සහිත මහත් ජලය. **විශොෂණ**= වියලීමෙහි. **ඒකඝර්මාවතාර**= අසහාය ග්‍රීෂ්මාවතාරය. **මත්සරනක්‍ර**= ක්‍රොධී කිඹුලුන් විසින්. **දුර්ග්‍රාහ**= ලං විය නො හැක්කා වූ. **සාගර**= , සයුර සමාන ශ්‍රමණයන් වහන්ස.

**උතුරුකුරුදිවින්**= අටදහස් යොදුන් පමණ විශාල වූ. සිතූ පැතූ දෙය දෙන කප්රුකින් සලකුණු වූ. එ නම් විපයෙන්. **ලොහිතචන්දනයෙන්**= රත්සඳුනෙන්. **විතතාචාර**= අදහස. **අද්වෛතවචනවූ**= වචන දෙකක් නැත්තා වූ.

(65) සිව.

**ශාන්ත සද්ධර්මාමෘතවර්ෂීවූ**= සත්හුන් සධර්ම නැමැති අමා වැසි වස්වන්නාවූ. **සම්බුද්ධ සුධාරස අනභිඥවූ**= සම්බුධ නැමැති අමාරස නො දන්නා වූ. **චතුරපාය**= නරක, තිර්යක්, ප්‍රෙත, අසුර යන සිවු අපායට. **පාතනියතවූ**= වැටීමට නියමව. **මහා අසුභ**= මහත් අසුභයන්ට. **සමස්තභුවනශර්මකරවූ**= සියලු ලොක යාට් යහපත කරන්නා වූ. **පරම මහනතරවූ**= අතිශයින් පූජ්‍ය වූ. **සංසාරපූතිගර්ත නිමග්නවූ**= සසර නැමැති අශුචි වළෙහි එරුණාවූ. **පවිත්‍රස්නානයට**= පිරිසිදු නෑමට. **ධර්ම මහාහ්‍රදය**= දහම් නැමැති මහාවිල. **සංස්කරණයෙහි**= පිළියෙල කිරීමෙහි.

**බැහැවුම්**= භයභාවය. **අග්නිශෙඛා කාළ පරිදි**= වොටුනු පළන් විධිය. **අසරණවූ පරිදි**= දුප්පත් වූ අයුරු. **නිෂ්පන්නවූ**= සිඩ වූ. **මාත්සර්ය**= මසුරු බව. **ඒකාශ්චර්ය**= අසහාය පුදුම බව. **ව්‍යාපාදය**= ක්‍රොධය. **විශාරදවූ බව**= මහත්වයට පැමිණි බව. **පැළැඹි**= මතුපත්ව. **තත්ප්‍රතිකාර**= ඒ අධර්මාදීන් සමග විරුඩ ක්‍රියායෙහි. **තත්පර**= යෙදුනු. **පුරුෂාන්තරාසෙවණ**= පුරුෂයකු සෙවීමෙහි. **ව්‍යග්‍රවූ**= ආශකතව. යෙදී. **උදිතොදිත**= පහළ වූ. **රාජහංසනිසෙවිතවූ**= රාජහංසයන් විසින් සෙවුනා ලද්ද වූ. **සර්වාඞ්ගසුන්දරවූ**= සියලු ශරීරාවයව වලින් මනොඥ වූ. **ධෛර්යමන්දිරවූ**= වීර්යයට මැදුරක් වූ. **කීර්තිසාන්ද්‍රවූ**= යශොඝොෂ යෙන් ඝණ වූ. **වනිතානයනමධුකර**= අඞගනාවන්ගේ ඇස් නැමැති බමරුන් විසින්. **නිසෙවිතාරවින්දවූ**= සෙවුනා ලද පද්මයක් වැනි වූ.

(66) පිට.

**ලෝකෝත්සවශ**= ලෝකානන්දය. ලෙවන්ගේ සතුට. **යෞවනානුපපන්නවූ**= යොවුන් බවට පුරයක් වූ. **ප්‍රණය ප්‍රසාද**= ප්‍රේම ප්‍රසාදයන්. **දත්තාවූ**= දෙන්නී වූ. **ශෘඞ්ගාරකේලිරසිකාව**= නාට්‍ය ක්‍රීඩාවන්හි ඇලී. **අශ්‍රාන්ත**= නො සන්හුන්. **චිත්ත සන්තර්පණභූයිෂ්ඨවූ**= සිත සැතප්වීමෙහි අධික සේ යෙදී. **ප්‍රේම දුස්තරවූ**= ප්‍රේමය කරණ කොට ගෙණ එතරවීමට දුෂ්කර වූ නොහොත් අධික වූ. **භාග්‍ය විස්තර වූ**= පුණ්‍යය කරණ කොට ගෙණ අධික වූ. **මුළුල්ල**= සියලූ දෙනා සමග. **අතර්ක්‍යවූ**= නො සිතිය හැක්කා වූ. **තරුණතර**= අතිශයින් ලපටි වූ. **තරල පල්ලව**= කම්පාවන්නා වූ නොහොත් බබලන්නා වූ පත්‍රයන් කරණ කොට ගෙණ. **අභිරාමවූ**= සිත්කලු වූ. **සාලබොධිශ**= සල් බෝ රුක. **තුමුල මාරබල අවලෙප**= සියලු මාරයන්ගේ බල හා ගර්වයන්. **විලොප පූර්වාඞ්ගමකොට**= විනාශ කිරීම පෙරටු කොට. **ප්‍රත්‍යූහ ශූන්‍යවූ**= අන්තරාය රහිත වූ. **පුත්‍රීකෘතවූ**= පුත්‍ර භාවයෙහි තැබූ. **රාෂ්ට්‍රිකාවූ**= රටකට අධිපතියෙක්ව,

**පරිණාමොන්මුඛවූ**= පිරිනැමීම් වශයෙන් උද්යොග කළ. **ස්වෛරසඤ්චාර**= සිය කැමැත්ත පරිද්දෙන් හැසිරීම. **දුඃඛනිර්වාපණයෙහි**= දුක් නිවීමෙහි. **සර්වදුඃඛසමතික්‍රාන්තවූ**= සියලු දුක් ඉක්ම වූ.

(67) පිට.

**සමන්තාලොකාලොක**= සියලු ලොව ආලොක කිරීම. **නිරුපහත**= විනාශ කරණ ලද. **අඥානාලොක**= නු නුවණ සමූහ. ඇති. **ප්‍රජාශොක**= ජනයන්ගේ කනගාටු. **මාරොත්සෙක**= (මාර-උත්සෙක) මාර ගර්වයාගේ බැහැරලීම්. **ධර්මානීක**= ධර්මයුධ. **කර්මවිපාක**= සුචරිත දුශ්චරිත කර්මයන් පිළිබඳ විපාක. **නිරවධිවූ**= අප්‍රමාණ. **කාරුණ්‍යාම්‍රෘතනිෂෙක ඇති**= කුළුණු දිය ඉසීම් ඇති. **නිර්වාණ නායකවූ**= සත්‍වයන් නිවණට පමුණුවන්නා වූ. **ලොකනායකවූ**= ලොක ශ්‍රෙෂ්ඨ වූ. **බුද්ධබන්ධුකෙණෙක්**= බුඩ ඥති වරයෙක්. **පූරණ ප්‍රාවීණ්‍යයෙන්**= පිරීමෙහි දක්ෂ භාවයෙන්. **සම්ප්‍රාප්තවූ**= අවබොධ කිරීම් වශයෙන් පැමිණියා වූ. **ප්‍රඥාප්‍රකර්ෂී**= ප්‍රඥවගේ උසස් බැව්. **සකලලොක සුදර්ශීනවූ**= සියලු ලෝවැස්සන්ට යහපත් දැකීමක් වූ. **සම්පත්තින් අමත්තවූ**= සම්පත් කරණ කොට ගෙණ මත් නො වූ.

**නවයෞවනාකාර**= අභිනව යොවුන් ලක්ෂණයෙන්. **මධුරවූ**= මනොඥ වූ. **හෘදය මධුකරවාරණ**= හෘදය නැමැති භෘඞ්ගයන්ගේ හැසිර වීමෙන්. **සුමනස්වූ**= යහපත් සිත් ඇත්තාවූ. **කුචකමලකුඩ්මල**= පියොයුරු නැමැති පියුම් කැකුල. **සන්නිවෙශ**= තැබීමෙන්. **මනොහර**= සිත්කලු වූ. **වක්ෂස්ථල**= පපුව නැමැති. **මහාසරසින්**= මහවිලින්.

(68) පිට.

**සර්වලොකමිත්‍රවූ**= සියලු ලෝවැස්සාගේ සුහෘදයෙක් වූ. **කොටිසියක්**= සියක් කෝටියක්. **සකලසමෘද්ධි**= සියල්ලෙන් සම්පූර්ණවීම. **සඞ්කුලවූ**= ආකුල වූ. ගැවසී ගත්තා වූ. **සකල ලොක**= සියලු ලෝවැස්සාගේ. **මනොරථවර්ධනවූ**= චිත්තප්‍රාර්ථනාවන් වඩන්නා වූ. **සකලලොකදීපවූ**= සියලු ලොවට පහනක් වූ. **ඉෂ්ටාර්ථ සම්පවූ**= අභිවෘද්ධියට ආසන්න වූ. **නීපපාදපමූල දෙශ**= බක්මී රුක මුල. **ප්‍රබල මාරබල**= අතිශයින් බලවත් වූ මාරබල නැමැති. **ශලභකුලප්‍රලය**= පලහැටි සමූහයාගේ විනාශයෙහි. **ප්‍රදීපායමාන**= පහනක් වැනි වූ. උපමානාර්ථයෙහි ආය මාන ප්‍රත්‍යය සි. **සම්භාවිත**= ලබන ලද. **නිර්ජිත සංසාරාඞ්කුර ඇති**= පරදවන ලද නොහොත් උගුළුවන ලද සංසාර නැමැති පැලැටි ඇති. **තර්ජිතමාරාහඞ්කාර ඇති**= තැති ගන්වන ලද මාරයාගේ ගර්ව ඇති.

**ක්ෂිපිතවූ**= බැහැර කරණ ලද. **කොලශචමත්කාර**= කෙලෙසුන්ගේ අධික සන්තොෂය. **ප්‍රාප්ත**= පැමිණියා වූ. **ප්‍රෙම ප්‍රසාද ප්‍රකර්ෂ**= උත්කෘෂ්ට වූ ප්‍රෙමයෙන් හා ප්‍රසාදයෙන්. **ප්‍රවණීකෘත**= නැමීම කරණ ලද. **ආත්ම ඇතිවැ**= ශරීර ඇතිව. **ගාම්භීර්‍ය්‍යයෙක් ද**= ගැඹුරු බවෙක් ද. **ඖචිත්‍යයෙක් ද**= උචිත (=සුදුසු භාවයෙක් ද. **අසන්දෙහමධුරවූ**= නිසැක භාවයෙන් මනොහර වූ. **විඥානයෙක්ද**= දැන ගැණීමෙක් ද. **ධර්මපක්ෂපාතයෙක්ද**= ධර්මයට පක්ෂකමෙක් ද. **කර්ණාමෘතවහන**= කන්හි අමා ගල්වන. **නිර්විකාර**= විකාර ශූන්‍ය වූ. ප්‍රකෘතිමය වූ. **පුරුෂ දම්‍ය ශික්ෂා ප්‍රකාරයෙක්ද**= අදම්‍ය (=දමනයට දුෂ්කරවූ) පුරුෂයන් දමනය කරණ ඉගැන්වීම් ආකාරයක් ද.

**අභූෂණ**= අලඞ්කාර ආභරණ රාහිත්‍යයෙන්. **සුභගවූ**= මනොඥ වූ. **විලාසයෙක්ද**= ආත්ම භාවයෙක් ද.

(69) පිට.

**උගභටස**= අසිරුය. **සද්ධර්මසාම්‍රාජ්‍යරාජ්‍යධුරන්ධරවූ**= සද්ධර්ම චක්‍රවර්ති රාජධුරය දරන්නා වූ. **සකලකාරුණික**= සියල්ල කරුණාමයව. **සඤ්ජාතවූ**= හටගත්තා වූ.

## (70) පිට.

**බොධිසත්ත්ව පුරුෂාකාරයට**= බෝසත් පුරුෂ ශ්‍රෙෂ්ඨයන්ගේ ආකාරයට. **තෘතීයාත්මභාවයෙන්**= බුදුවන අත් බැව්හි සිට ප්‍රතිලොම වශයෙන් තුන්වන ආත්මභාවයෙහි. **සකල ලොකමඞ්ගල**= සියල් ලෝවැස්සාගේ අභීෂ්ටාර්ථ සිද්ධියට භාජන වූ. **සර්වසම්පත්**= සියලු සැපත්. **සමුද්ගතවූ**= පැන නැංගා වූ නොහොත් සම්පූර්ණ වූ. **නිරුපම**= උපමා රහිත වූ. හෙවත් අසදෘශ වූ. **අඞ්ගප්‍රත්‍යඞ්ග**= අඟ පසඟින්. මූහුන, අත, පය ආදි ප්‍රධාන අවයව 'අඞ්ග' නම්. කන්, නාසා, ඇඟිලි ආදි කුඩා අවයව 'ප්‍රත්‍යඞ්ග' නම්.

**ප්‍රභාවතිවූ**= අතිශයින් කාන්තිමත් වූ. දිලිසෙන්නා වූ. **කාමජ්වර**= කාමජ්වරයෙන්. **ජර්ජරිත**= දුදුරු වූ. **නවයුවති**= අභිනව යුවතීන්ගේ. **හෘදයාහ්ලාද**= හෘදයට ප්‍රියඞ්කර වූ **කල්හාරකර්පූරහාරායමාන**= හෙල්මැලි කපුරු හරක් (=මාලාවක්) බඳු වූ. **අසමානයෞවනයෙහි**= අතුල්‍ය වූ (=සම නැත්තාවූ) තරුණ භාවයෙහි. **අභිනව රූප ශ්‍රී සුන්දරවූ**= අලුත් රූ සිරින් මනොඥ වූ. **ශෘඞ්ගාරශාඨ්‍යචාටුචෙෂ්ටාවට**= කාමාභියොගයාචන නැමැති රැවටිලි ක්‍රියාවට. **සහස්‍රමිශ්‍රිත වූ**= දහසින් මුසු වූ. **හාවභාවයන්ට**= ශෘඞ්ගාර රසාස්වාදයෙහිදී ඇතිවන චෙෂ්ටාවෝ 'හාව' නම් වෙති; ශෘඞ්ගාර චෙෂ්ටාවෙහි දී හෘදයගත තමා අදහස් ප්‍රකාශ කිරීම 'භාව' නම් වෙයි; ඒ හාව භාවයන්ට.

**ප්‍රණයලතා ප්‍රසූනවූ**= ආදර නැමැති ලිය පහළ කළ. **විරචිතවූ**= කරණ ලද. **නරසුර ආනන්ද**= දිව්‍ය මනුෂ්‍යයින්ගේ සතුටු. **අමන ගුණ සුගන්ධ ඇති**= වහනය වන ගුණ සුවඳ ඇත්තා වූ. **සර්වලොක**= සියලු ලෝවැස්සාගේ. **ශොකදූරීකරණ**= සොක දුරුකිරීමෙහි. **ප්‍රවීණවූ**= දක්ෂ වූ. **වෙණු**= උණ. **මාරමාන**= මරුන් ගේ ආඩම්බර නැමැති. **ගිරිහඞ්ගවිදාරණ**= පර්වත නිකුඤ්ජ කැඞීමෙහි හා පැළීමෙහි. **එකනිර්ඝාතපාතවූ**= අසහාය අසනි ප්‍රහාර (=සෙනපහර) වැටීමක් වූ. **උදාරවූ**= අප්‍රමාණ වූ. **ධර්මතත්ත්ව**= ධර්ම යන් පිළිබඳ යථාස්වභාවය (=ඇති සැටි). **සර්වසමය**= සියලු ලබ්ධීන්. **සාක්ෂාත්කරණයෙන්**= අවබොධ කිරීමෙන්. **බොධිමූල ප්‍රාන්තයෙහි**= බෝ මුල සමීපයෙහි.

## (71) පිට.

**පරව්‍යසන**= මෙරමා පිළිබඳ විනාශය. **අපහර**= දුරුකිරීම් නැමැති. **කර්මයෙහි**= ක්‍රියායෙහි. **නිෂ්ණාතවූ**= නිපුණව. **ස්වර්ගාපවර්ගමාර්ග**= දෙව් ලෝ හා නිවන් මඟ. **ව්‍යාඛ්‍යාන**= ප්‍රකාශ

කරණ. **විද්‍යායෙහි**= ශාස්ත්‍රයෙහි. **පරමාචාර්‍ය්‍යවූ**= ශ්‍රේෂ්ඨ ඇදුරුව. **අපායගාමී**= අපායට යන සුලු. **විරලකොරෙමින්**= අඩු කරමින්. **මේරුමන්දරාදින්**= මහමෙර මන්දරාදි පර්වතයන්. **තරලීකොරෙමින්**= ජලබවට පමුණුවමින්. නොහොත් කම්පා කරමින්. **අකලඞ්කවූ**= කැලැල් නැත්තා වූ. **ධවලකොරෙමින්**= සුදු කොරෙමින්. **නිර්ව්‍යාජමධුර**= සැබැවින් ම මිහිරි වූ. **කබලකොරෙමින්**= පිඬුකර අනුභව කරමින්. **සාධුවාදයෙන්**= සාදු කාර හඬින්. **ප්‍රබලකොරෙමින්**= අතිශයින් බලවත් කරමින්. **සත්පුරුෂ වෘත්තයන්**= සත්පුරුෂයන් පිළිබඳ පැවතුම්. **තුමුලකොරෙමින්**= අධික කොරෙමින්.

**ලොකාර්ථචර්‍ය්‍යායෙහි**= ලොවට හිතවැඩ පිණිස හැසිරීමෙහි. **සමස්තචක්‍රවාලාවල අනන්ත**= සියලු සක්වළ පර්වත අනන්තය. **සීමාන්තවිභක්ත**= අන්තිම සීමාව වශයෙන් බෙදන ලද. **විශ්වාම්බරමණ්ඩල**= සියලු අහස් මඬල. **ඒකාමණ්ඩණායමානවූ**= අසහාය සේ බබලන්නෙක්ව. **බුද්ධොත්පාද මඞ්ගල**= බුදුන් උපන්නේය යන යහපත් ශබ්දය. **ශ්‍රවණයෙන්**= ඇසීමෙන්. **සඤ්ජාතවූ**= හටගත්. **කුතූහල**= දෙළ. **සප්තරත්න සමලඞ්කෘත වූ**= සත් රුවනින් මොනවට අලඞ්කාර වූ. **ප්‍රඥා පුරස්සරවූ**= ප්‍රඥාව පෙරටුකොට ඇත්තාවූ. **කාරුණ්‍යධුරන්ධරවූ**= දයා ධුරය ධරන්නා වූ. **සාරධීරතා**=සාර ධෛර්‍ය්‍ය භාවයෙන්. **යුගන්ධරවූ**= යුගඳුරක් වැනි වූ. 'යුගන්ධර' නම්, මහමෙර වටා සිටි ජලමට්ටමේ සිට සතලිස් දෙදහස් යොදුන් උස ඇති ඝන බහළ මහා පර්වත වලල්ලකි. ඒ පර්වතය මෙන් තහවුරු වූ ධෛර්‍ය්‍ය ඇත්තේයැ යි යු සේ සි. **නිර්විකල්ප**= විකල්ප රහිත වූ.

(72) පිට.

**ලොකසඞ්කල්ප**= ලෝවාසීන්ගේ අදහස්. **සිද්ධිකාරණවූ**= සිදුවීමට හෙතු වූ. **ලොකලොචන**= ලෝවැස්සන්ගේ නෙත්‍රය. **ප්‍රියදර්ශීවූ**= ප්‍රියඞ්කර දර්‍ශනයක් වූ. **සමස්ත**= සියලු. **තත්ත්වාර්ථ දර්ශීවූ**= යථාස්වභාවාර්ථයන් දක්නා සුලු වූ. **විධ්වස්තවූ**= විනාශ කරණ ලද. **සමස්ත**= සියලු. **බොධිපාක්ෂික ධර්ම ප්‍රතිබන්ධ**= සත් තිස් බොධපාක්ෂිය ධර්මයන්ගේ ප්‍රතිවිරොධ ධර්මයන්. බොධ පාක්ෂිය ධර්මයෝ: සතිපට්ඨානසතර ය, ඍද්ධිපාද සතර ය, සම්‍යක් ප්‍රධාන සතර ය, ඉන්ද්‍රිය පස ය, බල පස ය, බොධ්‍යඞ්ග සත ය, ආර්‍ය්‍යමාර්ගාඞ්ග අට ය, යන සත්තිස යි. **ප්‍රවීණ**= දක්ෂ වූ. **ප්‍රඥාතිරෙක**= අධික ප්‍රඥා ඇති.

**පඤ්චකාමගුණාස්වාදයෙන්**= පස්කම් සුව විඳීමෙන්. **ප්‍රණීත** වූ= පිණ වූ. **අන්තඃකරණ ඇති**= ඉන්ද්‍රියයන් ඇති. **ධන්‍ය**= භාග්‍ය සම්පන්න වූ. **නරනාරී**= ස්ත්‍රීපුරුෂයන් විසින්. **නිෂෙවිත** වූ= සෙවුනා වූ. **අප්‍රමාණ**= අධික වූ. **විත්ත ඇති**= සම්පත් ඇති. **මුග්ධමධුර** වූ= සොඳුරු බැවින් මිහිරි වූ. **මුඛචන්ද්‍ර**= මුව නැමැති සඳින්. **වාමලොචනා නයන**= දිගැසියන්ගේ (=ස්ත්‍රීන්ගේ) නෙත්‍ර නැමැති. **චෂකපූර**= පිරුණු බඳුනෙන්. **නිපෙය**= පානය කටයුතු වූ. **කාන්තිපීයූෂ**= ශොභා අමෘත ය. **නිෂ්‍යන්ද**= ගැලීමෙන්. **සුන්දර**වූ= මනොඥ වූ. **නවයෞවනාවතාරය**= අභිනව තරුණ භාවයට.

**විමල**= නිර්මල වූ. **වදනකමල**= මුඛ පද්මයෙන්. **මධුරාධර පාලී**= සුන්දර වූ ඔඩොක්කු පිළිවෙළින්. **ඛෙලනා**= ක්‍රීඩාකරන්නා වූ. **උත්කලිකාව**= උත්කණ්ඨාවට. කළකිරීමට. **අරතිය**= අධිකුශලධර්මයෙහි නො ඇලීමට. **වනදුර්ගී**= වනයන් නිසා වූ දුර්ගස්ථාන. **සංස්කාර කොට**= උපකරණ කොට. **කුසීදතාව**= කුසීත භාවයට. **ජලදුර්ගී**= ජලයෙන් දුර්ගම (=යා නො හැකි) තැන්. **ආරොග්‍යයෙන්**= නිරොගී භාවයෙන්. **දෛවඥායේ**= පූර්වාසනායෙහි. **අනුකූල්‍යයෙන්**= යොග්‍ය භාවයෙන්. **අපශව්‍යාත් භාවයෙන්**= පසුතැවිලි නො වන බැවින්. **වෙෂභාෂාදෙක්හි**= වෙස් බස් දෙකේ. **සෞන්දර්‍යසාරයෙන්**= සුන්දර භාවයාගේ සාර වත් භාවයෙන්. **උජ්වලිත**වූ= බබලන්නා වූ.

## (73) පිට.

**ආජානීයරථයෙන්**= 'ආජානීය' නම් අසුන් යෙදූ රථයෙන්. මෙහි ආජානීයාශ්වයෝ නම්:—

> "ශක්ති හිර්භින්න හෘදයාඃ ස්ඛලන්තස්‍ය පදෙ පදෙ
> ආජානන්ති යතඃ සංඥා මාජා නෙයාඃ තතස්මෘතාඃ" යූ

ලක්ෂණ ඇති උත්තම අශ්වයෝ යි. "ශක්තිය කරණ කොට ගෙණ බෙදුනා වූ හෘදය ඇති, පියවරක් පාසා පයින් ගටන්න හුගේ සංඥව දන්නා අශ්වයෝ 'ආජානෙය' නම් වෙත්" යනු මෙහි අදහස ය. 'ආජානෙය' යනු ඊ නිසා අශ්වයන්ට නමක් බැවි නො තැකූ ධර්මකීර්තිපාදයෝ 'ආජානීය' ප්‍රත්‍යයක් දැක්වූහ.

**විවිධලොකපූජාවිධෙය**වූ= නානා ලෝ වැස්සන් විසින් පිදිය යුතු වූ. **කකුධ**= කුඹුක්. **මාරබල ව්‍යාලකුලවික්ෂොභකෙලි දෛවතෙයවැ**= මාරබල නැමැති. **ව්‍යාලකුල**= සමූහයාගේ.

**විශෝභකෙලි**= කෑලඹීම් ක්‍රීඩාවට. නොහොත් විනාශයට. **වෛනතෙය්‍යවූ**= ගුරුළෙක් සමානව. **සමස්ත වස්තු**= සියලු වස්තූන් ගේ. **විස්තාර ස්වභාව**= පැතිරීම් ලක්ෂණය. **සර්වස්වග්‍රහණ**= සර්වප්‍රකාරයෙන් ගැන්මෙහි. **රක්ත**= ඇලුනා වූ. **සකලලෝකාපවර්ගාචාර ධෞරෙය්‍යවූ**= මුළුලොවට වැඩ පිණිස හැසිරීමෙහි අග්‍රධූරීණව. (=ශ්‍රෙෂ්ඨ තනතුරු දරන්නෙක්ව). **කාරුණ්‍ය ප්‍රඥාපරවූ**= කාරුණාව හා ප්‍රඥාව පිහිට කොට ගෙණ. **අමන්දවූ ජගදානන්දකෝමවූ**= නො මඳ වූ (=අප්‍රමාණ) ලොකාප්‍රසාදය කොට. **කාරුණ්‍ය'වශ්‍යවූ**= කාරුණාවෙන් මනොඥ වූ.

**ශ්‍රද්ධා**= තුනුරුවන් ගුණ ඇදහිම. **නිර්වාණා'රාමාභිරාම වූ**= නිවන්හි යෙදෙන්නන් හට අභිරාම වූ (=මනොඥ වූ).

## (74) පිට.

**සමස්ත තත්ත්ව විදර්ශීවූ**= සියල්ල යථාස්වභාව වශයෙන් මැනැවින් දන්නා වූ. **පශ්චෙහි**= පසු කාලයෙහි. **නිරුපදෙශ**= උපදෙශ රහිතව. **බුද්ධගොචරදර්ශීවූ**= බුදුවරයන්ගේ ආචාර ධර්ම දක්නා වූ. **සර්වාඞ්ගශොභනවූ**= සියලු අඞ්ගයන්ගෙන් හොබනා වූ. **තෙජසින්**= තේජස් කාරණ කොට ගෙණ. **භාස්කර වූ**= සූය්‍ය්‍යීයා සදෘශ වූ. **සර්වලොකශඞ්කරවූ**= සියලු ලෝ වැස්සන්ට සුභ සිඬකරන්නා වූ. **මනුජලොක පුරන්දරවූ**= මනුෂ්‍ය ලොකයට ශක්‍ර වූ. **රාජමූර්ත්ති**= රාජදෙහයෙන්. **සුන්දර වූ**= මනොඥ වූ. **ශ්‍රැතවෘත්ත**= ප්‍රසිඬ වූ පැවැත් මෙන්. **බන්ධුර වූ**= මනොඥ වූ.

**රාජලොක**= රාජ සමූහයාට. **ශෙඛරවූ**= මුදුන්මල්කඩක් වූ. **චාරුභාව**= මනොඥ අධ්‍යාශයයන්ට. **පඤ්ජරවූ**= මැදිරි යක් වූ. **වික්‍රමෛකමන්දිරවූ**= අතිශය වත් සූර භාවයෙන් මැඳුරක් වැනි වූ. **ක්ෂිප්ත**= ගසන ලද. **අරතිසඞ්ගරවූ**= කොප යුද ඇති. **විපුල කීර්ත්තියෙන්**= මහත් වූ යසසින්. **සාගරවූ**= සයුරයක් වූ. **මදන මඞ්ගල මන්දිර ආකාර**= අනඞ්ගයාගේ ශුභ මැඳුරක් වැනි වූ. **චාරුශරීරකාන්ති**= මනොඥ සිරුරු ශොභායෙන්. **සම්පූර්ණවූ**= පිරුණා වූ. **නවයෞවනශ්‍රීන්**= අභිනව තුරුණු බැව් සිරියෙන්. **විරාජමානවූ**= බබලන්නා වූ. **කන්දර්පතරුවරාග්‍රශාඛාසමානවූ**= අනඞ්ග නැමැති උත්තම වෘක්ෂයාගේ මුදුන් අත්ත වැනි වූ. **රුචිර**= මනොඥ වූ. **නූපුර රාවයෙන්**= නුරුවලා හඬින්. **අනවරත**= නිරන්තරයෙන්. **මුඛරවූ**= දෙඩමළු වූ. **නිජ**= ස්වකීය. **හර්ම්‍යස්ථල**= මහල්තල. **කල්පතරුශාඛායෙහි**= කප්රුක් අත්තෙහි. **කුසුමස්තබකය**= මල් පොකුර.

(75) පිට.

**වසන්තාවෙශ**= වසන්ත කාලයාගේ පැමිණීමෙන්. බක්, වෙසක්, දෙමස වසන්තකාල නම්. **සමුද්ගත**= හටගත්. **ප්‍රගත**= අතිශය වත්. **කුසුමසම්පත්**= මල් පහස්. **තුමුලමාරබල**= අධික වූ මාරබල නැමැති. **බහල අන්ධකාරනිකරයෙහි**= ඝනාන්ධකාර සමූහයෙහි. **ප්‍රචණ්ඩ**= අතිශයින් සැඩ වූ. **සංවර්තමාර්තණ්ඩ මණ්ඩලවූ**= සංවර්ත කාලයෙහි වූ සූර්යමණ්ඩලයව. (ලොක විනාශ සමය 'සංවර්ත' නම්. සූර්යයාගෙන් හටගන්නා ගින් තෙන් නැසෙන සංවර්තසමය මෙහි ගැණිති.) **චණ්ඩභාව**= සැඩ බව. **සමස්තඥෙය්‍යධර්මාව**= සියලු දතයුතු ධර්ම නැමැති සටහණ. **නිර්විශෙෂකොට**= වෙනසක් නැති කොට. **ධර්මප්‍රවිණත්වට**= ධර්මයෙහි පරිචිතියට. **ධර්මනෛරන්තර්යත්වට**= ධර්මයෙහි නිරතුරු හැසිරීම් බවට.

**ධර්මවිජයත්වට**= දැහැමින් දිනීමට. **ධර්මාධිෂ්ඨානත්වට**= දහම් ඉටීමට. **ධර්මවිජ්‍රුම්භණත්වට**= ධර්මානුභාවයට. **ධර්මදර්පත්වට**= දහම් ගර්ජියට. **ධර්මමහොත්සවත්වට**= දහම් සැණ කෙළියට. **ධර්මොත්සෙකත්වට**= දහම් පැතිරීමට. **ධර්මවෛශාරද්‍යත්වට**= දහම්හි දැතිරි ප්‍රඥවට. **ධර්මහර්ෂත්වට**=දහම් අධික සතුටට. **අධර්මතර්ජනත්වට**=අද මට තරක් කිරීමට. **අධර්මනිර්මථනත්වට**= අධර්මයාගේ මැඬීමට. **අධර්මවිදාරණත්වට**= අධර්මයාගේ පැළීමට. **අධර්මනිෂ්කාසනත්වට**= අධර්මය කාරා දැමීමට. **සර්වලොකසම්මතාවූ**= සියලු ලොව ප්‍රසිද්ධව. **අභ්‍යස්ත**= පුරුදු කරණ ලද. **සමස්තවිද්‍යා**= සියලු ශාස්ත්‍ර විෂයෙහි.

**නිරවද්‍යමතිවූ**= නිදෝෂ නුවණැත්තෙක්ව. **දොෂප්‍රපඤ්චය**= දොෂ විස්තරය. දොස්රාශිය. **දීනානාථ**= දුගීන්ගේ හා අනාථයින්ගේ. **මනොරථපූරණය**= මනදෙළ පිරීම. **චකොරශකුන්**= ඇටිකුළුක්හු. **තමාලනීලවර්ණ**= තමලු මෙන් නිල් වන් සමින්. **සුන්දරවූ**= මනොඥ වූ. **විද්‍යොතමාන**= බබලන. **විද්‍යුත්චලශොභිරාම**= විදුලි කළඹින් මනොඥ වූ. **නිරන්තර**= අනවරතයෙන්. නිතර. **ඉන්ද්‍රචාපකලාප**= ඉඳු දුනු කළඹින්. සූර්යයාගේ නානාවර්ණ රශ්මිහු පවතින් ගැටී දුන්නක්මෙන් දක්නා ලැබෙත් ද ඒ 'ඉන්ද්‍ර චාප' හෙවත් "දේදුන්න" නම්. **අවනද්ධවූ**= වෙළඳනා ලද. **මෙඝකූටයකට**= වැසි වළාවකට. **වාතක**= කැදැති. **අතිනීල**= ඉතා නිල්වන් වූ. **සීතල සලිලභරිත**= සිහිල් දියෙන් පිරුණු. **වනසරසීවිගාහන**= වනයෙහි වූ විලකට බැස ගැණීමෙහි. **ඒකාග්‍රසිත**= එකම අදහසැති. **මත්තමාතඞ්ගරාජෙන්ද්‍රයන්**= මතැත්

රජකු මෙන්. **ජනනීස්තනාදර්ශනස්ථ**= මවුගේ පියොවුරු දැකීමට. **තරුණස්තනන්ධයකු**= බාල දරුවකු. **මහාහ්‍රදස්ථ**= මහත් වූ ජලාශයකම. **පථිකෙක්ෂු**= මගියෙක්. **නිර්වාණෝන්මුඛව**= නිවණට ඉදිරිපත්ව. **පරමප්‍රීතිප්‍රසාද**= උතුම් වූ ප්‍රීතියෙන් හා ප්‍රසාදයෙන්. **නිරන්තරීභූත**= නොකඩ වූ.

## (76) පිට.

**දෘශ්‍යමානශරීරශෝන්මෑ**= ශරීරය පෙණෙද්දී ම. **මූල්හි ගෙණෑ**= මූලින් ගෙණ. 'මූල්හි' යනු සාම් අරුත්හි අදර විබති. **මල්සැතක්**= මල්කුඩයක්. **සද්ධර්මවර්ෂා**= සදහම් වැසි. **සතතෝද්‍යුක්ත වූ**= නිරන්තරයෙන් උත්සාහවත් වූ. **අර්ථාර්හනාමාක්ෂර**= අර්ථයට සුදුසු නාම හා අක්ෂර ඇති. (ධර්මදර්ශී යන නමට ම සුදුසු). **අන්තඃකල්පය**= "දස හැවිරිදි මිනිසුන් කෙරෙහි පටන් ගෙණ මනුෂ්‍යයන්ගේ ආයුෂ ක්‍රමයෙන් නැඟී අසඞ්ඛ්‍යයට පැමිණ අසඞ්ඛ්‍යයෙහි සිට ආයුෂ ක්‍රමයෙන් බැස දස හවුරුදු වන තැන් දක්වා මෙ දෙ අතුර එක් අන්තඃ කල්පයෙක් නම් වෙයි" එය රොග, දුර්භික්ෂ, ශස්ත්‍ර ය යි ත්‍රිවිධ වේ. **ත්‍රිභුවන ශරණවූ**= තුන්ලොවට පිහිට වූ. **රාජලක්ෂ්මී**= රාජ ශ්‍රී කාන්තාව විසින්. **විරචිත**= කරණ ලද. **ස්වයංවර**= ස්වෙච්ඡාවෙන් සොයා සැමි කොට ගන්නා වූ.

**අනුපම**= උපමා රහිත වූ. **චාරුකරණවිහිත**= මනොඥ ඉන්ද්‍රියයන් විසින් කරණ ලද. **සමස්තතන්ත්‍රවාපී**= සියලු වෙද නැමැති වැව. **නිස්තාරණවූ**= තරණය කරන්නා වූ. **ප්‍රණත**= නමස්කාර කරන්නා වූ. **ධරණීපති**= රජුන්ගේ. **මණිමෞලිමාලාලම්බිත**= මාණික්‍ය සිළුමිණි මල් මාලාවෙන් එලුනු. **චරණ** වූ= පාදයන් ඇත්තා වූ. **පාර්ශ්වස්ථිතඛුරගන්ධවාරණවූ**= නරෙන්ද්‍ර නැමැති හස්තීන්ට ගඳැතෙක් වූ. **විරචිත**= කරණ ලද. **ඉන්ද්‍රිය අහඞ්කාර**= ඉඳුරන් පිළිබඳ ගර්වය. **නිවාරණ** වූ= වළකන්නා වූ. **මාත්සර්ය**= මසුරු බව. **ප්‍රත්‍යාඛ්‍යානකරණවූ**= අත්හැරීම කරන්නා වූ. **ධර්මෛකශරණවූ**=ධර්මයට අසහාය පිහිට වූ.

## (77) පිට.

**දුර්නීති**= නපුරු ව්‍යවස්ථාවන්. **විසරණවූ**= දුරු කරන්නා වූ. **නයනානන්දනවූ**= නෙත්‍රයට ප්‍රිය උපදවන්නා වූ. **මුග්ධාඞ්ගනාවදනකමල**= බොළඳ ස්ත්‍රීන්ගේ මුඛ නැමැති පද්ම. **විකාසන එක රාජහංසායමාන**= බබුලුවන ශ්‍රෙෂ්ඨ හංසරාජයකු වැනි වූ. **යෞවනාවස්ථාවතාරයෙන්**= යොවුන් බවට පැමිණීමෙන්.

**අව්‍යාජකෙළිරහිතවූ**= ශඨ (=කපටි) ක්‍රීඩා නැතිව. **සර්වාඞ්ගින**= සියලු අඞ්ගයන්ගෙන් සම්පූර්ණ වූ. **අනඞ්ගසන්දහ**= අනඞ්ගයාගේ කෙලශ දැවිල්ල. **නිර්වාපණයෙහි**= නිවීමෙහි. **නවචන්දනපල්ලව**= අලුත් සඳුන් කොළ හා. **රස නිෂෙකායමානවූ**= දිය ඉසීමක් වැනිව. **අව්‍යාජප්‍රීතිවර්ධනවූ**= සැබවින් ම ප්‍රීති වර්ධනය කරන්නා වූ. **රුචිරතර**= අතිශයින් මනොහර වූ. **බදරවනයෙහි**= ඩෙබර වෙනෙහි බදර්‍ය හෙවත් ඩෙබර නම් 'මසන්' ය. **සනරාමර ලොකප්‍රණත**= දෙව් මිනිසුන් සහිත ලොකයා විසින් නොහොත් සමූහයා විසින් නමස්කාර කරණ ලද.

**රක්තකොරක**= රත්පාට කැකුළු ඇති. 'කොරක' නම් මදක් මුකුළු කැකුළු ය. **මාරබල**= මාරසේනා නැමැති. **මූලොන්මූලන**= වංමුතු ඉගිලීමෙහි. **කෙළිමහාවරාහවූ**= මහත් වූ ක්‍රීඩා සහගත ඌරු රජෙක්ව. **සර්වධර්ම**= සියලු ධර්මයන්. **නිරූපන**= දර්ශනය කරවීමෙහි. **ප්‍රවීණ**= දක්ෂ වූ. **ප්‍රඥා ප්‍රකර්ෂ ඇතිවූ**= උත්තමඥාන ඇතිව. **ජරාපරිපන්ථ**= ජරා උවදුරින්. **මෘත්‍යු**= මාර යාට. **නිඝාතපාතයෙන්**= හෙන හෙළීමෙන්. **ශොකවිශොෂණෙන්**= ශොක වියලීමෙන්, **පරිදෙවශූල**= වැලපීම් නැමැති උල. **විනොදයෙන්**= දුරු කිරීමෙන්. **දුඃඛජාල**= කායික දුක් සමූහ නැමැති. **නලජ්වාල**= ගිනිසිල. **අවලෙපයෙන්**= දූෂණය කිරීමෙන්. (-නැසීමෙන්) **දෞර්මනස්‍ය**= දෞර්මනස් නැමැති. **මූර්ඡාවෙගයෙන්**= මුසපත් වෙයින්. **උපායාස**= දැඩි ආයාස නැමැති. **විෂාවෙගයෙන්**= විෂ පැමිණීමෙන්. **ත්‍රිභුවනව්‍යාපි**= තුන් ලෝ පතළ. **ගුණගණශ්‍රවණයෙන්**= ගුණ සමූහය ඇසීමෙන්. **අදනාලද්දවූ**= ගැතිකරණ ලද්ද වූ.

## (78) පිට.

**නිරන්තරකොරෙමින්**= අතර නැති කෙරෙමින්. **දිව්‍ය**= දෙව් ලොව ඇති. **පුෂ්ප**= මල්. **ධූප**= දුම්. **දීප**= පහන්. **නෘත්‍ය**= නැටීම්. **ගීත**= ගැයීම්. **වාද්‍යාදීන්**= වැයීම් ආදියෙන්. **අචින්ත්‍ය වූ**= නො සිතිය හැක්කා වූ. **අතුල්‍යවූ**= අසමාන වූ. **අවාච්‍යවූ**= නො කිය හැක්කා වූ. **අවෙද්‍යවූ**= නො දත හැක්කා වූ. **ඉහලොකය**= මෙ ලොව. **නිරවධි**= සීමාරහිත හෙයින් අනන්තවූ. **නිරුපධි**= විනාශ රහිතවූ. **විශුද්ධබුද්ධශාසනානුෂ්ඨානයෙන්**= පිරිසිදු බුදු කිස කෙරෙමින්. **විස්මයාපිත**= පුදුමයට පමුණුවන ලද. **ප්‍රහ්ලාදිත**= අතිශයින් සතුටු කරණ ලද. **නිර්වාපිත**= නිවන ලද. **එකවීරවූ**= එකු ම වීර්‍යයා වූ. **එකධීරවූ**= එක ම ධෛර්‍ය්‍යවත් තැනැත්තා වූ.

**එකමාන්‍යවූ**= එක ම බුහුමන් කටයුත්තා වූ. **එකවදාන්‍යවූ**= අසහාය දනශීලී කෙණෙක් වූ. **එකශ්ලාඝ්‍යවූ**= එක ම පැසැසිය යුත්තා වූ. **එකවාග්මිවූ**= එක ම ශ්‍රෙෂ්ඨ වචන ඇත්තා වූ. **එකපුරුෂොත්තමවූ**= අසහාය උත්තම පුරුෂයා වූ.

## (79) පිට.

**ස්වමතිප්‍රභාව**= ස්වකීය ඥානානුභාවයෙන්. **අප්‍රතිෂිද්ධාර්ථවූ**= නො වළකන ලද ලොකාභිවෘද්ධි ඇති. **සංසිද්ධ**= මනාකොට සිද්ධ කරණ ලද. **අශෙෂපුරුෂාර්ථවූ**= නිරවශෙෂ පුරුෂාර්ථයන් ඇත්තා වූ. ධර්ම, අර්ථ, කාම, මොක්ෂ යන මොවුහු යි. **ප්‍රකාශීකෘත**= ප්‍රකට කරණ ලද. **සමස්ත**= සියලු. **මහිත මහොත්සව භාරවූ**= කළ පූජා උත්සවයෙන් බර වූ. **උදිත**= පහළ කරණ ලද. **සමස්තලොකහෘදයානන්ද**= සියලු ලොකයාගේ චිත්තප්‍රීති කරන්නා වූ. **සකලයුවතිලීලා**= සියලු ස්ත්‍රී ශොභායෙන්. **දර්ශිවූ**= දක්වන සුළු වූ. **ශතවාරවිභක්ත**= සියක් වරක් පෙළූ. **කාර්පාසඵලස්පර්ශාවූ**= කපු පුළුන් රොදක් සේ පහස් ඇත්තා වූ. **ප්‍රණයිනී**= අඞ්ගනාවන්ගේ. **ප්‍රණයකටාක්ෂනික්ෂෙපලක්ෂ්මී**= ආදර වත් යටැස් බැලීම් නැමැති ශ්‍රී කාන්තාව විසින්. **ක්‍රියමාණ**= කරණු ලබන්නා වූ.

**ප්‍රතිපන්නනවයෞවනභාජනත්වැ**= ප්‍රසිද්ධ වූ අභිනව තරුණ භාවයට බදුන්ව. **හෘදයාහ්ලාද**= චිත්තප්‍රීතිකර වූ. **චන්ද්‍රොපමවූ**= සඳ වැනි. **සකලසමෘද්ධීන්**= සියලු දියුණුවලින්. **අසදෘශවූ**= අසමාන වූ. **ප්‍රබුද්ධවූ**= පිපියා වූ. **විනිද්‍රපුෂ්පාලඞ්කාරීවූ**= පිපියා වූ මලින් බබලන්නා වූ. **උදාර**= මහත් වූ. **මාරසර්පදර්පවාරණ**= මාර නැමැති නාගයාගේ අඩම්බරය දුරු කිරීමෙහි. **එකවෛනතෙයත්වැ**= අසහාය ගුරුළු රජෙක්ව. **නිෂ්ප්‍රත්‍යූහ**= විරුද්ධ ධර්ම රහිත. **දුර්දාන්තදමනයකොටැ**= මැඩපීමට දුෂ්කරවූවන් දමනය කොට. **රොෂවිෂ**= ක්‍රොධ නැමැති විෂය. **උත්පාටනයකොරෙමින්**= උගුළු වමින්. **කුදෘෂ්ටිදෘෂ්ටි**= මිථ්‍යාදෘෂ්ටීන්ගේ මිථ්‍යා දර්ශනයන්. **සමුද්ඝාටනයකොරෙමින්**= උගුළුවමින්.

## (80) පිට.

**අමිතවූ**= අප්‍රමාණ. **චතුරඞ්ගසෙනා ඇති**= ඇත්, අස්, රිය, පාබල යන සිවුරඟ සෙනඟ ඇත්තාවූ. **අවමඞ්ගල**= අවමඟුල්. **මඞ්ගල ඇති**= ශුභ ඇති. **සර්වලොකකර්මීණවූ**= සියලු ලොක ක්‍රියාවන්හි දක්ෂ වූ. **සද්ධර්මප්‍රීතින්**= සදහමින් වූ ප්‍රීතියෙන්.

**නිරන්තරීභූත**= අතර නැති වූ. **චිත්තසන්තාන**= සිත් සතන්. **මහදම්පක්**= මහත් වූ ඉදුනු දඹ ගෙඩි. **බද්ධකක්ෂ්‍යවැ**= බැඳුනා වූ සිත් ඇතිව. **නොයෙක්දොළින්**= නානාවිධ ආසාවෙන්. **ප්‍රතිවිදිත**= අවබෝධ කරණ ලද. **තත්ත්වාර්ථ ඇති**= ස්වභාව අර්ථ ඇති. **තීර්ථකයන් විසින්**= අන් තොටුවන් විසින්. **අදෘශ්‍යවූ**= නොදැකිය හැක්කා වූ. **අදූෂ්‍යවූ**= දූෂණය නො කට හැක්කා වූ.

## (81) පිට.

**දිව්‍යශ්‍රී**= දිව සැප. **ප්‍රඥා**- ප්‍රඥ නැමැති. **ලබ්ධ**= ලබන ලද. **බන්ධුජන ඇති**= නෑ සමූහයා ඇති. **නිරත්‍යවූ**= බාධා රහිත වූ. **ලෝකාත්ම සහිතවූ**= ලොකයා කෙරෙහි සමානව පවත්වන ආත්ම සහිත. **ස්වාමිසම්බන්ධ ඇති**= ස්වාමි ගුණය ඇති. **ප්‍රත්‍යාඛ්‍යාත**= ප්‍රතික්ෂෙප කරණ. බැහැරකළ. **දුර්නීතිගන්ධ ඇති**= නපුරු නීති නැමැති ගඳ ඇත්තා වූ. **ලෝකව්‍යාපිවූ**= ලොව පැතුරුණා වූ. **කීර්ති ප්‍රබන්ධ ඇති**= කීර්ති රාශි ඇති. **වෘෂභස්කන්ධවූ**= උත්තම ශරීර ඇත්තා වූ. **සෞන්දර්‍ය්‍ය ශ්‍රී නිවාස කුශල සමාත්ම වූ**= පූර්වොපචිත කුසලයට සමව ලැබූ ආත්ම ඇති.

**විනිද්‍රමුඛපද්මවූ**= පිපියා වූ මුව පියුම් ඇති. **නවයෞවන සුන්දරතර**= අභිනව යෞවනයෙන් අතිශය මනොඥවූ. **සෙනහ මන්දිරවූ**= සෙනහයට මැඳුරක් වූ. **යූනාවස්ථාවට**= තරුණ අවස්ථාවට. **සර්වතොභද්‍රවූ**= සර්වප්‍රකාරයෙන් මනොඥ වූ. **නයන කුමුද විකාශ**= නෙත්‍ර නැමැති කෛරව ප්‍රබොධයෙහි. **නවචන්ද්‍රිකා ප්‍රවාහවැ**= අභිනව සඳරැස් වතුරක්ව. **පරමානන්ද මූර්තිවූ**= උත්තම වූ ප්‍රීතියෙන් හටගත් ශරීරයක් වූ. **ලොකොත්තරවූ**= ලොකශ්‍රෙෂ්ඨ වූ. **ප්‍රවීණ**= දක්ෂ වූ පුරුෂයන් විසින්. **ආකීර්ණවූ**= ගැවසුනා වූ. **අවිරල**= ඝනවූ. **කුසුමසංකුලවූ**= මලින් දනතුර වූ. **සර්වලොක ප්‍රියදර්ශනවූ**= සියලු ලොකයාහට ප්‍රිය දැකුමක් වූ. **සකලකලිනාශනවූ**= සියලු පව් නස්නා සුලු වූ:

**අශන**= පියාගස (පලු.) **මාරසෙනාමාන**= මාරසෙනාවන්ගේ මාන නැමැති. **ප්‍රතානලතා ග්‍රන්ථි භෙදයෙහි**= වෙළුනා වූ වැල්හි ගැට බිඳීමෙහි. **ප්‍රබල ප්‍රභඤ්ජනවැ**= ඉතා බලසම්පන්න වාතයක්ව. **අතරුණ කාරුණාධිෂණවිෂයීකෘත**= අබාල වූ කාරුණායෙන් වසඟ කරණ ලද. **සමස්ත ප්‍රාණිමණ්ඩල**= සියලු සත්ව සමූහයා (සහ). **ශ්වෙතමණ්ඩල ඇති**= නේ මඩුලු ඇත්තා වූ. **ධර්මරාජ්‍යයෙහි**= ධර්ම නැමැති රජයෙහි. **ඥානාභිෂෙක ලදින්**= ඥානයෙන් වූ අබිසෙස් මඟුල් ලදින්. **බොධිද්‍රුම ප්‍රාන්තයෙහි**= බෝ මූල සමීපයෙහි.

## (82) පිට.

**ලෝකාලඞ්කාරකාරන්නට**= ලෝකය බබලවන්නට. **සර්ව ලෝක විඥාතවූ**= සියලු ලොව් ප්‍රසිද්ධ වූ. නොහොත් සියල්ලන් විසින් දන්නා ලද්දා වූ. **භූලෝකපාරිජාතවූ**= මනුෂ්‍ය ලෝකයට පරසතු නම් කප් රුකක් වූ. **විචිත්‍රා'ශ්‍රාමිකා පදනජාතවූ**= විසිතුරු නො ගැමි වූ (=ශිෂ්ටවූ) චරිතයෙන් හටගත්තා වූ. **උභය පක්ෂයෙන් සුජාතවූ**= මවු පිය දෙ පසින් පිරිසිදුව උපන්නා වූ. **සමස්තසම්පත්ති**= සියලු සම්පත්තීන්ගේ. **සාංඝාත්‍යයෙන්**= එක් වීමෙන්. **වල්ලි**= වනයෙහි. **ශ්‍රීපාදසේවාපිණ්ස**= සිරි පා සෙව නය කිරීම පිණිස. **සාල්‍යාණකීර්තිවූ**= යහපත් යශෝඝෝෂය ඇත්තා වූ. **ධර්මමූර්තිවූ**= ධර්මයෙන් හටගත් ශරීරයක් වූ. **චිත්තෝත්පාද සමකාලයෙහිම**= සිත පහළ වූ කෙණෙහි ම.

**චිත්‍රලතාවනාදි**= දෙව් ලොව එනම් වනය ආදිකොට ඇති. **දිව්‍යෝද්‍යානසතරට**= දිව්‍යලෝකයෙහි වූ උද්‍යාන සතරට. එනම්:- නන්දන, මිශ්‍රක, චිත්‍රලතා, ඵාරුසක යන සතර යි. **සුමුගෙක්හි**= කරඬුවක. **චිත්‍රවින්‍යාස මනෝහර**= විසිතුරු පිළියෙලින් සිත් කලු වූ. **කුසුම පූජාසොටැ**= මල්පුද. **පද්මරාගමයවූ**= පියුම් රාමිණි (=රතුකැට). **සවර්ණමයවූ කර්ණිකා ඇති**= රුවන්මය කෙමි ඇති. මල් කෙමිය නම් මලමධ්‍යයෙහි වූ බට්ටය යි. **සුරභිසෞරභ මනෝහරවූ**= සුගන්ධවත් පරාගයෙන් සිත් ගන්නා වූ. **මෙහි පෙලෙන්**= මෙහි විපාකයෙන්. **සෝත්සාහවැ**= උත්සාහ සහිතව. **අනන්‍ය සාධාරණවූ**= අසමාන වූ.

## (83) පිට.

**මහාවජ්‍රඥානෝදයයෙන්**= විදුරු මිණි බඳු මහත් ඥානය පහළවීමෙන්. **වජ්‍රප්‍රාකාරයෙක**= විදුරුමිණි පව්වෙක. **සමස්ත භුවනාභෝගභාසකරවූ**= සියලු ලොක කුහරය බබලවන්නා වූ. **අපගත**= පහ වූ. **මනඃකාලුෂ්‍යය ඇති**= පාපයන් ඇති. **අනුලෝම විලෝම**= පූර්වාපරග්‍රහණ වශයෙන්. **සමස්තලෝකාභිවෘද්ධිපූර්ෂ්‍යවූ**= සියලු ලොකාභිවෘඩින් ස්පර්ශ කරන්නා වූ. **සමස්ත සම්පත්තින්**= සියලු සැපතින්. **විකාසිතවූ**= ප්‍රබොධ වූ. **නිර්ජිතවූ**= දිනන ලද්දා වූ. **ආරාතිසේනා ඇති**= සතුරු සමූහයා ඇති. **නිරූපමෙයවූ**= උපමා රහිත වූ. **සවබාහුපාශ**= සවකීය හස්තපාස යෙන්. **නමිත**= නමන ලද. **නවයුවතිජන**= අභිනව තරුණ ස්ත්‍රීන්ගේ. **පෞඪගාඪ ශ්ලෙෂස්ට**= අතිශයින් දැඩි වූ වැලඳ ගැන්

මට. **අඛාෂවූ**=සම්පූර්ණ වූ. **සෙනහ ඇති**= ආදරය ඇති. **ශෘඞ්ගාර ශයන සහායවූ** = රති ශයනයෙහි උපකාරඇත්තෙක් ව. **හස්තිස්කන්ධයෙන්**= ඇතු පිටින්.

**උදග්‍ර**= උඩගු වූ. **සින්ධුරවරස්කන්ධ සන්ධිසමාරොහණ**= උත්තම හස්තීන්ගේ කන්දෙහි වූ සන්ධීන් සම්බන්ධ නැගීමෙහි. **ප්‍රාවීණ්‍යයෙන්**= දක්ෂ භාවයෙන්. **ප්‍රකාශිතාන**=ප්‍රකාශ කරණ ලද. **ඓරාවතනාගරාජාධිරූඪවූ**= ඓරාවත ඇතු පිට නැගුනා වූ. **පුරන්දරසෞන්දර්‍ය්‍යශ්‍රීය**= ශක්‍රයා පිළිබඳ ශොභාව. පුර නම් අසුරයා දමනය කොළෙන් ශක්‍ර තෙමේ ‘පුරන්දර’ නාමයෙන් ප්‍රචලිත විය. **අභිවෘද්ධවූ**= වැඩෙන්නා වූ. **සෞන්දර්‍ය්‍ය ශ්‍රී ඇති**= ශොභා සම්පත් ඇති. **අෂ්ටමුෂ්ටිප්‍රමාණ**= අටමිටක් පමණ. **තෘණ ප්‍රතිග්‍රහණ**= තණ පිළිගැන්ම.

## (84) පිට.

**සකලලොකපාලකවූ**= සියලු ලොව පාලනය කරන්නා වූ. **ආමලක**= නෙල්ලි. **මාරචක්‍ර වික්‍රම වික්ෂොභකෙලි**= මාරයාගේ ආඥා වික්‍රමයන් කැළඹීම් සඞ්ඛ්‍යාත ක්‍රීඩායෙහි. **විදග්ධවූ**= නිපුණව. **ප්‍රත්‍යාඛ්‍යාතවූ**= වළහණ ලද. **සමස්තවස්තු**= සියලු වස් තුන් විෂයයෙහි. **විස්තාර**= පැතිර පවත්නා. **යථාර්ථ්‍යවිරොධන**= ඇති සැටි වැළහීම ම. **එකාරසික**= එක ම රසය කොට ඇති. **මොහ ප්‍රබන්ධසම්බන්ධ**= මුළා සමූහ පිළිබඳ. **සකලවිනෙය වර්ගයා**= සියලු විනෙය ජන සමූහයා. **නිසර්ගමධුරතාරණයෙන්**= සවභාව යෙන් ම. මනොඥ වූ එතර කිරීමෙන්. **සර්වාපවර්ගමාර්ගයෙහි**= දෙව් නිවන් මඟෙහි. **සකලාරාතිදමනයෙන්**=සියලු සතුරන් දම නය කිරීමෙන්. **යථාර්ථනාම වූ**= නාමයට බඳු අර්ථ ඇත්තා වූ. **නිරතිශය ප්‍රසාදයට**= අතිශය පැහැදීමට. **කල්ප**= කල්පය. **මහා මෙඝයක්**=මහත් වූ. වැස්සක්. **නිස්සඞ්ගවූ**= නො ඇලී.

## (85) පිට.

**අශොෂ්‍යවූ**= නො වියලිය හැක්කා වූ. **කාරුණ්‍යප්‍රවාහ ඇති**= කාරුණ්‍ය නැමැති දිය ඇති. **භූත**= අතීතය. **භවිෂ්‍යත්**= අනාගතය. **වර්තමාන**= පවත්නා කාලය **කාලත්‍රයදර්ශීවූ**= කාල තුණ දක්නා වූ. **සමස්තභුවන බන්ධුවූ**= සියලු ලොකයාහට නෑයෙක් බඳු වූ. **අක්ෂීණ**= නො පිරිහුණු. **බන්ධුමත්වූ**= බන්ධුන් (=නෑයන්) ඇත්තා වූ. **ප්‍රබුද්ධ**= පිපියා වූ. **වදන**= මුඛ නැමැති. **භානුබන්ධුමතිවූ**= පද්මඇත්තා වූ. (පද්ම විකසනයට සූර්‍ය්‍යයා උපකාරී හෙයින් “භානුබන්ධුර්‍ය්‍යස්‍යසඃ” යන විග්‍රහයෙහි ‘භානුබන්ධු’

යනු පද්මයට නම්. **මදනජ්වර** = කාමජ්වරයෙන්. **ජර්ජරිත** = දූදුරු වූ. **යුවති ජන නයන උත්පල**=තරුණියන්ගේ නෙත්‍ර පද්මයන් හට. **ආස්පද**= ප්‍රතිෂ්ඨාවූ. **තරුණ සුවර්ණ ඵලකායමාන වූ**= බාල නො වූ රන් පවුරුවක් බඳු වූ.

**ස්නේහබහුමධුරදර්ශන ඇති**= ආදර පූර්ණ මනොඥ දැකුම් ඇති. **ප්‍රෙමසීමා අවිලඞ්ඝ්‍යවූ**= පෙම් ඉම නො ඉක්මවියහැකි වූ. **ශෘඞ්ගාර සුධානිෂෙක පාත්‍රවූ**= කාමාමෘතය ,බැහීමෙහි බඳුනක්ව. **නිර්වූඪ**= අතිශයින් නැඟුනා වූ. **ප්‍රෙමබන්ධන ඇති**= පෙම් බැඳුම් ඇත්තා වූ. **ආජානිය සෛන්ධවයන්ගෙන්**= 'ආජානීය' නම් උතුම් අසුන් යොදන ලද-(65 වෙනි පිටෙහි වියූ විස්තරය බලනු.) **සහමල් සල්වෙනෙහි** =එනම් වූ සල් උයන්හි. **බහලතුමුලමොහ පටල පාටන**= ඝන වූ විශාල මොහ සමූහය විනාශ කිරීමෙහි. **සහායවූ**= උපකාරි වූ. **මාර**= මාරයාගේ. **ඝොරතර**= අතිශයින් දරුණු වූ. **හුංකාරවිකාර නිකර**= හුං හුං යන ශබ්දවිකාර සමූහයන්. **දූරීකරණයෙන්**= දුරුකිරීමෙන්. **ප්‍රකාශීභූතවූ**= පතළා වූ. **බොධිසත්ත්ව සාමාජීය**= බෝසත්හුගේ සමජීභාවය.

## (86) පිට.

**අනූනපාණ්ඩිත්‍යයට**= සම්පූර්ණ පණ්ඩිත බවට. **ධර්මවර්ෂී**= දහම් වැස්ස. **ෂොඩශනසහස්‍ර සඞ්ඛ්‍යාත**= සොළ ලක්‍ෂගණන්. **සර්වරත්නමණ්ඩිත වූ**= සියලූ රුවනින් බබලන. **ස්ථානොචිත**= තැනට සුදුසු. **සුවර්ණකාර්මාන්ත වින්‍යාසයෙන්**= රන් කම් පිළියෙලින්. **සකල ධර්මාධර්ම විභාග නිදර්ශිවූ**= සියලු දහම් අදහම් විභාග කොට දත්තා වූ. **ඔබ්බෙහි**=එයින් මෙ පිට. ඔබ්බෙහි යනු අතීතාර්ථයෙහි හා අනාගතාර්ථයෙහි ද යෙදෙන්නේ ය. මෙ තැන්හි අනාගතාර්ථයෙහිය. **නාමශ්‍රවණ මාත්‍රය කුදු**= නම ඇසිම පමණකුත්. **ක්ලෙශබන්ධන දහන**= පාප බැඳුම් දැවීමෙහි. **ශිඛිවූ**= වහ්නියක් වූ. **ඥානාතිරෙක සමෘම්භූවූ**= අතිශය ඥානය කාරණකොට ගෙණ බුහමයා වූ.

## (87) පිට.

**රාගනාගමර්දන**= රාග නැමැති නාගයන් මැඩීමෙහි. **ශිඛිවූ**= මයුරෙක් වූ. **පද්මරාග මණිගණ කිරණ ස්ඵුරණයෙන්**= පියුම්රාමිණී සමූහයාගේ රශ්මි විසිරීමෙන්. **නිරන්තරයෙන්**= නිතර ම. **අරුණවර්ණවූ**= මඳක් රතු වූ. **අතිතරුණවූ**= ඉතා අභිනව වූ. **ලොකත්‍රය ව්‍යාපීවූ**= තුන්ලොව පැතුරුණා වූ. **සරච්චන්ද්‍ර ශොභාවතිවූ**= සරත්කාල්හි සඳට බඳු කාන්ති ඇත්තා වූ. **ප්‍රණය කුපිත**=

ආදරයෙන් කිපියාවූ. **ප්‍රණයිනීන්ගේ**= ප්‍රෙමිනීන්ගේ. **මානග්‍රහ**= මාන ග්‍රහණ නැමැති. **විෂ**= විසයට. **චිකිත්සාර්හ**= පිළියම් කිරීමට යොග්‍ය. **භෛෂජ්‍යමාන**= බෙහෙතක් වැනි වූ. **නවයෞවනයට**= අභිනව තරුණභාවයට.

**පඤ්චබාණ සම්බාධ ස්වරූපවූ**= පස්කම් එක් වූ තැනක් වැනි වූ. **මදන නයන**= අනඞ්ග නෙත්‍රයන්ට. **සදනධුරන්ධරවූ**= මඤ්ජීර ධුරය උසුලන්නා වූ. අනඞ්ගයාගේ නෙත්‍රයන්ට මැදුරක්ව. **සෞභාග්‍යොජ්ජ්වලවූ**= පිතින් බබලන්නා වූ. **හෘදය මදන මන්දිරායමානවූ**= චිත්ත මදයන්ට මැදුරක් වැනි වූ. **සකලභව දුඃඛ**= සියලු සංසාර දුක්වලට. **ප්‍රත්‍යනීකවූ**= විරුඬ වූ. **මාරබල බාලමෘණාල භේදයෙහි**= මාරබල නැමැති ලා නෙලුඹල බිඳීමෙහි. **ප්‍රවර වරාහ විලාස**= උත්තම හුරු රජක්හුගේ ආකාරය. **ක්ලේශාවරණ**= කෙලෙස් වැසුම්. **ව්‍යපගමයෙන්**= දුරු කිරීමෙන්. **විශුඬවූ**= පිරිසිදු වූ. **අන්තඃකරණ ඇති**= ඉඳුරන් ඇති. **මස්තක ප්‍රාප්තවූ**= මතුපත් වූ. **සමස්ත සත්ත්වාභිමතාර්ථ සාධන**= සියලු සත්ත්වයන්හට ඉෂ්ට වූ වැඩ සිදුකිරීමෙහි. **එක කල්පශාඛාවූ**= අසහාය කල්පශාඛාවක් වූ.

(88) පිට.

**අපරිහීනවූ**= සම්පූර්ණ වූ. **විරචිත වූ**= කරණ ලද. **ඉන්ද්‍රිය දමන**= ඉඳුරන් හික්මවීම. **අබුද්ධොත්පාදයෙහි ද**= බුදුවරු නොඉපදෙන කාලයෙහි ද. **සුභාවිත වූ**= පුරුදු කරණ ලද්ද වූ. **බොධිසත්ත්වාභිප්‍රායවූ**= බෝසතුන්ගේ අදහස වූ. **සංහතවූ**= නසන ලද්ද වූ. **මදනශිඛා ඇති**= මද නැමැති ගිනි ඇති. **ශිඛා ප්‍රාප්තවූ**= මුදුන් පත් වූ.

(89) පිට.

**අනුපමවූ**= අසමාන වූ. **සුප්‍රතීත**= අතිශයින් පතළා වූ. **විශුඬ ශීලවතී**= පිරිසිදු සිල් ඇත්තා වූ. **නවයෞවන සුන්දරවූ**=අභිනව තරුණ භාවයෙන් මනොඥ වූ. **සුන්දරිජන මදන මහොත්සව මන්දිරවූ**= ස්ත්‍රී සමූහයාගේ මදන සැණ කෙළියට මැදුරක් වූ. **ආචාරයෙන්**= හැසිරීමෙන්. **පවිත්‍රවූ**= පිරිසිදු වූ. **රූපයෙන්**= රුවින්. **විචිත්‍රවූ**= අලඞ්කාර වූ. **මුඛ චන්ද්‍රොපනීත**= මූව තැටියෙන් එළ වූ. **මධුර ගණ්ඩූෂ මධුපානයෙන්**= මිහිරි වූ ගඬ මී පීමෙන්. **ප්‍රසාදසුමුඛවූ**= පැහැදීමෙන් යහපත් මුහුණ ඇති වූ. **සුප්‍රබුද්ධ**= මනාව පිපියා වූ. **පද්මොපමමුඛවූ**= පියුමකට බඳු මුහුණ ඇති. **ශෘඞ්ගාරකාමුක**= රතියෙහි ඇලුනු.

**නාගමානවක මනොරථවර්ධනවූ**= නා මෙනෙවියන්ගේ මනදෙළ වඩන්නා වූ. **ලොකාර්ථචර්‍යාවත්සල මාංසලවූ**= ලොවට වැඩ පිණිස හැසිරීමෙහි බලවත් ආශා ඇති. **මාරවීරවිජයී කර්පූරදහනෙහි**= මාරභටයන්ගේ වීර්‍ය නැමැති කපුරු දැවීමෙහි. **ප්‍රබලවහ්නිවිලාස**= චණ්ඩ වූ ගිනි ආකාරය. **අනන්තාපර්‍යන්ත**= අප්‍රමාණ වූ. අගක් නැති. **ලොකාර්ථ සම්පාදනයෙහි**=ලොවට වැඩ සිදුකිරීමෙහි. **අවිශ්‍රාන්තවූ**= නො නැවැත්තා වූ. **භුවනාචාර්‍ය ධුරයෙහි**= ලොක ගුරු තනතුරෙහි. **මහිමයෙන්**=අනුභාව යෙන්. **ග්‍රාමනිගම රාජධානියෙහි**= ගම් නියම් ගම් රජදනව්වල. **චාරිකායෙහි**= හැසිරීමේ. **බුද්ධාලම්බණ**= බුදුන් නිමිති කොට උපන්. **නිර්ධූත**=පහකරණ ලද. **මාරභ්‍රූකුටි**= මාරයන්ගේ බැම හැකිලීම්.

## (90) පිට.

**තෙලෙස්ධුතාඞ්ගධරවූ**= ආරඤ්ඤිකාඞ්ගය, රුක්ඛමූලිකාඞ්ගය, සොසානිකාඞ්ගය, අබ්භොකාසිකාඞ්ගය, යථා සන්ථතිකාඞ්ගය යන සෙනසුන් පිළිබඳ අඞ්ග පස ද= පිණ්ඩපාතිකාඞ්ගය, සපදානචාරිකාඞ්ගය, ඛලුපච්ඡාභත්තිකාඞ්ගය, එකාසනිකාඞ්ගය යන ආහාරය ඇසුරු කළා වූ පස ද, වීර්‍ය සංයුක්ත වූ නෙසජ්ජිකාඞ්ගය ද, පංසුකූලිකාඞ්ගය, තෙචීවරිකාඞ්ගය යන චීවරනිඃශ්‍රිත අඞ්ග තුණ ද යන මේ දහතුණ 'තෙලෙස්ධූතාඞ්ග' නම් වෙති. කෙලෙසුන් ධූනනය (–කම්පා) කරණ හෙයින් මේ තෙලෙස ධූතාඞ්ග නම් වූහ. විස්තර විශුද්ධිමාර්ගයෙහි ධූතාඞ්ග නිර්දෙසයෙන් දත්තේය. **ධර්මමාහාත්ම්‍යයට**= ධර්මයාගේ ගරුභාවයට. **ප්‍රතිභූ වූ**= අධිපතී වූ.

## (91) පිට.

**චණ්ඩවූ**= නපුරු වූ. **අවිවෙකී වූ**= විවෙක රහිත වූ. **ආරොහකයන්**= ඇතරුවන්. ඇත්ගොව්වන්. **කිකිවක්**= කියන ලද කියන ලද ආකාරයෙන්. **සකලගුණභද්‍රවූ**= සියලු ගුණයෙන් යහපත් වූ. **භවප්‍රතිසන්ධි ඇති**= සසර නැවත නැවත ඉපදීම් ඇත්තා වූ. **ලොකප්‍රණාමගුණගමන ඇති**= ලෝවැස්සන් නමස්කාර කරණ ගුණයන්ගෙන් සමන්විත වීම් ඇත්තා වූ. **ශ්‍රමණ ගජගන්ධලිප්තවූ**= ශ්‍රමණ නැමැති ගන්ධහස්ති ගන්ධය තැවරූ. **ප්‍රලයයට**= විනාශයට.

## (92) පිට.

**ආශ්චර්‍යගුණ ඇති**= අසිරිමත් ගුණයෙන් යුත්. **සකල ලොක කල්‍යාණමිත්‍රවූ**= සියලු ලොකයාහට කල්‍යාණ මිත්‍රයෙක්

වූ. **මෛත්‍රෙයනාථයෝ**=මෛත්‍රී නම් බුදුහු. **සමස්ත සත්ත්වක්ෂෙමං කාරවූ**= සියලු සත්ත්වයන්හට නිර්භය භාවය ඇති කරන්නා වූ. **පුරොහිතවූ**= පෙරෙවි තනතුර දරණ. **සදෘශ පුත්‍රලාභයෙන්**= සදෘශ පුත්‍රයකු ලැබීමෙන්. **විශොකවූ**= පහ වූ ශොක ඇති. **මදන දහන ආවිෂ්ට**= මදන දහයෙන් ඇවිසුනු. **විදග්ධ**= කොමල වූ. **ගන්ධර්වහෘදය නිර්වාපණ**= ගඳැති ලියන් හද නිවීමෙහි. **එකසුධා ප්‍රවාහයෙක් සමානවූ**= අසහාය අමා දියත්තක් බදු. **සෞන්දර්‍ය්‍ය ශොභා**= මනෝඥ ශොභායෙන්. **විරොචිතවූ**= බබලන්නා වූ. **ශෘඞ්ගාර ශාස්ත්‍ර සම්ප්‍රයොගයෙහි**= කාම ශාස්ත්‍රයෙහි යෙදීමේ. **අග්‍රධුරීණත්වැ**= අග්‍රධුරය දරන්නෙක්ව. **සුවිඛර**= පිරිසිදු ශරීර දරන්නා වූ. **ලොකශොකාපහාරීවූ**= ලොකයාගේ ශොකයන් පහකරන්නාවූ. **මාරහෘදය පල්ලවදල කම්පායෙහි**= මාරයාගේ හෘදය නැමැති අභිනව පත්‍රයන් සෙලවීමෙහි. **යුගාන්තවාත විභ්‍රම**=කල්පාවසානයෙහි වූ වාතාකාරය.

### (93) පිට.

**විච්ඡින්නවූ**= සිඳින ලද. **භවබන්ධන ඇති**= සංසාර බැඳුම් ඇති. **අක්ෂීණවූ සත්ත්වකාරුණ්‍යයෙන්**= සම්පූර්ණ වූ සත්ත්වානුකම්පාවෙන්. **සකලලොකයා විසින්**= සියල් ලෝවාසීන් විසින්. **අනවරතයෙන්**= නිතර. **චරණ සරණාගමන ඇති**= පාදය පිහිට කොට ගැන්ම ඇති. **ප්‍රාසාද ශෘඞ්ගාග්‍රයෙහි**=' පහ කොත් අග. **විරාජමානවූ**= බබලන්නා වූ. **නවරත්න ශොභා ඇති**= නවරුවන් පැහැ ඇත්තා වූ. **නවයුවති හෘදය හරණ චාතුර්‍ය්‍යවූ**= අභිනව තරුණියන්ගේ හෘදය ගැන්මෙහි ඇදුරු වූ. **සෞන්දර්‍ය්‍යයෙන්**= රූප ශොභායෙන්. **උද්දීප්ත වූ**=බබලන්නා වූ. **පරම මධුර ගාත්‍රවූ**= අතිශයින් උත්තම ශරීර ඇති. **ප්‍රණයකලහාවසාන**='පෙම් හබ කෙළවර. **සම්භාව්‍යමානවූ**= බබලන්නා වූ. **සම්භොග ශෘඞ්ගාර සුධාස්වාදයෙන්**= අනුභවකරණ රතික්‍රීඩා අමෘතයු රස විඳ ගැන්මෙන්. **ප්‍රණයරසාස්වාදීවූ**= ආදර රසය වැහෙන්නා වූ.

### (94) පිට.

**නවනීලමෙඝකූටවිලාසයෙන්**= අභිනව නිල් මේකුළක ආකාරයෙන්. **සාඩම්බරවූ**= උඬත වූ. **මාරවීරශොෂාස්පද**= මාරභටයන්ගේ සොෂණයට කාරුණු වූ. **නීරශොෂයෙහි**= ජලය වියලීමෙහි. **ප්‍රලයදිවාකරවැ**=කල්පාන්ත සූර්‍ය්‍යව. **අසාධාරණ කාරුණ්‍ය ධීනවැ**=අසමාන වූ කාරුණ්‍ය දරන්නෙක්ව. **අශිථිලවූ**=නො බුරුල්

වූ. **සම්පත්තීන්**= සම්පත්තිය කරණකොට ගෙණ. **අගර්විතවූ**= උඩඟු නො වූ. **ප්‍රතිරාජ්‍යසමානිවාරණ පර්වතවූ**= විරුඩ රාජයන්ගේ සෙවන වළහන පව්වක් වූ. **විශාලිත**= විශෙෂයෙන් බිඳින ලද. **විශ්වපාපවූ**= සියලු පව් ඇති.

(95) පිට.

**යෞවනවිලාසපාටවවූ**= තරුණ භාවයෙන් මනොඥ වූ නොහොත් දක්‍ෂ වූ. **අමන්දවිලාසමන්දිරවූ**=අපමණ සොභාවට මැඳුරක්වූ. **කාරුණ්‍යශෘඞ්ගාර කෙළිසභාගවූ**= කාරුණ්‍යවත් කාම ක්‍රීඩාවට උපකාරීව. **සර්වලොක විජිතවූ**= සියලු ලොව දිනූ. **උත්කණ්ඨාවෙන්**= කළකිරීමෙන්. **බාහිරවූ**=බැහැර වූ. **හෘදයානන්ද මන්දිරවූ**=චිත්ත සන්තොෂයට මැඳුරක් වූ. **මාරවීරවිරොධ නිරොධිතවූ**=මාර භටයන්ගේ විරුඩය විනාශකළා වූ. **මාරාණීකප්‍රත්‍යනීක**=මරබල ඇණියට විරුඩ වූ. **නිජපරාක්‍රම ප්‍රභාව ආනිවූ**= ස්වකීය වීර්‍ය්‍ය මහිමය ඇතිව. **සකලලොකපාලවූ**=සියලු ලොව රකින.

(96) පිට.

**ධනපතන**= වස්තුව ප්‍රාර්ථනා කරණ. **සුපටුන්**= යහපත් පටුනු (-තොටවල්.) **ඝර්මාභිතප්ත**= ග්‍රීෂ්මයෙන් තැවුනු. **මුක්තිකක්**= මිදීමක්. **බන්ධනගත**= පුඩුවකට අසුවුන.

---

## සූවිසි විවරණකථා ගැටපද විවරණයයි.

---

(97) පිට.

**සුචරිත**= පාරමී නැමති පුණ්‍යයන්. **අනන්තාපර්යන්ත කාලයෙහි**= තිම් හිම් නැති කාලයෙහි. **ල**= හෘදය. **මරුකාන්තරට**= වාලුකා කාන්තාරයට. **ගොචරවූ**= ගොදුරුව. **මායම්**= රැවටිලි. **පරිවාර**= පිරිවර. **ක්‍ෂීණවූ**=ඉවරව. කෙළවරව.

(98) පිට.

**මරුභූමියෙහි**= වැලි පොළොවේ. **සංසාරකාන්තර**= සංසාර නැමැති කාන්තාරයෙහි. **කාදුවලලු**= කාදු නම් මැටියෙන් කළ වලලු. **තුලාදණ්ඩ**= තරාදි දණ්ඩ. **මත්‍ර**= පමණක්. **උපදෙශ**= ගුරුකම්. **සරාජකාවූ**= රජුන් සහිත වූ.

(99) පිට.

**දෙවධර්ම**= එනම් ධර්මය. "හිරි, ඔතප් වයෙන් යුක්තව යහපත් වූ සුකල ධර්ම නම් ලත් සුචරිත ධර්ම පූරන්නා වූ සත්පුරුෂ තෙමේ දෙවධර්මය යි කියනු ලැබේ." **මළුන්**= මලනුවන්.

**මහාරාජ**,=මහරජාණෙනි; අහං,.මම; තෙ, නුඹ වහන්සේගේ; පුත්තො, සහජ වූ පුත්‍ර වෙමි; ජනාධිප, ජනප්‍රධානයන් වහන්ස; ත්වං, නුඹ වහන්සේ; මං, මා; පොස, පොෂණය කරණු මැනැවි; දෙවො, දෙවයන් වහන්සේ; අඤ්ඤෙපි, දසිදස හස්ත්‍යශ්වාදී සෙස්සෝ ද; පොසෙති, පොෂණය කරණ සේක; සකං පජං, සවකිය ප්‍රජාව වූ (මා) කිස්සු, කුමක් හෙයින් පොෂණය නො කරන්නෙහි ද?;

**ගිවිස්වන්නෝ ද**=, ඔප්පු කරන්නෝ ද. **මතු**= අනාගතයෙහි. **ධර්මස්වරූපය**= ධර්ම තත්ත්වය. **ධර්මප්‍රසවය**= ධර්මයාගේ ප්‍රසූතිය පහළ කිරීම.

## (100) පිට.

**සිසාරා**= වටකොට. **තවපැල්හි**= තාපස ආරාමයෙහි තාපසසින් වසන කුටියෙහි. **අවිනීත**= නො හික්මුණු. **ශරප්‍රහාරයෙන්**= ඊ පහරින්. **රසතෘෂ්ණායෙන්**= රසයෙහි ලොල භාවයෙන් ආසාවෙන්. **මීහිමුසු**=මීයෙන් මිශ්‍ර වූ. **රාජාඞ්ගණය**=රජ මිදුල.

## (101) පිට.

**මලින්**= පුඩුවෙන්. උගුලෙන්. **පවනින් ම**= සුළඟින් ම. **ධර්මන්‍යායෙහි සිටූ**= ධර්ම නීතියෙහි පිහිටා. **පණිවධයෙන්**= ප්‍රාණඝාතයෙන්. පරපණ නැසීමෙන්. **බලිකර්මාන්ත**= බිලි පූජා. **ආශ්චර්ය්‍ය පවත්**= පුදුම ප්‍රවෘත්ති. **නොවිසඳුන් බව**= සිදුවෙන්නට නුදුන් බව.

## 102) පිට.

**ඉඳුරා**= එක එල්ලේ. **අධ්‍යවිෂ**= හෙල්ලය. යකඩ කුර. **දශරාජධර්මයෙන්**= දන, ශීල, පරිත්‍යාග, ඍජුබව, මෘදුබව, තපස, අක්‍රොධය, "අවිහිංසාව, ක්ෂාන්තිය, අවිරොධය යන දශයක් රජවරුන් කෙරෙහි පිහිටිය යුතු ගුණවලින්. **අශ්වාධමයා විසින්**=හීන අශ්වයා විසින්. **විරහයෙන්**= වෙන් වීමෙන්.

## (103, 104, 105,) පිටු.

**අස්ථානයෙහි**= නුසුදුසු තැන. **ගුය්හඅඞ්ග**= රහසඟ. **හිරිඔතප්**= ලජ්ජා භය. **කාමාතුරතාව**= කාමයෙන් පීඩිතව. **චොදිතව**= මෙහෙයන ලදුව. **සොළොස්කිරිගන්**= කිරිය නම් අමුණු සතරකි. එබඳු කිරි සොළොසක්. අමුණු සිවු සැටකි. **ඊර්ෂ්‍යාදී**= එකින් එකා ගැටෙමින්. **අත්‍යවසපිතව**= නො තහවුරුව. **අසෝස්ථාන**= අසුවල් තැන. **ශරීරධර්ම**= මලකිස. **සධර්මජීවිකායෙහිම**= යහපත් දැහැමි දිවි පැවැත්මෙහි.

## (106, 107,) පිටු.

**පණ්ඩිත කුටිම්බිකවැ**= නුවණැති කෙළෙඹියෙක්ව. **මිඩ්ඪ පුත**= දසියගේ පුත්‍රය. **උඩනකාම්**= උඩගු කම්. **විනාසක්**= විනාශයක්. **සහලහුරු**=නිති අහුරු. **අත් සරුසොබවැ**=හසතසාරකරලා. **ලොලවිමෙහි**= ආසා උපදවීමෙහි. **ඉනිඛ**= ඒ නිසා. **ගණශාකාවැ**= මහත් සමූහයකට ඇදුරුව. **නවුවාවූ**= විනාශ වූ. **භව්‍ය පුද්ගලයන්ට**= සුදුසු තැනැත්තන්හට. **නෙරම්සි**= බැහැර කරම් කියා. **ධම්තාවෙහි**= ධම් සවභාවයෙහි. **අවවාදක්‍ෂම**= අවවාදයට සුදුසු.

## (109, 110,) පිටු.

**ධම්මිජ්ඣකාම**= දහැමි භාවය. **ප්‍රභාවය**= වාසනා ශක්තිය. අනුභාවය. **ව්‍යාජාන්තරයකින්**= බොරු වූ අතික් කරුණකින්. **නිබොසින්**= නිහීයෙන්. **ජයකාමහ**= ජය වැම්. දිනුම් කණු.

## (111, 112,) පිටු.

**පහණ**= පාෂාණ ය! (ගල) අජීවාමන්ත්‍රණය යි. **රැහැණි**= කොපවී. **පෙදක්සේ**=පඳුවක් මෙන්. **ආත්මපරිත්‍යාගය**=දිවිපිදීම. **ගැත්තක්හු**=දසයෙකුගේ. **මහා ඊශ්වරකොණෙක්**= මහා අධිපතියෙක්. **සොත්සාහවැ**= උත්සාහ සහිතව. **සාභිලාෂවැ**= ආසා සහිතව. **සාරවැ**= හර (අරටු) සහිතව. **සාරදවැ**= අකම්පයවැ. **සප්‍රෙමවැ**= ප්‍රෙම සහිතව. **ජරාජීණ්වැ**= මහළු බැවින් දිරා. **ලෙලිලෙලි**= සෙලව සෙලවී. **දෘෂ්ටාන්තකොටැ**= උපදෙස් (-නිදශීත) කර. **එවු**= අන්තවා. **රැහැ**= රාත්‍රියෙහි.

## (113) පිට.

**සුළුපතක්**= හුළු අත්තක්. **රැහැසියන්**= ඔත්තුකාරයන්. **තොළුකොටුයෙහි** ආසන්න කොටුයෙහි. **කොධනා,**= ක්‍රොධි යහ. අකෘතඥදුව=අකෘතඥ ද වෙති. පිසුනාව, ප්‍රිය සූන්‍ය කථා ද කෙරෙති. මිත්තදූභිකා, මිතුරන්ගේ බිදීමට සුදුසු කථාකරණ සවභාව ඇත්තා හ.

## (114) පිට.

**ලිහිල්වූ**= බුරුල්වූ. **දැළි**= රැවුල්. **සමනෝඥ**= හිමියානෝ (පුරුෂයා)ය. **දනුතුදු**= දිනතත්. **විෂවෛද්‍ය**= විෂයට බෙහෙත් දන්නා වෛද්‍යයා විසින්. **අලෞකිකවූ**= ලොකොත්තරවූ. **අචින්ත්‍යවූ**= නො සිතියහැක්කා වූ: **අතුල්‍යවූ**= අසමාන වූ **අවාච්‍යවූ**= කියා නිමවිය නොහැක්කා වූ. **අවෙද්‍යවූ**= නො දත හැක්කා වූ. **නිෂෙවිතවූ**= සෙවුනා ලද්ද වූ.

## (116, 117, 118,) පිටු.

**කාලාන්තරයකින්**= බොහෝ කාලයකින්. **දුෂ්ටග්‍රාමභොජකයාගේ**= නපුරු ගම් මූලාදෑනියාගේ. **අනායකව්**= ප්‍රධානයෙක්, අධිපතියෙක් නැතිව. **මනුෂ්‍යපථයට**= මිනිසුන් වසන පෙදෙසට. **යෙළමසක්**= මාස එක හමාරක්. **කිම්පල**= අඹ වැනි විෂ ගෙඩි වර්ගයක්.

## (119, 120,) පිටු.

**යථානානන්තරය**= තනතුර. **මිනිසා**= මේ ආකාර. **පැලැවාවූ**= පැනගියා වූ. **අක්ෂධූර්තව**= දූ කෙළීමෙහි ලොල් වූ යෙක්ව. **පස ඇටගලන**= සුදු කැට ගිලින්නා වූ. **ප්‍රත්‍යවේක්ෂා නොකොට**= නුවණින් සලකා නො බලා. **ප්‍රත්‍යයපරිභොග කෞක්‍ර්තම්**= සිවු පස වළඳ නම්. **අවිශ්වාසනීයවූ**= විශ්වාස නො කට යුතු වූ. **කිම්ගන්නාක්මෙන්**= ගෙපල කපන්නාක් මෙන්.

## (121, 122,) පිට.

**වස්තුකාම**= රූප, ශබ්ද, ගන්ධ, රස, ස්පර්ශ යන පඤ්ච කාමය වස්තුකාම නම්. **ක්ලේශකාම**= පූර්වෝක්ත පඤ්චකාමයෙහි පැවැති ඡන්දරාගය ක්ලේශකාම නම්.

**අනන්තශයනය**= අනන්තිම නිදීම. (ගාථාව.) **සඞ්ඛාරා,**= සංස්කාරයෝ තුමූ. **අනිච්චා,**= ඉපිද නැතිවන හෙයින් අනිත්‍යය හ. **උප්පාදවයධම්මිනො,**= ඉපදීම විනාශය ස්වභාව කොට ඇත්තාහ. **උප්පජ්ජිත්වා,**= ඉපිද. **නිරුජ්ඣන්ති,**= නිරුද්ධ (විනාශ) වෙත්. **තෙසං,**= එබඳු සංස්කාරයන්ගේ. **වූපසමො,**= සංසිදීම් සඞ්ඛ්‍යාත නිර්වාණය. **සුඛො,**= සුවවත් වන්නේ ය. **දුර්ගතවෙති**= දුප්පත් වෙත්. **කූටවෙළෙඳහු**= සොර වෙළෙන්දෝ. **ගස්බුහුරෙහි**= ගස් බිලයෙහි. ගස් සිදුරේ. **ජ්‍යෙෂ්ඨතාපසයන්ගේ**= වැඩිමහළු තවුසාගේ. **උත්කර්ෂයට**= උසස් බවට. **සං කැවූහ**= හන්දි එක් කොළේ ය.

## (123) පිට.

**යථාලාභසන්තොෂ**= ලද පමණින් තුටුවීම යථාලාභ සන්තොෂ නම්. **තෘෂ්ණාමහිමාවට**= තෘෂ්ණාවගේ ප්‍රභාවට. **අන්හකුරු**= කැටපොලු ගැසීම. **ගස්පත්**= ගස් කොළවල. **මාත්සර්ය්‍ය**=මසුරුකම. **අප්‍රතිවජනනව**= නො වැසී. **විෂදවෙයි**= පිරිසිදු වෙයි.

## (124, 125, 126,) පිටු.

**පිළිසෙන්**= වස්ත්‍රයෙන්. **වටසින්**= මූත්‍රයෙන්. **ලෞල්‍යය**= ලොලභාවය. කෑදරකම. **අන්තෑවාසිවෑ**= අන්තෙවාසීව. ශිෂ්‍යවෑ. **අඩසවිපනෙම්සි**= හුල් උඩින් පනිම් කියා. **ප්‍රත්‍යන්තය**= පසල් දනව්ව. **සංහිඳුවන්නට**= සමථ කරන්නට. කොලාහල නො වන පරිදි කරන්නට. **නබවුණුකොටෑ**= නියපොතු වලින් තුවාල කොට. වණ කරලා. **අභයදෙවා**= මරණයට පැමිණවීමට නියම තැනැත්තෙක් හෝ මරණීය අවස්ථාවක සිටින්නෙක් හෝ ඉන් නිදහස් කිරීම අභයදානය යි. "මහාභය"යි කියන ලද මරණයෙන් නිදහස් කරණ හෙයිනි. ඒ දෙවා ලා.

## (127, 128,) පිටු.

**වලාම්කරන්නට**= විලාප කියන්නට. **බොහොඩවෙසක්**= කාටුසු වෙසක්. **පුණ්‍යමයවූ**=පිණෙන් හට ගත්තා වූ. **පරිචයලෙස**= පුරුදු පරිදි. **සාම්‍යයක්**= සමාන භාවයක්. **නුහුනුබව**= නො හැකි බැව්. **මහනියම්හි**= මහානියඟ යෙක. **තමන්ලිවාකොටෑ**= තමා විසින් ලියන ලද්දක් මෙන් කරලා. **ශ්‍රී**= සමපතති. **නුනුඅජ්ඣ**= සියුම් අදහස. **අයුක්තකාරිවූ**= අයුතු කරන්නා වූ. **සුහුඹුල්**= බල සහිත.

## (129, 130, 131, 132,) පිටු.

**කුරුඟුලාකන්හි**= රෙදි කොණේ. **ධර්‍මචින්තායෙන්ම**= ධර්‍මය සිහි කරමින් ම. **විෂාග්නි**= විස නැමැති ගිනි. **හරණට**= බැහැර කිරීමට. **පැලහෙමින්**= පිළිස්සෙමින්. **රන්පත්**= රන් වූ පියා පත්. **හෙබට**= දියවලට. "සොබ්භ" ශබ්දයෙන් කිඳිති. **දඩෑහුන**= දඩයට පැමිණියේ ය. **වැරදූ**- වැරදී. **හී**= වැටී. **ගෑහෑවී**= ගැටිලා. **බ්‍රහ්මලොකපරායන**= බ්‍රහ්මලොකය පිහිට කොට. ඉපැදීම මෙහි පරායනය වශයෙන් තැකූහ. **සමුද්‍රදෙවතාවෑ**=මුහුදු අධිපති දෙවියෙක්ව. **උකා**= ඉස. **අසක්‍යානුෂ්ඨාන**= කළ නො හැකි කටයුතු. **ජිවසූලයෙහි**= දිවස්උල. **වම්ශ**= සම. **සිවිලඟකොටෑ**= බුරුල් (මොලොක්) කොටෑ.

## (133, 134, 135) පිටු.

**මූලොච්ඡින්න**=මුල් සිඳීම. **පරුෂත්වය**=පරුස (රළු) බව. **ඇලවව**=පැත්තකට වෙව. මඟ හරුව. **සාරඹිඟු**=රියැදුරා. **සිඹියා**= සිනාසී. **සතර අපායෙහි**=නරක, තිර්‍යක්, ප්‍රෙත, අසුර යන සිවු අපායෙහි. **අවගුණය**=අගුණ ය **දනන**=දිනන. **පරිහරණය කොටෑ**=පොෂ්‍යය කොට නොහොත් ආරක්‍ෂා කොට. **බොධි**

**සම්භාරධර්මයන්**=පාරමී ධර්මයන්. **මරණුවස්**=මරණ පිණිස. **දූවාන භිත්තියෙහි** = පළිඟු භිත්තියේ. **වැකුණු** = තැවරුණු. **නිත්‍ය වෛරිවූ**=සදහි ම වෛර ඇති. **කාඤ්චනගුහායෙහි**=රන් ගුහායෙහි. **සාත්මකොට**=ආත්මය සහ සමකොට. **වජ්‍රකවචයෙක**=විදුරුමය යුධ සන්නාහයෙක.

### (136, 137) පිටු.

**කාලාන්තරයකිනුදු**= බොහෝ කලකිනුත්. **බහුශ්‍රැතභාවයෙන්**=බොහෝ ඇසූ පිරූ තැන් ඇති බැවින්. **පර්ණශාලාව**= පන්සැල. **සන්තර්පණයකලාවූ**=සැතැප් වූ **වේදත්‍රයය**=ඍක්, යජුස්, සාමන් යන වේද තුණ. **හස්තිසූත්‍ර**=පාලකාදීන් විසින් නිර්මිත ඇතුන් මනාව හික්මවන ශාස්ත්‍රය. **අළුයම් නොවිදහන තුරු**=එළිය වැටෙන්ට පෙර. **පිරිවහා**=ඉගෙණ. **අසම්භීතසිංහනාදයෙන්**= නිර්භීත වූ සිංහ ස්වරයෙන්. **සරාජිකා පර්ෂත්**= රජු සහිත පිරිස. **ශෝකාතුරවූ**=ශෝකයෙන් ඔබලත් වූ.

### (137, 139, 140, 141) පිටු.

**රූපාග්‍රප්‍රාප්තවූ**=රුවින් අග තැන් පැමිණි. **ආත්මභාවයෙහි**= ශරීරයෙහි. **සංවට්ට**=විපත් මෙඝයෙහි පටන් ජ්වාලෝපච්ඡේදය තෙක් සංවට්ට නම්. **විවට්ට**=සම්පත් මෙඝයෙහි පටන් හිරසඳ පහළවන තෙක් විවට්ට නම්. **කොහොන්කම්**=කුහන කම්. තමා වෙත නැති ගුණ දම් ඇඟවීමාදිය යි. **ආචාරසම්පන්න**= හික්මීම් ගුණෙන් යුත්. **අග්නිහොත්‍ර**=ගිනි පිදීම. **දූෂකයෙක**= කෙලෙසන්නෙක. **කමඬලු**=පැන් භාජනය. **අස්වසා**=සනසා. **කුලීනයාගේ**= කුල වතාගේ. **වෘත්තාන්ත**=තොරතුරු. (ගල් ඇන දමාගසන සැටියනාදියෙන්.) **දුර්ගය**=රජවරු වසන නො යා හැකි රහස් පුරය. **ගද්‍රභයන්**=කොටලුවන්. **සමාහිතො**=සිත සමාධිගත (එකඟ) වූයේ **යථාභූතං** = සත්‍යාදිය තත්වාකාරයෙන්. **පස්සති**=දකී යි. **විරසවූවා**=රසයෙන් තොරවූවා. **සිංහචර්ම**=සිංහ හම්. **නියමුවෙස්**=නැව්වෙස්, නැවු පදවන තතතුර.

### (142, 143) පිටු.

**කාරනැවැමියාගේ**=ඇම්බැට්ටයාගේ. **අස්බෙර හස්වා**=අශ්ව ශබ්ද පවත්වා. **කුශලාකුශලධර්ම**=පින්කම් සහ පව්කම්. **ස්වරූපසේම**=ඇති තත්වය පරිදි ම. **අවිපරීතකොටැ**=වෙනස් නො කොට. **ඇලලෙන**=කැලඹෙන. **විප්‍රතිපන්නවූ**=නො මනාව පිළිපන්නා වූ.

### (144) පිට.

**සතර අගති**=ඡන්ද, ද්වේෂ, භය, මෝහ යන සිවු පරිදි වූ අගති. **අපරිහීනධ්‍යානවැ**=නො පිරිහුනු දහැන් ඇතිව. **ඥාන**

**වෘඛයන්**=නුවණින් වැඩිහිටියන්. **ගඳකිළි**= (ගන්ධකුටි) බුදුන් වැඩ වසන සුවඳ කිළිය ගන්ධකුටිය යි. **ගම්භොාටැ**= ආඩම්බර කොට. **රූප ප්‍රශංසා**=රූපයට කළ පැසසුම්.

**(145, 146) පිටු.**

**ශරීර රක්‍ෂායෙහි**=සිරුර රැකීමෙහි. **කුශලවූ**=දක්‍ෂ වූ. **ධර්‍ම යුක්තවූ**=ධර්‍මය සමග යෙදුන. **චිත්තාවක්**=සිත්විල්ලක්. **දළදප්**= දැඩි වූ උඩඟුකම. **ගූඪවූ**=ගැඹුරු වූ. **චාචාලකම්**=දෙඩමලු ගතිය. **ශත්‍රැවිනාශ සුප්‍රාඩශමවූ**=සතුරන් හික්මවීම පෙරටු° කොට ඇති.

**(147) පිටු.**

**ස්පර්‍ශකරන්නාහු**=සම කරන්නාහු. **ධර්‍මාධිරාජවූ**=ධර්‍මයට සක්විති වූ. **ත්‍රිභුවනෛශ්වරවූ**=තුන්ලොවට අධිපති වූ. **සුරාසුර ප්‍රජාපති**=දිව්‍ය අසුර බ්‍රහ්මයන්ගේ. **මකුට මණිලළිත**=වොටුනු මිණෙන් ලීලොපෙත වූ. **චරණකමල ඇති**=පාද පද්ම ඇති.

**(148, 149) පිටු.**

**හසති ශික්‍ෂාව**=ඇතුන් හිලෑකිරිම. **ප්‍රතිපක්‍ෂ**=විරුඛ. **ආරම්මනයෙහි**=අරමුණෙහි. කරුණෙහි. **ඛන්තුනම්**= අන්නේ නම්. **බන්ධන මුක්ත කරවන්නාහු**=බැම්මෙන් ලිහන්නාහු.

**(150, 151) පිටු.**

**අසදෘශවූ මානයෙන්**= අසමාන වූ මානයෙන්. මම උසස් වෙමි යි සිතී ම මාන නම්. එය නවවිධ වෙයි. **ශුඛචිත්ත යෙන්**=පිරිසිදු සිතින්. **තොල් බිඳලන්නාවූ**=තොල් ගටන්නා වූ **පන්කලය**=කොළ කලය. **කාමසුඛානුයොගය**=කාම් සැපයෙහි යෙදීම. **ශෙඩිදී**=බැට දී. **දුක්ඛිතවූ**=දුක් වූ.

**(152, 153, 154) පිටු.**

**කණ්ඨමාණික්‍යය**= බොටුවෙහි මැණික. **අතිපානයෙන්**= බොහෝ බීමෙන්. **අක්‍ෂමවැ**=ඉවසා ගත නො හී. **මෙහෙනිමව මින්**=බත් අනුභවය අවසන් කරමින්. **ශ්‍රෙෂ්ඨිපුත්‍රයන්**=සිටුපුතුන්. **අගුණු**=අගුණ. **මුදුකොලට**=මුහුදු තීරයට. **කායවෙෂ්‍යාවළම**= කයින් කරණ වතාවත්. **ලොමුදෘහැ**= රොමොද්ගමය. (මයිල් කෙළින් සිටීම ) **ආරාමදූසක**=අසපුව කිලිටිකරණ. **ආශ්‍රිතවූ**=ස්ථාන වූ. **කණ්විවර**=කන් සිදුර.

**(156) පිට.**

**නොගිවිස්මෙහි**=නො පිළිගැන්මෙහි. **සරණාගත**= පිහිට සොයා ආවුන්ට. **වජ්‍රපඤ්ජරවූ**=විදුරුමය කුඩුවක් වූ. **සමස්ත**

**ලොකපාලවූ**= සියලු ලොව රක්නා වූ. **ශත්‍රුමණ්ඩලය**=සතුරු සමූහය. **භස්මකරන්නට**= අළු කරන්නට. **කුළුපකාව**= අතිශය හිතවත්ව. **භවාග්‍රප්‍රාප්තවැ**= නෙවසඤ්ඤ නාසඤ්ඤයතනය යි කියන ලද භවාග්‍රයට පැමිණ.

## (157, 158, 159) පිටු.

**විශරූගුණුවන්**= පිස්සන්. **බෝසසස්**= බොසෞ සම්පත්. **භද්‍රකුම්භය**=සිතූ පැතූ දෙය දෙන කළය. **කවජපයන්ට**=කැස්බා වන්ට. **පරාක්‍රමය** = දැඩි උත්සාහය. **දමනය** = යටත් කර ගැන්ම. **සමාධිය**= සිතඑකඟ කිරීම. **විජයට**=දිනීමට. **ලුවාවූ**= රළු වූ. **ගරබොයින්**=ගැරඬින්. **ඩෙබරළුල**= මසන් ගෙඩි.

## (160, 161, 162) පිටු.

**පරශුධාරා**= පොරෝ මුවහත. **ප්‍රසාද මධුරවූ**= ප්‍රේමයෙන් මනොඥ වූ. **ප්‍රතිබිම්බය**=පිළිරුව. **වහනක්**=උපාහනයක්. සෙරෙප්පුවක්. **පත්කුඩයක්**= කොළවලින් මැසූ කුඩයක්. **සංස්කාර ධර්මයෝ**=හේතු ප්‍රත්‍ය සමූහයෙන් උපන් පංචස්කන්ධය. **අනිත්‍යතා ප්‍රතිසංයුක්ත**=අනිත්‍යයෙන් යුක්ත වූ.

## (163, 164, 165 පිටු.

**සබ්භව**= සියලු භවය. **වූපරිද්දෙන්**= ඇති හැටියට. **නිශ්ශය**= නිශචය. **ශෘගාලයා**= හිවලා. **ක්ෂුද්‍රයන්ට**=කුඩා ඇත්තන්ට. **ප්‍රතිවචන මාත්‍රයක්**=පිළිතුරක් වත්. **නිර්විකල්පවැ**= නො පෙරළී. **විකොටැ**=විකුණා. **පෑ**=ප්‍රකාශ කළ. **කන්කුලක් සා**=කුළුගෙයක් පමණ. **සකුලක්**=යකඩ කුළුගෙඩිය. **කිසුණු පරිකම්**=කසිණ භාවනාවේ පූර්වභාගය කසිණ පරිකම්ම නම්.

## (166, 167) පිටු.

**කුලධනකොටැ**= කුලයෙහි නො සිඳ පැවතෙන ධනයක් කොටැ. **උරෙකිඳ**=ලෙයින් වැඩු(තමාගේම ය යි යූ සේ යි). **මරණසි භාවනායෙන්**= මරණ සති භාවනාවෙන් **සුපණිරාජවැ**= ගුරුළු රජව. **රක්ෂාප්‍රකාරයෙක**= රැකීමට පවිරෙක. **අමෘතෞෂධයෙක**= අමා බෙහෙතකි. **භිඳුවූ**= වඩන ලද්ද වූ. **භිනොත්සාහවනබවට**= අඩු වූ උත්සාහ ඇති වන බවට. **මධුවණිවූ**= මී පැණියට. **තරවා උගුරගෙණැ**=දැඩි සේ · බෙල්ලෙන් අල්වා ගෙණ. **කෙලසොපද්‍රවයන්**=කෙලෙස් උවදුරු.

## (168, 169) පිටු.

**කඩුවහයා**= කඩුව අමෝරා. කඩුව උළුක් කර. **උල්ලඞ්ඝණයක්**=උඩින් පැණීමක්. ඉක්ම වීමක්. **විද්‍යාභ්‍යාස**= ශාසත්‍ර පුහුණුව.

**සමණන් අත**= හිමියා අත. **සිප්‍ර**=සිනාසුනි. **අමෛෂයෙහි**= මෛෂ නො කිරීමේ. **උත්තමාධම**= උත්තම වූත්, අධමවූත්. **ගුණා ගුණ විභාගකරණ**=ගුණ සහ අගුණ පරීක්‍ෂා කරණ. **ගිජ්ඣපොතකයා**=ගිජුලිහිණි පැටියා.

## (170, 171, 172 පිටු.)

**කඹුරුපෝරුවෙයෙහි**= කම්කරුවන්ගෙන් පිරුණු විපියෙහි. **හිඳිකටු**= ඉදිකටු. **කෘශවන**=කෙට්ටුවත. **මාංසවිලොපන යයි**= මස් සොරකම් කිරීම යි. **දෘෂ්ටමාත්‍රයකින්ම**= දැකීම් පමණකින් ම. **ආලම්බනය කොටැ**= අරමුණු කොට.

## (173) පිට.

**ග්‍රාමාන්තරයකට**= අනිත් ගමකට. **ජීවිත සංසයකට**=ජීවිතය පිළිබඳ සැකයකට. **අන්තයෙහි**= කෙළවර. **කෘතඝනවූ**= අපරාධ කළා වූ. පාපී වූ. **සඵටික විමානයෙහි**= පළිඟු විමානයෙහි **සංසාරසාගරවෛරාග්‍යයෙන්**= සසර සයුර කෙරෙහි නොඇල්මෙන්. **අශකනිද**=ඔබ ත් දවස. **යුවරජ**=දෙවෙනි රජ.

## (174) පිට.

**සංකා කලමනා ස්ථානයෙහි**= සැක කළ යුතු තැන. **දිව්‍ය විලාසයෙන්**=දෙවියෙකුගේ අයුරින්. **නිද්‍රාප්‍රාප්තකාල්හි**=නිදගත් කල. **මනස්කාරයෙහි නිරතවැ**=චිත්තාභොග සිතිවිලි සිතීමෙන් යුක්ත ව. **ජාතිස්මරණඥානයෙන්**=පෙර ජාතිය සිහිකරණ නුවණින්. **භාෂිතයෙහි**=කථායෙහි.

## (175, 176, 177) පිටු.

**ගණිකාව**= වෙසා ස්ත්‍රිය. **පඤ්චකාම සොදයෙහි**= පස්කම් සැප විදීමෙහි. **ශ්‍රෙෂ්ඨිපුත්‍රවැ**=සිටුපුත්ව. **අධවාළකොටැ**= අඩවල් කර. මදක් ඇර. **නටධ්‍යානය**=පිරිහුණු දැහැන. **ආක්‍රන්දස්වරය**= බැගෑපත් කණගාටුදායක හඬ. **විද්‍යාධරයා**= විද්‍යාධර නම් මන්ත්‍ර ශක්තියෙන් අහසින් යන දෙව විශෙෂයකි. **පූතිමාංශ**= කුණු වූ මස්. **පර්‍යෙෂණය**= සෙවීම. **ශෘගාලයාගේ**= හිවලාගේ. **ප්‍රඥා ප්‍රකර්ෂ**= ප්‍රඥයෙහි උසස්කම. **ත්‍රිභුවනාතිශායී**= තුන්ලොව අතිශයින් පැතිරෙණ සුලු වූ. **තිව්‍රවූ**= කටුක වූ. **දුඃඛානුභවය**= දුක්විඳීම. **සිද්ධවතුදු**=සිදුවෙතත්. **බ්‍රහ්මචර්‍ය්‍යානිඃශ්‍රිත වූ**=බ්‍රහමචරියාව පිළිබඳ.

## (178) පිට.

**අනන්තඃ කල්පයක්**= අවුරුදු දහසකට අඟලක් වැඩෙනා මහ පොළොව එක් යොදුන් තෙගවු උස වැඩෙන තරමේ දීඝී කාල

යක්. **එකාශ්වාසකුදු**= එක අශ්වාස මාත්‍රයකුත්. **තෛලබින්දුමාත්‍ර කුදු**=තෙල් බිඳක් පමණකුත්. **සුශුසුගකුදු**= හුණු ටිකකුත්. **දන්තාභිරත**= දන්දීමෙහි ඇලුනෙක්. **ලෝකාර්ථ තත්පරවැ**= ලොවට වැඩ කිරීමෙහි යෙදී.

**(179, 180, 181) පිටු.**

**හස්තිකුණපාදීන්**= ඇත් මළකඳන් ආදීන්. **අතෘප්තවැ**= සතුටු නො වී. **අනාසමාකොටැ**=ප්‍රමාද නො කරවා. **සුදුබිත්ත**= සුදුවන් බිත්තිය. **ආයුෂ්සංස්කාරය**=ජීවන ශක්තිය. ආයුෂය. **ගුරුවචනය**= පියානන්ගේ වචනය. **කුලජ්‍යෙෂ්ඨයන්**= කුලදෙටුවන් කුලයෙහි ප්‍රධානයන්. **අදණ්ඩයෙන්**= දඬුවම් නැතුව. **අශස්ත්‍රයෙන්**=සැත් නො ගෙණ.

**(182, 813 පිටු.)**

**මෛත්‍රීරසයෙන්ම**= මෛත්‍රී නැමැති දියෙන් ම. **දූවකොටැ**= දූපතක් කරලා. **දීපාන්තරයකට**= අන්‍යවීපයකට. **සමුද්‍රොත්පාතකොටැ**=මුහුදු ගිල්වා. **අසාධ්‍යවූ**=සුවකිරීමට දුෂ්කර වූ. **ශොකාතිසාරයෙන්**= ශොකයෙන් හටගත් අතිසාරයෙන්.

**(183, 184) පිටු.**

**මිත්‍රාමිත්‍ර ලක්ෂණ**= මිතුරු අමිතුරු ලකුණු. **පවත්කොටැ**= ඇතිකොට. **වැඩෙක**= කණුවක. **අක්ෂණවෙධිවූ**= අකුණු එළියෙන් විදින සුලු. **ශර**= ඊ. **ජවය**= වේගය. **දෘඪප්‍රතිඥාබලයෙන්**= දැඩි වූ පොරොන්දු බලයෙන්. **කණකාජලි**= රන්දෙහොතක්. **ඉද්දෙශි**=ඉහලින්. **සවර්ණස්තම්භයෙක**= රන් වැඩෙක. **දුර්භාෂිතයෙන්**=නපුරු වචනයෙන්.

**(185, 186 පිටු)**

**හුනුබව**= වැටුන බව. **කොලක්**= කොළයක්. **සා**= ප්‍රමාණ. **විෂපීතශරප්‍රහාරයෙන්**= විෂ පෙවූ ඊ පහරින්. **මූර්ච්ඡිතවැ**=මූස පත්ව. කලාන්තව. **සඵස්වැ**= සැපවත්ව. **කෝහොන්කම්**=කුහක ක්‍රියා. **අස්ථානයෙහි ප්‍රසන්නවූ**=නුසුදුසු තැන පැහැදුනු. **සපථ කරන්නාහුද**= දිවුරවන්නාහු ද. **ජාතිමානය**= මගේ ජාතිය ශ්‍රෙෂ්ඨය යි උත්කර්ෂයෙන් තැකිමෙන් හටගත් මානය යි. **ජටාමඬුලෙහි**=දළ මඬුලුයෙහි. තලප්පාවෙහි.

**(187, 188, 189,) පිටු.**

**භස්මකොටැ**=අළුකොට. **දහසක් සෛන්ධවයන්**= දහසක් ශ්‍රෙෂ්ඨ අසුන්. **අග්‍රදක්ෂිණෙය්‍යවූ**= දක්ෂිණාව පිළිගැණීමට සුදුසු ශ්‍රෙෂ්ඨයන් වූ. **අමුරන්**= ශුද්ධ නො කළ රන්. **තෙලඹුදලි**= තෙලුම් කරටි.

### (190, 191) පිටු.

**කසල්ලේ**=කැදූල්ලේ. **ප්‍රචණ්ඩ වාතයකින්**= දරුණු සුළඟකින්. **ආශ්‍රමයෙහි**= පන්සැලෙහි. **මූර්ධයන් අතුරෙහි**=මෝඩයන් අතර. **යෞවනප්‍රාප්ත වූ**= තරුණ බවට පැමිණි. **හඹමින්**= එලවමින්. **මුදුකොලට**= මුහුදු තෙරට. **වජ්‍රඥානයෙන්**= විදුරු වැනි සියුම් නුවණින්. **ජීවිතපර්‍ය්‍යවසානයෙහි**= දිවි කෙළවර.

### (192,194) පිටු.

**යගෙහි**= යකඩින් කළ ගෙහි. **දෘෂ්ටාන්ත**= නිදර්ශන. **පර්ෂත් සහිතවූ**= පිරිස් සහිත වූ. **බුද්ධිසම්පන්නයන්**= නුවණැත්තන් විසින්. **අභිරති**=ආසා. **ශ්‍රී**= සම්පත්ති. **ස්ථිරකරන්නාහු**= තහවුරු කරන්නාහු. **උත්කණ්ඨිතවූ**= කලකිරි.

### (195, 196, 197) පිටු.

**පෙළැඹී**= සිත් බැඳ. **අනිවාර්‍ය්‍යතාව**= නො වැළැක්විය හැකි බව. **පිතෘඝාතක කර්‍ම**= සිය පියා මැරීමේ කර්‍මය. මෙද ආනන්තර්‍ය්‍ය කර්‍මයෙකි. **නිරුපධිශෙෂ නිර්වාණ ධාතුව**= පඤ්චස්කන්ධය ද ඉතුරු නො කොට පිරිනිවීම. **අනන්ත ප්‍රාණීන්ගේ**= අපමණ සතුන්ගේ. **කර්‍මකටුල්**= කටුක කර්‍මයක්. **විදැද**= ඉවසමින් ද. **දුර්ලබ්ධි**= මිථ්‍යා දෘෂ්ටි. **අටලොස් අක්ෂෞහිණියක්**= අතිකිණි දශයක් අක්ෂෞහිණියකි. එකි එකී කලාපයෙහි උණ දඬු සැට සැට ඇති කලාප (මිටි) හැටක් ගමන් කරණ සෙනාව විසින් සුණු කරණ ලද කල්හි එපමණ සෙනාව අක්ෂෞහිණිය යි නිඝණ්ඩු ග්‍රන්ථවල පෙණේ. මෙය ප්‍රමාණ රහිතව ප්‍රකාශිත නමුත් හස්තීන් 21870 ය, රථ 21870 ස, අශ්වයෝ 65610 ය ය, පදාතීහු 109350 ද යන සංඛ්‍යාවෙන් ප්‍රමිත වූ යේ අක්ෂෞහිණිය යයි සමහර ග්‍රන්ථයන්හි දක්වා තිබෙත්. එබඳු අක්ෂෞහිණී දහ අටක්.

### (198) පිට.

**ධාතුපරිනිර්වාණය**=ධාතූන් වහන්සේ පිරිනිවන් පෑම. මෙය සිදු වූ විට ශාසනය මුලු මනින් ම පිරිහුනේ වේ. මේ සසුන් අතුරුදහන් කරුණු වලින් අන්තිම කරුණ ය. ප්‍රතිපත්ති, පර්‍ය්‍යාප්ති, ප්‍රතිවෙධ, ලිඞ්ග යන සතර සිදුවී අවසානයෙහි ශාරීරික සියලු ධාතූන් වහන්සේ දඹදිව ජයශ්‍රීමහා බෝධි මූලයට රැස්ව එයින් බුදුසිරුර මැවී ඇතුළත හටගත් තෙජෝ ධාතුවෙන් ඒ සියලු ධාතු ද පිරිනිවේ. **ක්‍ෂෙමමන්ත්‍ර**= නිභීය මන්ත්‍ර. ආරක්‍ෂා මන්ත්‍ර. **හිතොපදෙශ කරන්නාවූ**= යහපත් උපදෙශ හොඳ අවවාද දෙන්නා වූ.

**සමස්ථානයෙහි**=සම වූ තැන. **සදෙවකා**= දෙවියන් සහිත. **සමාරකා**=මරුන් සහිත. **සබ්‍රහ්මකා**= බඹුන් සහිත. **අනාචාර්‍ය්‍යවෑ**= ඇදුරෙක් (ගුරු කෙනෙක්) නැතිව. **කා**= කවරෙක්. **බැහැරින්**= පිටතින්. **මනුෂ්‍යාමනුෂ්‍යාදි**=මිනිස් හා දෙවි යක් බඹ ඈ අමනුෂ්‍ය ආදීන්ගෙන්. **දූරාතිදූරණ**=අතිශයින්ම දුරැය. **වජ්‍රකාවචවූ**= විදුරුමය සැට්ටයක් වූ. **ශෛලසිඝාසන්**= එක්සිය පණස (150) ක් **කාරුණ්‍යාකුක්ෂියෙහි**= සාරුණා ගැබෙහි.

## (199) පිට.

**අපායස්ථයෝය**= අපායෙහි වූවෝ ය. **දශදික්භාගවර්තිවූ**= දශ දිග පවතින්නා වූ. **නක්ඛත්තාක්**=ඇතිසැටි සියල්ල ම. **නාග**= නයි. **සුපණ්**= ගුරුළු. **ත්‍රිකූටපර්වතය**= මහමෙර දරා සිටින ලිප්ගල් තුණක් මෙන් පිහිටි පර්වත තුණකි. **අනලෝම්බනම්**= හස්තාවලම්බනය නම්. අත්වැල නම්.

**ධම්මො**= ධර්මය තෙමේ, **හවෙ**= එකාන්තයෙන්, **ධම්මචාරිං**= දහම්හි හැසිරෙන්නහු, **රක්ඛති**= රකී සි **ධම්මො**= ධර්මය තෙමේ **සුචිණ්ණො**= මොනවට පුරුදු කරණ ලද්දේ, **සුඛං**= ලෞකික ලොකොත්තර සියලු සැප, **ආවහති**= ගෙණ දෙයි, **ධම්මචාරී**= දහම්හි හැසිරෙන තැනැත්තේ, **දුග්ගතිං**= දුගතියට, **න ගච්ඡති**= නො යයි, **ධම්මො**= ධර්මය, **සුචිණ්ණො**= මැනවින් පුරුදු කෙළේ. **එසො ආනිසංසො**= මේ ආනිසංස වෙයි.

---

## දහම්සරණ විතිශ පරිච්ඡෙදයේ විවරණ

## නිමි.

---

## (200, 201, 202) පිටු.

**දුඃඛප්‍රතිකාරණට**= දුක් පිළියමට. **කෙළිනළු**=ක්‍රීඩා නාටක. **හඹුපිසන්නට**=බත් උයන්නට. **පසග පිහිටුවා**= දෙදන දෙවැල මිටි නළල යන ස්ථාන පස බිම ඔබා වැදීම පසඟ පිහිටුවා වැදීම ය. **පිටිපෑදෙරගෙයක**= පසු පැත්තේ ගෙයක. බස්නාහිර පැත්තේ ගෙයක. **සසින්**=බඩගින්නෙන්. **ධම්සෙනෙවි**= බුදුරජානන් වහන්සේ විසින් පළ කළ සියලු ධර්මයන්ට ආයුෂ්මත් ශාරිපුත්‍ර ස්ථවිරයන් වහන්සේ සෙනාපතියෙකු බදු හෙයින් උන් වහන්සේට මේ නාම ව්‍යවහාර වේ. **අඹුව ඇකයේ**= ස්ත්‍රියගේ ඔඩොක්කුවේ. **ඛෙත්වත**=ක්‍ෂෙත්‍ර වස්තුව. කුඹුරු බිම.

### (204, 205) පිටු.

**සඤ්ඡගසා**= හත තබා. සංඥව පිණිස ඔබ්බන ලකුණු තබවා. **ක්‍ෂණික්**= වෙසහතක්, **ලද් අවසරයෙසා**= ඉඩ ලැබුන වේලාවක. **බුදුපාමොක්**= බුදුන් ප්‍රධාන. **සාඑමෙන්**= හැන්දෙන්. **උසා ගෙණැ**= බේරා ගෙණ. උධරණය කොට ගෙණ. **අමෘතපරිෂෙකයක්**= අමා දිය ඉසිමක්.

### (206, 207 208,) පිටු.

**සකලලොකාධිකාක්**= ලොකාභිවෘධිකර සියලු දේ ම. **කෘෂ්ණපක්‍ෂචාතුද්දසියෙහි** = කළුවර පක්‍ෂයේ තුදුස්වක් පොහෝද. **ලකිරු කුසක්**= බාල සූය්‍ය මණ්ඩලයක්. **ජාතිරඹගමාණික්‍යයක්**= දූරහමිණි රුවනක්. **එල්බකොටැගෙණැ**=ආධාර සාර ගෙණ නොහොත් ඉලක්කයක් සාර ගෙණ. **රාජභය**= රජුන් කෙරෙන් වන බිය. **චොරභය**= උමං පැහැරීම් ආදී සොරුන් කෙරෙන් වන භය. **අග්නිභය**= ගින්නෙන් වන බිය. **ගර්හමාංශය**=ගැබ් මස. ගැබිනි දරුවන් වසන තැන. **මලදු**= මලකඩ දූලා **විසාගිකවූ**= පිපියා වූ. **සාරය**= දූලිපිහිය. **සාරඅක්හිම**= හිසකේ සිඳ අවසන්හි ම. **සිවුපිළිසිඹියාපත්**= අර්‍ථ, ධර්‍ම, නිරුක්ති, ප්‍රතිභාණ යන සතර ප්‍රතිසංවිදාවන් අවබොධ කොට. (විස්තර සද්ධර්‍ම රත්නාකරය බලනු.)

### (209, 210, 211) පිටු.

**වහල්වන්නට**= පිහිට වන්නට. උපකාර වන්නට. **වජ් මනුලෙක්**= සී සැම් මනුලෙක්. **අනුමෙවෙනිබණ**= අනුමොදනා ධර්‍ම. **පෙසකාරයා**=රෙදි වියන්නා. **පිරිවෙනක්**= පරිවෙණ ස්ථානයක්. භාවනාදිය කිරීමට යොග්‍ය වූ ආශ්‍රමයක්. **ගිඩ්ඩා**= පොරොන්දු කරවා. **තුන්සිවුරු**= හඳනය, තනිපට සිවුර, දෙපට සිවුර යන සිවුරු තුණ. **සුමුගක්**= මඤ්ජුසාවක්. පෙට්ටියක්. **අනාගත ඥානයෙන්**= මතු කාලය බලන නුවණින්.

### (212, 213) පිටු.

**අශ්වාරොහකයන්**=අසරුවන්. අසුන් එලවන්නන්. **වාතිාවක්**= ප්‍රවෘත්තියක්. **අවධි අවශ්‍යා**= සීමා ප්‍රමාණය. **කාලාන්තරයක්**= විසා වේලාවක් නොහොත් සවල්ප කාලයකින් පසු. **අවධිලදින්**= සිහි ලැබ. **රූවට**= රූපයට. **පරාක්‍රමයට**= අධික වීය්‍යීයට. **ශීල**= ප්‍රාතිමොක්‍ෂාදි සීලය. **සමාධි**= සිත එකඟකර ගැණිම. **ප්‍රඥා**=විදර්ශනා ඥනාදි ශ්‍රෙෂ්ඨ නුවණ. **වටා**=වට කොට.

**සසලා පිශා**= වක්‍ෂුවල කොට. **විළිතැතිවැ**=ලජ්ජා නැතිව. ක්‍රීඩා ශබ්දයෙන් තිහන සි. **ගැතිපක්වගෙ**=දුස් භාවයට පැමිණියහ.

## (214 215) පිටු.

**අටමහානරකයෙහි**= 1. සඤ්ජීවය, 2. කාලසූත්‍රය, 3. සඞ්ඝාතය, 4. රෞරවය, 5. මහා රෞරවය, 6. තාපය, 7. ප්‍රතාපය. 8. අවීචිය යි කියන ලද නිරය අටෙහි. **සමුදී**= අවසර දී. **ගවිසක්**= සිත්හි උඩඟු කමක්. ආඩම්බරයක්. **සඟළසිවුර**= දෙපට සිවුර. **සවණක් සණ බුදුරැස්**=නීල, පීත, ලොහිත, අවදාත, මඤ්ජිෂ්ඨ, පභස්සර යන ෂට්වර්ණ වූ බුඩ රශ්මි. සතරවන සතියේ රත්නගෘහයෙහි දී ප්‍රතීත්‍ය සමුත්පාදය මෙනෙහි කරණ කල බුදු සිරුරෙන් මෙ කී සවණක් **රැස්** ප්‍රථම වරට විහිදුනේ ය. **මචඡකාචඡප ඝන්ධ**= මස් කැසුබුවන්ට. **ජලාශ්‍රෂවූ**= දිය ඇසුරු කොට ඇති. **දුරුකාතර**= ඉතා දුර වූ මාගීය. දීඝී මාගීය.

## (216, 217) පිටු.

**අරහතො,** පූජාදියට සුදුසු හෙයින් අර්හත් නම් වූ; **සම්මා සමබුඩසස,** චතුරාර්‍ය්‍ය සත්‍ය ධර්මයන් නිරුපදෙශව තෙමේ ම පිරිසිඳ දත් හෙයින් සම්‍යක් සම්බුඩ වූ; **තසස භගවතො,** භගන කළ රාග වෙෂාදීන් ඇති ඒ භාග්‍යවතුන් වහන්සේට;**නමො,**නමස්කාර වේවා. **ඉඳුනිල්මිණි**= ඉන්ද්‍ර නිල මණිමය වූ. **මුබෙහි**=ලඟ. **බබෙහි**=එපිට. **අනලගලක්**= ඇතුරු ගලක්. **භගවතා**= භාග්‍යවතුන් වහන්සේ විසින්. **ධම්මො,** ධර්මය තෙමේ; **සවාකඛාතො,** මනාකොට දෙශනා කර වදළසේක. **අශවාරොහණමඞගලසට**= අසුන් පිටට ශුභ දිනයෙක්හි අභිනවයෙන් නැඟීමේ ප්‍රීත්‍යුත්සවයට. **භගවතො,** භාග්‍යවතුන් වහන්සේගේ; **සාවකසඞෙඝා,** ශ්‍රාවක වූ සඞ්ඝතෙමේ; **සුපටිපනෙනා,** මධ්‍යම ප්‍රතිපදාවෙහි පිහිටි හෙයින් සුප්‍රතිපන්න ය. **පත්අතුරෙන්**= කොළ අස්සෙන්. **වෙළෙළ්**=රිකිලි. **නබරශමිනැමැති**= නියරැස් නැමැති. **එහිභික්‍ෂුභාවයෙන්**= "එව! මහණ!! බඹසර හැසිරෙව සි" බුදුරජානන් වහන්සේගේ මුවගැබින් නික්මුණු පමණින් පූර්වකෘත පුණ්‍යානුභාවය පරිදි පා සිවුරු අහසින් විත් තෙමේ ම සිරුර වෙළී පැවිදි වීම **එහි භික්‍ෂුභාව ප්‍රව්‍රජ්‍යාව** නම්.

## (218, 219, 220) පිටු.

**ශොකාතුරවැ**= ශොකයෙන් ඔබලත්ව. **උපාසාහනර** =උපාසාරුණු. **අශ්‍රවූ**= ශෙෂ්ඨ වූ. **ගංහිසැ**= ගංගායෙහි මුදුන් පෙදෙසට.

**අහොසුඛං**= සැපය පුදුම යි. **කාමසුඛයක්**= කාම් සැපතක්. **උදන් අනති**= ප්‍රීති වාක්‍ය ප්‍රකාශ කෙරෙති. චිත්තාභ්‍යන්තරයෙහි අප්‍රමාණ සතුටක් උපන් විට එය දරා සිටීමට හෘදය නො තරම් බැවින් එය වචන බවට පැමිණ මුව ගැබින් පිට වෙයි එය උදන නම් වේ. **නවලොවුතුරුදහම්**= නවලොකොත්තර ධර්මය. සොවාන් මාර්ගාදී සතර මග සතර ඵල සහ නිවණ ද යන නවය යි. **ධම්මපීති**=නවලොවුතුරු දහම් රස වළඳන්නේ, **සුඛංසෙති**= සැප සේ ශයනය කෙරෙයි **පණ්ඩිතො**=නුවණැති තැනැත්තේ; **විප්පසන්නෙන**=අතිශයින් ප්‍රසන්න වූ; **චෙතසා**=සිතින් යුතුව; **අරියප්පවෙදිතෙ**=ආර්‍ය්‍යයන් විසින් පවසන ලද; **ධම්මෙ**=ධර්මයෙහි; **සදා**, සැමකල්හි; **රමති**, ඇලෙයි.

**අසාමෙන්**= ඇවෑමෙන්. මරණින් පසු. **සහජාතවූ**= එක්ව උපන්නා වූ.

(221, 222 පිටු.)

**ගණසඞ්ගණිකාවට**= ගණයා (=සමූහයා) කෙරෙහි ඇලීමට. **නියතකලහ**=නියම කලහ. **අසමාධි කාරන්නාවූ**= හිත එකඟ කරගැණීමට නො දෙන නොහොත් අහිතකාරී වූ. **කාය චිත්ත**= ශරීරය පිළිබඳ වූ ද සිත පිළිබඳවූ ද. **පණ්ණසාලායෙහි**= පන්සැලෙහි. **සෙහෙන්** = සුව සේ. **අබ්භොකාශයෙහි**= එළිමහනේ. **හත්ථිලිඞ්ගනම් සකුණයෙක්**= ඇත්කඳ ලිහිණියෙක්. **හයාගෙණ**=උසුලා ගෙණ. ඇරගෙණ.

(223, 224, 225) පිටු.

**මණ්ඩපාකාරයෙන්**= මඩුවක් මෙන්. (කවාකාරවැ.) **ප්‍රසවවිමද**=මවු කුසින් බිහිවීම ද. උපදීම ද. **විරොධයක්**=විරුද්ධකමක්. **ස්වයංජාත**= තෙමේ ම හටගත්. ඉබේම හැදුන. **හදහා**= විශ්වාස කොට.

(227, 228, 229, 230) පිටු.

**වැලි**= නැවත. **ක්ෂුධාවට**= බඩගින්නට. **සත්ඛෙක**= සත් වතාවක. **කුකුරුවකු**= බලුපැටවෙක්. **නිබඳවැ**= නිතර. **දණ්ඩගසා**= ලියෙන් පැහැර. **කණ**= කොළවර. **ගෙත්නම්කාරණ පිණිස**= මැහීමට. **වක්‍රබුද්ධියක්**= වක් වූ (=ඇදවූ) නුවණක්. **ඍජු බුද්ධියෙන්**=අවඞ්ක වූ නුවණින්. **ආහාරක්ෂයින්**= ආහාර ක්ෂය වීමෙන්. නැතිකමින්. **ඛන්කොණෙහි**= දෑමූ වේලෙහි. **අදවක දවස**= අද දින.

## (231, 232) පිටු.

**ගොඩුද්දෙශි**= ගවයින් වසන ගාලෙහි. **ගොවුදිගාඬෙහි**= ගවයින් යන ඉදිකඩ. **චණ්ඩසත්ත්වයන්**= දරුණු සතුන්. **වක්‍රගාමී**= ඍජු නො වූ ගතිය= **ශික්ෂිත ගොණුන්**= පුරුදු කළ විනීත ගොන්. **මහාභාග්‍ය**= මහ පිණැති. **වජ්‍රප්‍රාකාරවූයේ**= විදුරු මිණි පව්වක් උනේ. **පවත්**= ප්‍රවෘත්ති. **එකත්පස්වැ**= එක් පාර්ශ්වයකින් පැත්තකින් සිට. **ගැලිගෙණැ**= නැමී. **විජනස්ථානයෙහි**= මනුෂ්‍යයන් නැති තැන. **එළිසත්**= එළු දෙනක්. **නෙරිනට වනත්**= එලවීමට උත්සාහ කළ (නමු) ත්.

## (233,234) පිටු.

**හුනු**=වැටුනා වූ. **ලැහැබ**= ගොල්ල. **නලකාරයෙක්**= කුළු පොත්තෙක්. **අප්‍රමත්තවැ**= පමා නොවී. **කුඩලා**= වලන් පුළුස් සන බඩහැලයා. **සූල**= මැටි අත. **අවජාතපුත්‍රයෙක්**= තමාට බදු නො වූ හීන වූ පුත්‍රයෙක්. **පලහන**=පුලුස්සන. **සූලයෙහි**= ලිප්හි. **මේදැස**= මේ දහස. දහස යයි යු තැන මධ්‍ය හකාර ලොපයෙන්. දැසය යි සිදුවි ය. එහෙයින් ම පූර්ව වර්ණයට දීර්ඝවිය. **නිහඬකරන්ට**= ඉෂ්ට කරන්ට. **දිවාභාගයෙ**= දවල් කාලය. **මෙහෙවරෙක**= පණි වුඩ ක්‍රියා වෙක. **දෙවෂයක්**= එරෙහි බවෙක්. **නිශ්චයවුවද**= තිර ණය උනත්. **නෙල**= අර. **තුලු**= මොහු. **පත්**=ලියුම්.

## (235, 236, 237) පිටු.

**දුටු ඇසිල්ලෙහිම**=දෙක්ක වේලේ ම. **සත්බුමු**= සත් මහල් **ව්‍යාපාරවිධියට**=සෙල්ලම්කරණ ස්ථානයට. **කුරුඟුලාකණ**=රෙදි කොණ. ඔඩොක්කු කෙළවර. **නියුක්ත**= පොරෙත්තු. **සංඛ්‍යා විචාරණ**=ප්‍රමාණය අසලා. **ද්විපද**=දෙපා ඇති සත්ත්වයෝ ය. **චතුෂ්පද**= ඇත් අස් ආදී සතර පා ඇති සත්ත්වයෝ-ත්. **මිනිසා**= මේ ආකාර, **අවමඞ්ගල්‍ය බස්**= අවමඟුල් වචන. **රාජාඞ්ගණයෙහි**= රජමිදුලේ. **ආදි**=මුලින්. **අනාපත්වැ**=තත්ත්වය නො දැන. **ආපත උවමනාවේද යි**=පණ්ඩිතවිය යුතු නොහොත් යථාර්ථය දක් නෙක් විය යුතු නො වේ ද.

## (238, 239, 240) පිටු.

**අරගල**=කොලාහලය. **අන්තඃපුරයට**= ඔරොධයට. අගමෙහෙ සුන් බිසව් හැර අවශෙෂ පුර ස්ත්‍රීන් වසන පුරය. **අස්ඹබ්බවා**= මුද්දර තබා. තහනම් කොට.

### (241, 242, 243) පිටු.

**ඈතෙකු ඉදිකරවා**= ඈතෙකු සාදවා. **විජිතයට**= නුවරට. **හස්තිලණ්ඩ**=ඇත් බෙටි. **ජීවග්‍රාහගොකොට**=සතුරුරජෙකු අල්වා ගෙණ ඔහු නො මරා යටත් කොට ගැන්ම ජීවග්‍රාහය යි. ජීවිතය සහිතව ගෙණ යනු අර්ථ යි. **සාඩතුරාවෙන්**= තිරයෙන්. **ශ්වෙත කුෂ්ටඇති**= සුදු කුෂ්ට රොග ඇති. **අනුරාගයක්**= පිළිබඳ සිත් ඇති බවක්. **බොල්වැ**= සණ ව. **වලහා**= රවටා. **ජවනිකාව**= තිරය. **භද්‍රාව**= සොඳුරිය. **සැමියන්**= ස්වාමින්. **සහෝදරයන්නෝද**= සහෝදරයෝ ද. **උපචාරපිණිස**= සම්පූර්ණ වීම පිණිස.

### (244) පිට.

**හැවිලියදි**= කලබොල වෙත් දී. **සිළිපියෝද**= කුඩා පියා ද. **පරිභවැබැණැ**=අවමන් කොට කියා. **මහාපරිවාරකුලෙන්**=මහා පිරිවර ඇති කුලයක. **වාතිකලද**= ප්‍රවෘත්ති කියේ ද. **හල**=විවෘත කළා වූ. **දවානල**= ලැව් ගින්න. **කර්පූරසලාවක්සේ**= කපුරු ඉරටුවක් මෙන්. **අද්දගුලිකාසේ**= බෙහෙත් ගුලි මෙන්. **උපනිඃශ්‍රය**= වාසනා බලය.

### (245) පිට.

**පිල්මරා**= පිල් පාත් කොට. **ඉන්ද්‍රනිලමයුරයන්**= ඉඳුනිල් බඳු පැහැති මොණරුන්. **නිලකාන්තිනමන්නාවූ**= ඉඳුනිල් කාන්ති වහනය වන්නා වූ. **නෙවුනාවූ**= බබලන්නා වූ. **බැමසගලින්**= බැම යුගලයෙන්. (-දෙකින්) **රන්ගල්අතලයකින්**= රන්ගල් තලාවෙකින්. **අතිධවලවූ**= ඉතා සුදු වූ. **ඌර්ණරොමධාතුවෙන්**= නළල දෙබැම අතර පිහිටි සුදු වූ රොම ධාතුවෙන්. **පෙරවි**=පෙර වන ලද. **විඳුගෙණැ**= කම්පා කරමින්. **වෙලෙව්ව**= ඉක්මනට. හදිසියෙන්.

### (246, 247) පිටු.

**ජාත්‍යන්ධයන්ට**= උත්පත්තියෙන් ම දෙ ඇස් අන්ධ වූවන්ට. **සතරමහාදිව**= ජම්බුද්වීපය, පූර්වවිදෙහය, අපරගොයාන, උත්තර, කුරු යන මහා ද්වීප සතර. **උදුරාපියන**= ගලවන. **වෙරම්භ වාතය**= අහස යොදුනකින් මත්තෙහි හමන සැඩ වූ වාතය. **සුණුතනකුදු**=ටිකක් වත්. **පදලස්**= පාද ලාංඡනය. පා සටහන. **ලක්ෂණ මන්ත්‍ර**= බොධිසත්ත්ව, චක්‍රවර්ති රජ, සම්‍යක් සම්බුද්ධ යන් වහන්සේලාගේ ශරීර ලක්ෂණ දන්නා ශාස්ත්‍රය. **ලම්බිය**= හෘදය. **දෙතිස්කුණපකොටසින්**=කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර, ඇට, ඇටමිදුලු, වකුගඩු, හදවත, අක්මාව, දලබුව,

බඩදිව, පපුසම, අතුනු, අතුනුබහන, උදරකොෂය, අසුචිය, සඳ මිදුලුය, යන පෘථිවි ධාත්වාශ්‍රිත කොටස් විස්සය, පිතය, ශ්ලෙෂමය, සැරවය, ලේහෙය, ඩහදිය, මේද තෙල්ය, කඳුලුය, මුස්තෙල්ය, සොලය, සොටුය, මුත්‍රය, යන ආපොධාත්වාශ්‍රිත දොළොස් කොටසය යන දෙතිසෙන් යුත් ශරීර කුණප කොටස්වලින්. **විෂයක්ෂෙත්‍රය**= සර්වඥතාඥානයට විෂයවන ක්ෂෙත්‍රය යි. මෙහි වනාහි ප්‍රමාණයක් නො මැතිය. සර්වඥ තාඥනය අපරිමිත හෙයිනි. **ජන්මක්ෂෙත්‍රය**= තථාගතයින් වහන්සේගේ උත්පත්තිය, ධර්මචක්‍ර දෙශනාව, ආයුසංස්කාර හැරීම, පරිනිර්වාණය, යන මෙතෙක් කරුණු වල දී කම්පාවන දස සහස්‍රලොක ධාතුව යි. **ආඥාක්ෂෙත්‍රය**= කොළ ලක්ෂයක් සක්වළ ආඥ ක්ෂෙත්‍රය යි. මොර පරිත්ත, ආටානාටිය සූත්‍රාදියෙහි බලය මෙහි පවතී. එහෙයින් මෙය ආඥක්ෂෙත්‍රය යි.

## (249, 250, 251) පිටු.

**කොසඹෑනුවර**= බ්‍රහමක්ෂත්‍රිය වංශයෙහි කුශා නම් රජහට දෑව වෛදනී නම් මෙහෙසිය කුසින් උපන් කුශාම්බ කුමරුවන් විසින් නිර්මාපිත හෙයින් මෙ නම් විය. **අඩාලපොහොයෙහි**= අඩ උපොසථයෙහි හෙවත් දවසින් අඩක් අටසිල් සමාදන්වීමෙහි **කො දූට**= කවදට. **ශුන්‍යාගාරයෙහි**= අරණ්‍යයෙහි. **නානානය මනොහරවූ**= නොයෙක් ක්‍රමයෙන් මනොඥ වූ. **දහසක්නයින්**= සොවාන් ආදී මාර්ග ඵල වලට පැමිණීමේ දහසක් ක්‍රමයෙන් (විස්තර සාරසංග්‍රහව බලනු.) **සහමුල්වැළපුළහෙයින්**=මුලින් ම උදුරා දැමූ හෙයින්.

## (252, 253, 255, 256) පිටු.

**කසිවාර්ණෙසේ**= කථාකර ගැණීම මෙන් නොහොත් වර්ණනාව මෙන්. **තුලකුන්**= (එක) තුලකුන්. **පරමාර්ථයෙන්**= උත්තම අර්ථයෙන්. **සංසාරහසර**= සංසාර මාර්ගය. **පසිඳෑ**= විනාශකොට. **අදෘශ්‍යකොළෙමි**= නො පෙණෙන්නක් කොළෙමි. **අධිකරණයෙක්**= නඩුවක්.

## (257, 258, 259, 260, 261) පිටු.

**ශරශ**=ඊය. **පගිලිශ**= අල්ලා ගන්නා පුඩුව. **අචෙතස්කවූ**= චෙතනා රහිතයෙක් වූ. **සර්වාභරණවිභූෂිතවූ**=සියලු රාජාභරණයෙන් බබලන්නාවූ. **ජාලාකවුළුව**= දැල් කවුළුව. **බත්උදව්ද කිශා**= බත් ඉදි ද කියා, **ලඝ්වන**= පමාවන. **සාලුවෙන්**= ගැන් දෙන්. **දෝනාදිශ**= කැඳ. **සමහවමාලුයෙකින්**= පිළියෙල වී තිබුනු

මාලුවකින්. **හුණුසුමින්**=උෂ්ණයෙන්. **මඳබතිපිඩක්**= බත් ඇට පිඩක්. **අරුණුවන්මැලි**= අනවතප්ත විලෙන් නික්මුණු සැට යොදුන් අහස් ගඟ හුණු තැන පිහිටි අරුණ වර්ණ (-මඳක් රතු)වූ මැලිය. මෙය දුලීහ වස්තුවකි. **හෙලමාළුග**= වැස් විය. **පිහිදෙර**= වැසූ දෙර. **උදුසනක්සේම**= ඉතා උදෑසන ම. **පුරෝහිතයා**=රජුට අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනය කරන්නා. **තාඹුන්**= තරුණ වස්සන්. **තිරළුවන්**=කොටලුවන්. **පලෙලුවන්**= සුදු එලුවන්. **තජ්ජිතවැ**= තැති ගැනී.

(262, 263) පිටු.

**ශ්‍රීමුඛසදුර්මුඛකාරණා**= මුහුණ දුර්වර්ණවීමට කරුණු. **යුගාන්තවහ්නිශක්සේ**= කල්පාවසානයෙහි වූ ගින්නක් මෙන්. **සතරමහාසාගරයෙහි**= මහමෙර වටා පිහිටි සාගර සතරෙහි, මෙයින් නැගෙණහිර පැත්තෙහි පිහිටි සයුර පළිඟුවන් සුදු පැහැය. දකුණු සයුර ඉඳුනිල් මිණිවන් පැහැය. පශ්චිම සයුර පබලුවන් රත් පැහැය. උතුරු දිග සයුර ස්වර්ණවන් පැහැය. මෙසේ හෝ ලවණ සමුද්‍රය, ක්ෂීර සමුද්‍රය, දධි සමුද්‍රය, ඝෘතසමුද්‍රය යන සතර සයුරුවල. **තෛලගලා**=තෙල් වත් කොට. **අනාවරණඥානයෙන්**=සියලු අවිද්‍යාව සමූලයෙන් ම නැසූ හෙයින් අනාවරණ වූ නුවණින්.

(ගාථාර්ථ ව්‍යාඛ්‍යා)–

යෙ, යම්බඳු වූ අපි; **සන්තෙ**, ප්‍රතිග්‍රාහක, දෙයධර්මයන් ඇති කල්හි ම; **නද දම්හසෙ**, දන් නුදුන්නෙ මු ද; (ඒ අපි) **දුජ්ජීවිතං**, (ත්‍රිවිධ දුශ්චරිතයන්හි හැසිරීම් වශයෙන්) නින්දිත වූ දිවි පැවැත් මෙන්; **අජීවිම්හ**, ජීවත්වීමු; **භොගෙසු**, සම්පත්; **විජ්ජමානෙසු**, ඇති කල්හි; **අත්තනො**, තමන්හට; **දීපං**, පිහිටක්; **න අකම්හ**, නො කෙළෙමු.

**සබ්බසො**, සර්ව ප්‍රකාරයෙන්; **නිරයෙ**, ලොහොකුම්භී නරකයෙහි, **පච්චමානානං**, පැසෙන්නා වූ (අපට) **සට්ඨිං වස්සසහස්සානි** සැට දහස් අවුරුද්දක්; **පරිපුණ්ණානි**, සම්පූර්ණ විය; **කදා**, කවර දවසක; **අන්තොභවිස්සති**, එහි කෙළවරක් වන්නේ ද?

**මාරිස**, නිදුකානෙනි; **තදා හි**, එකල්හි වනාහී නොහොත් **තදා**, එකල්හි, **හි**, යම්හෙයකින්; **මම**, මා විසින් ද; **තුය්හං ච**, තා විසින් ද; **පාපං**, පාපය; **පකතං**, බොහෝ සෙයින් කරණලද ද (එහෙයින්) **අන්තො**, මේ දුක්හි කෙළවරක්; **නත්ථි**, නැත්තේය.

**අනෙනා**, මේ දුක් විඳීමෙහි අවසානයක්; **කුතො**, කොයින් ද; **අනෙනා**, දුක්හි කෙළවරක්; **න පතිදිස්සති**, නො පෙණෙන්නේ ම ය.

**සොචාමි**, ඒ මම වනාහි; **ඤූන**, ඒකාන්තයෙන්; **ඉතො**, මෙයින් චුතව; **ගනත්වා**; ඉපදීම් වශයෙන් ගොස්; **මානුසිංයොනිං**; මිනිසත් බවක්; **ලධාන**, ලැබ; **වදඤ්ඤූ**, දන් දී මෙහි ගුණ කියන සුලුව; **සීලසම්පනෙනා**; සීලයෙන් යුක්ත වූ වෙක් ව; **බහුං**, බොහෝ වූ; **කුසලං**, කුශල කම්; **කාහාමි**, කරන්නෙමි.

(264) පිට.

**ජාගරතො**, නිදි නො ලබන්නා හට; **රතති**, රාත්‍රිය තොමෝ; **දීඝා**; දික් වන්නීය; **සනතස්ස**, බොහෝ සේ විඩාවට පත් වූ තැනැත්තාට; **යොජනං**, සිවුගවු පමණවූ යොදුන; **දීඝං**, දික් වන්නේය. **සඬම්මං**, සත්තිස් බොධපාක්ෂික ධර්මය; **අවිජානතං**, විශෙෂයෙන් නො දත්තා වූ; **බාලානං**, අඥානයන්හට; **සංසාරො**, ස්කන්ධ ධාතු ආයතනාදීන්ගේ නො සිඳ පැවැත්ම සංඛ්‍යාත සංසාරය තෙමේ; **දීඝො**, දීඝීය; **නවවිධවෂ්ාවකින්**=නවවිධ වෂ්ාව නම්:-

(1.) ප්‍රචණ්ඩ වූ වාතය. (2.) භයානක මෙඝය. (3.) ප්‍රබල පජීත වෂ්ාව. (4.) තියුණු සැත් වෂ්ාව. (5.) අඟුරු වෂ්ාව. (6.) කුරිරු අළු වෂ්ාව. (7.) වැලි වෂ්ාව. (8.) කලල් මඩ වෂ්ාව. (9.) පැතුරුණු ඝණාන්ධකාරය. **අප්‍රතිහතවූබුඩිඇති**= පතලා වූ නුවණ ඇති. **ආසයානුසය**= ආසය නම්:- දහම් දෙසිය යුතු පුද්ගලයාගේ සිත්හි පවත්නා චිත්තාවස්ථාව දැන්මය. **අනුසය** නම්:- ඔහු ධර්මය ශ්‍රවණ කිරීමෙන් මාර්ග ඵලාදියකට පැමිණීමට තරම් භාග්‍යවතෙක් ද? යනු දැන්මය.

(265, 266, 267) පිටු.

**ආත්මහිතතත්පරවූ**= තමාගේ අභිවෘඩියෙහි ඇලුනු. **පරහිතයෙහිදෙලගත්**=මෙරමාහට වැඩ සිදු කිරීමෙහි ආසා ඇති. **අනවස්ථිතවූ**=ස්ථිර නැතිවූ. **සංසයක්**= සැකයක්. **නිත්‍යොත්සාහිවූ**=නිතර උත්සාහ ඇත්තා වූ. **විචක්ෂණමිහි**= පණ්ඩිත භාවයෙහි. **හෙත්තැහිබැවින්**= හිතුවක් කරණ බැවින්. **පඤ්චවර්ණ ප්‍රීතින්**= ඛුද්දක, ඛණික, ඔක්කන්තික, උබ්බෙග, ඵරණ යන ප්‍රීති පසින්. **පුළුසමයෙහි**= කිරි වැදුන කාලයෙහි. **පුළුඅගහස්**= එනම් ධානය. **දනසමයෙහි**= කපන කාලයෙහි. **කොෂ්ඨාගාරයෙහි**= කොෂ්ඨාගාරයට. අටුවට....

**(268, 269, 270 පිටු.)**

**අග්‍රධර්මපතා**=නිර්වාණය ප්‍රාර්ථනා කොට. **ඖදරික ආහාර**=රළු ආහාර. **නෙරඤ්ජරා**=එනම් ගඟ. පිරිසිදු යහපත් දිය ඇති හෙයින් මෙ නම් විය. **අජපාල**=මේ නුගගස සේයායෙහි එලු පල්ලෝ ගොස් රැස්වී සිටිත්. එහෙයින් අජපාල නම් විය. **මනශ්ශිලාතලයෙහි**=සාදිලිගම් ගල්තලාලෙහි. **අනුපමසත්‍යවිලාසයෙන්**=අසමාන වූ සත්‍ය බලයෙන්. **දෘෂ්ටධර්මවේද්‍ය**=මෙලොව දී ම විඳිය යුතු. **අපරාපර්‍ය්‍යවේද්‍ය**=ඔබ මොබ අනියම් ආත්ම භාවයෙහි විඳිය යුතු. **උපපද්‍යවේද්‍ය**=අනතුරු අත්බැව්හි විඳිය යුතු නොහොත් විපාක දෙන. **වදනා**=පිවිසෙන්නා වූ. **පිටිවතුරු ගන් වන්නාවූ**=උතුර වන්නා වූ. **යතා**=ගියකල. **ශෙඩිදී**=ගුටි දීලා.

**(272, 274, 276, 277, 278 පිටු.)**

**තුලුන්**=ඔවුන්. **සෙය**=සෙවනැල්ල. **කෑණිමඬලට**=ගෙයි පරාලය සවිකරණ දණ්ඩ. **කොලොඹුවෙහි**=මස් ලොඹුවෙහි. **රනයට**=රත්රන් ඇතුළත. **නිබඩකොටැ**=නිතර ඇතිකොට. **ශරීරමණ්ඩනයට**=සිරුර සැරසීමට. අලඞ්කාර කිරිමට. **බඩපෑලා**=බඩ පෙන්වමින්. උඩුකුරුව. **අඛණ්ඩශීලය**=නො බිඳුනු ශීලය.

**(279, 280, 281, 282 පිටු.)**

**මෙහෙමය**= මෙයාමය. **මාතලිසඞ්ගාහකතෙමේ**= මාතලී නම් රථාචාර්‍ය්‍ය තෙමේ. **පෑලිය**=පෙන්නුවේය. **බැඳිවන**=රුවටූයේය. **ගත්‍යන්තරයක්**=ගමනට ප්‍රතිෂ්ඨාවක් නොහොත් භවයට පිහිටක්. පිහිට ඇති කරුණක්. **වාරනක්ෂත්‍ර කොටැ**=දින නකත් කොට. **දෙවාතිදෙවවූ**=දෙවියන්ට අතිදෙව වූ. **ශක්‍රාතිශක්‍රවූ**=ශක්‍රයන්ට වඩා උතුම් ශක්‍ර වූ. **පැදුම්දික්හි**= බස්නාහිර දෙස. **සන්නිපාතයෙක්**=රැස්වීමෙක්. **ක්ෂීණවිය**=පිරිහුනේය. **පඤ්චපූර්ව නිමිත්තයන්**=පෙරනිමිති පස. එනම්. (1.) පැලඳි මල් මැලවීම. (2.) වස්ත්‍ර කිළිටිවීම. (3.) කිසිල්ලෙන් ඩහ බැහැරවීම. (4.) ශරීරය දුර්වර්ණවීම. (5.) දෙවාසනයෙහි නො ඇල්ම යනු සි. **හෘදය නිශ්‍රිතවූ**=හෘදය ඇසුරු කළා වූ. **ශොකශල්‍යය**= ශොක නැමැති උල.

**(283, 284, 288 පිටු.)**

**සමන්තචක්ෂුස්**=ලොකයෙහි යම්කිසි ඥෙයපදාර්ථයෙක් ඇත් නම් ඒ සියල්ල ස්වයම්භූඥානයෙන් දත් හෙයින් නොහොත් නුදුටු දෙයක් නොමැති හෙයින් තථාගතයන් වහන්සේ සමන්තචක්ෂුස් නම් වතු සේකි. **පිරිඳක්වැ**=මෝරා, වැඩී. **උත්තමාඞ්ග**

**සෙන්**=හිසින්. **වඞ්කාල**=වකුටු කළ. **පක්ඛිබිබ**=සිළු (=කොණ්ඩා) පසක් ඇති හෙයින් මේ නම් වී. **වල්ලභස්ස**=මිත්‍රය. **අවිදූඞ්නූ**= අවිද්‍යාව නැතිකළ. **දිනුපු**=ඉදුරන් ජයගත් හෙයිනි. **වෙසවක**=වෙළුම්.

(ගාථාව්‍යාඛ්‍යා) (1.) **සූරියවච්චසෙ**= සූය්‍යීම ණ්ඩලයක් වැනි ශරීර ඇති. **කල්‍යාණී**=ශොභමාන වූ; **මම**=මට. **ආනන්දජනනී**= සතුටු උපදවන්නා වූ. **භද්දෙ**=පින්වත් සුඥරිය; **යෙන**=යමක් කරණකොට ගෙණ. **ජාතාඅසි**=නුඹ උපන්නෙහිද; **තිම්බරු**= තිම්බරු නම් වූ; **තෙ**=තීගේ; **පිතරං**=ඒ පියා; **වන්දෙ**=වඳිමි.

**සෙදනං**=හටගත් ඛඟ බිදු ඇත්තවුන්ට; **කන්තො**=මනොඥ වූ; **වාතොඉව**=වාතයක් මෙන් ද; **පිපාසිතො**= හටගත් පිපාසා ඇත්තෙකුට; **පානීයංඉව**=පැනක් මෙන් ද; **අරහතං**=රහතුන්ට; **ධම්මොඉව**=නවලොවුතුරුදහම මෙන් ද.

**ආතුරස්ස**=රොගයෙන් ඔබලත් තැනැත්තාහට; **භෙසජ්ජං ඉව**=බෙහෙතක් මෙන් ද; **ජිඝච්ජතො**=හටගත් බඩසා ඇත්තෙකුට; **භොජනංඉව**=භොජනයක් මෙන් ද; **අරඛිසි**= කාන්තිමත් ශරීර ඇත්තිය; (නුඹ) **මෙ**=මට; **පියාඅසි**= ප්‍රියවෙහිය; **භද්දෙ**= සුඥරිය; **ජලන්තං**=දිලියෙන ගින්නක්; **වාරිනාඉව**= දියෙන් මෙන්; **පරිනිබ්බාපය**=(මාගේ රාගපරිඩාහ) සංසිඳුවව.

**සම්මාහිතතෙතා**=ග්‍රීෂ්මයෙන් තැවුනාවූ; **නාගො**= හස්තියෙක් තෙමේ; **කිඤ්ජක්ඛරෙණුනායුතං**= පද්මකෙශරයෙන් යුක්ත වූ; **සිතොදකිං**=සිහිල් දිය ඇති පොකුණකට; **ඔගාහෙ**= බස්නේ ද (එමෙන්ම) **ථනූදරං**=නුඹගේ පියොවුරු දෙක මැදට හා උදරයට; **ඔගාහෙ**=බසින්නේය.

**මෙ**=මා විසින්; **තුත්තතොමරං**= කණමුල විදින කටුව හා පා විදින කටුව; **ජිතං**=දිනන ලද්දේය යි; **අච්චඞ්කුසො**=ඉක්ම වන ලද අකුස්ස ඇති; **නාගොඉව**=මද දපිය තිසා කාරුණු නොහගින හස්තියෙක් මෙන්; **ලක්ඛඤුරුයො**= ලක්ෂණ සම්පන්න වූ ඌරු යුගලය කරණකොට ගෙණ; **සම්මත්තො**= විශෙෂයෙන් මත්කරණ ලද්දේ; **කාරණං**=රාග විරාග කාරණයක්; **නපජානාමි**=නොම දනිමි.

**තයි**= තී කෙරෙහි; **ගථිතචිත්තො අස්මි**= පිළිබද සිත් ඇත්තේ වෙමි. **වඩක්ඛසො**=බිලිය ගිල්ලා වූ; **අම්බුජොඉව**= මත්ස්‍යයෙක් මෙන්. **චිත්තං**=සිත; **විපරිනාමිතං**= පෙරළුණේය; **පටිගන්තුං**=පෙරළා යන්ට; **නසක්කොමි**=නො හැක්කෙමි.

**වාමොරූ**=මනොඥ කලවායුගලක් ඇත්තා වූ; **භද්දෙ**= සුන්දරිය; **මං**=මා; **සජ**=වැළඳ ගනුව; **මන්ද ලොචනෙ**=මද බැල්මෙන් බලන ඇස් ඇත්තිය; **මං**=මා; **සජ**=වැළඳ ගනුව; **කල්‍යාණි**=මනොඥ තැනැත්තිය. **මං**=මා; **පලිස්සජ**=හාත්පසින් වැළඳ ගනුව. **මෙ**=මා විසින්; **එතං**=මෙය; **අභිපත්ථිතං**=නිතර පතන ලද්දේය.

**වත**=එකාන්තයෙන්; **අප්පකො**=සවල්ප වූ **මෙ**= මාගේ; **කාමො**=කාමය තෙමේ; **වෙල්ලිත කෙසියො**= අග් බඹරු කෙස් ඇති තී සම්බන්ධවූයේ; **අරහන්තෙ**= රහතුන් විෂයෙහි; **දක්ඛිණා ඉව**=දක්ෂිණාවක් මෙන්; **අනෙකභාවො**= නොයෙක් කොටස්; **සමුප්පාදි**=ඇති විය.

**තාදිසු**=එබඳු වූ; **අරහන්තෙසු**=රහතුන් විෂයෙහි; **මෙ**= මා විසින්; **කතං**=කරණ ලද; **පුඤ්ඤං**= පිණක්; **අත්ථි**= ඇත්තේ ද; **සබ්බඞ්ගකල්‍යාණි**=සර්වාඞ්ග ශොභන තැනැත්තිය; **මෙ**=මාගේ; **තං**= ඒ පිණ; **තයා සද්ධිං**=තී සමග; **විපච්චතං**=විපාක දේවා.

**එකොදි**=එකඟ සිත් ඇති; **නිපකො**= නිපක ප්‍රඥ ඇති; **සතො**=ස්මෘතිමත් වූ; **සක්‍යපුත්තො**= ශාක්‍යපුත්‍ර වූ සර්වඥමුනි තෙමේ; **අමතං**=අමෘතමහානිර්වාණය; **ජිගිංසානො ඉව**=සොයන්නාක් මෙන්; **සුරියවච්චසෙ**=සූර්‍ය්‍යමණ්ඩලය වැනි ශරිර ඇත්තිය; **තං**=තී; **අහං**=මම; **ජිගිංසානො**=සොයන්නෙමි.

**මුනි**=සර්වඥ මුනි තෙමේ; **උත්තමං**= උතුම් වූ; **සම්බොධිං**= සර්වඥතා ඥනයට; **පත්වා**=පැමිණ; **යථා**=යම්සේ නම්; **නන්දෙය්‍ය**= සතුටුවන්නේ ද; **එවං**=එපරිද්දෙන්; **තයා**= තී සමග; **මිස්සීභාවගතො**=සමාගමයට පැමිණියා වූ (මමද) **නන්දෙය්‍යං**= සතුටුවන්නෙමි.

**තාවතිංසානං**=තව්තිසා වැසි දෙවියන්ට; **ඉස්සරො**=අධිපති වූ; **සක්කො ච**=ශක්‍ර තෙමේ ද; **මෙ**=මට; **වරං**=ශක්‍රපුරය ගණුව යි වරයක්; **දජ්ජා**=දෙන්නේ ද; **අහං**=මම; **තං**=එය; **වරෙය්‍යාහෙ**=වලක් වන්නෙමි; **එවං**=එපරිද්දෙන්; **මම**=මාගේ; **කාමො**=කාමය තෙමේ; **දළ්හො**=දෘඪය.

**යස්ස**=යමෙක්හට; **එතාදිසී**= මෙබඳු වූ; **පජා**= දුවක්වී ද; **සුමෙධසෙ**=සුන්දර ප්‍රඥ ඇත්තිය; **චිරං**=බොහෝ කලකින්; **ඵුල්ලං**=පිපියා වූ; **සාලවනං**=සල්වනයක් වැනි; **තෙ**=තීගේ; **පිතරං**= පියාට; **වන්දමානො**=වඳින්නේ; **නමස්සාමි**=නමස්කාර කරමි.

(288, 289, 291, 292, 293 පිටු.)

**හසාබූ**=කුඩා වූ. **දෙවනිකායෙහි**=දෙව සමාගමෙහි. **සංසශක්**=සැකයක්. **සදොෂචිත්තෑ**=ක්‍රොධ සහිතව. **ඊර්ෂ්‍යා**= පරගුණ නො ඉවසන ගතිය ඊර්ෂ්‍යාව යි. **ඡන්ද**=කැමැත්ත. **විතර්ක**=නානාරම්මණයන් ගැණ නොයෙක් අයුරින් කල්පනා කිරීම. **තෘෂ්ණා සම්ප්‍රයුක්තවූ**=තෘෂ්ණාව සමග යෙදුනාවූ. **අනුත්පන්නිසට**=නො ඉපදවීමට. **අලෝලා**=ආලොඩනය කොට . කළඹා. **සොම්නස**=සිත්හි සන්තොෂය. **ප්‍රශ්නව්‍යාකරණ**= ප්‍රශ්න විසඳීම. **කායසමාචාරය**=ශරීරය පිළිබඳ මනාහික්මීම. **පයෙෂිණක්**= සෙවීමක්. **ලගන්නී**= සිත් ගන්නී.

(294, 296, 297, 298 පිටු.)

**නිෂ්ඨාකොටෑ**=කෙළවර කොට. **ඥනපරිපාකයට**= නුවණ මේරීමට. **අප්‍රතිපුද්ගලවූ**=සමාන පුද්ගලයෙක් නොමැති. **වරපලට**=උතතම විපාකයට. **එවෑ**=වත්කොට. **ප්‍රඥප්ත**= පැන වූ. **පූර්වලොකධාතුව**=පෙරදිග ලොක ධාතුව, නැගෙනහිර ලොව. **අමාවහන**=අමෘතය වහනය කරන්නා වූ. **සඳමඩුලු**= චන්ද්‍රමණ්ඩලය. **ඇතුළු කොපුල**=හක්ක තුළ. **බැමිණිශාපයෙන්**= දඹදිව සාගල් පුර රජකළ මිළිඳු රජ එක්තරු ස්ත්‍රියක් කෙරෙහි ලොභ කොට නිවරද වූ ඇගේ සැමියා නිකරුණේ හරක් හොරකමක් ගැණ වරද පමුණුවා මැරීම නිසා පතිව්‍රතා ධර්මය රැකි භාර්‍ය්‍යාව වූ බැමිණිය විසින් කරණලද සාපය කරණකොට ගෙණ දෙළොස් අවුරුද්දක් වැසි නො වැස මහත් දුර්භික්ෂ භයක් ඇති විය. මෙය ලක්දිව චොරනාග රජසමයෙහි සිදුවූවකි. වළගම්බා කාලයෙහිය යි ඇතැම් පොත්වල පෙණේ. **වදුල්බිඳගෙණෑ**=වැසි වලාකුල් බිඳගෙණ. **එපෑලෙහ**=ඒ ආකාරය. **ප්‍රතිරූපදෙශවාසයෙහි**=තෙරුවන් පවතින යහපත් දෙශයක විසීමෙහි. **මහාරඤ්ඤයෙන්**=රෙණින්.

(299, 300, 301, 303 පිටු.)

**රූපකායය**=රූප ශරීරය. **අනූපම විලාසයෙන්**= උපමා රහිත ආකාරයෙන්. **අසනවෙන**=ගෙවෙන. **නෑකිවිලි**= සිතිම්. **සිටිනෑතිකොට**=නැවැත්මක් නැති කොට. **බමින්**= බස්වමින්. **මූර්තිමත්වෑ**=ශරීරයක් හටගැනී. **ඉපිලිගිය**=ඉල්පුන. **පරාලපතු පෙලය**=ඉලඇට පෙළය. **ලදනිඤ්ඤන්න ඥුදු**=ලැබුන නිය කනු මසක් පමණ. **ශිවිආදී**=ශිවි (=සම්) ආදිය. **යනා**= මැඩ. **චිත්ත විකෂෙපකොටෑ**=සිත එකඟ විය නොදී. **කර්ණපුටයෙන්**= කන්

පුගලයෙන්. **උසභා**=උරු බී. **ගිරිතිගන්නාකලෙක්**= සිතාසීමට කාලයක්. **චතුමධුර**=ගිතෙල්, වෙඬරු, උක්සකුරු, මීපැණි යන මධුර ද්‍රව්‍ය සතර. **කණකිරිහෙසිනි**=කණ සීරෙන හෙයින්ය. (අප්‍රියය යනුයි.) **වෙහෙරබුමුකට**=විහාර භූමියකට. **හැඬෙන**= පවත්නා. **ගොදුරුසන්න**=ආහාර ආසාව, **ඇණිකොටැ**= බල සමූහයක් කරලා.

## (304, 305, 306, 307 පිටු.)

**නොසෙදෙසි**=වැරදි යි. **ඥානාලොකදෙන**=නුවණ නැමැති එළිය දෙන. **සමාධින්**=එකහ සිතින්. **පිළිවිදවිඳ**= ප්‍රතිවිඥනය කොට කොට. **ඇවිම්ලියක්**= පෙරළත්තක්. කරදරයක්. **පැමිද**= ප්‍රෙතිය ද. **ප්‍රතිඥාව**=පොරොන්දුව. **ලදවූපලලවසෙන්**=මොලොක් වූ දල්ලෙන්. **මදඹවැ**=මදයෙන් මුළාව. **සතරවනදසාසෙහි**= වනය සතර දිසාවේ. **භද්‍රජාති**=සුන්දර ජාති ඇති.

## (308, 309, 310, 312, 313, 314, 315 පිටු.)

**ශීලවිරොධයක්**= ශීලයගේ විරුඬ භාවයක්. **ආවජිනා කොටැ**=සිහිකොට. **දිගෙඩියක්**=දී වලින් පිරූ මුට්ටියක්. **ඛණ්ඩයක්**=කැඩීමක්. **ඡිද්‍රයක්**=සිදුරු කිරීමක්. **සබලයක්**=පුල්ලි වැටීමක් නොහොත් කබර වැටීමක්. **කල්මාසයක්**= කිලුටක්. **මඩුන්**= මැඩියන්. **හුල්ඇලහු**= උලින් ඇත පිළිස්සූ. **හෙල්මැලිගැබින්**= කල්හාරනම් ජලජ පුෂ්පජාතියකි. එහි ගර්භයෙන්. **හිමකනිකායෙන්**=හිමපොදින්. **සුබආවහනමන්ත්‍රවූ**=සැප එලවන මන්ත්‍රයක් වූ. **ගඳමහන්**=ගන්ධමාදන පර්වතය.

## (316, 317, 318, 319, 320, 321 පිටු.)

**තුය්හං**=තා විසින්; **ඉච්ඡිතං**=කැමැති වූ ද; **පත්ථිතං**=පතන ලද්දාවූ ද (සියල්ල) නොහොත්; **තුය්හං**=තාගේ; **ඉච්ඡිතං**=ඊප්සා ද **පත්ථිතං**= ප්‍රාර්ථනා ද (යන සියල්ල) **ඛිප්පමෙව**= වහා ම; **සමිජ්ඣතු**=සම්පූර්ණ වේවා; **සබ්බේ චිත්තසඞ්කප්පා**= සියලු චිත්ත සඞ්කල්පයෝ; **චන්දෝ පණ්ණරසෝ යථා**=පසළොස්වක පුරසඳ සේ; **පූරෙන්තු**=පිරෙත්වා.

## (326, 327, 328, 329, 330 පිටු.)

**පරිවස**=පුරුද්ද. **හිනවිශ්‍රිෂතාවසන්**= වීර්‍යයෙන් හීන වූ (අඩුවූ සතුන්.) **ඉසබක්**= රියන් 143 ක ප්‍රමාණයක්. **සතරවරම්මහරජ්ජුරුවන්**=ධෘතරාෂ්ට්‍ර, විරූඪ, විරූපාක්ෂ, වෛශ්‍රවණ යන ශක්‍රයාගේ ප්‍රධාන ආරක්ෂක දෙවියෝ සතර දෙන. **කාහාදූසි**=

කුම්භට ද කියා. **විමුක්ති**=මාර්ගචිත්තයට අනතුරුව වාසනාගුණ සංහිඳුවමින් උපදනා ඵල සිත සියලු කෙලෙසුන් කෙරෙන් මිදුන හෙයින් විමුක්ති නම් විය. **විමුක්තිඥානදර්ශන**= ලෝකෝත්තර චිත්ත වීථියෙහි මගපල සිත් වලට අනතුරුව උපදනා මාර්ගඵල නිර්වාණයන් ද නැසූ කෙලෙසුන් ද අවශෙෂ කෙලෙසුන් ද ප්‍රත්‍යවෙක්ෂා කරණ ඥානය යි. **විරූවාසු**=රත්කල. **පඤ්චදුශ්චරිතකර්ම**=සතුන් නැසීමාදී පඤ්චපාපයෝම. **ආහාර සංඥාය**=ආහාරය යන සංඥා මාත්‍රය (සෙස්ස ද මෙසේය.) **බලාවැල**=කොක්කු පඞ්ක්තිය. **ශතපටලසහස්‍රපටල**=සියක් වලාකුල් පටවල් දහසක් වලාකුල්.

(331, 332, 333, 334, 335, 336, 338, 339 පිටු.)

**ඉන්වූ**=සිට වූ. රොපණයකල. **අරළුයෙන්**= ඇහැටුයෙන්. **ස්වාම්‍යාමාත්‍යාදීවූ**= ස්වාමිය, අමාත්‍යය යනාදී මෙහි ආදි ශබ්දයෙන් පුරය, රාෂ්ට්‍රය, කොෂය, දණ්ඩය, සුහෘත් යන මොව්හු සඞ්ගෘහීතය. **පැස්පුරා**= භාජන පුරවා, **තොලබොවිතක්**= තොලබෝ පත්‍රයෙන් කළ ගොටුවක්. **පිරිවුළු**= උකස්ගෙණ. **වරෝ**= "එවු" යනාර්ථ යි. ආමන්ත්‍රණයකි. දූනුදූ මෙය වහරෙහි පවතී. **තෙරපන**=මඩන. **පහසින් පතිනුන්**= කැඩපතෙන් ද. **ස්වෙදබින්දු**= ඩහබිඳු. **යෞවනස්ථවූ**= තරුණ බැව්හි පිහිටි. **හස්වැණි**=සිල් වැනි.

**තෙල්ලෙසැයි**=තෙලිතුරකැයි. පින්සලයකැයි. **සුන්නක්**-චූර්ණයක්. කුඩක්. **බඩසාකියවත්ද**=බඩදවත්ද? (ලොහොබ කරත්. යනු ගම්‍යාර්ථයි.) **අවනෙසා**= තැබැරුමක. **බමණ**= හැසිරෙන. **මත්වලුවන්**=උද්ගතවූ මත්භාවය ඇත්තවුන්. **කොටගෙයි**= කොෂ්ඨාගාරයෙහි. අටුයෙහි. **කුඹකුම ජලයට**= කොකුම් දියට, **ඉනිබ**=දෑන්. **පැහැගණ**=කාන්තියෙන් අධිකවූ. **මුවබාගෙහි**= මූබ නැමැති බැම්මෙහි. **ලසනාවලදන**=මල් හටගන්නා.

(242, 243, 244 පිටු.)

**අෂ්ටාදශවිද්‍යාස්ථානයෙහි**= අටළොස් විද්‍යාවන්හි. එනම්, ශික්ෂා, කල්ප, ව්‍යාකරණ, නිරුක්ත, ජ්‍යොතිෂ, ඡන්දස්, ඍක්, යජුස්, සාමන්, අථර්වන්, මීමාංසා, ආයුර්වේද, ධනුර්වේද, ගාන්ධර්ව, න්‍යාය, අර්ථශාස්ත්‍ර, පුරාණ, ධර්මශාස්ත්‍ර යන අටළොස යි. **චිකිත්සාපිණිස**= වෙදකම් පිණිස. **ස්වස්ථකොටැ**=සුවපත් කොට.

(315, 348, 351 පිටු.)

**මලෙන්**=කුණුවලින්. **සාඩක්**=වස්ත්‍රයක්. **වධ්‍යයන්**= වධක යන්. **රුරුසොටැ**=සුණු විසුණු කොට. **පර්වතපාදයට**= පර්වතයේ කෙලවරට. **ආශ්‍රමපදයෙහි**=පන්සල් පෙදෙසෙහි. මහා

**බලකාය**=මහාභට සේනාව. **කාඤ්චනප්‍රතිමාවක්**=රන් පිළිමයක්. **ශතපොරිසප්‍රපාතයෙහි**=මිනිසුන් සියයක් පමණ උස ඇති බෑවුමෙහි.

(353, 354, 355, 356, 357 පිටු.)

**ප්‍රසඬගයෙහි**=ඇලීමෙහි. යෙදීමෙහි. **ගම්භීර**=ගැඹුරු. **ධීරනාදයෙන්**=මහත්වූ නාදයෙන්. **ප්‍රවීණ**=දක්ෂ වූ. **සාඩම්බරය**=ගර්වසහිතය. **අනූනවූ**=නො අඩු වූ. **යෞවනයෙන් උද්දාමවූ**= තරුණභාවය නිසා ආඩම්බර වූ. **අනින්දිතවූ**= නින්දා නොකරණ ලද්දා වූ. **කන්වැසිවූ**=පුරුදු වූ. දක්ෂවූ. **විදග්ධවූ**= ඇලුතා වූ නොහොත් පාටවයෙන් යුත්. **අභ්‍යන්තරබාහිරඬගකාරියෙහි**= ඇතුළත් හිවූත් පිටත්හිවූත් අඬගයන් පිළිබඳ කටයුතුවල. **මහාකුලීනභෙයින්**=මහත් වූ පිදිය යුතු වංශ ඇති බැවින්. **දෛවය**=හෙතුව. වාසනා ශක්තිය. **ක්ෂොභ්‍යනොවැ**=අවුල් නො වී. **බලතුන්**=භටයන්ය. **කිළිඟුන්**=එනම්, ගීත ජාතිකයන්. **අවනනලද**=ආකීර්ණ කරණලද. **පසඟතුරුනාදින්**=අඬග පසකින් යුත් තූර්‍යනාදය. එනම්:-ආතත, විතත, ආතතවිතත්, ඝන, සුසිර යනු යි. **විදුනාලද**=යුක්ත වූ. **තිරිකුඩම්**=සැරසිලි විශෙෂයන්. **මෙහෙනැනුන්**=භොජන ස්ථානයන්, බත්දෙන තැන්. **මඬුලුබැඳ**=මණ්ඩල බන්ධනය කොට රාශිභූතව. **ඒකනිඝෝෂය**=එකනින් නාදය. **ව්‍යාපාරවීථියට**=වෛශ්‍යයන් වසන වීදියට. **භුවනශෙඛරවූ**=ලොකයට මුදුන් මල්කඩක් වූ. **දහසින්බැඳිපිසල්ලක්**=දහසක් නැඹූ පොදියක්. **නිපුණ**=දක්ෂ වූ. **ධනසම්භාර**=ධන රාශි.

(358, 359, 360 පිටු.)

**මහාරජ**=මහාරජන් වූ; **වෙස්සන්තර**=වෙසසන්තරයෙනි; **භවං**=පින්වතුන්; **ජයතු**=සම්පත්කාමීයෙන් දිනාවා. **මිණිරහුදම් පෙළය**=මිණිමය වූ රහුගෙ ගෙඩි පෙලය. **කණ්ණාභරණ**=කණ පළඳන අබරණ. **කුඹසැදු**=කුම්භස්ථලය අලඞ්කාර කළ. **ශුණ්ඩයේ**=හොඬේ. **සොවැත්ත**=ස්වස්තික ලක්ෂණය. නාගඅකුර.

(361, 362, 363. 364 පිටු.)

**දිවිගණුත්**=මැරීම ද. **දිමිතිල්ලක්**=දිමි ගොටුවක්. **නොදකිති**=නො කත්. එල නො විදිත්. **දෙබිසින්නන්කෙරෙහි**=සහෝදරයන් කෙරෙහි. **කාමරතියට**=කාමයෙහි බැඳීමට. **මුහුලුබැඳ**=රාශිවී වශීබන්ධනය කොට. **බැහැවී**=අභ්‍යාස වී. පුරුදු වී. **ළියගී**=

ලයාන්විත ගීතිකාවන්. **කිංපුරුෂයන්**-කිඳුරන්. **ලැහැන්බැඳ**=රංචු ගැසී. **නා**=නා ගස්. **පතා**=කොස්. **තුවරලා**= එනම් අතිශය සුගන්ධවත් ද්‍රව්‍යය.

## (365, 367 පිටු.)

**නොහැම්මෙමි**=ජීවත් නො වෙමි. **පලන්නාසේ**=පිටකරන්නාක් මෙන්. **අල්ලේදවස්**=සමීප දවස. **කම්මින්තන්**=වැඩ කාරියන්. **ශංඛලා**=සක් අබරණ. **තිසරරුවන්**=හංසාකාර මහගු අබරණ. **මුදුරුවන්**=වටිනා මුදු. **උකාගන්නට**=උරගන්නට. **පිළිසබඩන්**=වස්ත්‍ර පෙට්ටගම්. **හුණාපී**=රත්කළ. **පාදඞගුලී**=පයැඟිලි මුදු. **පාදකටක**=පා වළලු. **පස්රු**=ආභරණ විශෙෂයකි. **පස්පෙරහර**=ආභරණ විශෙෂයකි.

## (367, 368, 369 පිටු.)

**කැටපහණ**=කුඩාගල් සහ බොරලු. **සුවසහන්**=සැප ඇති යානාවල. **ධවළචාමරයේ**=සුදු සෙමරවල. **අවුමුසු**=ඉර අවුවෙන් මිශ්‍ර වූ. **ප්‍රචණ්ඩවාතයෙන්**=අතිශයින් සැඩ වූ සුළඟින්. **ඉච්ඡාසේ**=කැමැති පරිද්දෙන්. **පකාපැකි**=කුඩාවූත් මහත්වූත් ගෙඩි. නොහොත් පැසුන නො පැසුන ගෙඩි.

## (371, 372 පිටු.)

**තෙලපෙණෙන**=අර පෙණෙන. **එලාඑලයෙන්**= ලොකුවූත් කුඩාවූත් ගෙඩිවලින්. **විපුලවූ**=පැතිරුණා වූ. **ගිරිඋපලන්**=ගල් උල්පතින්. **බට**=වැගිරෙණ. ගලායන. **ඉපුල**=උපුල්, පියුම්. **හංසශ්‍රෙණීන්**=හංසපෙළින්. **විරාජමාන**=බබලන. **මාලාමැලි**=මහත් මල් සහ කුඩා මල්. **සුඹුලු**=රිටිපට්ටා. **තිදඬු**=ත්‍රිදණ්ඩ. **පුළුලුමල්**=විශාල මලු.. **සුඹුල්කරු**=බලඇති දෙබල්කරු. **වගුන්**=ව්‍යාඝ්‍රයන්. **භූ**=භූතයන්. **හඹරක්**=මාගීයක්. **දළමඩුල්ලට**=ජටාමණ්ඩලයට තලප්පාවට. **දළමුක්හර**=මහාමුක්තාහාරය. **එකාවැල**=උරෙහි ලන තූල.

## (373, 374, 375 පිටු.)

**මසිඳු**=මා විසින් ද. **අනාථ**=සරණක් (=පිහිටක්) නැති. **රුහැණිව**=කොපව. **ගහට**=හිරිහැර. **දත්හුනු**=දත් වැටුන. **පවුකිළිසකි**=පව්කාරියකි. **ෂෙහෙලා**=තරුණ මිතුරියෝ. **ජරහම්මාල්ලා**=ජරපත් මහල්ලා. **සෙනවේලෙහි**=සිනාසෙන විට. **පහණක්**=ගලක් මෙන්. **කනවටුවාට**=වැහැරුණහුට. **මියුඩුහුරුලා**=පුසුම්

ලා. **පැනට**=වතුර පිණිස. **නතනමින්**=තැතිගන්වමින්. **කොද බෙණෙමින්**=කොප වචන කියමින්. **කොලකොල්ලන්**=ජඩ වූවන්. **සුළුක්දූරිශෝ**=සත්‍රිහු සමූහයක්. **ඕනාසේ**=බඟන්නාක් මෙන්.

## (376 පිටු.)

**ඉපිලඟින**=ඉල්පුනේය. **ජඩවූනඹවිම්මැලිශ**=තඹරවුල් ඇති කම්මැලිය. **කන්නලවුනොපිරිවා**=අඥානා බස් නො කියා. **වෙරමස්කාසි**=ශරීරයේ මස් කාසි. **හවමින්**-සාපකරමින්. **අඹුදූරි**=තරුණ වූ ස්ත්‍රිය. **කළව**=කළාහුය. **තොල්බොල්සිඳගෙණ**=තොල් නළල් කඩාගෙණ. (භාල යන්නෙන් බොල්ය යි බිදුනි.) **පිරිහෙමින්**= අයසට පැමිණෙමින්. **දනළුනුවැලම්පිලොලා ගෙණ**=උස්වූ දනහිස සහ වැලමිට ලෙවකමින්. **දිනබල්ලෝ**=වණ්ඩ වූ බල්ලෝ. **තපිණාපසිශද**=කැම ඔලගුව. **අඳුරපතරට**=අන්ධකාර පැතිරීමට. **කානුශිශ**=ඊතලය. **තුඩශෙහි**=දුනුදියෙහි. **වම්මවම්මා**=ගල්වමින්. වම. වැම්මෙහිදසින්. **පඤ්චසකුණශන්ට***=මහදෙවියන්ට. පඤ්චසකුණ නම් යාගය කොට දෙමි නොහොත් මහවැසිලිහිණීන්ට දෙමි. **තුන්මංසුල**=තුන් මහසන්ධි වූ තැන. **පනක්සේ**=කඩයක් මෙන්.

## (377, 378, 379, 380, 381, 382 පිටු.)

**එක්වන්**=නිතර. **මල්පල්ලෙන්**=මලින් සහ කොළවලින්. **හැලිගසා**=රැලි දමා. **ඔද්දේ**=ඔඩොක්කුවෙහි, උකුලෙහි. **වගුල**=වැටුන. **ශ්‍රමදහ**=විඩා මහන්සි. **හසහින්**=මාගීයෙන්. **කඳුබැඳි තිබෙන**=රැශි වී කන්දක් මෙන් ඇති. **විලිකෂවැ**=ඉදී. **අනෘතනු සිතෙකින්**=අමුතු සිතකින්. **මෙවල**=මේ වනයෙහි. **කම්කිලිශගේ**=කම්කාරිගේ. කළ පව්කම් ඇත්තියගේ. **එකලාකම්**= තනියම වසන බව. **කිලින්**=පුරස්ථානයන්. **පඤ්චමහාගඞ්ගාව**=ගඞ්ගා, යමුනා, අචිරවතී, සරභූ, මහී යන ගඞ්ගා පස. **සරස් මෙහෙනැන**=පහත් වූ මෙහෙකරු තනතුරෙහි. **මරුවැලක්**=මරණ උපායක්. **නොහසළවිරුශ**=අදක්ෂය. **මෙවෙලාහැම්මෙසි**=දූත් නවතුව.

## (384 පිටු.)

**බොරුවෝ**=බොරුකාරයෝ. **හිගිලාලා**=ඉහිකරලා. සංඥ කරලා. **ඊනැතිවන්නා**=ඕ තොමෝ නැති හෙයින් ද. **උපුල්වන් මහාථේරිනී**=ඉඩිමන්තිනියන් අතුරෙන් එතදග්‍රස්ථානයට පැමිණි

---

* පඤ්චසණංයජිස්සාමි=(අට්ඨකථා)

මුන්වහන්සේ පියුමතුරා බුදුන්ගෙන් විවරණ ලබා කාසුප් බුදුන් දවස කිකී නම් කාසිරජහට දියනිව විසිදහසක් අවුරුදු බඹසර රැක භික්ෂූන්ට පිරිවෙණක් කරවා දී ඉන් සැව දුගී කුලයක ඉපිද එක් පසේ බුදුන්වහන්සේ නමකට විළඳ සහ නිල්පියුමක් පුදා විලඳ ගණනින් දරුවන් පතා පදුමවතී කාලයෙහි පුත්‍රයන් පන් සියයක් ද ලබා අප බුදුන් දවස සැවැත් නුවර සිටුකුලයක ඉපිද නිලුපුල් ගැබකට බඳු ශරීරවණී ඇතිව උපන් හෙයින් යථොක්ත නාමයෙන් ප්‍රකටව රූපාග්‍රප්‍රාප්තව රූපය කෙරෙහි ඇලුනු දඹදිව බොහෝ රජ ඇමති සිටුවරුන් විසින් යුවතිභාවයෙන් අයැදී කල ඒ සියල්ලන් සතුටු නො කට හැකි හෙයින් උන් පියන් විසින් බුදුසසුන් හි පැවිදි කර විය. පැවිදිව නොබෝ කලකින් තෙජොකසිණය වඩා සිවුපිළිසිඹියා පත් රහත් බවට පැමිණි සේක.

**(385, 386, 387 පිටු.)**

**රන්පිටාටු**=සුවණීවණී පෘෂ්ටය **දෙස්**= ශාක්‍ෂි. **පිහසිය**= පඩුවන් ය. **වමපරුසිය**= වපරය. **බමුණුරෙද්ද**= බමුණුවහල්ලා. **අළුව**= බැම්ම නොහොත් ඇහැටුව. **ඔරින්**= උරයෙන්. **පසුමහාපරිත්‍යාගය**= ශ්‍රෙෂ්ඨ ධන පරිත්‍යාගය, පුත්‍රදාර පරිත්‍යාගය, රාජ්‍යපරිත්‍යාගය, අඞ්ගප්‍රත්‍යඞ්ගපරිත්‍යාගය, ශරීරාඞ්ග පරිත්‍යාග යන උතුම් පරිත්‍යාග පස යි. **පෙකැල්ලන්**=රැකඹින්.

**(388, 389, 390, 391 පිටු.)**

**පැහැනුදුල**= ප්‍රභාවෙන් කාන්තියෙන් බබලන. **බමර රවට**= බමරුන්ගේ නාදයට **දෙව්ල්ල**= රිටි දෙබලය. **පිටටහැඹි**= පිටතට ගොස්. **සිකලහ**= සියලු ශරීරය. **දරුසන්නව**= දරු සෝකයෙන්. **ලස්වැසි**= පමා වී යයි. **හලාහලවැ**= විෂයක්ව. **නිදිවියෝව්වැ**= නින්දෙන් තොරව. නිදි නැතිව. **වහලක්**= වැඩකාරියක්.

**(392, 393, 394 පිටු.)**

**උකුනොවන**= අඩු නො වන. **සපතකින්**= යකඩ පියන් පතකින්. **ඔරකිද්දේ**=ඔබොක්කුවේ. ඇකයේ.

---

**දහම් සරණ ග්‍රන්ථපදාර්ථ විවරණය**

**නිමි.**



